ISSN 1927-5218 Dasatha(Print)
ISSN 1927-5226 Dasatha(Online)

Tel: 416 822 2789
dasathainfo@gmail.com
www.dasatha.com

# දසත Dasatha

සතුට. විනෝදය. දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

Pages 52 DECEMBER 2017 Issue : 97 මාසික සංග්‍රහය 2017 දෙසැම්බර්, 97 කලාපය 50 ¢







**ඉදින්.... සුරලොව ඔවුන්ගේ ගී නදින්, ඔවුන්ගේ වෙණ නදින් කම්පිත වනු ඇත.....**
**මහා ගාන්ධර්ව පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේවයන් සමග සංගීතවේදී රුවන් වීරසේකර**

**සේයාරුව - දයාන් විතාරණ**

# ශ්‍රී ලංකාවේ පළාත් පාලන මැතිවරණය

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට කොට්ඨාස හා සමානුපාතික මිශ්‍ර මැතිවරණ ක්‍රමයට පවත්වන පළාත් පාලන මැතිවරණය සඳහා පළාත් ආයතන 341 ක් වෙනුවෙන් පත්විය යුතු සභිකයන් සංඛ්‍යාව සඳහන් විශේෂ ගැසට් නිවේදනය නොවැම්බර් 11 වෙනි දින නිකුත් කරනු ලැබූ අතර පළාත් පාලන මැතිවරණය සඳහා පළාත් පාලන ආයතන කීපයක නාම යෝජනා දෙසැම්බර් 11 වෙනි දින සිට 20 වෙනි දින දක්වා කැඳවීමට මැතිවරණ කොමිසම තීරණය කරනු ලැබීය. එසේම 2018 පෙබරවාරි 15 වෙනිදාට පෙර මැතිවරණය පැවැත්වීම මැතිවරණ කොමිසමේ අපේක්ෂාව බවද සඳහන් වී ඇත.

මෙවර මැතිවරණය පැවැත්වීමට නියමිත 'මිශ්‍ර මැතිවරණ ක්‍රමය' ශ්‍රී ලංකාවට අලුතින්ම හඳුන්වා දෙන මැතිවරණ ක්‍රමයක් වන අතර එය කොට්ඨාස සහ සමානුපාතික යන දෙකෙහිම මිශ්‍රනයක් සහිත නව මැතිවරණ ක්‍රමයකි.

මෙම නව ක්‍රමයට අනුව කොට්ඨාස සීමා නිර්ණය කිරීමේදී පෙර 336 ක් ලෙස පැවති පළාත් පාලන මැතිවරණ ආයතන සංඛ්‍යාව 341 ක් ලෙස ඉහළ ගොස් ඇත. එසේම මෙතෙක් සභිකයන් 4486 ක් ලෙස තිබූ සභික සංඛ්‍යාවද මෙම මැතිවරණයේදී 8356 දක්වා වැඩිවී ඇත.

මහ නගර සභා 24 ක්, නගර සභා 41 ක්, ප්‍රාදේශීය සභා 272 ක් ලෙස ශ්‍රී ලංකාව තුළ පෙර පැවති පළාත් පාලන ආයතන 337 ට අලුතින් පොළොන්නරුව මහ නගර සභාව, මිල්ලනිය, නෝර්වුඩ්, ආගරපතන කොටගල හා මස්කෙළිය ප්‍රාදේශීය සභා එක් වී ඇති නිසා සමස්ත පළාත් පාලන ආයතන සංඛ්‍යාව මෙසේ 341 ක් දක්වා ඉහළ යනු ලැබුණි.

මේ අතර පළාත් පාලන මැතිවරණයේ ඡන්ද කොට්ඨාස සීමා නිර්ණයන් හා සභික සංඛ්‍යාව ඇතුළත්ව නිකුත් කර තිබූ ගැසට් නිවේදනය වළක්වාලමින් නොවැම්බර් 22 වැනි දින අභියාචනාධිකරණය මගින් අතුරු තහනම් නියෝගයක් නිකුත් කරනු ලැබූවත් නොවැම්බර් 30 වන දින අභියාචනාධිකරණය විසින්ම එම නියෝගය අහෝසි කරනු ලැබුණි. එම නියෝගය පැනවීමට හේතුපාදක වූ පෙත්සම් ඉල්ලා අස්කර ගන්නා බව පෙත්සම් දැමූ පාර්ශ්වයේ නීතිඥවරයා විසින්ම අධිකරණයට දැනුම් දීමෙන් පසු එම නියෝගය පනවන ලද ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල විසින්ම එම තහනම් නියෝගය අහෝසි කරනු ලැබ ඇත. අතුරු තහනම් නියෝග නොතිබුණු පළාත් පාලන ආයතන 93 ක් සඳහා නාමයෝජනා භාර ගැනීම දෙසැම්බර් 11 සිට 20 දක්වා සිදුකරන බව මේ වන විටත් නිවේදනය කර තිබූ අතර මෙතෙක් අතුරු තහනම් නියෝග තිබූ පළාත් පාලන ආයතන 208 සඳහාද නාමයෝජනා කැඳවීමේ නිවේදනය දෙසැම්බර් 04 වෙනිදා නිකුත් කරනු ලැබේ. මීට අමතරව තවත් පළාත් පාලන ආයතන 40 ක සීමා මායිම් විස්තර කිරීමේ ගැසට් නිවේදනයේ මුද්‍රණ දෝෂ පවතින හෙයින් එම මුද්‍රණ දෝෂ නිවැරදි

**8 වන පිටුව බලන්න**

# NAFTA අහෝසියේ බලපෑම....!

උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම (NAFTA) අවසන් කළහොත් එයින් කැනේඩියානු ආර්ථිකයට දැඩිව බලපෑම් එල්ල විය හැකි වුවත් එය කළමනාකරණය කරගත හැකි අවදානමක් බවට පත් කර ගැනීමට හැකි බව BMO මෑතකදී නිකුත් කළ වාර්තාවක් සඳහන් කොට සිටී. එහිදී ව්‍යාපාර, වෙළඳපොළ තත්ත්වය හා ප්‍රතිපත්ති සම්පාදකයින් ඉතා ඉක්මනින් ඊට මුහුණ දීමට කටයුතු සකස් කරගත යුතු බව කරුණු සහිතව එම වාර්තාවේ දක්වා ඇත.

එම වාර්තාව සැකසීමේදී සිදුකළ අධ්‍යයනයට අනුව NAFTA ගිවිසුම අහෝසි කිරීමෙන් බලපෑම් සිදුවන එකම රට කැනඩාවට පමණක් නොවන බව දැක්වේ. එහිදී මෙම ගිවිසුම තුළ සිටින කැනඩාව, මැක්සිකෝව සහ ඇමරිකාව යන හවුල් රටවල් තුනටම හා එම රටවල් විසින් ගිවිසුම යටතේ සිදුකළ සියලුම කර්මාන්ත හා වෙනත් අංශයන්ට මෙහි ප්‍රතිවිපාක විඳීමට සිදුවීම අනිවාර්යය බව එය පවසයි. විශේෂයෙන්ම මෙම ගිවිසුම අහෝසි කිරීමෙන් විශාලතම පරාජිතයන් වන්නේ පාරිභෝගිකයින් බව BMO පෙන්වා දී ඇත.

NAFTA ගිවිසුම පිළිබඳව නැවත සලකා බැලීම සම්බන්ධයෙන් පැවැත්වෙන සාකච්ඡා මාලාවේ පස්වන වටය පසුගියදා මෙක්සිකෝවේදී පැවති අතර එහිදී මෙම

**8 වන පිටුව බලන්න**



දසත Dasatha

සතුට, විනෝදය, දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

# www.dasatha.com

## වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

## Gamini - 416 822 2789

All Ads & Classified Ads are also Published in the ONLINE Edition at

**WWW.DASATHA.COM**

**For NO ADDITIONAL CHARGE**

**Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com**

## ඔබේ නිවසටම දසත Dasatha

**සෑම මසකම දසත පුවත්පත ඔබේ නිවසටම තැපැල් මගින් ගෙන්වා ගැනීමේ අවස්ථාව දැන් සලසා ඇත.**

ඔබගේ නම සහ ලිපිනය සඳහන් කොට පහත සඳහන් ලිපිනයට අදාළ චෙක්පත යොමු කරන්න.

**දසත දායකත්ව ගාස්තු**
**Subscription Rates for Dasatha**

මාස හයක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 35

වසරක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 70

Please make all Cheques payable to **Dasatha Publications**

**Dasatha Publications, 114 Chatfield Dr. Woodbridge L4H 0Z7. Ontario. Canada**

**Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com**

# ඔබේ දුරකථනයත් ටැප් වෙයිද?

කැනඩාවේ දේශීය රහස් ඔත්තු ඒජන්සිය (Canada's domestic spy agency) විසින් ඇතැම් අවස්ථාවල ජංගම දුරකථන නිරීක්ෂණ සඳහා භාවිත කරන ලද තාක්ෂණ උපකරණ තවදුරටත් භාවිත කළ හැකි නිශ්චිත අවස්ථා පිළිබඳව ෆෙඩරල් අධිකරණය පසුගියදා තීන්දුවක් ලබාදෙන ලදී.

වසර ගණනාවක සිට කැනේඩියානු ආරක්ෂක බුද්ධි සේවය Canadian Security Intelligence Service (CSIS) විසින් ජාතික ආරක්ෂාව පිළිබඳ තත්ත්වයන් තුළදී අවසරයක් සහිතව මෙන්ම රහිතවත් පරිගණක, ටැබ්ලට්, ජංගම දුරකථන සහ වෙනත් දුරකථන උපාංග පිළිබඳව තොරතුරු රැස් කිරීම සඳහා Cell Site Simulator (CSS) නමැති උපාංගය භාවිත කරනු ලැබ ඇත. මෙය IMSI Catchers හෝ Stingrays ලෙසද හැඳින්වෙන අතර එය තොරතුරු එකතු කිරීම සඳහා භාවිත වන ජංගම කුලුනක් ලෙස පෙනී සිටී.

එහෙත් ඔත්තු සේවා විසින් පෞද්ගලික දත්ත එක්රැස් කිරීම සඳහා භාවිත කරන තාක්ෂණ උපකරණ පිළිබඳව දිගින් දිගටම විවේචන එල්ල වී තිබුණි. විශේෂයෙන්ම එම අධිසංවේදී උපකරණ භාවිතයේදී අදාළ පුද්ගලයාගේ පමණක් නොව ඒ අවට සිටින අනිකුත් සියලුම පුද්ගලයන්ගේ දුරකථන ඇතුළු ඉලෙක්ට්‍රොනික උපාංගවල තොරතුරු ග්‍රහණය වීමෙන් ඔවුන්ගේ පෞද්ගලිකත්වයට හා පුද්ගල රහස්‍යභාවයට විශාල හානියක් වන බව පුද්ගල අයිතීන් වෙනුවෙන් පෙනී සිටින ආයතන විසින් පෙන්වා දී තිබුණි.

මෙම දත්ත රැස් කිරීමේ තාක්ෂණ උපකරණ භාවිතයෙන් විශේෂිත කරුණු දෙකක් පමණක් විමර්ශනය කෙරෙන බව CSIS පවසා සිටියි. එනම්, යම් සිදුවීමකදී ජංගම දුරකථනයක් හෝ වෙනත් තාක්ෂණ උපකරණයක් ඔස්සේ ගොස් අදාළ පුද්ගලයා පිළිබඳ කරුණු අනාවරණය කර ගැනීමත් ඉන්පසුව එම පුද්ගලයා සිටින ස්ථානය හඳුනාගැනීමත් මෙම විශේෂිත තාක්ෂණ උපකරණ මගින් සිදුකරනු ලබයි. ඊට අමතරව කිසිදු ලෙසකින් අදාළ දුරකථනවල සංවාද ග්‍රහණය කර නොගන්නා බව CSIS පවසයි. කෙසේ වුවත් පුද්ගල අයිතීන් බරපතල ලෙස උල්ලංඝනය වන අවස්ථාවක් වන මෙම කරුණ ෆෙඩරල් අධිකරණය දක්වා ගෙන යාමට ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් වී ඇති ආයතන කටයුතු කර තිබුණි. එහිදී සිදුකළ පරීක්ෂණවලින් හෙළි වුයේ CSIS විසින් ඇතැම් අවස්ථාවල මෙම තාක්ෂණ උපකරණ භාවිතය සඳහා අතිරහසිගත අවසර ඉල්ලීම් (top-secret warrant application) ලබාගෙන ඇති බවත් ඇතැම් අවස්ථාවල එසේ අවසර ගෙන නොමැති බවත්ය. මෙහිදී එම අවසර ලබාගැනීම සහ නොගැනීම සිදුකර ඇති පදනම කුමක්ද යන්න පිළිබඳව පැහැදිලි නොවන බව සඳහන් වේ. කෙසේ වුවත් මේ පිළිබඳව ඉදිරිපත්ව ඇති කරුණු සලකා බැලූ අධිකරණය ඉදිරියේදී දුරකථන ආදිය විමර්ශනය කිරීමේදී නිශ්චිතව ඒ සඳහා අවසර ලබාගත යුතු හා අවසර ලබා නොගත යුතු අවස්ථා දෙකක් පිළිබඳව තීරණයක් ලබා දී ඇත. ඒ අනුව කිසියම් දුරකථනයක් මගින් අදාළ විෂය පිළිබඳව හෙළිදරව් කර ගැනීමට CSIS සතු තාක්ෂණ උපකරණ භාවිතයට අවසර ගැනීම අවශ්‍ය නොවන අතර එම දුරකථනය පිහිටි ස්ථානය නිරීක්ෂණය කිරීම සඳහා තාක්ෂණ උපකරණ භාවිත කිරීමට අවසර ලබාගත යුතු වේ.

CSIS විසින් මෙසේ දුරකථන දත්ත ලබාගැනීමට භාවිත කළ තාක්ෂණ උපකරණ ගැන අධිකරණය තුළ විභාග වූ නිසා පසුගිය ජනවාරියේ සිට ආරක්ෂක බුද්ධි සේවය විසින් මෙම තාක්ෂණ උපකරණ යොදා ගැනීම නවතා දමා තිබුණි. එහෙත් ඒ සම්බන්ධයෙන් පැහැදිලි තීන්දුවක් අධිකරණය විසින් ලබාදීමත් සමග එම අදාළ නීති රෙගුලාසිවලට අනුකූලව නැවතත් එම උපකරණ භාවිතය CSIS විසින් අරඹා ඇත.

# කැනඩා විරැකියාව අඩු වේ !

2008 වසරට පසු කැනඩාවේ තිබූ අඩුම විරැකියා අනුපාතය ගෙවී ගිය නොවැම්බර් මාසයේදී පෙන්වා ඇත. කැනේඩියානු ඩොලරයේ අගය ඉහළ යාමට පටන් ගැනීමත් සමග කැනඩා ආර්ථිකය යහපත් වීමෙන් මෙම රැකියා අවස්ථා වැඩි වූ බව මේ පිළිබඳව පළවූ පුවත් වාර්තාවල සඳහන් වේ. ඒ අනුව පසුගිය මාසයේ රැකියා උත්පාදනය බලාපොරොත්තු වූවාට වඩා අට ගුණයකින් ඉහළ ගොස් ඇති බව පැවසේ.

කලක පටන් දුර්වල තත්ත්වයේ පැවති කැනේඩියානු ඩොලරය ඉකුත් මාස කීපය තුළ ක්‍රමයෙන් ඉහළ යෑමට පටන් ගත් අතර එය නොවැම්බර් අවසාන සතියේදී වාර්තාගත ඉහළ යෑමක් එනම් ඩොලර් 1.23 ක් පෙන්වා තිබුණි. එහිදී විනිමය අනුපාතික තත්ත්වයන් තුළ කැනේඩියානු ඩොලරයක වටිනාකම ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 78.77 ක අගයක් ගැනුණි. පසුගිය කාලයේ මෙසේ ඩොලරයේ අගය ඉහළ යෑමෙන් වෙළඳපොළ තත්ත්වය යහපත් වීම කැනඩාව තුළ රැකියා අවස්ථා වැඩිවීමට විශේෂයෙන් බලපෑ බව ආර්ථික විශ්ලේෂකයින්ගේ අදහසයි. කැනඩාවේ රැකියා තත්ත්වය පිළිබඳව මාසිකව සිදුකරන කැනේඩියානු ශ්‍රම බලකා සමීක්ෂණයේ තොරතුරුවලට අනුව නොවැම්බර් මාසයේදී 80,000 ක් සඳහා රැකියා ලබා දී ඇත. මීට වසර කීපයකට පෙර කැනඩාව මුහුණ දුන් දරුණු ආර්ථික අවපාතයෙන් පසු නැවතත් ආර්ථිකය ප්‍රකෘතිමත් වීමේදී 2012 අප්‍රේල් මාසයේ එකවර රැකියා විශාල ප්‍රමාණයක් රටට එකතු වීමෙන් අනතුරුව නැවතත් එක් මාසයක් තුළ විශාලතම රැකියා සංඛ්‍යාවක් එකතු වූ අවස්ථාව මෙය බව සංඛ්‍යා දත්ත නිරීක්ෂණයේදී පෙනී යයි.

සමස්තයක් වශයෙන් ගෙවී යන වසරේ පූර්ණ කාලීන රැකියා අවස්ථා 441,000 ක් එකතු කර ඇති අතර නොවැම්බරයේ එක් වූ රැකියා අවස්ථා 80,000 අතරිනුත් 30,000 ක්ද පූර්ණ කාලීන රැකියා වේ. එම රැකියා අවස්ථා අතරින් අර්ධයකටත් වැඩි ප්‍රමාණයක් ඔන්ටාරියෝව තුළ පවතින අතර බ්‍රිටිෂ්කොලොම්බියාව, ක්‍යුබෙක් හා ප්‍රින්ස් එඩ්වඩ් දිවයිනද රැකියා උත්පාදනයේ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. රටේ ප්‍රදේශ රැසක රැකියා අවස්ථා වැඩි වුවත් නිව්බ්‍රවුන්ස්වික් හි 2,700 කට රැකියා අහිමි වී ඇති බවක්ද වාර්තා වේ. වෙළඳ අංශයේ රැකියා 38,800 ක්, 20,700 ක් අධ්‍යාපන අංශයෙන්, ඉදිකිරීම් කර්මාන්තයට සම්බන්ධ රැකියා 16,200 ක්, නිෂ්පාදන අංශයට සම්බන්ධ රැකියා 30,400 ක් වශයෙන් මෙම රැකියා රටට එක් වී ඇත.

# උද්‍යාන සඳහා දුන් සහන කාලය නිමයි

කැනඩාවට වසර 150 ක් පිරීම නිමිත්තෙන් 2017 වසරේදී වයස් සීමාවකින් තොරව ජාතික උද්‍යාන නොමිලේ නැරඹීමට යෑමට දී තිබූ අවස්ථාව 2018 ආරම්භයේ පටන් අවුරුදු 17 සහ 17 න් පහළ පිරිසට පමණක් සීමා කෙරේ.

මේ පිළිබඳ වූ නිවේදනය ෆෙඩරල් රජයේ පරිසර ඇමතිවරිය විසින් පසුගියදා ප්‍රකාශයට පත් කරනු ලැබුණි.

පසුගිය වසරේ ජාතික උද්‍යාන වෙත එන සියලුම ජනතාව සඳහා නොමිලේ ඇතුළුවීමේ පහසුකම් සලසා තිබුණි. මෙහිදී රථවාහන සඳහා උද්‍යාන ගේට්ටු අයකිරීම් ලබා ගැනීමක්ද සිදු නොවුණි.

මේ සඳහා රජය විසින් ඩොලර් මිලියන 76 ක් වැය කර ඇති බව සඳහන් වේ.

# අයිස් යුගයේ ගුහාවක් මොන්ට්‍රියල්වලින් මතු වේ

වසර දහස් ගණනකට පෙර තිබූ අයිස් යුගයට අයත් බවට සැලකෙන භූගත ගුහාවක් සොයා ගැනීමට ගවේෂක කණ්ඩායමක් සමත් වී ඇත. මේ යෝධ ගුහාව මොන්ට්‍රියල් Saint-Leonard හි පිහිටි Parc Pie-XII උද්‍යානයෙන් හමුවී ඇත.

අලුතින් සොයාගත් මෙම ගුහාවටම සම්බන්ධ වූ වෙනත් ගුහාවක් මීට දශක කීපයකට පෙර සිටම මෙම උද්‍යානය තුළ මහජනතාවට විවෘත පවතී. මෙම අලුතින් සොයාගත් ගුහාව එම ගුහාවේ පිටුපස පිහිටි හුණුගල් බිත්තියකින් සැඟවී තිබී ඇත. අලුත් ගුහාව දැනට පවතින ගුහාව මෙන් 10 ගුණයක පමණ විශාලත්වයකින් යුතු එකකි. එහි ඉතිහාසය වසර 15,000 ක පමණ ඈත අයිස් යුගය දක්වා දිව යන බව විශේෂඥ මතයයි.

බොහෝ විට ගුහා ඇතිවීමට ජල ඛාදනය බලපානු ලබයි. එහෙත් මෙම ගුහාව glaciotectonic ක්‍රමයෙන් බිහිවන්නට ඇති බව මෙම ගවේෂකයෝ පවසති. එනම් අයිස් යුගයේ තිබූ අයිස් කළු එසේත් නොමැති නම් ග්ලැසියර තුළ හටගත් පීඩනයත් සමග එම අයිස් කළු පුපුරා යාම මෙම ගුහාවල උපත විය හැකි බව පැවසේ.

මෙම ගුහාව සම්බන්ධ නිසි සමීක්ෂණ වාර්තා සම්පූර්ණ වූ පසු එයද මහජනයා සඳහා විවෘත කිරීමට බලධාරීන් අදහස් කර ඇත.

# සීතල අඩුද?

මෙවර ශීත සෘතුව පිළිබඳව කතා කරන බොහෝ දෙනෙකු පවසන්නේ තවමත් වින්ටර් එක හරිහැටි නොදැනෙන බවයි. මේ පිළිබඳව කැනේඩියානු කාලගුණ විශේෂඥයින් පවසන්නේ මෙවර කැනඩාවේ ශීතල තරමක් අඩුවිය හැකි බවයි. විශේෂයෙන්ම නත්තල 'හිම නත්තලක්' (white Christmas) නොවෙනු ඇතැයි ඔවුහු පවසති.

එහෙත් මෙවර ශීත තත්ත්වය පසුගිය වසරේ ශීත සෘතුවේ තරමටම අඩු නොවිය හැකි බවද ඔවුන් පෙන්වා දේ.

# ඔන්ටාරියෝවෙත් නයි.... !

නාගයෙකු දෂ්ට කිරීම නිසා අසාධ්‍ය වූ පීටර්බරෝහි පදිංචි 29 හැවිරිදි පුද්ගලයෙකු පසුගියදා රෝහල් ගත කර තිබුණි. CBC Toronto පුවත් සේවය විසින් මෙම සිදුවීම පිළිබඳව Toronto Animal Services වෙතින් විමසා ඇති අතර මෙම නාගයා සිටි ස්ථානය පිළිබඳ නිසි තොරතුරු ඔවුන් අනාවරණය කොට නොමැත.

ටොරොන්ටෝ සත්වෝද්‍යානයේ උරගයන් හා උභයජීවීන් සම්බන්ධ විශේෂඥවරයකු පවසා ඇති පරිදි සර්පයා දෂ්ට කළ පුද්ගලයා කලෙක පටන්ම මිතුරකු හා එක්ව උරගයන් සමග කටයුතු කරමින් එම සර්පයින් එහා මෙහා ගෙන යාමේ කටයුතුවල යෙදී සිට ඇත. මාරාන්තික උග්‍ර විෂ සහිත දකුණු ආසියානු කලාපීය රටවලට ආවේණික monocled cobra නමැති නාග විශේෂයක සර්පයෙකු මෙම දෂ්ට කිරීම කර ඇති බව ඔහුගේ අදහසයි. කෙසේ වුවත් මේ වන විට මෙම පුද්ගලයාගේ තත්ත්වය යහපත් අතට හැරී ඇති බව රෝහල් ප්‍රකාශකයින් පවසයි.

ඔන්ටාරියෝ පළාත් නීතියට අනුව නිල අවසරයක් නොමැතිව විෂකුරු සර්පයින් නිවෙස් තුළ පෞද්ගලිකව ඇතිකිරීම තහනම් වේ. සර්පයින් ඇතුළු එසේ තහනම් කර ඇති සතුන් ඇති කරන පුද්ගලයින් ඩොලර් 240 ක දඩයකට යටත් කෙරෙයි.

එහෙත් ටොරොන්ටෝ සත්වෝද්‍යානය පවසන්නේ විෂ සහිත උරගයන් රැසක් බොහෝ දෙනෙකු විසින් නිවෙස්වල තබා ගෙන සිටින බවයි. පසුගිය දශකය තුළ මේ හා සමාන සර්ප දෂ්ට කිරීම් 7 ක් පමණ GTA කලාපය තුළ සිදුවී ඇති බව උරගයන් පිළිබඳ විශේෂඥවරයා පවසා ඇත.

කැනඩාවට ආවේණික නොවන සහ මෙරටේ දක්නට නොමැති මෙවැනි විෂකුරු සර්පයින් මෙහි පැමිණි ආකාරය ගැන නොයෙක් වර විමර්ශන කොට ඇති අතර ඒවායේදී හෙළිදරව් වී ඇත්තේ මෙම සර්පයින්ගෙන් බහුතරයක් ආසියානු, අප්‍රිකානු රටවල්වලින් නීතිවිරෝධී මෙරටට රැගෙන විත් ඇති බවයි. එම සතුන් මෙහි රැගෙන ඒමේදී අනුගමනය කොට ඇති ප්‍රවාහන ක්‍රමද අතිශයින් බිහිසුණු බව සඳහන් වේ.

මේ ආකාරයට නීති විරෝධීව ළඟ තබාගන්නා සතුන් පිළිබඳව අදහස් දැක්වූ Toronto Animal Services හි අධ්‍යක්ෂිකා එලිසබෙත් හිලිබිරි පවසා ඇත්තේ, ජනතාවට ළඟ තබාගත හැකි සහ නොහැකි සතුන් පිළිබඳව ලැයිස්තුවක් ඔවුන් සතුව ඇති බවයි. එම ලැයිස්තුව පිළිබඳව නැවත අධ්‍යයනයක් මේ දිනවල අරඹා ඇති බවත් එහිදී එම ලැයිස්තුවට අලුතින් එක් කළ යුතු සතුන් පිළිබඳවත් දැනට ලැයිස්තුවේ සිටින ඉන් ඉවත් කළ යුතු සතුන් පිළිබඳවත් තීරණ ගැනීම සිදුකරන බවයි. මිනිසුන් අතර නීතිවිරෝධී විෂකුරු සර්පයින් කොතරම් සංඛ්‍යාවක් සිටීද යන්න පිළිබඳව නිසි වාර්තාවක් ලබාගැනීම දැඩි අපහසු කරුණක් බව ඇය පවසයි. ඒ පිළිබඳව ඇයගේ අදහස වන්නේ ඔන්ටාරියෝව තුළ නීති විරෝධී විෂකුරු සර්පයින් සිය ගණනක් නොව දහස් ගණනක් සිටිය හැකි බවයි.


SRC
SCARBOROUGH
REHABILITATION CLINIC
2950 Eglinton Avenue E., Suite 04
Scarborough, ON. M1J 2E7
• PHYSIOTHERAPY
• CHIROPRACTIC
• LASER THERAPY
• MASSAGE THERAPY
• ACUPUNCTURE
• PHYSICAL THERAPY
• PSYCHOTHERAPY
• REFLEXOLOGY
• CHRONIC PAIN MANAGEMENT
• OCCUPATIONAL THERAPY
- CUSTOM ORTHOTICS
- ORTHOPEDIC SHOES
- ORTHOPEDIC MATTRESS
- COMPRESSION STOCKINGS
- TENS MACHINE
- ASSISTIVE DEVICES
WE SPECIALIZE IN
SPORTS AND WORK INJURIES
• EXTENDED HEALTH CARE
• WSIB
• MOTOR VEHICLE ACCIDENT
• SLIP AND FALL
• ODSP
• ACCEPT ALL TYPES OF WORK BENEFITS
ඔබට අවශ්‍ය උපදෙස් සිංහල භාෂාවෙන් ලබාගත හැක.
Tel: 416-335-1424 | Fax: 416-335-4542
Email: scarrehab@bellnet.ca
Please contact Rosemarie Jude for more information 416-569-7523

# රිජ්වේ ළමා රෝහලේ පටක බද්ධ බැංකුව

කොළඹ රිජ්වේ ආර්‍යා ළමා රෝහලේ ස්ථාපිත කරන ලද මානව හදවත් කපාට සහ පටක බද්ධ බැංකුව පසුගියදා මහජන අයිතියට පැවරුණි. රුපියල් මිලියන 100 ක වියදමින් ඉදිකරනු ලැබූ මෙම බැංකුව නිසා හෘද රෝග සහිත දරුවන්ට විශාල සෙතක් සැලසෙනු ඇත.

රිජ්වේ ළමා රෝහලේ හෘද ශල්‍යකර්ම ආරම්භ කර ඇත්තේ 2007 වසරේදී වන අතර එම ශල්‍යකර්ම කිරීමේදී පවතින පහසුකම් ප්‍රමාණවත් නොවීම දැඩි ගැටලුවක් වී පවතී. විශේෂයෙන්ම මෙතෙක් මෙවැනි මානව පටක බැංකුවක් ශ්‍රී ලංකාවේ නොතිබුණු නිසා හදවත් කපාට ගැටලු සහිතව උපදින දරුවන්ගේ ශල්‍යකර්ම සඳහා භාවිත කර ඇත්තේ කෘත්‍රිම පටක වර්ගයක් බව පැවසේ. එසේම එම කෘත්‍රිම පටකයක් සඳහා රුපියල් ලක්ෂ 3 ක් වැය කිරීමට සිදුවී ඇත.

මේ වන විට රිජ්වේ ළමා රෝහලේ හෘද සැත්කම් සඳහා විශේෂ ඒකකයක්, වෛද්‍ය දැඩි සත්කාර ඒකකයක් සහ නව ජන්ම දැඩි සත්කාර ඒකකයක් පිහිටුවීම සඳහා මහල් 10 කින් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු ආරම්භ කර ඇත. මේ සඳහා ඔක්තෝබර් 02 දා මුල්ගල තැබුණු අතර මෙම ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 2400 කි. මේ සඳහා මහජන පරිත්‍යාග ලබා ගැනීම සඳහා 'පුංචි හදවත් - Little hearts' නමින් ජාතික වැඩසටහනක් ආරම්භ කර ඇති අතර ඒ සඳහා ඔබටත් දායක විය හැක. මේ සඳහා අවශ්‍ය තොරතුරු www.littlehearts.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට ලබාගත හැක.

ශ්‍රී ලංකාව තුළ වසරකට උපදින දරුවන්ගෙන් 3000 ක් පමණ විවිධ හෘද රෝග සහිතව උපදින අතර මේ වන විට රිජ්වේ රෝහල තුළ වසරකදී මෙවැනි දරුවන් 1000 කට පමණ සැත්කම් සිදුකරනු ලබන බව සඳහන් වේ. මෙහිදී රෝහලේ පවතින පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා මේ ආකාරයට අවම සැත්කම් ප්‍රමාණයක් සිදුකෙරෙන අතර නව ප්‍රතිකාර සේවා සංකීර්ණය ආරම්භ කිරීමත් සමග වසරකදී හෘද සැත්කම් 2000 ක්ද කැතීටකරණ සැත්කම් 900 ක්ද සිදුකළ හැකි වෙතැයි පැවසේ. මෙම නව ගොඩනැගිලි සංකීර්ණය ආරම්භ කිරීමෙන් පසු සියලුම සේවාවන් එකම ගොඩනැගිල්ලක පවත්වාගෙන යාමේ පහසුකමද සැලසෙනු ඇත.

# ශ්‍රී ලංකා රුපියල

මුදලක් පිටරටට යැවීමේදී එම රටෙහි විනිමය අනුපාතයට අනුව එම මුදල මාරු වීම සිදුවේ. ඒ අනුව එක් රටක මුදලකට තවත් රටක මුදලින් ගෙවන ප්‍රමාණය විනිමය අනුපාතය ලෙස හඳුන්වයි. රටක විනිමය අනුපාතය තීරණය වන්නේ එරටේ මුදලට ඇති ඉල්ලුම හා සැපයුම අනුවයි. එසේ නැතහොත් රටෙන් පිටවන හා රටට ලැබෙන විදේශ විනිමය මතයි.

වර්තමානයේදී ශ්‍රී ලංකාවේ පවතින දුර්වල විදේශ විනිමය කළමනාකරණය නිසා මේ වන විට රුපියල ඉතාමත් සීඝ්‍රයෙන් අවප්‍රමාණය වෙමින් පවතී. පසුගියදා ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් එහි නවතම වාර්තාව නිවේදනය කරනු ලැබූ අතර මෙම වාර්තාව සඳහා 2017 ජනවාරි සිට නොවැම්බර් 24 දක්වා ගතවූ මාස 11 ක කාලය සලකා බලා ඇත.

ඊට අනුව රටවල් කීපයකට සාපේක්ෂව රුපියලේ අගය පහත වැටී ඇති ප්‍රතිශතය දක්වා තිබූ ආකාරය මෙසේය. ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 2.5 (2.5%) කින්ද, ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 7.3 (7.3%) න්ද කැනඩා ඩොලරයට සාපේක්ෂව සියයට 8 (8%) න්ද යුරෝවට සාපේක්ෂව සියයට 13.3 (13.3%) න්ද පහළ ගොස් ඇත.

# බත්තරමුල්ල - කොටුව සැහැල්ලු දුම්රිය සේවයක්

මහජනයා බහුලව ගැවසෙන රජයේ ප්‍රධාන කාර්යාල රැසක් බත්තරමුල්ල අවට ස්ථාපිත කිරීමත් සමගම ඒ අවට මෙන්ම බත්තරමුල්ල - කොටුව අතර ගමනාගමනයද අතිදුෂ්කර වී ඇත. කාර්යාල සහ පාසල් වේලාවල් තුළදී පමණක් නොව, දවස පුරාම පවතින අධික වාහන තදබදය නිසා මහ පාරටම කාලය කා දැමීමට ජනතාවට සිදුවී ඇත. අප විශේෂයෙන් සඳහන් කරන ඉහත කලාපයේ පමණක් නොව රටෙහි ප්‍රධාන මාර්ග සියල්ලෙහිම බරපතල ලෙස මෙම තත්ත්වය දක්නට ලැබේ. දිනෙන් දින වර්ධනය වන මෙම මාර්ග තදබදය සඳහා කඩිනම් පිළියම් යෙදීම වහාම කළ යුත්තක් බව ජනතාව වෙතින්ද හඬ නැගෙන අතර ඒ පිළිබඳව දිගින් දිගටම බලධාරීන් වෙත කරුණු දැක්වීමද සිදු වේ.

මෙම වාහන තදබදය වැළැක්වීම සඳහා මින් පෙර විවිධ යෝජනා ඉදිරිපත් වූ අතර බත්තරමුල්ල - කොටුව අතර හඳුන්වා දීමට සූදානම් වූ 'මොනෝ රේල්' සංකල්පය ඉන් එකකි. එහෙත් එම වැඩ පිළිවෙළ කතාබහට පමණක් සීමා වූ අතර ක්‍රියාත්මක නොවුණි. මේ වන විට මෙම තදබදය අවම කිරීම සඳහා අලුතින්ම ඉදිරිපත් වී ඇති යෝජනාව වනුයේ සැහැල්ලු දුම්රිය පද්ධතියක් ස්ථාපිත කිරීමයි. මෙම අලුත් යෝජනාව පිළිබඳව මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය මේ වන විට අවධානය යොමු කර ඇත.



ඒ අනුව බත්තරමුල්ල-මාලබේ සිට කොටුව දක්වා සැහැල්ලු දුම්රිය මාර්ගයක් ඉදිකිරීමේ කටයුතු කඩිනමින් ඇරඹීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිතියම් ගත කිරීම මේ වන විට සිදුකර අවසන් බව සඳහන් වේ. කොළඹ නගරය හා අවට අධික වාහන තදබදය සහිත මාර්ග පද්ධති කීපයක් සඳහා මේ ආකාරයේ සැහැල්ලු දුම්රිය සේවා පද්ධති 7 ක් ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇති අතර එම සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට සියලු කටයුතු යොදා අවසන් බව වාර්තා වේ.

මෙසේ සැහැල්ලු දුම්රිය මාර්ග ඉදිකිරීමට නියමිත මාර්ග මෙසේය.

මාලබේ, බත්තරමුල්ල, බොරැල්ල හරහා පිටකොටුව (කි.මීටර 15.3), මාලබේ සිට කඩුවෙල දක්වා (කි.මීටර 6), කොල්ලුපිටියේ සිට බම්බලපිටිය හරහා බොරැල්ල, යුනියන් පෙදෙස සිට මරදාන දක්වා (කි.මීටර 14.8), කොටුව - මරදාන සිට මට්ටක්කුලිය හරහා පෑලියගොඩ (කි.මීටර 11.5), දෙමටගොඩ, බොරැල්ල, කිරුළපන හැව්ලොක් ටවුන් හරහා බම්බලපිටිය (කි.මීටර 10), මාලබේ සිට කොට්ටාව දක්වා (කි.මීටර 9.6), පෑලියගොඩ සිට කඩවත දක්වා (කි.මීටර 13)

ආරම්භයේදී මෙම සැහැල්ලු දුම්රිය සේවාවට එන්ජින් හා මැදිරි සියල්ලම එකතුව 4 ක් ලෙසින් යෙදවීමට නියමිත අතර එක් මැදිරියක මගීන් 165 කට ගමන් කිරීමට හැකිවන අයුරින් නිමවනු ඇත. වායු සමනය කර පහසුකම් සහිතව ධාවනය කරන මෙම සැහැල්ලු දුම්රියේ ගමන් සඳහා එක් දින හෝ මාසික වාර ප්‍රවේශ පත්‍ර ගැනීම කළ හැකි වන අතර ජංගම දුරකථනයෙන්ද ප්‍රවේශ පත්‍ර ලබාගැනීමේ අවස්ථාව සැලසෙනු ඇත. දෙපසට ගමන් කළ හැකි මාර්ග දෙකක් සහිතව ඉදිවන මෙම සැහැල්ලු දුම්රිය පද්ධතිය විදුලිය බලයෙන් ක්‍රියා කරනු ලබන නිසා පරිසර හානියක් සිදු නොවී බලශක්ති සංරක්ෂණයක් සිදු වීමද මෙහි ඇති විශේෂත්වයකි.

බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ලංකාවේ දුම්රිය මාර්ග ඇති කිරීමෙන් පසු ක්‍රියාත්මක කෙරෙන ප්‍රධානතම දුම්රිය සේවාව මෙය වන අතර මූලිකව ඉදිකෙරෙන මාලබේ - කොටුව දුම්රිය මාර්ගය ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණයෙන්ම ජපන් ආයෝජන මත සිදුකිරීමට නියමිත වේ. ඒ සඳහා වැයවෙන මුදල ඩොලර් බිලියන 1.4 ක් බවත් සමස්ත මාර්ග පද්ධතිය වෙනුවෙන් ඩොලර් බිලියන 6 ක් වැය වෙන බවත් ගණන් බලා ඇත. මාලබේ - කොටුව මාර්ගයේ ඉදිකිරීම් කටයුතු ලබන වසරේ දෙසැම්බර්යේදී ඇරඹීමට නියමිත වේ.

2023 වසර වන විට මෙම සැහැල්ලු දුම්රිය සේවා පද්ධතිය ජනතාව වෙත ලබා දීමට රජය ඉලක්ක කොට ඇත.

# විභාගවලට Turn Key System

ශ්‍රී ලංකාවේ විභාග පැවැත්වීමේ ක්‍රමවේදය විධිමත් කිරීමත් විනිවිද භාවයට පත් කිරීමත් සඳහා පත් කොට ඇති විද්වත් කමිටුව විසින් විභාගවල විශ්වසනීයත්වය තහවුරු කිරීම සඳහා යෝජනා දෙකක් ඉදිරිපත් කර ඇත. බහුවරණ ප්‍රශ්න සඳහා අයිතම බැංකුවක්ද අනෙකුත් සියලුම ප්‍රශ්න සඳහා අයිතම සංචිතයක්ද පවත්වාගෙන යෑමත් විභාග ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සඳහා Turn Key System නමැති ක්‍රමය හඳුන්වා දීමත් එම යෝජනා දෙකයි.

ප්‍රශ්න අයිතම බැංකුවක් පවත්වාගෙන යාම තුළින් පහසුතා දර්ශකය, විභවතා දර්ශකය (Potential index) වැනි අයිතම පරාමිතීන් පූර්ව පරීක්ෂණයට භාජන කර ප්‍රශ්න බැංකුගත කිරීමත් මෙමගින් සෑම වර්ෂයකම එක සමාන දුෂ්කරතා මට්ටමකින් යුත් ප්‍රශ්න පත්‍රයක් සිසුන්ට ලබාදීමට හැකි වීමත් ප්‍රශ්න පත්‍ර සෑදීමේදී පුද්ගලයින් සහභාගි නොවන නිසා ප්‍රශ්න පත්‍රවල රහස්‍යභාවය ආරක්ෂා වීමත් සිදුවන බව පැවසේ. එසේම අයිතම සංචිතයක් තුළ විවිධ වර්ගයේ ප්‍රශ්න රාශියක් ඇතුළත් කර තිබීමෙන් ප්‍රශ්න පත්‍ර සකස් කිරීමට යන කාලය අවම කර ගැනීමට හැකියාව ලැබේ. මෙම අයිතම බැංකුවට සහ අයිතම සංචිතයට ගුරු භවතුන් ලවා සකස් කරන ප්‍රශ්න ඇතුළත් කිරීමට අදහස් කර ඇති නිසා විෂය නිර්දේශයට අනුකූල හා ශිෂ්‍යයන්ගේ මට්ටමට ගැළපෙන ප්‍රශ්න පමණක් ඇතුළත් කිරීමේ සම්භාවිතාව වැඩිවන බව මෙම විද්වත් කමිටුව පෙන්වා දේ.

එසේම ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සඳහා Turn Key System ක්‍රමය යොදා ගැනීමෙන් ප්‍රශ්න පත්‍රවල රහස්‍යභාවය ඉතාමත් හොඳින් සුරැකෙන බව විද්වත් කමිටුව පවසයි. එහිදී ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සහ ඇසුරුම් කිරීම එකම යන්ත්‍රයකින් සිදුකිරීමත්, මුද්‍රණයේදී සහ ඇසුරුම් කටයුතුවලදී පුද්ගලයන් සම්බන්ධ නොවීමත්, ඇසුරුම් කටයුතු සඳහා දැනට සිටින නිලධාරීන් යෙදවීමට අවශ්‍යතාවක් නොමැති නිසා ප්‍රශ්න පත්‍රවල ගුණාත්මක භාවය ආරක්ෂා කරගැනීමට එම නිලධාරීන්ගේ පූර්ණ කාලය යෙදවීමට හැකි වීමත් වැනි වාසි අත්කරගත හැකි බව ඔවුන් පෙන්වා දී ඇත.

මෙම යෝජනා මේ වන විට අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර ඇති අතර Turn Key System ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය එක් යන්ත්‍රයක් මිල දී ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියද හිමිව ඇතැයි වාර්තා වේ. ඒ අනුව මෙම යන්ත්‍රයේ සවිකිරීම් කටයුතු 2018 ජනවාරි මාසයේදී සිදුකිරීමට සැලසුම් කොට ඇත.

# රජයේ විශ්වවිද්‍යාල ප්‍රවේශය වැඩි කෙරේ

2020 වසර වන විට රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් කරගන්නා සිසුන් ප්‍රමාණය 50,000 දක්වා වැඩිකිරීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගනිමින් සිටී.

මේ වන විට සෑම වසරකම සියයට 10 ක ප්‍රතිශතයකින් විශ්වවිද්‍යාල ප්‍රවේශය වැඩි කිරීමට පටන් ගෙන ඇති අතර 2015 දී සිසුන් 25,000 ක් වූ ප්‍රමාණය 2015-2016 වසරවලදී 30,500 දක්වා වැඩිකිරීමට කටයුතු කර තිබුණි. එසේම විවෘත විශ්වවිද්‍යාල සඳහා ඇතුළත් කරගන්නා ශිෂ්‍ය සංඛ්‍යාවද වැඩි කිරීම කෙරෙහි රජයේ අවධානය යොමු වී ඇත. මේ අතර විශ්වවිද්‍යාලයකට ඇතුළත් වීමට නොහැකි වූ සිසුන් සඳහාද විශේෂ ණය ආධාර පහසුකම් සැපයීමට රජය අපේක්ෂා කරයි. එහිදී රජය විසින් අනුමත උසස් අධ්‍යාපන ආයතනයකට ඇතුළත් වී උපාධිය ලබාගැනීම සඳහා එක් සිසුවෙකුට රුපියල් ලක්ෂ 8 ක පොලී රහිත ණයක් ලබාදීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය පියවර ගනිමින් සිටී. උසස් අධ්‍යාපනය අපේක්ෂා කරන තරුණ පිරිස වෙත උපාධිය ලබා ගැනීමේ අවස්ථා වැඩිකිරීමේ අරමුණින් මෙම පොලී රහිත ණය ක්‍රමය හඳුන්වා දීමට කටයුතු යොදා ඇති අතර මේ යටතේ රජයේ අනුමත උසස් අධ්‍යාපන ආයතනයකින් උපාධිය ලබා ගැනීමට වසර 4 ක අධ්‍යාපන කාලයක් සඳහා ලංකා බැංකුව මගින් මෙම ණය මුදල ලබාදෙනු ඇත.

දසත Dasatha
2017 දෙසැම්බර් December 2017

Published by Dasatha Publications
Publisher - Gamini Abeysinghe
Consultant Editor - Sirisena Vithanage
Editor in Chief - Chamari Abeysinghe
Graphic Design & Layout - Sampath Ranaweera
Creative graphics - Jagath Hewapanna
Web Master - Dhanushka Bandara

114 Chatfield Dr. Woodbridge
L4H 0Z7. Ontario. Canada

Telephone : 416 822 2789
Fax : 289 553 5668
E-Mail : dasathainfo@gmail.com
www.dasatha.com

Canada We acknowledge the [financial] support of the Government of Canada.
«Nous reconnaissons l'appui [financier] du gouvernement du Canada'
www.canada.ca

# මවුබිමේ ඡන්ද කල් යාම හා නව පළාත් මන්ත්‍රී සංඛ්‍යාව

2015 පැවති ජනාධිපතිවරණයත් මහා මැතිවරණයත් පසු වී තුන්වන වසරටත් ළඟා වෙමින් පවතී. එවකට පැවති පළාත් පාලන ආයතන බොහොමයක කාලය නිම වීද එතරම්ම කාලයක් ගත වී ඇත. මේ කාලය අතරතුර කාලයේදීද නිම වූ පළාත් පාලන ආයතනද රැසක්ම ඇත. මෙයට පෙර කිසි දිනෙක ශ්‍රී ලංකාවේ නොවූ මෙතරම් දීර්ඝ කාලයක් තුළ මැතිවරණ පවත්වා නොතිබීම කිසිසේත්ම ප්‍රජාතන්ත්‍රවාදී රටකට ගැළපෙන්නක් නම් නොවේ. මෙහි ආදීනව ඉතා බරපතලය. මහජන නියෝජිතයන්ගෙන් තොර මේ ආයතන දැනට පාලනය වනුයේ නිලධාරීන් මගිනි. විපක්ෂයක් සහිත පළාත් පාලන ආයතනයක සිදුවිය යුතු විවේචනය හා අධීක්ෂණයෙන් තොරව පාලනය වූ ගත වූ කාලය තුළ මෙම ආයතනයන්හි සිදුවූ දූෂණ, අක්‍රමිකතා හා අතපසුවීම් කොතෙකුත් ගැන පසුගිය කාලය තුළ වාර්තා විය. මේවා පිළිබඳ වගකීම භාරගන්නෝ කවුරුද? මේ සියල්ල විඳ දරාගත යුතු වන්නේ ජනතාවයි.

රජය මෙම මැතිවරණ කල් යාම පිළිබඳව නිදහසට ඉදිරිපත් කරන කරුණ නම් නව පළාත් පාලන පනතක් ගෙන ඒමත් ඡන්ද කොට්ඨාස සීමා නිර්ණය කටයුතුත් නිසා මෙසේ ඡන්ද කල් දැමීමට සිදුවූ බවයි.

1978 ජේ. ආර්. ජයවර්ධන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පිහිටවනු ලැබූ සමානුපාතික ඡන්ද ක්‍රමයත්, මනාප ඡන්ද ක්‍රමයත් රටට හෙණයක් වූ බව කවුරුත් පිළිග න්නා කරුණක් හෙයින් පළාත් පාලන පනතෙහි වෙනස්කම් කිරීමට අවශ්‍ය වී තිබුණ බව සත්‍යයකි. එහෙත් ආණ්ඩුවක සමස්ත කාල සීමාවෙන් අඩකටත් වඩා ඒ සඳහා ගත වී යැයි කීම කෙසේ නම් පිළිගත හැක්කක්ද? ඕනෑම රජයක් බලයට පත්වන්නේ තමන් ඉදිරිපත් කරන්නට යන වෙනස්කම් පිළිබඳව සැලසුම් අතැතිවය යන්න පිළිගන්නේ නම් රටක ප්‍රජාතන්ත්‍රවාදයට බලපාන මෙතරම් බැරෑරුම් කරුණක් පිළිබඳව අදහසක් බලයට පත් වෙද්දී තමන් සතුව නොතිබුණේද යන්නද සිතා බැලිය යුතුය.

කෙසේ හෝ මෙතෙක් කල් යෑම කෙරේ බලපෑ වස්දොස් සියල්ල නිම වී ජනවාරි මාසයේදී ඡන්ද පැවැත්වීමට සියල්ල සූදානම් වී තිබිණ. එහෙත් අධිකරණයට ඉදිරිපත් වූ පෙත්සමක් නිසා එය යළිත් කල් යාවිද යන සැකය පැන නැගෙමින් පවතී. මෙතරම් කාලයක් ගතවීත් අධිකරණයට යාමට නොහැකි වන සේ ගැසට් පත්‍රය සකස් කිරීමට නොහැකි වීම ගැනද රජය සිතා බැලිය යුතුය. අකාරයක්ෂමතාව එයට බලපා ඇත්නම් ඒ පිළිබඳව ගත යුතු ඉදිරි පියවර ගැනද රජයේ අවධානය යොමුවිය යුතුය.

ඉදිරි පළාත් මැතිවරණයේදී මෙතෙක් පැවති ප්‍රමාණයට වඩා රට පුරා පළාත් සභිකයන් 3,800 ක් වැඩි වීමද බරපතල ගැටලු මතුකරවන්නකි. සිටින පළාත් සභිකයින්ගෙන් ඉටුවන මෙහෙවරද ඉතා අල්පව තිබියදී තවත් මේ සා විශාල පිරිසක් ඊට එක් කිරීමෙන් බලාපොරොත්තු වන මෙහෙවර කුමක්ද යන කුකුස මහජන සිත්හි පැන නගිමින් පවතී. සිදුවන එකම මෙහෙවර නම්, රටට ඉසිලිය නොහැකි තරම් වැය බරක් අයවැය ලේඛනයට එක්වීම පමණකි. දැනට පවත්නා සභා ශාලා මේ සා විශාල පිරිසක් රැස්වීමට හැකිවන සේ විශාල කිරීමට හා උපකරණ සැපයීමට යන වියදම, කාර්ය මණ්ඩල ප්‍රමාණවත් නොවන හෙයින් කාර්ය මණ්ඩල වැඩිකිරීමට යන වියදම, සභික දීමනා අධික වීම නිසා වන වියදම ආදි තව තවත් වියදම් රාශියක් අලුතින් එකතුවීම තුළින් ජනතාවගේ බදු බර පැත්තට දැරිය නොහැකි බරක් එක් වීම එහි ලා අත්වන එකම මෙහෙවර නොවන්නේද?

මේ සභික ධූර සංඛ්‍යාව වැඩිවීම පිළිබඳව අගමැතිවරයා දුන් පිළිතුරක් මෙසේය. "එජාපයයි ජවිපෙයි සභික ගණන අඩු කිරීමට යෝජනා කළා. ඒකට ගියා නම් ඡන්ද තියන්න තව මාස හත අටක් කල් ගත වේවි. ඡන්ද ඉල්ලලා රට වටේ හා පන්සල් කෝවිල් ගාණෙ ගිය අය සභිකයන් 3,800 වැඩිවීමේ වගකීම භාරගන්න ඕනෑ" (2017. නොවැ. 19 - ඉරිදා ලංකාදීප)

අවුරුදු තුනකුත් ගත වී අගමැතිවරයා දෙන මේ පිළිතුරෙන් කියවෙන්නේ කුමක්ද? ජනතාව පිට බර පැටවෙන, අනවශ්‍ය යැයි ඔහුද සිතන සභිකයන් සංඛ්‍යාව වැඩිකිරීමේ මෙබඳු තීරණයකට එළඹ ඇත්තේ රටට අහිතකර වැරදි උද්ඝෝෂණයක් පදනම් කොටගෙන මිස ජනතාවගේ පැත්තෙන් වන අවාසි සහගත තත්ත්වයන් සැලකිල්ලට ගෙන නොවේය යන්න නොවේද? රජයක වගකීම වන්නේ එයද? උද්ඝෝෂණ මතම තීරණ ගැනීමට නම් රජයක් කුමකටද? අගමැතිවරයාද සිතන පරිදි මේ වැරදි තීරණය මෙතැන් සිට යළි සංශෝධනයක් කරන තුරු පැවැත්වෙන සියලු පළාත් පාලන මැතිවරණවලදී එක සේ බලපැවැත්වෙන බව සිතන්නට නොහැකි වූයේ ඇයි?

මවුබිමේ ජනයා වඩ වඩාත් පීඩාවට පත් කෙරෙන මෙබඳු අත්තනෝමතික වැරදි තීරණ ගැනීම 2015 මුලදීම කළ පරාජය වූ අපේක්ෂකයන්ට මන්ත්‍රී ධූර හා ඇමති ධූර පිරිනැමීම තරම්ම ප්‍රජාතන්ත්‍ර විරෝධී වූ බොළඳ ක්‍රියාවක් බව දැන්වත් වටහා ගත යුතුව ඇත.

# හත්පළේ ගා ගත් ශ්‍රී ලංකාවේ බැඳුම්කරය

■ දූරදර්ශි විසිනි

වසර 20 ක 25 ක කාලය මුළුල්ලේ ශ්‍රී ලංකාවේ බලයේ සිටි දේශපාලනඥයන් මුල්ව සිදුකෙරුණු විවිධ දූෂණ හා වංචා පිළිබඳව එක දිගටම අසන්නට ලැබුණු හෙයින් ශ්‍රී ලාංකිකයිනට ඒවා එතරම් දේවල් නොවන තැනට පැමිණ ඇත. එහෙත් ගත වූ වසර 3 ක කාලය මුළුල්ලේ එක දිගටම රට කැළඹූ බැඳුම්කර වංචාව තරම් බරපතල දූෂිත වංචාවක් ගැන නම් මෙතෙක් අසන්නට නොලැබුණි. දැනට අනාවරණය වෙමින් පවතින කරුණු අනුව මෙය මහ දාවල් දෙනෝදාහකගේ ඇස් වසා කළ මහා මංකොල්ලයක ස්වභාවය ගන්නා බව කිව යුතුය.

බැඳුම්කර වංචාව ගැන අප කවුරුත් අසා ඇතත් එහි යථා ස්වභාවය පිළිබඳව අප සතුව ඇති දැනුම අල්ප හෙයින් ඒ පිළිබඳව කෙටි හැඳින්වීමක් කිරීම උචිත යැයි සිතමි.

ඒ වන විට ශ්‍රී ලංකාවේ පැවති රජය කෙරෙහි ජනතාව තුළ වූ කලකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2015 ජනවාරි 08 වෙනි දින පැවති ජනාධිපතිවරණයෙන් මෛත්‍රීපාල සිරිසේන මහතා ජයග්‍රහණය කළේය. ඔහුගේ ජයග්‍රහණයට සහාය දුන් ප්‍රධාන පක්ෂය වූ එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා ඊට පසුදිනම එනම් 2015 ජනවාරි 09 වන දින අග්‍රාමාත්‍ය ධූරයෙහි දිවුරුම් දුන්නේය. 2015 ජනවාරි 12 වෙනි දින ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හා එක්සත් ජාතික පක්ෂයේ අමාත්‍යවරුන් 27 දෙනෙකුගෙන් යුත් අමාත්‍ය මණ්ඩලයද දිවුරුම් දුන්හ. මේ සමගම අමාත්‍යවරුන් සතු වූ විෂය පථය තීරණය කිරීමේදී ශ්‍රී ලංකා ආර්ථිකයේ හදවත බඳු වූ මෙතෙක් දිගටම මුදල් ඇමති යටතේ පැවති මහා භාණ්ඩාගාරය ප්‍රතිපත්ති සැලසුම් හා ආර්ථික සංවර්ධන නමින් යුත් නව විෂය ඒකකයක් යටතේ අගමැතිවරයා විසින් පවරා ගන්නා ලදී. 2015 ජනවාරි 23 වෙනිදා එතෙක් හිස්ව තිබූ මහා භාණ්ඩාගාරයේ අධිපති ධූරයට අර්ජුන මහේන්ද්‍රන් මහතා ජනාධිපතිවරයා විසින් පත් කරන ලද්දේ විෂය භාර අගමැති රනිල් වික්‍රමසිංහ මහතාගේ යෝජනාව පරිදිය. බැඳුම්කර සිද්ධියට මුල පිරෙන්නේ මේ පත්වීමත් සමගය.

මේ අර්ජුන මහේන්ද්‍රන් කෙබඳු අයෙක්ද යන්නද දැන ගැනීම වටී. ඔහු 1983 සිට වසර 10 ක් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරියෙකු වශයෙන් සේවය කොට රාජ්‍ය ශිෂ්‍යත්වයක් ලැබ ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයට ඇතුළත්ව එහිදී උසස් අධ්‍යාපනය ලැබුවෙකි. 2001 දී යළි ශ්‍රී ලංකාවට පැමිණ රාජපක්ෂ රජය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් සේවය කොට තිබේ. 2004 දී සිංග ප්පූරුවේ ස්විස් බැංකුවක නිලධාරියෙකු වශයෙන්ද ඉන් අනතුරුව හොංකොං හි බැංකු නිලධාරියෙකු වශයෙන්ද 2013 දක්වා සේවය කොට තිබේ. 2015 දී ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති ධූරයට පත්වන විට ඩුබායිහි බැංකු නිලධාරියෙකු ලෙස සේවය කරමින් සිට ඇත.

මෙම තනතුරට පත්වන අවස්ථාව වන විට මොහු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකුව නොසිටි හෙයින් ඔහුගේ පත්වීම පිළිබඳව පාර්ලිමේන්තුව තුළත් ඉන් පිටතත් විරෝධතා මතු වුවද අග්‍රාමාත්‍යවරයාගේ පූර්ණ අනුග්‍රහය ලබා සිටි ඔහුට ඉන් කිසිදු බාධාවක් පැන නොනැගුණි. 'ආරස්සාවට තැබූ දේ ඇළියාවට ගියා වැනිය' සහ 'වක්කඩේ හකුරු හැංගුවා' වැනිය යන්න සිහියට නගමින් බැඳුම්කර වංචාවේ ප්‍රධාන චූදිතයා බවට පත්වූයේ අගමැතිවරයාගේ විශ්වාසය දිනාගත් මේ බැංකු අධිපතිවරයාය.

ජනවාරි මාසයේ පත් වූ මොහු පෙබරවාරි මාසයේ සිටම එතෙක් පැවති මහා භාණ්ඩාගාර නියමයන් හා සම්ප්‍රදායයන් කඩා බිඳ දමමින් රජයටත් ජනතාවටත් පාඩු ගෙන දෙන පරිද්දෙන් කටයුතු කරන්නට වූ බවත් ඔහුගේ බෑණනුවන්ගේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් නම් සමාග මට (මොහුද මෙම සමාගමේ අධ්‍යක්ෂකවරයෙකු ලෙස සිට ඇත) විශාල වශයෙන් වාසි සැලසෙන පරිද්දෙන් මහා භාණ්ඩාගාරය හැසිරවීමට කටයුතු කර ඇති බවත් මොහුට නැගෙන චෝදනාවය.

මේ පිළිබඳව වූ මූලික එළිදරව් වීම් සමගින් මහ බැංකු ගණුදෙනුකරුවන් තුළත් රට තුළත් පාර්ලිමේන්තුව තුළත් බලවත් විරෝධතා පළ වූ අතර එම තනතුරෙන් ඔහු ඉවත් කරන ලෙස මන්ත්‍රීවරුන් පිරිසක් විසින් සාමූහික යෝජනාවක්ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. එහෙත් ඉනිදු කිසිදු පළක් නොවීය. සැබවින්ම මේ අවස්ථාවේදී ඔහු තනතුරෙන් ඉවත් කළේ නම් ඔහු පිළිබඳව වඩාත් නිදහස් පරීක්ෂණයකට ඉඩකඩ සැලසෙන්නට තිබූ අතරම මේ සිද්ධිය මෙතරම් හත්පළේ ගා ගැනීමකට තුඩු නොදීමටද ඉඩ තිබිණි. එහෙත් එවැන්නක් සිදුනොවීය.

කෙසේ වෙතත් පාර්ලිමේන්තුවේ කෝප් කමිටු දෙකකටම විමර්ෂණය සඳහා මෙම සිදුවීම යොමු කරන්නට කරුණු සැලසුණේය. ඉන් පළමු කමිටුවේ සභාපතිත්වය දැරුවේ කොමියුනිස්ට් පක්ෂ නායක ඩිව් ගුණසේකර මන්ත්‍රීවරයාය. එම කමිටුව විමර්ෂණය අවසන් කළද ඊට සහභාගීව සිටි ඇතැම් එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරුන්ගේ එකඟතාව ලබාගත නොහැකි වූයෙන් 2015.06.26 වෙනි දින පාර්ලිමේන්තුව විසුරුවා හරින තුරුත් එය පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට සභාපතිවරයාට නොහැකි විය. ආණ්ඩුවක් විසිරවීමේදී එතෙක් පත් කළ කමිටුවල වාර්තා ඉදිරිපත්ව නොතිබුණ හොත් ඒවා අහෝසි වීම සම්ප්‍රදාය බැවින් එම වාර්තාවෙන් කිසිදු පළක් නොගෙනම අහෝසි වන තැනට කටයුතු යෙදිණි. එහෙත් වාර්තාවෙහි වූ ඇතැම් කරුණු ඩිව් ගුණසේකර මහතා හෙළිදරව් කළ අතර 2015 ජූලි 07 වෙනි දින පැවති සාකච්ඡාවකදී ඔහුගේ එම වාර්තාවේ කරුණු නීති විරෝධී ඒවා බවද අගමැතිවරයා ප්‍රකාශ කර සිටියේය.

තවදුරටත් බැඳුම්කර සිද්ධියෙහි උණුසුම යටපත් නොවී බුර බුරා නැගෙන්නට වූයෙන් නව රජය පැමිණි පසු යළි කෝප් කමිටුවට මේ සිද්ධිය විමර්ෂණය කිරීමට සිදුවිය. දෙවැනි කෝප් කමිටුව පත්වූයේ ජනතා විමුක්ති පෙරමුණේ සුනිල් හඳුන්නෙත්ති මහතාගේ ප්‍රධානත්වයෙනි. එම විමර්ෂණයෙහිදී 2015, 2016 දෙවර්ෂය තුළ බැඳුම්කර සම්බන්ධ වාර්තාවක් විගණකාධිපතිවරයා විසින් කමිටුවට ඉදිරිපත් කිරීමද එමගින් බොහෝ වැදගත් කරුණු අනාවරණය වීමද විශේෂත්වයකි. මෙම කමිටුවේදීද එක්සත් ජාතික පාක්ෂික මන්ත්‍රීවරුන් විසින් විවිධ බාධා පැමිණවූ බව මාධ්‍යවල පළවූ අතර කෙසේ වෙතත් එහි වාර්තාව 2015 ඔක්තෝබර් 28 වෙනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සුනිල් හඳුන්නෙත්ති සභාපතිවරයා සමත් විය.

20 වන පිටුව බලන්න



# ඔබ හිතන හැටි තේරුම් ගන්න

■ කේ. කේ. පී. ජයවීර

අපි සිතන්නේ අපට සිතීමේ නිදහස ඇතැයි කියාය. නිදහස තිබෙන බව සැබෑ නමුත් අපි සිතන්නේ අනුන් අපේ සිත්වලට කවන අදහස්ය. අපි එක්තරා රාමුවක් තුළ ලැග ගෙන එහි තුළ කරකැවෙමින් තිබෙන සිතුවිලි සැබෑ බවට හෝ බොරු බවට විශ්වාස කරමු. යම්කිසි ලාභ ප්‍රයෝජනයක් ලැබේ නම් ඇතැම් බමුණු මත වුවත් බොරු බව දැන දැන සැබෑ යයි කීමට අපි පෙළඹෙමු. අවාසි නිසා කීර්තියට හානි සිදුවන බැවින් සමාජ තත්ත්වය පහත වැටේ යැයි ඇති බිය නිසා අපි කවුරුත් සත්‍ය පවසන්නේ අඩකිනි. ඉතිරි කොටස් ගිලගෙන සිටිමු.

සමාජ තහංචි, නීති, සංස්කෘතිය ආදි වැටකඩොලුවලින් අපේ සිතීමේ නිදහස සීමා වේ. උදාහරණයක් වශයෙන් ආගමික දර්ශන හෝ වාද වැනි කරුණක් දැඩි ලෙස (දෘෂ්ටිය හැටියට) කෙනෙකු සිතින් අල්ලාගෙන සිටින්නේ වෙනත් කෙනෙකුගෙන් ලැබුණු සිතුවිලි අදහස් තමාද පිළිගන්නා බැවිනි. එවැනි දෙයකට විරුද්ධව සිතන්නට එසේ අල්ලාගෙන සිටින අයට බැරිය. එසේ නැත්නම් තමා මානසික වශයෙන් ලබන හිස් බව ගැන ඇති බිය නිසා තදින් දරාගෙන සිටින දෘෂ්ටියට එරෙහිව සිතන්නේ නැත. බොහෝ දෙනා අනුන්ට බණ කියන්නේ තමාට අවබෝධයක් නැතිවමය. තමාට අවබෝධයක් නැති විෂයයන් ගැන වෙනත් නොදන්නා කෙනෙකුට පැහැදිලි කර දීම නොහැකිය. ධර්මාවබෝධය යනු මාර්ග ඵලයක් ලැබීමකි. මාර්ග ඵල ලබා නැති සෙසු අය දෙසන්නේ අනුමානයෙන් තමා නිවැරදි යැයි සිතන ධර්මයන්ය.

අපි හරි යැයි සැබෑ යැයි කියා යමක් විශ්වාස කළ පලියට එය සැබෑවක් නොවේ. මහපොළොව පැතලි යැයි මුළු ලොවම විශ්වාස කළ අවධියක්ද තිබිණිඩ එහෙත් එයින් පොළොවේ හැඩය වෙනස් වූයේ නැත. හඳ ගැන හා හඳේ හාවෙකුගේ රූපය ගැන වුවද මෙසේය. දිව්‍ය ලෝකයක් හෝ නරකාදියක් ඇතැයි අප සිතා සිටියාට වැඩක් නැත. එයින් අපේ සිතීමේ නිදහස සීමා වනවා මිස වෙනත් වැඩක් සිදු නොවේ. හැබැයි එහෙම තැන් නැතැයි සිතා සිත පෙළෙන ක්‍රියා කළහොත් විපාක ලැබීම වහාම බලාපොරොත්තු විය හැකිය. එසේ වන්නේ යම් විඳීමක් දැනෙනුයේ සිතන බැවිනි.

අපි කියවා ඇති අසා ඇති දැක ඇති දේවල් ගැන අපට සිතන්නට පුළුවන. එහෙත් එම සිතුවිලි අප ජීවත්වන සමාජය නමැති රාමුව ඇතුළේ ඇති තහංචි නිසා සීමාව ඉක්මවා නොයයි. එක සමාජයක කැත පුරුද්දක් තවත් සමාජයක ඉතා උසස් චාරිත්‍ර ධර්මයකි. කෙසේ වුවත් ප්‍රසිද්ධියේ තමා සිතන දෙය හෙළි නොකර ඕනෑ තරම් සිතන්නට ඔබට පුළුවන. ඒ සඳහා ඔබ නිදහස් චින්තකයකු විය යුතුය.

ඔබේ කරුණාව දන්නා හඳුනන අයට හා ඔබ අයත් ආගමික කොටසට පමණක් නොවේ. එහෙත් ඔබ අදහන ආගමට විරුද්ධ කෙනෙකු වචනයක් ප්‍රකාශ කළොත්? යම් ගොඩනැගිල්ලක් ඉදි කළොත්? යම් ප්‍රචාරයක් ගෙන ගියොත්? සිතීමේ නිදහස අනුන්ට පැවරූ කෙනෙකු බව ඔබම ඔප්පු කරන්නේය. සිතීමේ නිදහස මොනම දර්ශනයකටවත් ඇදහිල්ලකටවත් සීමා වී නැති බව තේරුම් ගන්න.

අපි හිතන්නේ අපට ඕනෑ දේවල් නම් කවුරු මොනවා කීවත් කළත් මළගමකදී අඬන්නේ නැතිව සිටිය හැකිය. හැමෝම කරන බොරු වැඩ අත්හැර දැමීමට පුළුවන. මිනිස්සුන්ට වෛර කරමින් මිනිසුන් සමග අමනාපකම් ඇති කර ගනිමින් මිනිසුන්ගේ නුගුණ පවසමින් හරක් මස් නොකා හරකුන්ට පමණක් මෛත්‍රිය කරන්නේ කාට ඕනෑවටද? මස් මරණ හා විකුණන අයට වෛර කරමින් සතෙකුට තිරිසනෙකුට මෛත්‍රිය කිරීම කුමන මෛත්‍රියක්ද? මෙවැනි අවස්ථාවලදී අපි සිතන්නේ අප අවට සිටින අයගේ ඕනෑ එපාකම්වලට අනුකූලව බව පැහැදිලි නොවන්නේද?

කෙනෙකුගේ හොඳ කීම කළ යුත්තේ ඔහුගේ මුහුණටමයි. එහෙත් අපි සිතන්නේ අපට සමාජය පුරුදු කර ඇති ක්‍රමය වන්නේ වෙනකකි. ඒ නිසා අපි කෙනෙකුගේ හොඳ කියන්නේ ඔහු නැති තැන හෝ ඔහු මළාට පසුවයි. අපි අපට ඕනෑ දේවල් සිතන්නට පුරුදු වෙමු. එසේ සිතමින් සමාජයට ඕනෑකරන විධියට ජීවත් වෙමු. අනුන් හරි යැයි කියන හැමදෙයක්ම අනුමත කරන්නට ඕනෑද? අනුන් අපට සිතන්නට පුරුදු කර ඇති වැරදි සිතුවිලි කොපමණද කියා තනිවම කල්පනා කර බලන්න. එවිට එය සිතට ව්‍යායාමක් වී සිතීමේ ශක්තිය සියලුම රාමුවලින් පිටතට විහිදී යනු ඇත. එසේ ඈතට විහිදෙන සිත විමුක්තිය නැත්නම් සහනය ලබයි. සිතේ සහනය ඇති වන්නේ සිත බැඳ තබා ගෙන සිටින වැරදි සිතුවිලි නමැති බැම් කඩා බිඳ දැමීමෙනි.



# ගුරාගේ කොළම

...ලියාගෙන යන මට

ගුරාගෙ කොළම ලියන්න පටන්ගෙන අවුරුදු හතරක් ගෙවිලා. වසර හතරක් තරමක් දිගු කාලයක්. කලින්ම කියන්න ඕන දේ තමයි මම වෘත්තීය ලේඛකයෙකු හෝ ලේඛන කලාව ක්‍රමවත්ව ආයතනයකින් ඉගෙන ගත් කෙනෙකුත් නොවෙයි. ඒත් යම් ලිවීමේ හැකියාවක් පාසල් යන කාලයේ ඉඳන් තිබුණා. පත්තරේකට මම දකින අහන දේ ගැන ලියන්න හිතට ආසාවක් ඒ දිනවල තිබුණට එතරම් උනන්දුවක් නැතිව ඉන්න කොට ඒක යථාර්ථයක් කරන්න දිරි ගන්වපු බුද්ධිට වගේම මම ලියන දේවල් දසත පත්තරේ පළකරන්න කටයුතු කළ චමරිටත් ගොඩක් පින්.

කොළමට ලිව්ව දේවල් අලුත් හෝ මිනිසුන් නොදැන හිටිය දේවල් නොවෙයි කියල සමහර වෙලාවට හිතෙනවා. ඒත් අපේ ගතියක් තියෙනවානේ ඇහුවත් දැක්කත් අපි එහෙම දෙයක් දැක්කද ඇහුවද කියල අපට සමහර වෙලාවට තේරුමක් නෑ. කවුරු හරි කියල මතක් කළාම තමයි හිතෙන්නෙ 'ඇත්තනේ ඒක එහෙමනේ.... දැන්නෙ තේරුණේ....' කියල. ඒ වගේම තමයි සමහරුන්ට ඇඟිල්ලෙන් ඇනල කියනකන් තේරෙන්නෙ නෑ. සමහරු ටියුබ්ලයිට් වගේ. ටික වෙලාවක් ගිහිල්ලයි වැඩේ තේරුම්ගන්නෙ.

කොළම ලියන්න පටන්ගත්ත මුල කාලේ 'ලියන්නෙ කවුද' කියල වැඩිදෙනෙක් දැනගෙන හිටියෙ නෑ. ඒත් බුද්ධි ඇන්ද මගේ පින්තූරෙයි යහළුවන්ගෙ ආරංචියි නිසා ලියන්නෙ මම කියල ටික කලක් ගතවෙද්දි හුඟදෙනෙක් දැනගත්ත. මගදි හමුවුණාම කොළම ගැන ඔවුන් තමන්ගෙ අදහස් උදහස් ප්‍රකාශ කළා. හොඳ ප්‍රතිචාර තමයි බොහෝවිට ලැබුණේ. සමහරු ඊ-මේල් මගිනුත් අදහස් දක්වල තිබුණා. හිතට සතුටුයි. ලියන දෙයක් කවුරුහරි අගේ කරනවනම් ලැබෙන ආත්මතෘප්තිය මුදලින් මිල කරන්න බෑ. පත්තරේ ගත්තම මුලින්ම කියවන්නෙ කොළම කියලත් සමහරු කිව්වා.

කොළම කියන්නෙ ඉංග්‍රීසියෙන් කොලම්න් (Column) කියන වචනයට යොදාගත්ත සිංහල වචනයක්. ඒකට 'තීරුව' හෝ 'තීරු ලිපිය' කියලත් කියනවා. ඒත් සමහරු ඒක කියව්වේ 'කෝළම' කියල. සමහරවිට ලියන ඒව කෝළම් වගේ තේරෙන්න ඇති. මම ලිව්වේ සමාජයේදි එදිනෙදා අපට මුණගැහෙන විවිධ වූ පුද්ගලයන්ගෙ හැසිරීම් පිළිබඳව. ගැහැනු-පිරිමි බේදයක් නැතිව අප කරන කියන දේවල් තමයි මම පෙන්නුවෙ. හැබැයි මම ලියුවෙ මට හිතෙන විදිහට මිනිසුන් රඟන දෙබිඩි චරිත. හොඳ මෙන්ම සමාජයට අහිතකර වැඩ දැනුවත්ව හෝ නොදැනුවත්වම කරන කියන දේ. ඒවත් නිකන්ම ලියන්නේ නැතිව වෙනත් කතා එකතු කරල උදාහරණ සහිතව තේරෙන විදියට ලියන්න තමයි උත්සාහ කළේ. ඒක සාර්ථක වුණා කියල හිතෙනව. ඒ ඒ පුද්ගලයන් සමග කටයුතු කිරීමේදි තම දූ දරුවන් සමග වැඩකිරීමේදි තරහ නොවී කටයුතු කරන්නේ කොහොමද කියල මට හිතෙන හැටියට කියන්න උත්සාහ කළා. සමහරු ලියන දේවල්වලට කැමතිවෙන්න ඇති. සමහරු අකමැති වෙන්නත් ඇති. පුද්ගලිකව කාටවත් රිදවන්න අපහාස කරන්න හෝ කිසිම අදහසක් නෑ. මිනිසුන්ගෙ වැරදි අඩුපාඩු විතරද ලියන්නෙ කියලත් සමහරු මගෙන් ඇහුවා. මම වැඩි වශයෙන් ලියුවෙ මිනිසුන්ගෙ හැසිරීම් ගැන. සමහරු තොප්පිය දාගන්න ඇති. තවත් අය 'ඔය කියන්නෙ අහවලා ගැන' කියල අනුන්ට තොප්පිය දාන්නත් ඇති.

මිනිසුන්ගෙ හැසිරීම් ගැන මෙතරම් තීරු ලිපි ගණනක් ලියන්න පුළුවන් වුණාද කියලත් සමහර වෙලාවට පුදුමත් හිතෙනවා. තවත් මොනවද ලියන්න ඉතුරුවෙලා තියෙන්නෙ. 'වෙනස් වන ලෝකයේ වෙනස් නොවන එකම දෙය වෙනස් වීම' කියල තියෙනවනේ. තාක්ෂණය මතම යැපෙන සමාජය පුළුල් වෙනකොට මිනිස් හැසිරීමත් වෙනස් වෙනවා. ලියන්න කරුණු අලුතෙන් එකතුවෙන්න ඉඩ තියෙනවා. ඒත් දැනට කොළම ලියුවා ඇති කියල හිතුණා. 'වැඩිය කනකොට අතිරසත් තිත්තයි' කියල කතාවක් තියෙනවනේ. ආයෙත් වතාවක් කාලෙකට පස්සෙ මට හිතෙන දේ ලියනව කියල හිතාගෙන මේ අවසාන කොළම කියල නවතිනවා.

මෙතෙක් මගේ කොළම කියවූ මෙය අගය කළ හොඳ නොහොඳ පෙන්වූ සැමට පින්. තෙරුවන් සරණයි !

මේ වගට
**ගුරා**

පාඨක ප්‍රතිචාර එවීමට : gura.kolama@gmail.com

# XVI වෙනි ෆ්‍රැන්සිස් පාප් වහන්සේ

වර්තමාන ශුද්ධ වූ සභාවේ නායකයානන් වශයෙන්ද රෝමයේ අගරදගුරුතුමානන් වශයෙන්ද ලොව කුඩාම ස්වාධීන රාජ්‍යය ලෙස සැලකෙන වතිකානු රාජ්‍යයේ නායකයා වශයෙන්ද කටයුතු කරන 16 වෙනි ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේ මාධ්‍ය තුළ නිතරම කතාබහට ලක්වන ආගමික නායකයෙකි. ලබන වසරේ සිට වතිකානු රාජ්‍යය සඳහා එතුමා විසින් ක්‍රියාත්මක කිරීමට සැරසෙන ආන්දෝලනාත්මක තහනමක් ගැනත් එතුමා වෙත ලැබුණු සුපිරි මෝටර් රථයක් වෙන්දේසි කිරීමට සැරසෙන පුවතක් ගැනත් පසුගිය දිනවල විදෙස් මාධ්‍ය වාර්තා කොට තිබුණි.

## දුම්වැටි තහනම

රටක ප්‍රජාව සෞඛ්‍ය සම්පන්න නම් එම රට සශ්‍රීකත්වය කරා ගෙන යෑම අසීරු නොවන බව කාටත් පැහැදිලි කරුණකි. එසේම රටෙහි ප්‍රජාවගේ සෞඛ්‍ය සම්පන්න බව සුරැකීම රටේ පාලකයන්ගේද ප්‍රමුඛ වගකීමකි. මේ වගකීම අකුරටම පිළිපදිමින් රටේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂා කර ගැනීම සඳහා වතිකානුවේ නායක ෆ්‍රැන්සිස් පාප් වහන්සේ අභීත පියවරක් තැබීමට කටයුතු කර ඇත. ඊට අනුව 2018 වසර ආරම්භයේ සිට වතිකානුව තුළ සියලුම වර්ගයේ දුම්වැටි විකිණීම තහනම් කිරීමට නීති පැනවෙනු ඇත. මෙම තීරණය පිළිබඳ සඳහන් වීමත් සමග වතිකානුවේ වෙළඳසල්වල තිබූ දුම්වැටි තොග සීඝ්‍රයෙන් අලෙවි වීමට පටන් ගැනුණු අතර එසේ නිම වන තොග වෙනුවට වෙළඳසල් හිමියන් විසින් අලුත් තොග ලබාගැනීමක් කරන අයුරු දක්නට නොලැබුණි.

පාප් වහන්සේ විසින් ගත් මෙම තීරණයත් සමග වතිකානුවට වසරකදී යුරෝ මිලියන 10 ක් පමණ අහිමි වී යනු ඇත. ලොව සුප්‍රකට සමාගම් රැසකට අයත් සුවඳ විලවුන්, ඖෂධ, මත්පැන්, ඉන්ධන ආදි භාණ්ඩ රැසක් වතිකානුව තුළ අලෙවි වන්නේ තීරුබදු රහිතවය. දුම්වැටිද එසේ තීරුබදු රහිත භාණ්ඩ ගොන්නට අයත් වූවකි. වතිකානුවේ ආසන්නතම රට වන ඉතාලියේ වෙළඳසලක ඇති දුම්වැටි බණ්ඩලයක මිල මෙන් සියයට විස්සක් පමණ අඩුවෙන් වතිකානුව තුළ එය මිල දී ගත හැක.

එහෙත් මෙම තීරුබදු රහිත මිලට විකිණෙන භාණ්ඩ මිල දී ගත හැක්කේ නියම වතිකානු පුරවැසියන්ට හා එම රාජ්‍ය තුළ සේවය කිරීම සඳහා අවසර ලත් වැසියන්ට පමණක් වීමද විශේෂත්වයකි.

පාප් වහන්සේ විසින් දුම්වැටි තහනම් කරමින් ගැනීමට සූදානම් වන මෙම තීරණය අනුමත කරන පිරිසක් මෙන්ම ඊට විරෝධය පාන පිරිසක්ද සිටී. ඔවුන් පවසන්නේ වතිකානු රාජ්‍ය තුළ සිදුවන මෙම අසීමිත සීමා කිරීම් දැන්වත් නවතා දැමිය යුතු බවයි.

එහෙත් එම විරෝධතා පිළිබඳව එතරම් සැලකිලිමත් නොවන ෆ්‍රැන්සිස් පාප් වහන්සේ, බහුතර ජනතාවගේ යහපත ගැන සිතා කටයුතු කිරීමට ගත යුතු පියවර ගන්නා ආකාරයක් පෙනී යයි. එතුමා විසින් ගෙන එන තහනම් නියෝග මාලාව තවත් පියවරක් ඉදිරියට තබමින් වතිකානු රාජ්‍යය තුළ ඉදිරියේදී මත්පැන් අලෙවියද තහනම් කෙරෙනු ඇතැයි ඇතැම් විදෙස් පුවත් සේවාවන් සඳහන් කර සිටී.

2018 වසරේ සිට දුම්වැටි අලෙවිය සම්පූර්ණයෙන්ම නවතා දැමීමෙන් පසු, ලොව රාජ්‍යයන් අතරින් මුළුමනින්ම දුම්වැටි තහනම් කළ පළමු රාජ්‍යය ලෙස වතිකානුව ඉතිහාසයට ගතවනු ඇත.

## ලැම්බෝර්ගිනි

ශ්‍රී ලාංකික අපට නම් ලැම්බෝර්ගිනි නුපුරුදු වචනයක් නොවේ. මීට වසර 3-4 කට පෙර ලංකාවේ පාරිභාෂික වචන මාලාවට එකතු වී අද වන විට හැමෝම අසා ඇති නිතර කියවෙන වචනයක් බවට ලැම්බෝර්ගිනි පත්ව ඇත්තේ අපේ දේශපාලනඥයන්ට පිං සිදුවන්නටය.

රේසිං මෝටර් රථ අතර අතිසුඛෝපභෝගී මෝටර් රථ මාදිලියක් වන ලැම්බෝර්ගිනි මෝටර් රථය ඉතාලියේ Automobili Lamborghini හි නිෂ්පාදනයකි. වසරකට සීමිත රථ සංඛ්‍යාවක් පමණක් නිපදවන ලැම්බෝර්ගිනි මෝටර් රථයක අවම මිල කැනේඩියානු ඩොලර් ලක්ෂ 2 කට ආසන්න වේ.

පසුගිය කාලයේ ෆ්‍රැන්සිස් පාප් වහන්සේ ගැන ලෝක මාධ්‍ය තුළ පළ වූ කතා බහ අතරට මේ ආකාරයේ සුපිරි ලැම්බෝර්ගිනි රථයක්ද සම්බන්ධ වී තිබුණු ආකාරය දක්නට ලැබුණි. එම පුවතට අනුව, ලැම්බෝර්ගිනි සමාගම විසින් එතුමාණන් වෙත සීමිත මාදිලියේ Lamborghini Huracán මෝටර් රථයක් පිරිනමා ඇති අතර එහි වටිනාකම ඇමරිකානු ඩොලර් 216,000 ලෙස සඳහන් වේ. නොවැම්බර් 15 වෙනිදා වතිකානුවේදී මෙම පරිත්‍යාගය සිදුකරන අවස්ථාවේදී ලැම්බෝගිනි සමාගමේ ප්‍රධානීන් ඇතුළු විශේෂ පිරිසක් සහභාගි වී සිටිනු දක්නට ලැබුණි. එහිදී තමා වෙත ලැබුණු මේ අගනා ත්‍යාගය සතුටු සිතින් භාරගත් ෆ්‍රැන්සිස් පාප් වහන්සේ එම මෝටර් රථයෙහි ඉදිරිපස කොටසෙහි තම අත්සන තබා ආසිරි ගන්වා ඇත. ඉන්පසුව එම සුවිශේෂී මෝටර් රථය වෙන්දේසි කරන ලෙස ලැම්බෝගිනි සමාගම වෙත දන්වන ලදී. එම වෙන්දේසියෙන් ලැබෙන සියලුම මුදල් සමාජ සත්කාර කටයුතු සඳහා යොදා ගැනීමට පාප් වහන්සේ බලාපොරොත්තු වේ.

පූජකවරුන්, කන්‍යා සොහොයුරියන් වැනි ආගමික ප්‍රධානීන් සුඛෝපභෝගී රථ වාහන භාවිත කිරීම පිළිබඳව වරෙක එතුමාණන් අපූරු කතාවක් කියා තිබුණි.

'නව මාදිලියේ මෝටර් රථයක් සමග පූජකයෙකු හෝ කන්‍යා සොහොයුරියක දකින විට එයින් මා පීඩාවට පත් වෙනවා. කාර්යයන් රැසක් කරගන්න මෝටර් රථයක් අවශ්‍යයි. නමුත් කරුණාකර සරල ඉතා සුළු රථයක් තෝරාගන්න. ඔබ අරුමෝසම් දේවල්වලට කැමති වන සෑම වාරයකම සිතා බැලිය යුතු දේ නම්, මේ ලොව තුළ කොපමණ දරුවන් ප්‍රමාණයක් කුසගින්නේ සිටිනවාද? එයින් මිය යනවාද? යන්නයි'

('It hurts me when I see a priest or a nun with the latest model car, you can't do this'

'A car is necessary to do a lot of work, but please, choose

a more humble one'

'If you like the fancy one, just think about how many children are dying of hunger in the world')

ෆ්‍රැන්සිස් පාප් වහන්සේ විසින් සිදුකරනු ලබන සමාජ සත්කාරයන් අතර මිනිස් වෙළඳාම (ජාවාරම) නතර කිරීම, වීදි ගණිකා වෘත්තියේ යෙදෙන්නන් ඉන් ගලවාගෙන පුනරුත්ථාපනය කිරීම, අප්‍රිකානු කලාපයේ සාගතයෙන් මිය යන දරුවන් සඳහා සහන සැලසීම වැනි කාර්යයන රැසක් ඇතුළත් වේ.

# ඉන්දියාව ළමා ලිංගික අතවරවලින් පෙරමුණේ...

■ **(බී.බී.සී. සිංහල පුවත්)**

ඉන්දියාවේ සෑම විනාඩි 15 කටම වරක් දරුවෙකු ලිංගික අතවරවලට ලක් වෙන බව ආණ්ඩුවේ අලුත්ම සංඛ්‍යාලේඛනවලින් හෙළිදරවු වී තිබේ.

ළමුන් ලිංගික අපයෝජනයට ලක්වීම ගතව ගිය වසර කිහිපය ඇතුළත විශාල වශයෙන් ඉහළ ගොස් තිබෙන බවද බ්‍රහස්පතින්දා (නොවැ 30) ප්‍රකාශයට පත් කෙරුන ජාතික අපරාධ වාර්තා කාර්යාංශයේ වාර්තාවේ දැක්වේ.දූෂණයට ලක් වූ දස හැවිරිදි දැරියකට දරුවෙකු බිහි කිරීමට සිදුවීමෙන් අනතුරුව ළමා ලිංගික අපචාර පිළිබඳව යළිත් වරක් ඉන්දියාව පුරා ප්‍රබල අවධානය පළවෙමින් පවතී.

එම දැරිය දූෂණය කිරීමේ චෝදනාවට වැරදිකරුවන් වූ ඇයගේ මාමාවරුන් දෙදෙනෙකුට පසුගියදා ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම කෙරිණ. ස්වදේශ කටයුතු අමාත්‍ය රජ්නාත් සිං විසින් දිල්ලි අගනුවරදී ප්‍රකාශයට පත්කරන ලද 2016 වසරේදී ඉන්දියාව පුරා සිදු වූ අපරාධ පිළිබඳ ජාතික අපරාධ වාර්තා කාර්යාංශයේ වාර්තාව ප්‍රකාර, එම වසර ඇතුළත දරුවන්ට එරෙහි අපරාධ 106,958 ක් වාර්තා වී තිබේ. ඒ අතරින් 36,022 ක් දරුවන්ට එරෙහි ලිංගික අපරාධ ගණයට වැටෙන අපරාධ වේ.

ලෝකයේ ලිංගික අතවරවලට ලක් වූ දරුවන් වැඩිම පිරිස සිටින රට ඉන්දියාව බව පෙන්වා දෙන දිල්ලි අගනුවර සිටින බීබීසී වාර්තාකාරිය ගීතා පාන්ඩේ, එහෙත් ඒ සම්බන්ධයෙන් විවෘතව කතාකිරීමට බොහෝ දෙනා මැලිකමක් දක්වන බවද පවසන්නීය.

එබැවින් සැබවින්ම ලිංගික අපයෝජනයට ලක් වූ දරුවන් පිරිස වාර්තාවේ ඇතුළත් සංඛ්‍යාවට වඩා ඉතා වැඩි පිරිසක් විය හැකි බවද බීබීසී වාර්තාකාරිය පවසයි.

ඉන්දියාවේ ළමා වර්ධනය සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් 2007 දී පවත්වන ලද සමීක්ෂණයකට අනුව, තමන් කිසියම් ආකාරයක ලිංගික අපයෝජනයකට ලක් වූ බව සමීක්ෂණයට සහභාගි වූ දරුවන්ගෙන් 53% ක් පවසා තිබිණ.

බහුල වශයෙන්ම ඒ දරුවන් අපයෝජනයට ලක්වන්නේ දෙමාපියන්, ඥාතීන් හෝ පාසල් ගුරුවරුන් වැනි ඔවුන්ට ඉතා සමීප පුද්ගලයන් අතින් බව ළමා අයිතිවාසිකම් පිළිබඳ උද්ඝෝෂකයෝ පවසති.

1 වන පිටුවෙන්

## ශ්‍රී ලංකාවේ...

කිරීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශය වෙනමම ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට සකස් කර ඇති බවද වාර්තා වේ.

මෙහිදී නව මිශ්‍ර මැතිවරණ ක්‍රමයට අනුව මන්ත්‍රීවරුන් අතරින් සියයට 60 ක් ඡන්ද කොට්ඨාස ක්‍රමයටද ඉතිරි සියයට 40 සමානුපාතික ක්‍රමයටද තෝරා පත්කර ගැනීමට නියමිත වේ. මෙවර මැතිවරණයේදී කාන්තා නියෝජනය සඳහා විශේෂ අවධානයක් යොමු කොට ඇති අතර කොට්ඨාස මට්ටමින් තරග කරන මුළු සභික සංඛ්‍යාවෙන් සියයට 10 ක් කාන්තාවන් විය යුතු බව නීතිගත කර ඇත. එසේම සමානුපාතික නියෝජනයෙන් ඇතුළත් කළ යුතු අපේක්ෂිකාවන් සංඛ්‍යාව නාම යෝජනා පත්‍රයේ සඳහන් අපේක්ෂකයින්ගෙන් සියයට 50 ක් විය යුතු බවද සංශෝධිත පනතේ සඳහන් වේ.

## NAFTA...

BMO වාර්තාවේ කරුණු සාකච්ඡා කොට ඇත. එම සාකච්ඡාව සම්බන්ධයෙන් අදහස් දැක්වූ කැනේඩියානු විදේශ කටයුතු ඇමතිනිය පැවසුවේ, මෙම සාකච්ඡා දිගටම පවත්වාගෙන යාමට බාධා කීපයක් පවතින බවයි. මූලාරම්භයේ සිට ඇති නීති වෙනස් කිරීමට එක්සත් ජනපදය විසින් ගෙන එන දැඩි ඉල්ලීම්ද ගිවිසුමේ සඳහන් කාලය පිළිබඳ වගන්තිද නොසලකා හැර කටයුතු කිරීම මෙහිදී දැඩි ගැටලුවක් වී ඇති බව ඇය පවසයි.

NAFTA අවසන් කිරීමෙන් කැනඩාවේ සැබෑ දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධන වේගය වසර පහක කාලයක් තුළ වෙනත් ආකාරයකින් අපේක්ෂා කළ හැකි ප්‍රමාණයට වඩා සියයට 0.7 සිට සියයට 1 දක්වා ප්‍රමාණයකින් අඩුවිය හැකි බව BMO පෙන්වා දේ. මෙම පහත වැටීමත් සමග දුර්වල වන විනිමය අනුපාතය මගින් ඉහළ යන තීරු ගාස්තු නිසා කැනඩාවේ පාරිභෝගික මිල ගණන් දළ වශයෙන් සියයට 0.8 කින් ඉහළ නැංවෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

එසේම රැකියා තත්ත්වයද දැඩි ලෙස අවදානමට ලක්විය හැකි බවත් එයින් රැකියා 25,000 සිට 50,000 දක්වා අහිමි විය හැකි බවත් වාර්තාව පවසයි. කැනඩාවේ ප්‍රමුඛතම අපනයන කරුවා ලෙස කටයුතු කරන ඇමරිකාව ඈත් වුවහොත් කැනේඩියානු අපනයන ඩොලර් බිලියන 20 කින් පමණ පහත වැටෙනු ඇත.

# ට්‍රම්ප් දිනුම් !

මුස්ලිම් රටවල් හයක පුරවැසියන් ඇමරිකා එක්සත් ජනපදයට ඇතුළු වීම තහනම් කරමින් ඊට අවශ්‍ය ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගය දෙසැම්බර් 04 වෙනිදා නිකුත් කරනු ලැබ ඇත. මෙම රටවල් 06 සංචාරක තහනම සම්බන්ධයෙන් පහළ අධිකරණය මගින් වාරණ නියෝගයක් පනවා තිබූ අතර එම නියෝගය අහෝසි කරමින් ට්‍රම්ප් පරිපාලනයට මෙම තහනම පැනවීමට අනුමැතිය ලබාදී තිබුණි.

මෙහිදී ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් 9 දෙනාගෙන් 7 දෙනෙකුම එම රටවල් හයෙහි පුද්ගලයන්ට ඇමරිකාවට ඇතුළුවීමේ තහනම බලාත්මක කිරීමට අනුමැතිය පළ කොට ඇති අතර විනිසුරුවන් දෙදෙනෙකු පමණක් ඊට විරුද්ධව සිට ඇත.


SRI LANKA'S NO.1
TRICO
TRICO MARITIME
(Sole Authorized Agent of
Trico Meritime (Pvt) Ltd. Sri Lanka)
The first Customs Bonded Warehouse for Personal
Effects and gift items clearance in Sri Lanka
Serving People Worldwide Reliably for 35 Years
SRI LANKA'S BEST AND
LARGEST CLEARING
FACILITIES IN THREE
MAJOR CITIES SINCE 1980
COLOMBO
GALLE
KURUNEGALLA
DOOR TO DOOR SERVICE
to any part of Sri Lanka
A VERY MERRY
CHRISTMAS
and Happy New Year!
special service to
Colombo, Jaffna,
Kilinochchi, Batticaloa,
Trincomalee, Vavuniya
& Mannar
NEW
INTERNATIONAL
COURIER
DOCUMENTS & PARCEL SERVICE WORLDWIDE
-OVER 220 COUNTRIES-
TRICO
TORONTO: DERRICK ANTON
647.833.3020 | 416.335.8800
Our Canadian Agents
OTTAWA : 613 513 6106 (SAMAN) • MONTREAL: 514 884 8550 (VICKIE / NOEL) • VANCOUVER: 604 219 6232 (VIJE)
CALGARY: 403 971 6721 (SAMAN) • ALBERTA : 587 708 5665 (TONY) • WINNIPEG: 204 800 2364 (MANGALIKA)
Trico Maritime Customer Services & Warehouses in Sri Lanka
HEAD OFFICE
Trico Maritime (Pvt) Ltd
50K Cyril Perera Mawatha
Colombo 13
Tel: 2345580 / 2345581
Fax: 2432000
COLOMBO WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
414/17 K. Cyril Perera Mawatha
Colombo 13
Tel: 2448270 / 2440114
Fax: 2432000
KURUNEGALA WAREHOUSE
Trico Maritime (Pvt) Ltd
Humbara Road Sandagala
Uhumeeya
Tel: 073 2238924 / 037 2238925
Fax: 037 2238967
GALLE WAREHOUSE
Trico Maritime
Pro Cargo Distribution (Pvt) Ltd
No. 331 Matara Rd, Kangoda, Galle
Tel: 091 2234842
Fax: 2234841
Trico Maritime Freight Forwarding Canada Inc.
151 Nashdene Rd, Unit #5, Scarborough On. M1V 4B3 Tel: 416 335 8800 email: info@tricomaritim
Intersection: Markham Road/Nashdene Road Fax: 416 335 8848 www.tricomaritime.ca

# සේලයින් දෙන්නේ ඇයි?



■ වෛද්‍ය රුචිර සෙනෙවිරත්න

"කොහොමද ලෙඩාගෙ තත්වෙ.....?"

"සේලයිනුත් දෙනවා. ලෙඩේ හුඟක් බරපතලයි වගේ....." යම් පුද්ගලයකු අසනීපව රෝහල්ගත කර ප්‍රතිකාර කිරීමේදී සේලයින් ලබා දෙන විට අපි බොහෝ දෙනා එසේ පවසන්නෙමු.

සේලයින් දෙන්නේ බරපතල රෝග තත්ත්වයකදීද? පිළිතුර ලෙස පැවසිය හැක්කේ 'සියයට සියයක් නිවැරැදි නැත' යන්නය. සේලයින් ලබා දෙන සෑම රෝගියකුම බරපතල තත්ත්වයේ පසු නොවේ. නමුත් බරපතල රෝග අවස්ථාවලදී සේලයින් ලබා දේ.

බරපතල රෝග අවස්ථාවලදීත් එසේ නොමැති අවස්ථාවලදීත් ලබා දෙන මෙම සේලයින් යනු කුමක්ද? ඒ පිළිබඳව අප තුළ වැටහීමක් තිබිය යුතුය.

## සේලයින්වල අඩංගු ද්‍රව්‍ය

සේලයින් යනු සෝඩියම් ක්ලෝරයිඩ් සහ ජලය සහිත සෞඛ්‍ය ආරක්ෂක ලෙස අසුරා ඇති ද්‍රාවණයකි. සේලයින් බෝතලයක ඇති සෝඩියම් ක්ලෝරයිඩ් ප්‍රමාණය ලුණු ග්‍රෑම් 9 ක් වතුර ලීටරයක දිය කළ සාන්ද්‍රණයට සමානය.

## සේලයින් ලබා දෙන්නේ ඇයි?

දැන් කෙනෙකුට මතුවිය හැකි ගැටලුව නම් සේලයින්වල වැඩිපුර ඇත්තේ ලුණු නම් එය ලබා දෙන්නේ ඇයි දැයි කියාය.

සේලයින්වල ඇති සාන්ද්‍රණය රුධිර සාන්ද්‍රණයට සමානය. එබැවින් යම් පුද්ගලයකුට සේලයින් ලබා දෙන්නේ එම තැනැත්තාගේ රුධිර පීඩනය රැක ගැනීම සඳහාය.

රුධිර පීඩනය රැක ගත යුතු අවස්ථා වනුයේ රෝගියා විජලනයෙන් පෙළෙන විට, අධික ලෙස රුධිරය සිරුරෙන් පිටතට වහනය වන විට, මුත්‍රාශය ආශ්‍රිත ශල්‍යකර්ම සිදු කරන විට, රෝගියා නිර්වින්දනය කර ඇති විට වැනි අවස්ථාවලදීය.

## විජලනයට පත්වීම

යම් පුද්ගලයකු විජලනයට පත්විය හැකි අවස්ථා රැසක් පවතී. අධික ලෙස වමනය යන විට, පාචනය, වසංගත රෝග, රුධිරය අධිකව වහනය වන විට, ආහාරපාන මුඛයෙන් ගත නොහැකි අවස්ථාවලදී යන හේතු මත යම් පුද්ගලයකු විජලනයට පත්විය හැකිය. එවිට රුධිරයෙහි පැවතිය යුතු සාන්ද්‍රණය වෙනස් වේ. එවැනි අවස්ථාවලදී සේලයින් ලබා දිය යුතු වේ.

මෙහිදී සේලයින් ලබාදිය යුතු ප්‍රමාණය සහ සේලයින් ලබාදිය යුතු කාලය රෝගියාගේ රෝග තත්ත්වය අනුව තීරණය කරනු ලැබේ. ඇතැම් පුද්ගලයන්ට යම් කාල සීමාවකදී නියමිත මාත්‍රාවට ඖෂධ ශරීර ගත කළ යුතු අවස්ථා මතුවේ. එවැනි අවස්ථාවලදී සේලයින් ඔස්සේ අදාළ ඖෂධ ශරීරගත කරනු ලබයි.

## තුවාල පිරිසිදු කිරීමට

සේලයින් භාවිත කරනුයේ ඉහත අවස්ථාවලදී පමණක් නොවේ. තුවාල පිරිසිදු කිරීම සඳහාද සේලයින් වතුර භාවිත කරයි. මෙවැනි අවස්ථාවලදී සේලයින් බෝතලය විවර කළ පසු දින දෙකකට වඩා එය තුවාල පිරිසිදු කිරීම සඳහා භාවිත නොකළ යුතුය. දින කිහිපයක් විවෘතව තිබෙන විට සේලයින් ද්‍රාවණය තුළට විෂබීජ එක්වේ.

## වෛද්‍ය උපදෙස් මත

කෙසේ වෙතත් වෛද්‍ය නිර්දේශ මත පමණක් සේලයින් ලබාදිය යුතුය. එසේම සේලයින් ලබා දෙන විට එහි සාන්ද්‍රණයේ අඩුවැඩි බව රෝගය, වයස ආදිය අනුව තීරණය වේ. සාමාන්‍යයෙන් වැඩිහිටියකුට 0.9% යුත් සාන්ද්‍රණය සහිත සේලයින් ලබා දේ. කුඩා ළමයකුට ලබා දෙන සේලයින් හි සාන්ද්‍රණය 0.45% කි.

මේ අනුව රෝහල්ගත වන සෑම පුද්ගලයකුටම සේලයින් ලබාදිය යුතු නැත. එසේම සේලයින් ලබාදිය යුත්තේ වෛද්‍ය උපදෙස් මත පමණි.

## සේලයින් සහ කුරුම්බා

සේලයින් වතුර සහ කුරුම්බා වතුර අතර එක සමාන ගුණයක් නැත. ඇතැම් වැඩිහිටියෝ සේලයින් වගේ යැයි කියමින් කුඩා කුරුම්බා ගෙඩිවල ජලය රෝගීන්ට ලබා දේ. එය නිවැරැදි ප්‍රතිකාරයක් නොවේ. සේලයින් සාන්ද්‍රණය සහ කුරුම්බා වතුරේ සාන්ද්‍රණය අතර වෙනසක් පවතී.

# එදා සිරිපා වඳින්න ගිය සමනලුන් මෙදා කෝ?

■ ෂේන් වීරසිංහ

උඳුවප් පුර පසළොස්වක පෝදායින් ආරම්භ වී වෙසක් පුර පසළොස්වක පෝදායින් අවසන් වන සිරිපා වන්දනා වාරයේදී අවුරුදු පතා ලක්ෂ සංඛ්‍යාත බැතිමතුන් සිරිපා කරුණා කරති.

සිරිපා වන්දනාකරුවන් මෙන්ම සමනලුන්ද මීට වසර කීපයකට පෙරදී අවුරුදු පතා සිරිපා වඳින්නට ගිය ආකාරය අප අසා ඇත. දැක ඇත. මීට වසර විස්සකට තිහකට එපිට කාල වකවානුව සිහිපත් කරන අපේ ගැමියන් පවසන කතා ඉතා රසවත්ය. සමනල අඩවිය සහ වන්දනාවේ ගිය සමනලුන් අතර අපූරුතම කට කතා ගැමි ජනවහරේද ප්‍රචලිතව ඇත.

ඈත අතීතයේදී මේ මුළු කඳුවැටියම සමනලුන්ගෙන් පිරී පැවති නිසා සමනල කන්ද නමින් හඳුන්වන්නට අපගේ පැරැන්නෝ පුරුදු වී සිටියහ. අවුරුදු පතා ඉගිල ගිය ලක්ෂ සංඛ්‍යාත සමනල රැන් සමනල කන්දේ හැපී මියගිය බවද ගැමියෝ විශ්වාස කළහ. ඒ පිළිබඳව අපද අසා ඇත. ගැමියන්ගේ කතාවල කිසියම් හෝ සත්‍යතාවක් ඇති බැව් පැහැදිලිය. එදා දහස් ගණනින් කහපාට, සුදුපාට, හා පාට පාටින් සමනලයන් රැන්, රැන් දේදුන්නක් සේ එකම දිසාවට ඉගිලී ගිය අයුරු ඔවුන් සිහිපත් කරන්නේ දෑසින් දුටු ඒ මනහර දසුන් මනසින්ද සිහිපත් කරමිනි.

මා පාසල් යන සමයේදී දුටු ඒ සමනලයන්ගේ පියකරු දර්ශනය අදත් මට මැවී පෙනේ. වෙල් ඉපනැලි, බඩවැටි, ඕවිටි පසුකරමින් කෙහෙල්ගමුව කඳුවැටිය හරහා සප්තකන්‍යා කඳුවළල්ල පසු කොට සමනල කඳුවැටිය බලා ඉගිල ගිය රැන් රැන් කහපාට සමනලුන් සිහිපත් වන විට මම අදත් පාසල් සමයට මනසින් ළඟා වන්නෙමි.

එහෙත් අවුරුදු පතා සිරිපා වඳින්නට යන සමනල නඩ, සමනල රැන් එදා මෙන් අද දකින්නට නැත. ඔවුන් සිරිපා වඳින්නට ගිය කතාව කෙතරම් පුදුම සහගත වූවද, ඒ අවිහිංසක පාට පාට සමනල රංචුවලට අද කුමක් සිදුවී ඇතිද? ඔවුන් අද කෝ? අප හමුවේ ඇති ඒ සැඟවී ගිය පැනයට පිළිතුරක් කෝ?

ශ්‍රී ලංකාව පුරා බොහෝ ප්‍රදේශවල සංචාරය කරන සමනලුන් අතර කහපාට, හා සුදුපාට සමනලුන් ප්‍රධාන තැනක් ගනී. එදා විශාල රංචු වශයෙන් ඔවුන් දකින්නට ලැබිණි. සමනලයෝ වරකට විශාල වශයෙන් බිත්තර දැමීම නිසා ඔවුන් ශීඝ්‍ර ලෙස බෝවීමට පටන් ගත්හ.

අපගේ ජනවහරට අනුව ඔවුන් සමනල කන්ද බලා ඉගිල ගියේ රංචු වශයෙනි.

සත්‍ය වශයෙන්ම මේ සමනලයන් ශ්‍රීපාදේ වඳින්න ගියාද? මේ පිළිබඳව තාමත් පැහැදිලි යමක් ප්‍රකාශ කළ නොහැක. මෙය විද්‍යාත්මකවද ඔප්පු කළ නොහැකිය.

එසේ නමුත් සම්බුදු පා පහස ලද උතුම් වූ පූජනීය සමනල අඩවිය සතුව ඇති අදෘශ්‍යමාන බලවේගයක් නිසා, සතා සිව්පාවුන් පවා සමනොල කූඨයට ගරු බුහුමන් කළා විය හැක.

උඳුවප් සිසිලත් රැගෙන සිරිපා සමය උදා වීමත් සමග මේ ප්‍රදේශය අනෙකුත් ප්‍රදේශවලට වඩා සිසිල් සෞම්‍ය දේශගුණයකට පරිවර්තනය වෙයි. නිහඬ, නිසල පරිසරයක් බවට පත්වෙයි. අනෙකුත් සතුන්ටත් වඩා සමනලුන් මුදු, මොළොක්, අවිහිංසක සතුන්ය. ඒ නිසාම මේ සෞම්‍ය දේශගුණයට සමනලුන් වැඩි ඇල්මක් දක්වයි. මේ හේතුව නිසාම ඔවුන් විශාල රංචු වශයෙන් සමනල අඩවියට ඇදී එන්නට ඇත. මේ කරුණු කාරණා නෙත ගැටුණු අපගේ වැඩිහිටියෝ මේ ගැන එදා විවිධ කතාන්දර ගෙතුවේ පාරිසරික සුන්දරත්වයද එක්කරමිනි. අපේ පරිසරය හැඩවැඩ කළ ඒ අවිහිංසක සමනලුන්ට මොකද වුණේ.

කෙසේ නමුදු සියල්ල මුදලින් තක්සේරු කරන සමාජයක මිනිසාගේම අත්තනෝමතික ක්‍රියා හේතුවෙන් ඒ සුන්දර සමනල ලෝකය අද අපට අහිමි වී ගොස් හමාරය.

නොයෙක් සංවර්ධන කාර්යයන් සඳහා වනාන්තර එළිපෙහෙළි කිරීම, සමනල වාසස්ථාන වූ ස්වභාවික පරිසරය විනාශ කිරීම, කැළෑ ගිනි තැබීම, කෘමිනාශක, වල් නාශක හා රසායනික පොහොර භාවිතය ආදි හේතූන් නිසා සමනල බිත්තර විනාශ වී, සමනලයන් වඳ වී යෑමේ තර්ජනයකට ගොදුරු වී ඇත. සමනල කෝෂ රහසිගතව පිටරට යැවීම, සමනල තටු යොදාගෙන විවිධ විසිතුරු නිර්මාණ කිරීම, ආදිය නිසාද අපේ රටේ සමනලයන්ට නරක කල දසාවක් උදාවී තිබේ.

ජෛව විවිධත්වයෙන් අනූන වූ ලංකාවේ සමනල විශේෂ විශාල ප්‍රමාණයක් එදා ජීවත් වූහ. මෙහි සිටි සමනල විශේෂ 242 න් ලංකාවට ආවේණික වූ සමනල විශේෂ 42 ක් එදා සිටි නමුදු අද එය සමනල විශේෂ 20 දක්වා පහත වැටී ඇත.

සකල ලෝකවාසී බැතිමතුන් ඉමහත් ගෞරව භක්ත්‍යාදරයෙන් වැඳ නමස්කාර කරන සම්බුදු සිරිපාදේ වඳින්නට එදා ගිය සමනල රැන් රැන් අද අපට දක්නට නැත. අතීත ජනකතාවලටත්, වියපත්ව කල් ගෙවන අපේම ඇත්තන්ගේ මියගිය මතක සටහන් අතරටත් පමණක් එම සමනල මතකය සීමා වී තිබේ.




ANTON
DHARMASEELAN
MORTGAGE AGENT
Available Till Midnight
Including Weekends & Holidays
CALL ME FIRST
FOR ALL YOUR MORTGAGE NEEDS
PURCHASE
REFINANCE
SELF EMPLOYED
RENEWAL
BAD CREDIT
INVESTMENT PROPERTY
416 704 1200
MAJOR BANKS-BEST RATES
MORTGAGE ALLIANCE
BROKER #10530

සංචාරයක මතකය

## පැරීසියේ රවුමක් යමු.....

# ඉතාලියේ සිට පැරීසියට ගිය මොනාලිසාත්, සුවිසල් අයිෆල් කුලුනත් අතරින් ප්‍රේම පාරාදීසයට...





▪ සටහන සහ සේයා රූ අනුරුද්ධ වැලිගමගේ

මොනා ලීසා චිත්‍රයේ ඇති මද සිනහව ගැන ඇති කතාන්තර මැද්දේ එයට ආසා නොකරන කෙනෙකු සොයාගැනීම දුෂ්කර වැඩක්. සේයාරූ තාක්ෂණය දියුණුව නොතිබූ 15 වන සියවසේදී පුද්ගල මතකයන් සදහා යොදා ගැනුණේ සිත්තරෙකු විසින් අඳින ලද සිතුවම්. ඉතාලියේ විසූ ෆ්‍රැන්සිස්කෝ ඩෙල් ගියෝකොන්ඩෝ (Francesco del Giocondo) ප්‍රභුවරයාට තම බිරිඳගේ රුව සිතුවමට නගා ගැනීමට අවශ්‍ය වුණේ 1503 දී. ඒ කාර්යය භාර දුන්නේ ප්‍රවීණ චිත්‍ර ශිල්පී ලියනාඩෝ ඩා වින්සි (Leonardo Da Vinci) ට. තම ප්‍රියතම සිතුවම වූ බැවින් ඩාවින්සි විවිධ දෑ එකතු කරමින් එය තමා ළඟම තබාගත් බව සදහන්.



1517 දී ප්‍රංශ රජුගේ ආරාධනයෙන් පැරීසියට යන විටත් එය රැගෙන යන්නට ඔහු අමතක කළේ නැහැ. 1519 මැයි 2 වැනිදා ඔහු මියගිය පසු ඔහුගේ නිර්මාණ භාරකාරත්වය දැරූ සලෙයි (Salai) ගෙන් ප්‍රංශයේ ෆ්‍රැන්සිස් රජු මේ චිත්‍රය මිල දී ගත්තේ රන්කාසි 4000 කටයි. කලක් වර්සායි මැදුරේ රජුන් අසලම හුන් මොනා ලීසා ප්‍රංශ විප්ලවයෙන් පසු ලූවර් මන්දිරයේ සැකසුනු කෞතුකාගාරයට පැමිණි බව සඳහන්.

අප මීට පෙරත් දසතින් අවස්ථා කිහිපයකදීම පැරීසිය ගැන කතා කර තිබෙනවා. ඒ පැරිස් නගර මධ්‍යයේ ඇති භූගත සොහොන් බිම් සහ ගැට කපන්නන් ගැනයි. උතුරු ඇමෙරිකාවෙන් යුරෝපයට යන සංචාරයක මතකය පැරීසියට ඔබව ගෙනයන්නේ ලෝකයේම කථාබහට ලක්වූ ලෝහමය අටල්ල වන අයිපල් කුළුණ සහිතව ප්‍රේමවන්තයන්ගේ පාරාදීසය වන ලෝකයේ වැඩිම සංචාරකයන් පිරිසක් එකතු වන නගරය වන නිසයි.

### අයිෆල් කුළුණ - Eiffel Tower

1889 දී ප්‍රංශයේ පැවති ලෝක ප්‍රදර්ශනයට සංකේතයක් ලෙස ඉදි කළ මේ ලෝහමය අටල්ලේ උස මීටර් 324 ක්. එය තට්ටු 81 ක් උස ගොඩනැගිල්ලකට සමානයි. 1930 වනතුරුම ලෝකයේ මිනිසුන් තැනූ උසම ඉදිකිරීම ලෙසින් නම් දරා සිටි මෙහි නිර්මාණ ශිල්පියා වුයේ ප්‍රකට ඉංජිනේරු ගුස්ටාව් අයිෆල්.(Gustave Eiffel) එක් එක් උස් මට්ටම්වල නැරඹුම් පරිශ්‍ර තුනක් ඇති මෙය ලෝකයේ මෙතෙක් වැඩිම පිරිසක් මුදල් ගෙවා නැරඹූ ස්ථානය ලෙසින්ද වාර්තා තබා තිබෙනවා.

මෙය ඉදිකිරීම සඳහා යොදාගත් වානේවල බර පමණක් ටොන් 7300 ක්. අවන්හල්, සිනමා හල්, විදුලි සෝපාන සියල්ල සහිතව දළ වශයෙන් මෙය ටොන් 10,100 බර වෙතැයි අනුමාන කෙරෙනවා. මෙය ඉදිකිරීමේදී මූලිකත්වය ගත් ප්‍රංශ ජාතිකයන් 72 දෙනෙකුගේ නම් මේ කුළුණේ කොටා තිබෙනවා.

1985 දී තිරගත වූ A View to Kill ජේම්ස් බොන්ඩ් චිත්‍රපටයේ ඇති Champ de Mars නම් උද්‍යානය තිබෙන්නේ අයිෆල් කුලුන මැදි කරගෙනයි. යුද්ධයට අධිපති අඟහරු දෙවියන් සිහිපත් කරමින් නම් කර ඇති මෙම උද්‍යානය කුලුන මුදුනේ සිට බලන විට හරිම ලස්සනයි. සෙයින් නදිය (Seine River) තිබෙන්නේ අයිෆල් කුලුනට අත ළඟින්. ඔබ සවස් වරුවක මෙතැනට ගියොත් තරමක් රෑ බෝවන තුරු මේ ඉසව්වේ කල් මරන්නට පුළුවන්. ගතින් වයසට ගියත් හිතින් තරුණ ප්‍රේමවන්තයින් වන්නත් පුළුවන්. විදුලි බුබුළුවලින් ආලෝකමත් වූ අයිෆල් කුලුන මවන්නේ මිහිබට සුරපුරක්. සෙයින් නදිය අසබඩ හිඳ අවට සිරි විඳිමින් අතීත සිතුවිලි මතක් කරගන්නටත් පුළුවන්.

පැරීසිය ඉතාමත්ම ජනාකීර්ණයි. පටු මාවත් නිසා වාහන තදබදය වැඩියි. ප්‍රධාන සංචාරක කේන්ද්‍රස්ථාන අසල වාහන නැවැත්වීම සදහාත් මහත් වෙහෙසක් දරන්නත්, සෑහෙන මුදලක් ගෙවන්නත් වෙනවා. එනිසා වඩා සුදුසු වන්නේ උමං දුම්රිය (Metro) තැනින් තැන නවතන (Hop & Hop) සංචාරක මගී බස්රථ හෝ සෙයින් නදිය දිගේ යන Batobus වැනි පොදු ප්‍රවාහන සේවාවන්. ඒවායින් පහසුවෙන්ම අඩු ඇවිදීමකින් සංචාරක කේන්ද්‍රස්ථාන කරා යන්නට පුළුවන්. ගමන සැලසුම් කරන මුල් අවධියේදීම ප්‍රධාන දුම්රිය ස්ථානයක් අසබඩ නවාතැනක් වෙන්කරවා ගතහොත් යුරෝපයේ අනෙකුත් ප්‍රධාන නගර කරා යන අධිවේගී දුම්රියක් අල්ලා ගන්නත් පුළුවන්. ගුවන් තොටුපලේ සිට පහසුවෙන් දුම්රියෙන්ම නවාතැනට යන්නත් පුළුවන්.

ගැට කපන්නන් බහුල නිසා ඔබේ මුදල් පසුම්බි, කැමරා, දුරකථන තමන්ගේ බඳේ ඉදිරිපසට වන්නට තබා ගැනීමත් නුවණට හුරුයි. ජංගම වෙළෙන්ඳන් සහ පෙට්ටි කඩවලින් ලාබයට සමරු සිහිවටන ගන්නට පුළුවන්. ඒ සදහා ප්‍රධාන මුදල් පසුම්බිය පාවිච්චි නොකර සිල්ලර මාරු නෝට්ටු තබාගැනීම ගැට කපන්නට ගොදුරු වීමෙන් වළකා තබාවි.



### ලූවර් කෞතුකාගාරය - Louvre Museum

ලෝක කෞතුකාගාර වර්ගීකරණය අනුව පළවෙනි තැන හිමි කර ගන්නේ මීට පෙර සංචාරයක මතකය තුළින් ඔබව කැඳවා ගිය ඇමෙරිකාවේ වොෂින්ටන් නුවර පිහිටි ස්මිත්සෝනියන් කෞතුකාගාරයයි. එහි අංක දෙක හිමි කරගන්නේ ලෝ ප්‍රකට කලා නිර්මාණ විශාල සංඛ්‍යාවක් ඇති ලූවර් කෞතුකාගාරය. චිත්‍රපටයකදී ලියනාඩෝ ඩාවින්චි මොනා ලීසා චිත්‍රය අඳින අයුරු දුටු දසුන සිතේ දරාගෙන සිටි අප නරඹන්නට ඇති දේ ලැයිස්තුවේ අංක එකේ තබා තිබුනේ මොනා ලීසා චිත්‍රයයි. අප හිතන තරම් විශාල නැති එහි සැබෑ ප්‍රමාණය දිගින් අඟල් 30 ක් සහ පළලින් අඟල් 21 ක්. එය හොඳින් බලන්නට නම් උදෑසන කෞතුකාගාරය විවෘත කළ විගසම එය ඇති කුටියට දිව යාම නුවණැති වැඩක්. මගේ හිතවතෙකු දුන් ඒ උපදෙස මටත්, අපේ ගමන් සගයන් රැසකටත් මොනා ලීසා ඉදිරිපස සිට හොඳ සේයා රූ රැසක් ගන්නටත් මග පෑදූ බව කිව යුතුයි. ඔබ පමා වුණොත් ඔබට මොනා ලීසාව බලන්නට වන්නේ දුරක සිටයි. ඒ තරමටම ඒ කුටිය ජනාකීර්ණ වෙනවා.



සෙයින් නදිය අසබඩ 12 වන සියවසේ සිට තිබූ රජ මාලිගාවක් ප්‍රංශ විප්ලවයෙන් පසු 1793 දී කෞතුකාගාරයක් බවට පත් වුයේ ප්‍රංශ රජ මාලිගාවල තිබූ සිතුවම් සහ බොහෝ වටිනා දෑ සුරක්ෂිත කරමින්. නැපෝලියන් අධිරාජ්‍යයාගේ යුරෝපා ආක්‍රමණ තුළින් තවත් බොහෝ දෑ මෙයට එකතු වූ අතර ක්‍රමවත් ලෙස අධ්‍යක්ෂක වරයෙකු යටතේ මෙය පරිපාලනය සකස් කරනු ලැබුවේත් නැපෝලියන් පාලන සමයේදී. දවසින් දවස සංරක්ෂණය කෙරුණු දෑ මෙයට එකතු වෙනවා.

පුරා දින කිහිපයක් පුරාම බලන්නට තරම් දේ ඇති මෙහි තිබෙන මයිකල් ඇන්ජෙලෝ (Michael Angelo) ගේ 'මරණයට කැප වූ වහලා' (Dying slave) සහ Venus de Milo ග්‍රීක ප්‍රතිමාවත් මහජනතාව රැස්කකා බලන තවත් අංග දෙකක්. කෞතුකාගාර වර්ගීකරණ තුළ ලූවර්වලට ඉතා වටිනාකමක් ලැබෙන්නේ එහි ඇති සැකැස්ම, අන්තර්ගතය සහ ඒවා ඉදිරි පරම්පරාවට ගෙන යාමේදී දක්වන දක්ෂතාවය නිසා. ගෘහ නිර්මාණ ශිල්පී අයි එම් පෙයි (I M Pei) ගේ සැලසුමකට 1988 දී ඉදිවුණු වීදුරු පිරමිඩය එය 21 වන සියවසට විවර කළ දොරටුව වෙනවා.

### Avenue des Champs-Élysées

ලූවර් කෞතුකාගාරය ඉදිරිපස ඇති කුලුන අද්දරින් ඇරබෙන ටියුලිස් උද්‍යානය (Jardin des Tuileries) පැරිසියේ ඇති තවත් ලස්සන තැනක්. මේ හරහා කිලෝමීටර 2 ක් පමණ ඇවිද ගිය විට ලෝකයේ මිල අධිකම විලාසිතා වීදියක් හමුවෙනවා. නිව්යෝර්ක්, මිලානෝ වැනි විලාසිතාවලට ප්‍රකට නගර අතරේ පැරීසියට හිමිවන්නේ මුල් තැනක්. උමං දුම්රියකදී, ආපන ශාලාවකදී පමණක් නොව මහ මගේදී පවා අලුත් විලාසිතාවලින් පිරි පැරිස් නගර වැසියන් වෙන්කර හඳුනා ගන්නට පුළුවන් . මිල දී ගන්නට අපහසු වුවත්, Window Shopping... සදහාත් ලෝකයේ ජනකාන්ත තරු දැකිය හැකි තවත් සංචාරක පරිශ්‍රයක් ලෙසත් මෙහි ඇති වැදගත්කම අති මහත්.

**ජයග්‍රහණයේ කුලුන, වර්සායි මහ මැදුර සහ නොට්රඩාම් මහ පල්ලිය බලන්නට ගිය තවත් ගමනක් සමග මීළඟ කලාපයෙන් හමුවෙමු.**

විස්තර සදහා මගේ E-mail ලිපිනයට ලියන්න. ඉඩ ලැබෙන පරිදි පිළිතුරු ලියන්නම්.

anuruddhawe@yahoo.com



# තෑග්ග

ඈත පිටිසර ගම්මානයක එක ළඟ තිබුණු ගෙවල් දෙකක අක්ක කෙනෙකුයි නංගි කෙනෙකුයි ජීවත් වුණා. මේ දෙන්නටම දූලා දෙන්නෙකුත් හිටියා. මේ දූල දෙන්නගෙ ගතිගුණ හරිම වෙනස්. නංගිගෙ දුව හරිම කරුණාවන්තයි. ඉවසිලිවන්තයි. ගෙදරදොරේ වැඩපළවලදි අම්මට උදව් වෙනවා. ඒත් අක්කගෙ දුව ඊට හාත්පසින්ම වෙනස්. ඒ දුව හරිම නපුරුයි. කිසිම කෙනෙකුට උදව්වක් වෙන්නෙ නෑ.

මේ අක්කයි නංගියි ජීවත් වුණේ කපු කැටීමෙන්. කපු කැටීමට පෙර පුළුන් සුද්ද කරගන්න ඕන. මේ පුළුන් සුද්ද කිරීමේදී නංගිගෙ දුව හැමදාම අම්මට උදව් වෙනවා. ඒත් අක්කගෙ දුව නම් එයාගෙ අම්මට උදව්වක් කරන්නෙ නෑ.

එදත් සුපුරුදු විදියට උදෑසනම නංගි කපු කැටීම පටන් ගත්තා. නංගිගෙ දුවත් ඇවිත් පුළුන් සුද්ද කරල දීල උදව් වුණා. ඒත් එකපාරටම ආපු සුළඟකට දුව අතේ තිබුණු පුළුන් ගොඩ ගසාගෙන ගියා. බොහොම උත්සාහ කළත් පුළුන් ගොඩ අල්ලාගන්න බැරි වුණා. අම්මා කෑ ගැසුවා....

"යන්න... යන්න.... ඉක්මනට දුවන්න.. අපේ අතේ තිබුණු පුළුන් ඔක්කොම ගසාගෙන යනවා.... ගිහින් ඒවා අරගෙන එන්න....."

අම්මා එහෙම කෑගසද්දි දුව භයවෙලා පුළුන් ගසාගෙන ගිය පැත්තට දිව්වා....දැන් පුළුන් උඩින් ගසාගෙන යනවා... දුව ඒ පස්සෙ පන්නගෙන යනවා....

මෙහෙම ටික දුරක් යද්දි ළිඳක් ළඟ මහලු අම්මා කෙනෙක් නාන්න හදනවා. ඒ අම්මා මේ දුවට කතා කළා...

"අනේ දුවේ... උඹට පිංසිද්ධ වෙනවා.... මට නාගන්න මේ ළිඳෙන් වතුර ටිකක් ඇදලා දීල පලයන්...."

දැන් මොකද කරන්නෙ... මේ දුවට 'බෑ' කියල පුරුද්දකුත් නෑ. පුළුන් ගසාගෙන යන දිහා බලාගෙනම අර මහලු අම්මව නාවන්න පටන් ගත්තා. නාල ඉවර වුණු හැටියෙම ඇය මේ ගැහැනු ළමයා දෙස බලා...

"උඹට හොඳක්ම වෙන්න ඕන දුවේ...." කියා කිව්වා.

ඒ සමගම මේ ළමයා ආයෙමත් පුළුන් ගසාගෙන ගිය පැත්තට දුවන්න පටන් ගත්තා. ටික දුරයි යන්න ලැබුණේ... තද ගිනි අව්වේ ගැට ගසා සිටි එළදෙනක් හරිම දුක හිතෙන විදියට මේ ළමයා දිහා බලා මෙසේ කිව්වා...

"අනේ ළමයෝ... මට මේ අව්වෙ ඉන්න බෑ... මාව හෙවණ ඇති තැනක ගැටගසාපන්...."

තමා හොඳටම පමා වී ඇති බව තේරුණත් එළදෙන විඳින දුක දැක්කම ඒ ගම දුවට එම ඉල්ලීම ඉටු නොකර යාමට නොහැකි වුණා. ඇය එළදෙනව ගෙන ගොස් හෙවණ ඇති ගසක් යට ගැට ගසා දුවන්න හදනකොටම එළදෙන මෙසේ කිව්වා.

"උඹට හොඳක්ම වෙන්න ඕන දරුවෝ..."

ඒකත් අසාගෙන ගැහැනු ළමයා ආයෙමත් වේගයෙන් දිව්වා. ඈත ගසාගෙන යන පුළුන් ගොඩ දැන් ඇයට පේනවා. ඇය තවත් වේගයෙන් දිව්වා... මෙන්න එකපාරටම පුළුන් ගොඩ මහ විශාල ගසක අත්තක රැඳුනා. ගස යටට ආ ගැහැනු ළමයා ගසට නැග පුළුන් ටික ගැනීමට සිතුවා. මෙසේ සිතා ගසට නගින්න පය තියනකොටම කටහඬක් ඇසුණා...

"ළමයා.... මොකද මොකද මේ ගසකට නගින්නේ..."

ගැහැනු ළමයා හැරී බැලුවා... රජතුමා.... ළමයාට භය හිතුණත් ඇය ඒ බව පෙන්වන්නේ නැතුව මෙසේ කිව්වා...

"රජතුමනි, සුළඟේ ගසාගෙන ආපු මගේ පුළුන් ටික මේ ගසේ රැඳිලා... මා එය ගන්නයි ගසට නගින්නෙ..."

"හොඳයි.... ඔබ ගස් නගින්න ඕන නෑ... මගේ මාළිගාවට ගිහින් රසවත් ආහාර වේලක් සාදා දෙන්න. මා ඔබට මේ පුළුන් ටික රැගෙන දෙන්නම්..."

"මට පුළුවනි රජතුමනි රසට කෑම හදන්න..."

ගම දුව හරිම කැමැත්තෙන් මාළිගාවට ගිහින් ඉතාමත් ප්‍රණීත රසවත් ආහාර වේලක් සාදා රජතුමාට පිළිගැන්වූවා. රජතුමාට හරිම සතුටුයි. ආහාර ගැනීමෙන් පසු රජතුමා මේ ගැහැනු ළමයාව ගබඩා කාමරයක් වෙත ගෙන ගියා. ඒ කාමරයේ එක එක ප්‍රමාණයේ ලොකු කුඩා පෙට්ටි ගොඩ ගසා තිබුණා.

"ඔබ හොඳ දක්ෂ කරුණාවන්ත ළමයෙක්.... ඒ නිසා මම කැමතියි ඔබට තෑග්ගක් දෙන්න... මේවායින් ඔබ කැමති පෙට්ටියක් තෝරා ගන්න..."

ගහැනු ළමයා වටපිට බලා එතන තිබුණු ලස්සන කුඩා සඳුන් ලීයෙන් හැඩ කළ පෙට්ටියක් තෝරා ගත්තා. රජතුමා සිනා සී ඇය දෙස බලා මෙසේ කිව්වා.

"හොඳයි දුව... ඔබගේ පුළුන් ටිකයි, මේ පෙට්ටියයි දෙකම දැන් මා ඔබට දෙනවා.... මේ පෙට්ටිය අම්මා ළඟටම ගිහින් විවෘත කරන්න. ඔබටත් අම්මාටත් ජීවිත කාලයම සතුටින් සිටිය හැකි දේවල් එහි ඇති...."

යහපත් ගැහැනු ළමයාට හරිම සතුටුයි. ඇය පුළුන් ටිකයි පෙට්ටියයි අරගෙන ගෙදර දිව්වා. අම්මා ළඟට ගිහින් සිදුවූ සියල්ල කියා රජු දුන් පෙට්ටිය අම්මාට දුන්නා. අම්මා එය විවෘත කළා.... මැණික්... ඒ පෙට්ටිය පුරවලා වටිනා මැණික්.... අම්මටයි දුවටයි හරිම සතුටුයි.

මේ කතාව අහපු අක්කටත් ඒ වගේ වස්තුවක් ලබා ගැනීමට ලොකු ආශාවක් ආවා. ඇගේ දුවට අඬ ගසා නංගිගෙ දුව රැගෙන ආ වාසනාව ගැන කිව්වා.

"අපෝ මෙයා නම් හරිම මෝඩයෙක්... මම ගියා නම් එතන තියෙන ලොකුම පෙට්ටිය ගේන්නෙ...." ඒ දුව එහෙම කිව්වා. දැන් ඇයටත් ඒ විදියටම රජගෙදරට ගිහින් ඊටත් වඩා වස්තුව රැගෙන පෝසත් වෙන්නයි ඕන.

පහුවදා අක්කගෙ දුවත් වුවමනාවෙන්ම පුළුන් රොදක් සුළඟේ ගසාගෙන යාමට සලස්වා ඒ පස්සෙන් දිව්වා. මෙහෙම දුවද්දි මහලු මවක් ළිඳෙන් නෑමට සූදානම් වෙමින් සිට ඇයගෙන් උදව් ඉල්ලුවා.

"මේ මොන දෙයක්ද? මට නාකි මැහැල්ලන් නාවන්න වෙලාවක් නෑ..." කියූ මේ දුව එතනින් වහාම දිව ගියා.

තව ටික දුරක් යද්දි අව්වේ සිටි එළදෙන සෙවණකට යාමට උදව් ඉල්ලුවා...

"මට බෑ මට ඕවා කරන්න වෙලාවක් නෑ..." කියා කිවු ඇය එළදෙනට උදව් නොකර දිව ගියා.

ඔහොම දුවද්දි උස ගසක මුදුණේ රැඳුනු පුළුන් රොද දැක ගස මුල සිට ඒ දෙස බලා සිටියා.

"ළමයා මොකද ඔතන කරන්නේ....?"

රජතුමාගේ කටහඬ ඇසෙනකම් තමයි ඇය සිටියේ.

"රජතුමනි, මගේ පුළුන් ටික මේ ගස මුදුණේ රැඳිලා"

"හොඳයි මම පුළුන් ටික රැගෙන දෙන්නම්. ඔබ මගේ මාළිගාවට ගිහින් රසට කෑම හදන්න ඕන"

"හොඳයි රජතුමනි මම එසේ කරන්නම්"

මෙසේ කියූ ඒ ගම දුව මාළිගාවට ගිහින් කෑම සූදානම් කර රජතුමාට පිළිගැන්වූවා. ඒ කෑම කිසිම රසක් නෑ. වතුරෙන් හදලා වගේ... රජතුමා කටට ගෙන රස බැලුවා පමණයි. කෑම කෑවේ නෑ...

ඉන්පසු රජතුමා ගැහැනු ළමයාවත් රැගෙන පෙට්ටි පිරුණු ගබඩා කාමරයට ගියා.

"මේ තියෙන පෙට්ටිවලින් ඔබ කැමති එකක් තෝරාගන්න..."

රජු එසේ කියූ සැණින් ඇය එතන තිබුණු විශාලම පෙට්ටිය තෝරාගත්තා. එය ඇයට ඔසවාගෙන යාමට බැරි තරම් බරයි. ඇයගේ තෝරාගැනීම දෙස බැලූ රජතුමා සිනා සී මෙසේ කිව්වා...

"මෙය මගදී ලෙහා නොබලා ගෙදර ගොස්ම ලෙහා බලන්න... ඔබගේ පුළුන් රොදත් රැගෙන දැන් මෙතනින් යන්න"

ඒ ගම දුවට පුළුන් රොදක ඕන කමක් නෑ. ඇය අමාරුවෙන් පෙට්ටිය පමණක් ඔසවාගෙන ගෙදරට ආවා.

දුව ඔසවාගෙන ආ විශාල පෙට්ටිය දැක්කම අම්මටත් හරිම සතුටුයි. අම්මයි දුවයි පෙට්ටිය ගේ මැද්දෙ තැබුවා.

"මගේ දුව නංගිගෙ දුව වගේ නෙවෙයි. හරිම හපනියෙක්...."

මෙහෙම කිය කියා පෙට්ටිය ලිහුවා.... දන්නවද ඒ පෙට්ටියේ මොනවද තිබුණෙ කියා... පෙට්ටිය පුරවලා හිටියෙ සර්පයෝ.... නයි, පොළොංගු වගේ මහා විෂකුරු සර්පයෝ... පෙට්ටියෙන් එළියට ආපු සර්පයින් ගේ පුරා ඇදුනා... අන්තිමේ මේ අම්මටයි දුවටයි ඒ ගෙදරවත් ඉන්න බැරි වෙලා ගේ අතහැර යන්න සිදු වුණා. වැඩි තණ්හාව නිසා තිබුණු දේවලුත් නැති කර ගැනීමට ඔවුන්ට සිදුවුණා.

## ළමා ගී

### කලකට පෙර ඒ බෙත්ලෙහෙමේ

කලකට පෙර ඒ බෙත්ලෙහෙමේ
ශුද්ධ වූ නගරේ
ජේසු මෙලොවට බිහි වුණේ
පුංචි ගවමඩුවේ

උඳුවප් මාසේ සීතල දවසක - මැදියම් රෑ යාමේ
දෙව් මව් තුරුලේ උණුසුම ලබමින් - මේ ලෝකෙට ආවේ
සීත සුළං රැළි දසත හමද්දී - සැතපීලයි උන්නේ
දුප්පත් එඬේරු මේ බව දැනගෙන - ගවලෙන වෙත යන්නේ

මරියතුමියගේ පෙම්බර මුහුණේ - එළියක් දිස්වූයේ
ජුසේතුමා කිසිදාකත් නෑ දෙව් - අණකට පිටුපෑවේ
වටපිට රොක් වී උම්බෑ ගාමින් - හරකුන් කෑ ගසති
රජතුන් කට්ටුව බිළිඳු ළඟ වැටී - පඬුරු ඔප්පු කරති

මිනිස් සමාජය පාපෙන් බේරා ගන්නට මෙහි ආවා
දිවස්වරුන් බොහෝ කලකට පෙර කී දේ ඉන් ඉටු වූවා

ගායනය : ධර්මරත්න සහෝදරයෝ
පද රචනය : මිල්රෝයි ධර්මරත්න
සංගීතය : ධර්මරත්න සහෝදරයෝ



# ඒ තමා ප්‍රේම ලෝකේ සැමදා ජීවිතේ.... !

## අමතක නොවන මතක අතර සැමදා රැඳුනු සුන්දර ලීනා....

■ සාකච්ඡා කොට සටහන් කළේ
චමරි අබේසිංහ

**1947 ජනවාරි 21 වෙනි දින 'කඩවුණු පොරොන්දුව' චිත්‍රපටය ප්‍රදර්ශනය කරමින් ආරම්භ වූ සිංහල සිනමාව තව නොබෝ දිනකින් එහි 71 වෙනි ජන්ම දිනය සමරනු ලබයි. මේ සා දීර්ඝ වූ සිංහල සිනමා ගමන් මගේදී වරින් වර අප දුටු සොඳුරු මිනිසුන් කොතෙක්ද? ඒ අතරින් ඇතැමෙකු අප සිත් තුළ සදානුස්මරණීය වී සිටින්නේ කලින් කල වරින් වර ඔවුන් සිනමාව තුළ පෑ පෙළහර නිසාමය. සිනමාව අප රටට හඳුන්වා දුන් මුල්ම අවදියේ එනම් 1950 දශකයේ සිනමාවට පිවිස, 'කලාව දෙවියන්ගෙන් ලද සුවිශේෂී වරප්‍රසාදයක්' නම් එම වරප්‍රසාදය ඉහළින්ම ලැබීමට තරම් භාග්‍යවන්ත වූ ප්‍රවීණ රංගන ශිල්පිනියක වන ලීනා ද සිල්වා රූපසේන මහත්මියද එසේ අප මතකයෙන් කිසිදා අමතක නොවන ප්‍රතිභාපූර්ණ කලා කාරිනියකි. සිංහල සිනමාවේ දීර්ඝ ඉතිහාසය ඇසින් දුටු හා එය ස්පර්ශ කළ සිනමාවේදීන් අතර සිටින ජ්‍යෙෂ්ඨතම රංගන ශිල්පිනියක වන ලීනා ද සිල්වා මහත්මිය සොයා අප ගියේ ඒ සුන්දර අතීතය පිළිබඳ තතු තොරතුරු විමසා සිටීමටයි. සුපුරුදු ලෙන්ගතු සිනහවෙන් ඉතාමත් සුහදව අප පිළිගත් ඇය දෙස බලා සිටි මට සිහිවූයේ 'සුන්දරම කාන්තාව' තෝරන තරගයකට ඇය ඉදිරිපත් වුවහොත් එදා මෙන්ම අදත් එහි ජයග්‍රහණය නිසැකවම ඇයට හිමි වනු ඇති බවයි. ඒ නිසාම වියපත් නොවූ ඇයගේ රූ සපුව පිළිබඳව පළමුව නොවිමසා සිටීමට මට නොහැකි විය.**

**Q එදා වගේම අදටත් ඔබතුමිය සතු මේ ලස්සන පෙනුමේ රහස මොකක්ද?**

(සිනා සෙමින්) අයියෝ දරුවෝ.... එහෙම පෙනුම රැක ගන්න කියල විශේෂ දෙයක් නම් මම කරන්නෙ නෑ. කිසිම දෙයක් ගැන ඕනවට වඩා බරට නොගෙන සැහැල්ලුවෙන් සතුටින් සිටීම වෙන්න ඕන එහි රහස. ඇත්තටම මම මගේ දරු මුනුබුරන් සමග මේ ගෙවන ජීවිතය ගැන පුදුම විදියට තෘප්තිමත්. මගේ පුතයි දුවයි අද හොඳ ස්ථාවරයක සිටිනවා. ඔවුන්ගේ දරුවනුත් අද අධ්‍යාපන කටයුතු හොඳින් කරගනිමින් ඔවුන්ගේ ජීවිත සාර්ථක කර ගනිමින් සිටිනවා. ඒ හැමෝම මාව හරිම ආදරයෙන් රැක බලා ගන්නවා. ඉතිං මට මේවම ඇති නේද සතුටින් සිටීමට. කෙනෙක් සතුටින් සිටින විට රූපය ඉබේම පැහැපත් වෙනවා. ලස්සන වෙනවා. ඒ සත්‍ය මටත් එලෙසමයි. ඊට වඩා දෙයක් නෑ.

**Q ඔව්... එය සැබෑවක්... ඔබ දෙස බැලූ විට එය පැහැදිලියි. ඉතිං අපි චිත්‍රපට ලෝකය ගැන කතා කරමු. ගැහැනු ළමයින්ට තහංචි රැසක් පැනවී තිබූ කාලයක ඔබ චිත්‍රපට රඟපෑමට එක්වුණේ කොහොමද?**

ඒක ටිකක් දිග කතාවක්. මම චිත්‍රපටවලට එනකොට මට වයස අවුරුදු 16 යි. ඇත්තටම අපේ ගෙදර හැමෝම කලාවට කැමතියි. ඒත් මාව චිත්‍රපටවල රඟපාන්න යවන්න අදහසක් නම් මගේ ගෙදර අයට එදා තිබුනෙ නෑ. අපේ පප්පගෙ මම්මගෙ පවුල්වල ගොඩක් සහෝදර සහෝදරියන් ඉන්නවා. ඉතිං ඒ අයත් මම රඟපාන්න යනවට කැමැත්තක් පෙන්නුවෙ නෑ. නෑදෑයො කියන දේවල් ගැන ලංකාවෙ අය සැලකිලිමත් වෙනවනේ. අනිත් එක අපේ පවුල්වල අය චිත්‍රපට බලන්න, සිංදු අහන්න වගේ කලා වැඩවලට කැමති වුණාට කිසිම කෙනෙක් ප්‍රසිද්ධියේ ඒවට යොමුවෙලා හිටියෙත් නෑ. ඒත් මුලදි ඒ විදියට අකමැති වුණත් චිත්‍රපටවල රඟපානකොට හැමෝම මාව අගය කළා. මම රඟපාන හැම චිත්‍රපටයක්ම ඉස්සෙල්ලාම ප්‍රදර්ශනය වෙන දවසෙ චිත්‍රපට ශාලාවල බැල්කනි ආසන වැඩිපුරම වෙන්කර ගත්තෙ මගේ නෑදෑයො.

**Q ඉතිං ඔබ කිව්වෙ නෑනෙ රඟපෑමට ආව හැටි....**

එතකොට මම පාසල් යන ළමයෙක්. මම ඉස්කෝලෙ ගියේ කොළඹ ආනන්ද බාලිකාවට. පාසලේදී වසන්ත කුමාර්, පණීභාරත, ජයනාත් කියන ගුරුවරුන් යටතේ මම උඩරට නැටුම් ඉගෙන ගත්තා. ඊට අමතරව ශේෂා පළිහක්කාර ගුරුතුමන්ගෙන් භරත, මණිපුරි වගේ ඉන්දියන් නැටුම් ඉගෙන ගත්තා. මේ අතර තමයි එස්. එම්. නායගම් ගේ 'අහංකාර ස්ත්‍රිය' චිත්‍රපටයේ නැටුම් ජවනිකාවක 'ලංකා මාතාව' ලෙස රඟපෑමට මිස්ටර් ශේෂා මාව තෝරාගත්තෙ. ඇත්තටම ඒ චරිතයට මාව එකතු කරගන්න මගේ දෙමව්පියන්ගෙන් ඇවිත් ඇහුවෙත් මගේ නැටුම් ගුරුතුමා ශේෂාමයි. ඔහුට බෑ කීමට බැරි කමට මම්මයි පප්පයි කැමති වුණා. මම නම් හරිම ආශාවෙන් එහි රඟපෑවේ. මොකද ඒ වෙනකොට 'කැළෑහඳ' චිත්‍රපටයට රුක්මණී දේවිය කළ රංගනය දැකලා රඟපාන්න ඒමට ලොකු ඕනකමක් ආශාවක් මටත් තිබුණා. මගේ මේ ලංකා මාතා නර්තනයෙන් පස්සෙ ඒ ආශාව තවත් වැඩි වුණා. ඒක පිස්සුවක් වගේ වුණා. ඒත් ඉතිං අපේ ඉස්කෝලෙ තිබුණු තද නීති රීති එක්ක අපේ පප්පලගෙන් ඒ දේවල්වලට ඉඩක් ලැබුණෙ නෑ.

**Q ඔබට ඒ කාලෙ රුක්මණී දේවියව හමුවෙලා තිබුණද?**

නෑ... ඒත් ඇයව හැබැහින් දකින්න කතා කරන්න පුදුම කැමැත්තකින් මම හිටියෙ. මම මේ ගැන මගේ පප්පටයි මම්මටයි කිව්වම අපේ ඥාතියෙක් සමග රුක්මණී දේවියගේ මීගමුවේ නිවසට යාමට අවස්ථාව මට ලැබුණා. මට ඒ දවස අද වගේ මතකයි. රුක්මණී දේවිය සහ එඩී ජයමාන්න දෙදෙනාම එදා ගෙදර හිටියා. පුදුම ලස්සනක් රුක්මණීට තිබුණේ. ඉටිරූපයක් වගේ. ඇයව දැක්කම දෙවඟනක් දැක්ක වගේ මට දැනුණෙ. ගතිගුණත් ඒ වගේමයි. හරිම නිහතමානියි. අපිත් එක්ක ටිකක් වෙලා කතා කර කර ඉඳල මගෙන් ඇහුවා, ඔයා ෆිල්ම්ස්වලට කැමතිද කියල. මම ගත් කටටම, ඔව් මම හරිම කැමතියි. කැළෑහඳ චිත්‍රපටයත් බැලුවා කියල කිව්වා. ඊට පස්සෙ ඔවුන්ගේ ඉල්ලීමට මම කැළෑහඳේ තියෙන 'දෙවා ගිනි මවා දුක්' කියන සිංදුව කිව්වා. ඒ වෙලාවෙ රුක්මණී මට කිව්වා, ඔයා චිත්‍රපටවල රඟපාන්න කැමති නම් ගිහින් එඩීගෙ ලොකු අයියා බී.ඒ.ඩබ්ලිව් ජයමාන්න හමුවෙන්න. එයා 'දෛවයෝගය' කියල ෆිල්ම් එකක් කරනවා. ඔයාට ඒකෙ රඟපාන්න අවස්ථාවක් ලැබේවි කියලා. මට ඉතිං හිතාගන්න බැරි වුණා. මගේ හීනය වෙලා තිබුණෙත් ඒකනෙ.

**Q ඒත් ඔබ දෛවයෝගයෙ හිටිය බවක් අපට මතක නෑ...**

ඉන්නෙ කොහොමද? ඒ කිව්ව විදියට ඒ චිත්‍රපටය ඒ කාලෙ කෙරුණෙ නෑනෙ. කොහොම වුණත් මම රුක්මණී කිව්ව විදියට බී.ඒ.ඩබ්ලිව් ජයමාන්න හමුවුණා. ඔහු මාව ඉන්ටර්වීව් කරලා දෛවයෝගය චිත්‍රපටයට තෝරා ගත්තා. ඒ වෙලාවෙ මට මතකයි සේනාධීර කුරුප්පුත් ඒ චිත්‍රපටයේ රඟපාන්න තෝරාගෙන හිටියා. ඒත් ඒ නිෂ්පාදන කණ්ඩායම් අතර මතභේදයක් නිසා නියමිත කාලෙදි ඒ චිත්‍රපටය නිෂ්පාදනය වුණේ නෑ. ඊට අවුරුදු ගානකට පස්සෙ ඒක කෙරුණත් මම එහි රඟපෑවෙ නෑ.

**Q චිත්‍රපටයක රඟපාන්න ආශාවෙන් හිටිය කෙනෙකුට සිද්ධ වුණු ලොකු මගහැරීමක් නේද එය....**

ඇත්තටම ඔව්.... ඊටත් වඩා දුක හිතෙන මගහැරීමක් මට වුණා. ඒ මිස්ටර් ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ රේඛාවේ රඟපෑමට ලැබුණු අවස්ථාව අවාසනාවන්ත ලෙස මගෙන් අත හැරුණු එක. රේඛාවේ චරිතයකට මාව සම්බන්ධ කරගන්න ශේෂා පළිහක්කාර අපේ ගෙදර ඇවිත් මගේ පප්පගෙන් අවසර ඉල්ලුවා. ඒත් පප්පා කැමති වුණේ නෑ. ඒ වෙනකොට මම අහංකාර ස්ත්‍රිය එකේ නැටුම් ජවනිකාවට හිටපු පින්තූරයක් දිනමිණ පත්තරයේ සිනමා අතිරේකයේ පළවෙලා තිබුණා. මේක අපේ ඉස්කෝලෙ ප්‍රින්සිපල් දැකලා පප්පව ඉස්කෝලෙට ගෙන්නලා ඉස්කෝලෙ යන ළමයෙක් චිත්‍රපටවලට යැවීම ගැන හොඳටම දොස් කියල තිබුණා. චිත්‍රපටවල රඟපෑමට යෑම ගැන ගෙදරින් ලොකු විරෝධයක් නොතිබුණත් පාසලෙන් ආව බලපෑම නිසා පප්පා ඉඩ දුන්නෙ නෑ මට 'රේඛාව' රඟපාන්න යන්න. එයා බය වෙන්න ඇති මාව ඉස්කෝලෙන් අස් කළොත් අධ්‍යාපනය කඩාකප්පල් වෙයි කියලා. ඇත්තටම ඒ අවස්ථාව නැති වුණ එක ගැන අදටත් මම පසුතැවෙනවා.

**Q මේ විදියට වෙද්දි චිත්‍රපටවලට යන ආශාවත් ටිකෙන් ටික අඩුවෙන්න ඇති නේද?**

අපෝ නෑ... ඒ ආශාව තව තවත් වැඩිවුණා. ඉස්කෝලෙදිත් අනිත් ළමයි ඉස්සරහ මම එක එක දේවල් රඟපාල පෙන්නුවා. ඒ වගේ පුංචි වයසකදි යම් දේකට ආශාවක් ඇති වුණාම ඒක ලේසියෙන් ඔළුවෙන් යන්නෙ නෑනෙ. එහෙම ඉද්දි තමයි සිරිල් පී. අබේරත්න, විල්ෆ්‍රඩ් සිල්වා හා රවීන්ද්‍ර රූපසේන අපේ ගෙදර ආවෙ.

මිස්ටර් ශේෂා පළිහක්කාරගේම රෙකමන්ඩ් කිරීමකට ඔවුන් එදා ආවෙ 'සුරතලී' චිත්‍රපටයේ ප්‍රධාන චරිතයට මාව සම්බන්ධ කර ගන්නයි. එදා නම් කොහොමහරි ඒ අය මගේ පප්පගෙන් කැමැත්ත අරගෙන මාව සුරතලී චිත්‍රපටයේ ප්‍රධාන චරිතයට තෝරාගත්තා.





**Q එතකොට ඔබේ පාසල් ගමන...**

ඉස්කෝලෙ ගමන එතනින් නැවතුණා. පුංචි නැටුමකට ඉඳල අච්චර දොස් ඇහුව නම් මේ වගේ ලොකු චරිතයකට ඉඳල ඉස්කෝලෙ ගියොත් මොනවා වෙයිද කියන බයත් හිතේ තිබුණ නිසා ආයෙ ඉස්කෝලෙ යන්න හිතුවෙ නෑ. අනික චිත්‍රපටයෙ වැඩවලට ඉන්දියාවට ගිය නිසා පාසල් යාමට ලැබුණෙත් නෑ. ඇත්තටම 1954 අහංකාර ස්ත්‍රිය එකේ නැටුම් ජවනිකාවකට විතරමනෙ මම පෙනී සිටියෙ. ඒ නිසා මම පළමුවෙන්ම රඟපාපු චිත්‍රපටය විදියට හඳුන්වන්න පුළුවන් වෙන්නෙ 1956 තිරගත වුණු සුරතලී චිත්‍රපටයයි. ඒ චිත්‍රපටය හරිම ජනප්‍රිය වුණා. ඇත්තටම Best commercial film වෙන තරමට ඒක මිනිස්සු අතරට ගියා.

**Q ඒ කාලෙ හරිම සුන්දර ඇති. විශේෂයෙන්ම ඔබගේ සැමියා රවීන්ද්‍ර රූපසේන මුණගැසීමත් ඒකෙදි සිදුවුණානෙ....**

ඇත්තටම සුන්දරයි. ඒ චිත්‍රපටය ඉන්දියාවේ රූපගත කිරීම් කළේ. රවීන්ද්‍ර ඒ වෙනකොට 'අහංකාර ස්ත්‍රිය' චිත්‍රපටයෙ රඟපාල තිබුණ නිසා එයා සිනමාවට ආගන්තුකයෙක් නෙවෙයි. මුලදි රවීන්ද්‍ර ගැන මට එහෙම විශේෂත්වයක් තිබුණෙ නෑ. රූපගත කිරීම් අතරතුර ඉන්දියාවෙදි මට ටිකක් තදට අසනීප වුණා. මගෙ මම්මත් මාත් එක්ක ඉන්දියාවෙ ගිහින් හිටියා. ඒත් නොදන්නා රටකදි තදබල විදියට අසනීප වෙනකොට අපි අසරණ වෙනවනෙ. ඒ වෙලාවෙදි රවීන්ද්‍ර අපිට හරියට උදව් කළා. එතනදි මට එයා ගැන ලොකු පැහැදීමක් ඇති වුණා. ඒ පැහැදීම ආදරයක් බවට හැරිලා එය විවාහය දක්වාම ගෙන යෑමට අපි වාසනාවන්ත වුණා.

**Q ඒ කාලෙ චිත්‍රපට ලැයිස්තුව බැලුවම ඔබ දෙදෙනා එකට රඟ පෑ චිත්‍රපට කීපයක්ම තියෙනවා. එක් අයෙකුව ගත් විට අනිත් කෙනාවත් ගත යුතුයි කියන ඉල්ලීමටද එහෙම වුණේ...**

නෑ... ඒක ඒ චිත්‍රපටවල අධ්‍යක්ෂකවරුන්ගේ කැමැත්ත. ඒ කාලෙ රවීන්ද්‍ර - ලීනා යුගයක් බිහිවෙලා තිබුණා. හැම කාලෙකම එහෙම යුග තිබුණානෙ. සුරතලී චිත්‍රපටයෙන් පස්සෙ මාත් රවීන්ද්‍රත් චිත්‍රපට කීපයකම එකට ප්‍රධාන චරිත රඟපෑවා. සුනීතා, සොහොයුරෝ, සුන්දර බිරිඳ, නළඟන වගේ හුඟක් චිත්‍රපටවල අපි දෙන්නා එකට රඟපෑව. මම ඒ මුල් කාලෙදි චිත්‍රපට 11 ක රඟපාල තියෙනවා.

**Q විවාහයෙන් පස්සෙ ඔබ සිනමාවෙන් සමුගත්තද?**

නෑ.... විවාහයෙන් පස්සෙත් චිත්‍රපට 4 ක් පමණ මම රඟපෑවා. දිගටම රවීන්ද්‍රයි මායි එකටමයි චිත්‍රපටවල හිටියෙ. 'රන්රස' කියන චිත්‍රපටය පමණයි මම රවීන්ද්‍ර නැතුව රඟපෑවෙ. ඒත් ඒ චිත්‍රපටයේදී ඇතිවූ සිදුවීමක් නිසා මට කළකිරීමක් ඇති වුණා. මම ඊට පස්සෙ චිත්‍රපටවල රඟපෑවෙ නෑ. රවීන්ද්‍රත් ටිකෙන් ටික සිනමාවෙන් ඉවත් වුණා.

**Q එය ඔබ දෙපළට මෙන්ම සිනමාවටත් සිදුවූ පාඩුවක් නේද?**

ඔව්... ඒක ඇත්ත. ඒත් ජීවිතය කියන්නෙ සල්ලි, ජනප්‍රියත්වය පසුපස යන එක නොවෙයිනෙ. අපි දෙන්නටම ඒ හැම දේටම වඩා අපේ පවුල් ජීවිතය වටිනා බව තේරුණා. දරුවන් ලැබුණට පස්සෙ අපට ලැබෙන හැම චරිතයම කරන්නත් බෑනෙ. අපිට ආර්ථික අපහසුතා එහෙමටම තිබුණෙත් නෑ. රවීන්ද්‍රට රැකියාවක් තිබුණා. එයා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ සැලසුම් නිර්මාණ ශිල්පියෙක් විදියට වැඩ කළා.

**Q ඒත් පසු කලෙක ඔබ නැවතත් චිත්‍රපට රංගනයට එකතු වුණා....?**

ඔව්... මගේ මහත්තය රූපගේ හදිසි වියෝවෙන් පස්සෙ මම ආයෙමත් රඟපාන්න ආවා.... 1978 දී හදිසියේම ඇතිවුණ හෘදයාබාධයක් නිසා රූපා අපිව තනි කරල ගියා. එතකොට මගේ දරුවො දෙන්න පාසල් යනවා. එයා නැතිවෙනකොට අපිට ගෙයක්, වාහනයක් තිබුණා. රූපගේ පෙන්ෂන් එකත් ලැබුණා. ඒත් දරුවන්ගෙ වැඩත් කරගෙන තියෙන දේවල් නඩත්තු කරන්න ඒ ආදායම ප්‍රමාණවත් නොවන බව මට දැනිලා තිබුණෙ. ඒ දේවල් ගැන හිත හිතා ඉන්නකොට තමයි මට ආයෙමත් සිනමාවට එන්න කියන ආරාධනාව ආවෙ....

**Q ඔබ එය බලා සිටි අවස්ථාවක්ද?**

චිත්‍රපටවලට එනවාම කියල බලා සිටියා නොවෙයි. ඒත් දෙවැනි වරට සිනමාවට එන්න කියල ලැබුණු පළමු ආරාධනාව අත අරින්න මට හිතුණෙ නෑ. ලංකාවේ ප්‍රධානම චිත්‍රපට අධ්‍යක්ෂවරියක වන මිසිස් සුමිත්‍රා පීරිස් හා නිෂ්පාදිකාවක වන මිසිස් මිලිනා සුමතිපාල දෙදෙනා අපේ ගෙදරටම ඇවිත් 'ගඟ අද්දර' චිත්‍රපටයේ රඟපාන්න එන්න කියන ආරාධනාව මට කළා. අතීතයෙදි මිස්ටර් ලෙස්ටර් ජේම්ස් පීරිස් ජේඛාව රඟපාන්න එන්න කියල මට ඒක මගඇරුණු හැටිත් ඒ වෙලාවෙදි මට මතක් වුණා. ඉතිං මට ලැබුණු ඒ වටිනා අවස්ථාව ඒ වෙලාවෙ මම කැමැත්තෙන්ම භාර ගත්තා. ඒ වෙනකොට මම චිත්‍රපට ජීවිතයෙන් ඈත් වෙලා අවුරුදු 13 ක්. ඒ වුණත් රඟපෑමෙදි මට කිසිම දේක ආගන්තුක බවක් දැනුණෙ නෑ. ඊට පස්සෙ ලෙස්ටර්, සුමිත්‍රා අධ්‍යක්ෂකවරුන් යටතේ යහළු යෙහෙළි, අවරගිර, කලියුගය චිත්‍රපටවලත් ආරාධනා, යස ඉසුරු, සිරිමැදුර, මලට නොඑන බමරු, කිරි සුවඳ, පාරමිතා, කැළෑ මල්, සීමා පවුරු.... දැන් මට නම් වශයෙන් කියන්න මතක නෑ... කොහොමහරි කැනඩාවේ පදිංචියට එනතුරුම ගොඩක් චිත්‍රපටවල රඟපෑවා...

**Q ඔබ ටෙලි නාට්‍යවලත් රඟපෑව නේද?**

ඔව්... මම මෙහෙ ආවට පස්සෙ වරින් වර ලංකාවෙන් ආව ආරාධනා නිසා එහෙ ගිහින් ටෙලිනාට්‍ය කීපයක රඟපෑව. සුදු පරෙවියෝ, උදාගිර, හිමි අහිමි... තව කීපයක හිටියා මට නම් මතක නෑ.... අපේ සහෝදර ශිල්ප ශිල්පිනියන් කැනඩාවෙදී කරපු ටෙලිනාට්‍යවලටත් මම රංගනයෙන් දායක වෙලා තියෙනවා.

**Q අතරමැද අවුරුදු 13 ක වගේ කාලය හැර ජීවිතයේ වැඩි කාලයක් ඔබ රඟපෑමේ යෙදිල තියෙනවා. ඒත් ඔබගේ රඟපෑම් නිසි ඇගැයුමකට ලක් වුණේ නැද්ද කියල අපිට හිතෙනවා....**

ඔව් මම ක්ෂේත්‍රයේ රැඳිල හිටපු කාලයේදී චිත්‍රපටි හා ටෙලිනාට්‍ය 65 ක් විතර කරල තියෙනවා. ඒත් සිනමා උළෙලකදි කවදාවත් සම්මාන ලැබිලා නෑ. මෙහෙම දෙයක් තියෙනවානෙ.. ලංකාවේ ගොඩක් වෙලාවට ඇගයුම් කරන්නෙ සම්මාන දෙන්නෙ ප්‍රධාන චරිතවලට විතරයි. ඒත් ඒක එච්චර හොඳ දෙයක් නෙමෙයි කියල මට හිතෙනවා. ඒ වුණාත් එහෙම තමයි වෙන්නෙ. (සිනාසෙමින් ඇය පිළිතුරු දෙයි) මම චිත්‍රපටවලට ආව මුල්ම කාලෙ තමයි ප්‍රධාන චරිත රඟපෑවෙ. ඒත් ඒ කාලෙ අද වගේ සම්මාන උළෙලවල් ගොඩක් තිබුණෙ නෑ.... ලංකාදීප පත්තරෙන් කරපු දීපශිඛා සම්මාන උළෙල විතරයි තිබුණෙ. ඒකත් අවුරුදු පතා පවත්වපු සම්මාන උළෙලක් නෙවෙයි. ඒ විදියට අවුරුදු පතා සම්මාන පිරිනමන්න තරම් චිත්‍රපට ප්‍රමාණයකුත් ඒ කාලෙ නිෂ්පාදනය වුණේ නෑ. වසර කීපයක් කරපු චිත්‍රපට එකතු කරල තමයි සම්මාන දුන්නෙ. අනික මම මුල්ම යුගයේ වැඩි කාලයක් සිනමාවෙ හිටියෙත් නෑ. ඒ රඟපාපු කෙටි කාලෙදි පැවැත්වුව දීපශිඛා සම්මාන උළෙලේ හොඳම නිළියට හිමි සම්මානය හිමි වුණේ රුක්මණී දේවියට. ඒත් සිනමා විචාරකයින් මම කළ රඟපෑම් අගය කරලා පත්තරවලට ලිව්වා.

**Q ඔබ රුක්මණී දේවි සමග චිත්‍රපට කීයක රඟපාල තියෙනවද?**

ඇත්තටම මේක ඇහුවොත් ඔබ පුදුම වෙයි. රුක්මණී දේවිත් මාත් එකම කාලයේදී රඟපෑම් කළත් ඇයත් මාත් එකට රඟපෑවෙ එකම එක චිත්‍රපටයක විතරයි. ඒ 'නළඟන' චිත්‍රපටියෙ. අපි දෙන්නට එහෙම එකට රඟපාන්න බැරි වුණේ වෙන හේතුවක් නිසා නොවෙයි. ඒ කාලෙ අපි දෙන්නම ප්‍රධාන චරිතවලටම තෝරගත්ත නිසයි. ඉතිං අධ්‍යක්ෂවරුන්ට අපි දෙන්නවම එකවර චිත්‍රපටවලට ගැනීම ප්‍රශ්නයක් වුණා. ඒත් මම කැමැත්තෙන් හිටියා ඇය සමග එකට රඟපෑමට. ඒක ඉෂ්ට වුණේ 'නළඟන' චිත්‍රපටියෙන්. මාත්, රුක්මණී දේවිත්, රවීන්ද්‍රත් ඒකෙ රඟපෑවා. ඒ චිත්‍රපටියේ මගේ රංගනය ගැන ඒ දවස්වල හරියට අගය කරමින් ලියවුණා. සිනමා සම්මාන උළෙලක් තිබුණා නම් වසරේ හොඳම රංගනයට හිමි සම්මානය ලීනාට ලැබිය යුතු බව ඒ චිත්‍රපටය ගැන ලියූ ප්‍රසිද්ධ චිත්‍රපට විචාරකයකු වුණු ජයවිලාල් විලේගොඩ කියල තිබුණා.

**Q ඔබ ඇසූ පිරූ බොහෝ තැන් සහිත අත්දැකීම් බහුල ඉතාමත් ප්‍රවීණ රංගන ශිල්පිනියක්. වර්තමානයේ ලංකාවේ සිනමාවේ සහ ටෙලිනාට්‍යවල සිටින තරුණ ළමයින් ගැන මොකද හිතෙන්නෙ....**

ටෙලි නාට්‍ය නම් මම බලන්නෙ නෑ... අලුත් චිත්‍රපට නම් ඉඳල හිටල මෙහාට ගෙන්නුවොත් බලන වෙලාවල් තියෙනවා. මම කාලයක් ජීවත් වුණේ ඒ දේවල් එක්කනෙ. ඉතිං ඒව බලද්දි ඒවයෙ තියෙන ඇද කුද මට පේනවා වැඩියි. ඒව දකිද්දි ක්ෂේත්‍රයට තියෙන ආදරය නිසා මගේ හිත රිදෙනවා. ඇයි මම ඒ වගේ දේවල් බලල ඒ වගේ අනවශ්‍ය හිත් රිදවීම් කර ගන්නෙ. ඒ වගේම මම දැන් ඒ හැම දේකින්ම ඈත්වෙලා ඉන්න එකේ නැවත නැවත ඒවා බලන්න ඕන නෑ කියලත් මට හිතෙනවා. අලුත් ටෙලි නාට්‍ය එහෙම නොබලන නිසාම මේ අලුත් අය ගැනත් මම දන්නෙ නෑ.... නොදන්න අය ගැන නොදන්න දේවල් කතා කිරීම හොඳ දෙයකුත් නෙවෙයි.... ඇත්තටම මම එහෙම කතා කරන්න කැමතිත් නෑ. එක්කෙනෙක් හොඳයි අනිත් කෙනා නරකයි කියමින් හිත් රිදවන්න හොඳ නෑ. මේ ක්ෂේත්‍රයට එන කවුරුත් මතක තියාගත යුතුම දේ තමයි ක්ෂේත්‍රයේ ගරුත්වය රැකගෙන තමන් කරන කාර්යය උපරිම කැපවීමෙන් දක්ෂ විදියට කිරීම. එහෙම කරන අයට ක්ෂේත්‍රය තුළ නමක් තබාගෙන රැඳී සිටීම ප්‍රශ්නයක් වෙන්නෙ නෑ. අලුතින් එන තරුණ ළමයි එය සිහියේ තබාගත්තොත් ඔවුන් සාර්ථක වේවි. නම් වශයෙන් කියන්න දන්නෙ නැති වුණත් මම දන්නවා බොහොම දක්ෂතා තියෙන තරුණ පිරිසක් අද කලාව තුළ ඉන්න බව.

**Q ක්ෂේත්‍රයෙන් ඈත් වෙන්න වුණ එක ගැන ඔබ දුකෙන්ද කතා කරන්නෙ....**

නෑ... කොහෙත්ම නෑ.. මම සිනමාවේ හිටිය කාලෙදි හොඳ අධ්‍යක්ෂවරුන් යටතේ හොඳ චරිත රඟපෑවා. ඒ ගත කරපු කාලයෙදි මම හරිම සතුටින් කැපවීමෙන් ඒ දේවල් කළා. මට පුළුවන් උපරිමයෙන් සිනමාව වෙනුවෙන් සේවයක් කළ බව මට විශ්වාසයි. ඉතිං දැන් ක්ෂේත්‍රයේ ඉන්න බැරි වුණා කියල විශේෂ දුකක් මට නෑ. ආයෙමත් මට ඒ අතීතයට යන්නත් බෑ. ඒ වගේම අතීතයේ මම රඟපාපු චරිත වර්තමානයේදී හෝ අනාගතයේදී මට කරන්නත් බෑ. මේ සත්‍ය තේරුම් ගත්ත කෙනෙක් හැටියට මට එහෙම දුකක් දැනෙන්නෙ නෑ.

**Q ඔබ විවාහය සහ දරුවන් නිසා පළමු වරට සිනමාවෙන් සමුගත්තා. දෙවෙනි වරට දරුවන් නිසා සිනමාවෙන් වගේම රටෙනුත් සමුගත්තා.... කැනඩාවේ ගෙවෙන මේ ජීවිතය තෘප්තිමත්ද?**

අපොයි ඔව්.... මෙහෙ ගෙවන ජීවිතය විතරක් නෙවෙයි මෙතෙක් කල් මම ගත කරපු ජීවිත කාලයම ගැන මම හරිම තෘප්තිමත්. ඒ ඒ කාලවලට කළ යුතු දේවල් නිවැරදි විදියට කළා කියන සතුට මට තියෙනවා. මම දැන් කැනඩාවට ඇවිත් අවුරුදු 27 ක් වෙනවා. මගේ දරුවෝ, ඒ අයගෙ දරුවෝ එක්ක මම හරිම සතුටින් ඉන්නෙ. දරුවෝ ළඟ සිටීම තරම් අම්ම කෙනෙකුට තවත් දෙයක් කොයින්ද නේද? ඇත්තටම මම කැනඩාවට ආවෙ මගේ දරුවො නිසාමයි. මගේ පුතා බිමල් තමයි මුලින්ම ආවෙ. එයා එතකොට විවාහ වෙලා නෑ. ඊට පස්සෙ එයාට තනියම ඉන්න බෑ කිව්ව නිසා මායි මගේ දුවයි ආවා. කැනඩාවට ඇවිත් කෙටි කාලයකින් අපේ දුවගෙයි පුතාගෙයි විවාහ කටයුතු කරල දුන්නා. පවුලට එකතු වුණු දුවයි, පුතයිත් මට මගේම දරුවො වගේ ආදරෙයි. මම දැන් ලොකු මුනුබුරන් 3 දෙනෙකුයි මිනිබිරියකුයි



**20 වන පිටුව බලන්න**

# දැනුම සමග කටට රසට



# මැන්ගෝ තිරමිසු - Mango Tiramisu

■ තිසරි ශිබා

ජීවිතේ බොහෝ සිදුවීම් සබන් බුබුළු මෙන් නැගි නැගී බිඳෙමින් බිඳි බිඳී විසිරෙමින් මතකය අලුත් කරන විට මගේ දෑසට නැගෙන කඳුළු බිී වළකාලීමට අපහසුය. බොහෝ විට මම, මම සමග කතා කරන්නේ එහෙයිනි. බොහෝ දුර ඈතක මා තනිවී ඇති බව පමණක් දනිමි. ඒ තනිය මකා ගැන්මට මගේ රෙසපි හා බැඳුනු අතීත කතා මා ඔබට පවසන්නේ එසේ මා තනිවම මා සමග කතා කරන විටකය. එය අකුරු සමග මුසු වී ඔබ වෙත මෙතෙක් පැමිණ ඇත. මගේ කතා දුක්බර යැයි ඇතමුන් මට කරන චෝදනා විටෙක අසත්‍යයක් නොවේ යැයි මටද හැඟෙන අතර ආදරණීයයන්ගෙන් ඈත් වී ගත කරන ජීවිතයත්, එය මග හරවා ගැනීමට ලියන මගේ අතීත කතාත් දුක්බර නොවන්නේ කෙසේදැයි මම ඔබෙන් අසමි. තවත් එවැනි දිනක් පසු කරන විට සෑදුනු 'මැන්ගෝ තිරමිසු' නිසා අතීතයේ අපූරු දිනක් මා මතකයට නැගුණි.

එකල මා සරසවියේ අවසන් වසරේ සිසුවියක්මි. ඒ 2004 වසරේ මුල බාගයයි. සරසවියේ අවසන් වසර නිසා නිරන්තරයෙන් ගමට යෑමට මට නොහැකි වූ අතර, මා එන පෙරමග බලා සිටින අම්මාට එය බොහෝ දුක්බර හේතුවක් වී තිබුණි. ඉන්පසු අම්මා කැලණිය සරසවිය ඉදිරියෙන් ගෙයක් කුළියට ගත්තේ මා නිසාය. අම්මාත් තාත්තාත් නගරෙට පැමිණීම මට ඉතා පහසුවක් වූ අතර එය මට වඩා මගේ සරසවි මිතුරියන්ගේ සතුටට හේතුවක් විය. එකල සරසවි මිතුරියෝ වැඩි දෙනෙක්ට මගේ නිවස ඔවුන්ගේ නිවස විය. මට වඩා ඔවුන් මගේ නිවැසියන් හා මිතුරු විය. සමීප විය. ලෙන්ගතු විය. ඔවුන් වෙනුවෙන් මගේ නිවසේ දොර නිරන්තරයෙන් විවර වී තිබුණි.

අම්මාගේ 50 වෙනි උපන්දිනය යෙදී තිබුනේ අම්මා ගම හැර දා අප වෙනුවෙන් නගරෙට පැමිණි අලුතමය. මට ඇයගේ උපන්දිනය ඉහළින් සැමරීමට අවැසි වූ නමුත් එකල මා අත මුදල් තිබුණේ නැත. මහපොල ශිෂත්වයට පින්සිදු වීමට ඉගෙන ගත් අපට තිබුණු බොහෝ අගහිඟකම් මග හරවා ගත්තේ සරසවියේ ඉගෙන ගන්නා කාලයේ කළ සුළු රැකියා කිහිපයක් නිසාය. ඒ මා ගෙදරින් මුදල් නොඉල්ලූ හෙයිනි.

එකල මම නිදහස් මාධ්‍යවේදිනියක් ලෙස ලේක්හවුස් ආයතනයට සේවය කළ නිසා ලියන ලිපි ගණනට සුළු මුදලක් ලැබුණි. මුදල් හිඟ වූ විට ලිපියක් දෙකක් ලියාගෙන ලේක් හවුස් ආයතනයට යන මා දෙස තම කණ්නාඩි කුට්ටම උඩින් බලන ප්‍රධාන කතුවරයා,

"මොකෝ මේ පැත්තෙ, උඹලත් දරුවො හරියට මෙරු වගේ. ආවෝ ගියෝ. මේ ඉන්නවා මේ නෑ" යැයි පවසන්නේය.

"හැමදාම එන්න බෑ. ලෙක්චර්ස් තියනවනෙ" මා පවසන්නේ බොරුවක් නොවන බව දන්නා ඔහු මම දුන් කිසිදු ලිපියක් කුණු කූඩයට නොදැමීමට තරම් කාරුණික විය. එවැනි ලිපියකට රුපියල් 250 පමණ මුදලක් එකළ අපට ගෙවනු ලැබුණි. ඉන් අමතරව ටියුශන් පන්ති දෙකක් පවත්වා අමතර මුදලක් ඉපයූ මම කිසිවිටෙක අම්මාට බරක් නොවීමට පරිස්සම් වුනෙමි.

කෙසේ හෝ එසේ පුවත්පතට ලිපි සපයා සහ ටියුශන් පන්තියේ ඉගැන්වීමෙන් මට ලැබුණු මුදලක් මා පරිස්සම් කර ගෙන තිබුණේ අම්මාගේ ළඟ එන උපන් දිනය හේතුවෙනි. මාස දෙකක් පමණ එසේ අමාරුවෙන් මා මුදල් එකතු කර ගත්තේ අමතර වියදම් සියල්ල කපා දැමීමෙන් පසුවය. මාස දෙකකට එකතු වූ මුදල විශාල මුදලක් නොවූවත් එය සුළුවෙන් උපන්දිනය සැමරීමට සෑහුණු අතර එය මා මුලින්ම පැවසුවේ මිතුරිය අයේශාටය. අප ඇයට සජී යැයි ඇමතුවෙමු.

"ෂා නියමයි නෙ. දාමු ලොකු පාටියක්"

"ලොකු පාර්ටි දාන්න බෑ. ඒත් අම්මව පුදුම කරන්න පුන්චි දෙයක් කරමු"

අම්මාගේ උපන්දිනය, සතියකට කලින් රහසිගතව සැලසුම් කළ අතර ඇයට සාරියක් මිල දී ගැනීමට දේශන අවසන් කර අප මුලු කිරිබත්ගොඩම ඇවිද ගියෙමු. අවසානයේ ඉතා අඩු මිලට ලස්සන සාරියක් මිල දී ගත් අතර එය සජීගේ බෝඩිමේ තිව්වේ නැත්නම් අම්මා දැන ගනීවී යැයි සැකයෙනි. උපන්දින කේක් එක මගේ අතින් සෑදීමට මට අවැසි වුවත් එකල මට එය බේක් කර ගැනීමට හැකියාවක් තිබුනේ නැත. සරසවිය අසල පිහිටි ස්වීට් හවුස් ආයතනයට අප ගිහින් අපේ අවශ්‍යතාවය පැවසූ අතර එහි මැනේජර්වරයා කාරුණික මහත්මයෙකු විය.

"අපි එහෙම පිටින් හදල දෙන ඒවා මෙච්චර කාලෙකට බේක් කරලා දීල නම් නැහැ. ඒත් මේ ළමයිගෙ අවශ්‍යතාවය කිව්වම බැහැ කියල කියන්නත් බැහැ. කමක් නෑ මම කරල දෙන්නම්"

ඔහුට මුව නොසෑහෙන්න ස්තූති කළ අප දෙදෙනා කේක් එක සෑදීමට අවැසි කලමනා මිල දී ගත් අතර දේශන නැති අතර කේක් බැටර් එක සාදා ගත්තේ බණ්ඩාරනායක නේවාසිකාගාරයේදීය. එය බේක් කරගත් මම එයත් සජීගේ බෝඩිමේ අක්කාගේ ශීතකරණයේ සැඟවූවෙමි.

අම්මාගේ උපන්දිනයට හරියටම තිබුනේ දවස් දෙකක කාලයකි. ඉස්සර චූටි චම්මා නිතරම සාදන අඹ රසැති කේක් එක සෑදීමට මට අවැසි වුවත් එය සාදන්නේ කෙසේදැයි මා දැන සිටියේ නැත. අම්මා එයට අතිශයින්ම ආසා කළාය.

"අපි චම්මට කෝල් කරලා අහ ගනිමු" සජී පැවසුවාය.

"දැන් වෙලා නෑනෙ. හෙට විතරනෙ තියෙන්නෙ"

"ඉතින් දැන් කෝල් කරමු"

අප පාඩම් කිරීමටත්,කුප්පි දැමීමටත් (කණ්ඩායම් ගැසී පාඩම් කිරීම) සවස් යාමයේ සරසවියට යන අතර නැවත එන්නේ රෑ බෝ වූ පසුවය. සරසවි භූමිය එකල ඉතා ආරක්ශිත තැනක් වූ අතර පුස්තකාලය බොහෝ රෑ වූ පසුවත් විවෘත වී තිබුනේ විභාග සමයේදීය. රෑ දොලහ පසු වී හෝරා දෙක තුනක් ගෙවී තිබුණත් තවමත් පාඩම් කරන සගයන් කිහිපදෙනෙකු ළඟට ගොස් දෙකේ කාසි කිහිපයක් රැස් කර ගත් අතර එයත් රැගෙන අප පුස්තකාලය ඉදිරියේ ඇති දුරකතන කුටිය වෙත ගියේ කෙසේ හෝ චම්මා සතුව තිබු රෙසපිය දැන ගැනීමටය.

බොහෝ වේලාවක් දුරකතනය නාද වීමෙ පසුව නිදිමරගාතයේ පැමිණි චම්මාගේ කටහඬ ඉතා සිහින්ව ඇසුණි.

"චූ-ටි දූ ඇ-යි?"

"චම්මා පොඩි හදිස්සියක්"

නිදිමත ඇගේ කටහඬ එකපාරට වෙනස් වූ බව මට හැඟුණි.

"ඇයි පුතේ කරදරයක්ද? කවුරුත් හොඳින් නේද?"

"නෑ නෑ අර අඹ කේක් එක හදන්නෙ කොහොමද?" කිසිවක් නොපවසා ඇය ටික වේලාවක් සිටි අතර

"අනේ චූටි දෝණි මේ....." යැයි පවසමින් චම්මා දුරකථනය විසන්ධි කළාය. හරියටම වේලාව රාත්‍රී දෙකට ආසන්න වී තිබුණා මතකය. සජී තුනහතරට නැවෙමින් මහ හඬින් සිනාසුණු අතර වෙලාවට වටපිට වෙන කිසිවකු සිටියේ නැත. ඊට පසුදා චූටි චම්මාගෙන් මා අසා ගත් බැනුම් ඔබට නොකියමි.

කෙසේ හෝ ඉතා අපහසුවෙන් සියල්ල සකසා ගත් පසු මගේ සරසවි මිතුරියන් කිහිපදෙනෙකු වන රසී, තිළිණි, ආත්මා, එරන්දි. ශාදී, නවමලීට මා උපන්දින උත්සවයට ආරාධනා කළ අතර ඒ පසුපස සජී නිරතුරුව මා සමග සිටියාය. එයින් බොහෝ දෙනෙකු ඊට පෙර දින අප නිවසේ නැවතුන අතර ඔවුන්ගේ පැමිණීමේ හේතුව රහසක් ලෙස තියා ගතිමු. නිරන්තරයෙන් අප නිවසේ නවතින ඔවුන් ගැන අම්මා තුළ තිබුනේ අසීමිත ආදරයකි. එදින මට නිදි නැති රැයක් විය. කවුරුත් නින්දට ගිය පසු මහ රෑ නැගිට ගත් මා කුස්සියට ගියේ පාන්දර වන විට අම්මා පුදුම කරනු වස් රසැති උපන්දින කෑම මේසයක් සකසනු වස්ය. උදෑසන වන විට මම විශාල කෑම මේසයක් සකසා අවසන් කළ අතර කිරිටොෆි සහ පොල්ටොෆිත්, කිරිබත්, කට්ට සම්බල්, බැදුම් සහ කට්ලට් සෑදුවේ මා තනිවමය. කඩෙන් ගෙනා බිස්කට්, මාශ්මෙලෝස් සහ කෙසෙල්ද මේසයට තැබූ අතර අවසානයේ බේක් කර ගත් කේක් එක අම්මා කැමතිම පළතුර වන ඉදුනු අඹවලින් සැරසුවෙමි. පාන්දර 6 වනවිට අපූරු කෑම මේසයක් අම්මාට සුබ උපන්දිනයකැයි කීමට සැරසී තිබුණි.

දෑස විසල් කරගෙන මා දෙසත්, කෑම මේසය දෙසත් බලා සිටි අම්මාගේ දෑසින් වැටුණු කඳුළු බිඳුත්, එය ඇයට ලැබුනු හොඳම උපන්දිනය බවත් පැවසූ අම්මා මා තරයේ වැළඳ ගත්තීය. එදා මට දැනුණු ඇගේ සුවඳ විඳ ගැනීමට අද මට බොහෝ කාලයක් බලා සිටීමට සිදුව ඇත. ඇයගේ කටහඬ ඇසෙන තෙක් මට දුරකථනය දෙස බලා සිටීමට සිදුව ඇත. මා ඈ නැතිව අද බොහෝ ඈතක තනිව ඇත.

## මැන්ගෝ තිරමිසු හදමු

### අවශ්‍ය දේ

- ලේඩිෆින්ගර් බිස්කට් පැකට් 1
- ෆිලඩෙල්ෆියා ක්‍රීම් චීස් කප් 1
- හොඳින් ඉදුනු අඹ ගෙඩි 3
- දෙහි ගෙඩියක යුෂ
- අයිසින් ෂුගර් මේස හැඳි 4
- විපින් ක්‍රීම් පැකට් 1 ( 500 මිලි ලීටර් )
- ඔරේන්ජ් ගෙඩි 3-4 ක යුෂ
- වැනිලා තේ හැඳි 1

### සාදා ගන්නා ආකාරය

බාජනයක් අරගෙන ඔරේන්ජ් සහ දෙහි යුෂ එකට මිශ්‍ර කරගන්න. පැත්තකින් තියන්න. තවත් බාජනයක් ගෙන ක්‍රීම් චීස්, අයිසින් ෂුගර් සහ වැනිලා එකට දමා බීට් කර ගන්න. තවත් බාජනයකට විපින් ක්‍රීම් දමා බීට් කරන්න. දැන් බීට් කරගත් විපින් ක්‍රීම් බාජනයට, කලින් බීට් කරගත් ක්‍රීම් චීස් එක දමා හැන්දකින් මික්ස් කර ගන්න. වීදුරු බෝල් එකක් අරගෙන තියාගන්න. ලේඩිෆින්ගර් එකින් එක අරගෙන ඔරේන්ජ් යුෂවල ඩිප් කර ගෙන වීදුරු බෝල් එකේ යට තට්ටුවක් ලෙස අතුරා ගන්න. අඹ සිහින් තීරු කපා ගෙන ලේඩිෆින්ගර්ස් උඩින් අතුරන්න. විපින් සහ ක්‍රීම් චීස් මිශ්‍රණය ඊටත් උඩින් දමා තුනී කර ගන්න. නැවතත් ඔරේන්ජ් යුෂවල පොඟවා ගත් ලේඩිෆින්ගර් බිස්කට් එක අතුරන්න. ඊට උඩින් අඹ, ඊටත් උඩින් චීස් ලේයර් එක. දැන් ශීතකරණයේ අඩුම තරමින් පැය 6 ක් වත් තියලා පිළිගන්වන්න. ඉක්මනින් හදා ගන්න පුලුවන් ඩෙසට් එකක්.

**Shikifood**
thisu.shika@gmail.com




TB
TISSA BOYAGODA, LLM
KNOW YOUR RIGHTS
TISSA BOYAGODA, LLM
Barrister, Solicitor & Notary Public
Former Staff Lawyer in Criminal and Family Law
with Manitoba Legal Aid, Former Judge, Sri lanka
Areas of Practice
Criminal Law
Family Law
Real Estate
Immigration Matters
Civil Litigation
Small Claim Court Matters
Power of Attorneys
Last Wills
Notarizations
GET ALL YOUR LEGAL QUESTIONS ANSWERED
1965 Britannia Road West, Suite 208
Mississauga, ON, L5M 4Y4
100 Consilium Place, Suite 200
Scarborough, ON, M1H 3E3
TEL: 416.627.6090
FAX: 289.997.3426
EMAIL: tboyagoda@gmail.com
www.tissaboyagodalaw.com


විඩාබර සිත නිවා පහන්වෙනු පිණිස...
දෙසැම්බර්
8
රාත්‍රී 7:30ට
MAJA PRENTICE THEATRE
Mississauga
USA CONCERT
Novemebr 18, 2017
First United Methodist Church
Ypsilante, Michigan, USA
සජීවී වාද්‍ය වෘන්දය
රමණීය නර්තන
සමග
ආරාධිත ඉන්දීය ගායන ශිල්පිණී
Mohua Parial ගේ සහභාගීත්වයෙන්
TICKETS
$25
$40 Reserved (Limited)
West End Temple (905) 891 8412
Asoka / Brampton (647) 286 6925
Sarath / Scarborough (647) 342 7651
Ananda / Hamilton (605) 304 4552
www.sathsara.com
www.facebook.com/Sathsara-264496077058451
GADFLYART '17
සත්සර
2017
මියුරු සර මියැසි සැරිසර
ඔන්ටාරියෝ කලාපයේ ආණ්ඩුකාරවරිය
Hon. Elizabeth Dowdeswell වෙතින්
ගෞරව සම්මානයෙන් පුද ලද
සරත් කුමාරසිංහ
සංගීතවේදියානන්ගේ
ඒක පුද්ගල ගායන සහ වාදන ප්‍රසංගයේ
ශ්‍රව්‍ය දෘශ්‍ය අත්දැකීම



# නත්තල හා නත්තල් සංකේත

## ගැන දත් නොදත් තතු

මේ නත්තල් මාසයයි. යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සිහිපත් කරන නත්තල කිතුනු ආගමික උත්සවයක් වුවත් අද එය ආගම් බේදයකින් තොරව ලොව පුරා බොහෝ ජනයා විසින් සමරනු ලබන උත්සවයක් බවට පත්වී ඇත. දෙසැම්බර් මාසය ආරම්භ වීමත් සමගම මංමාවත්, නිවෙස්, කාර්යාල ආදි ස්ථාන නොයෙකුත් සැරසිලි හා විසිතුරු කිරීම්වලින් පිරී යන අතර වට පිටාව තුළ පවතින සිසිල් දේශගුණයද නත්තල් අසිරිය තවත් තීව්‍ර කර දේ. අද අපි ඔබට පවසන්නේ මේ අසිරිමත් නත්තල සහ නත්තල සැමරීමට යොදා ගන්නා සංකේත කීපයක් පිළිබඳ තොරතුරුයි.

### දෙසැම්බර් 25

අප කවුරුත් දන්නා පරිදි නත්තල යෙදී ඇත්තේ දෙසැම්බර් 25 වෙනිදාටය. ඒ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ උපත සිදුවූ දිනය බව පවසමිනි. එහෙත් ශුද්ධ වූ බයිබලයේ කොතැනකවත් කිතු උපත සිදුවූ දිනය එය බව සඳහන්ව නැත. පුරාණ රෝමන්වරුන් විසින් සෝල් හා මිත්‍රා නමැති හිරු දෙවිවරුන්ගේ උපන් දින සැමරූ දිනය දෙසැම්බර් 25 වෙනිදා ලෙස සඳහන්ව ඇති අතර එම උත්සවවලට රෝමන්වරුන්ගේ කෘෂිකර්මයට අධිපති සැටනේලියා දෙවියන්වත් සම්බන්ධ කර සැමරූ බව සඳහන් වේ. ක්‍රිස්තු වර්ෂ 350 දී පමණ මෙම උත්සවවලට ක්‍රිස්තියානි ආගමික මුහුණුවරක් ලැබී ඇති අතර එම වසරේදී පළමුවන ජූලියස් පාප් වහන්සේ විසින් දෙසැම්බර් 25 යේසුස් වහන්සේගේ උපන් දිනය ලෙස සඳහන් කොට හිරු දෙවිවරුන් පිදූ චාරිත්‍ර වාරිත්‍ර නත්තල් සිරිත් බවට පත් කර ඇත.

කිතු සමිඳුන්ගේ උපත පිළිබඳව මත ඉදිරිපත් කරන බොහෝදෙනෙකු පවසන්නේ යේසු බිළිඳාගේ උපත අගෝස්තු මස දිනකදී සිදුවන්නට ඇති බවයි. බයිබලයේ සඳහන් වන ආකාරයට යේසු උපත සිදුවූ රාත්‍රියේ එඬේරුන් බැටළුවන් බලා ගනිමින් එළිමහනේ සිට ඇත. සාමාන්‍යයෙන් දෙසැම්බර් අවසානයේදී බෙත්ලෙහෙම් ප්‍රදේශයට ශීත සෘතුව එළඹ හිම පතනය පවා සිදුවන අතර එවැනි කාලයකදී එළිමහනේ බැටළුවන් තබාගෙන සිටීම ඇදහිය නොහැකි දෙයක් බව මේ පිළිබඳව අදහස් දක්වන්නෝ පවසති.

### නත්තල් ගස

නත්තල සංකේතවත් කරන ප්‍රධානම අංගයක් ලෙස නත්තල් ගස සලකනු ලබයි. අද වන විට ආගමික බේදයකින් තොරව ලොකු කුඩා කවුරුත් තම නිවෙස් නත්තල් ගසකින් සරසනු ලබති.

කිතු උපතටත් පෙර සිටම ශීත සෘතුවේදී අලංකාර සදාහරිත ශාක තම නිවෙස් තුළට ගනිමින් ඒවා සැරසීම ජර්මානු වැසියන් විසින් සිදු කොට ඇත. මෙහිදී කිතු උපත සමරමින් නත්තල් ගස් සම්ප්‍රදායය ආරම්භ වී ඇත්තේද 16 වන ශත වර්ෂයේ මුල ජර්මනියේදී බව සඳහන් වේ. එකල නත්තල් සමය වෙනුවෙන් නිවෙස් තුළ කළ සැරසිලි අතර ලීවලින් තැනූ නත්තල් පිරමීඩවලට ප්‍රධාන තැනක් හිමිව ඇති අතර මෙම ලී පිරමීඩ තැනීම සඳහා දැව සොයාගැනීමට අපහසු පිරිස් කොළ පැහැති පිරමීඩාකාර ස්වභාවික ගස් සරසා ඉටිපන්දම්වලින් අලංකාර කොට නිවෙස් තුළ තබා ඇත.



පළමුවරට කේතුධර ශාකයක් යොදාගෙන විශාල නත්තල් ගසක් නිර්මාණය කර ඇත්තේ 1510 වසරේදීය. ඒ යුරෝපීය රටක් වන ලැට්වියාවෙහි (Latvia) රිගා (Riga) පළාතේය. එහි වෙළඳපොළක වෙළඳුන්ගේ අනුග්‍රාහකත්වයෙන් මේ අලංකාර නත්තල් ගස සකසා ප්‍රදර්ශනය කර ඇත. මෙම නත්තල් ගස කෘත්‍රිම රෝස මල්වලින් සරසා ඉටිපන්දම් දල්වා ඉතාමත් විසිතුරු කොට තිබී ඇත. වෙළඳපොළ මධ්‍යයේ ඉදිකෙරුණු නත්තල් ගස වටා වටිනා වස්ත්‍රවලින් සැරසුණු වෙළඳුන් ඇතුළු පිරිස් නර්තන දක්වා ඇති බවත් උත්සවය අවසානයේදී නත්තල් ගස ගිනි තබා විනාශ කර ඇති බවත් සඳහන් වේ. එතැන් පටන් නත්තල් ගස් සැරසීම සඳහා වසර ගණනාවක්ම රෝස මල් භාවිත කර ඇති අතර රෝස මල්වලින් කන්‍ය මරියතුමිය සංකේතවත් කර ඇතැයි පැවසේ. ඒ වගේම නත්තල් ගස් සැරසීම සඳහා මිදි, ඇපල් ආදි සැබෑ පළතුරුද රසකැවිලිද යොදාගෙන ඇති බව රටින් රට නත්තල් තොරතුරු පිරික්ෂා බැලීමේදී පෙනී යයි.

ස්වභාවික නත්තල් ගස මෙන්ම පළමුවන කෘත්‍රිම නත්තල් ගස පිළිබඳ තොරතුරද වාර්තා වන්නේ ජර්මනියෙනි. 19 වන සියවසේදී නිර්මාණය කෙරුණු මෙම කෘතිම ගස සඳහා කම්බි කොකුවල රැඳවූ මිය ගිය පාත්තයින්ගේ පිහාටු යොදාගෙන ඇත. මෙම පාත්ත පිහාටු කොළ පැහැයෙන් සායම් ගන්වා ඇති අතර නත්තල් සමයේදී නත්තල් ගස් සෑදීම සඳහා සයිප්‍රස් සහ ෆයින් ගස් කපමින් සිදුකරන වන විනාශය වැළැක්වීම අරමුණු කොට මෙම කෘත්‍රිම නත්තල් ගස් නිර්මාණය වී ඇත. එහෙත් ඇති තරම් පාත්ත පිහාටු සොයාගැනීමට නොහැකි වීම නිසා එය එතරම් සාර්ථක ක්‍රමයක් වී නොමැත.

සාමාන්‍යයෙන් මකුළු දැල් බහුලව ඇති ගෙයක් දකින විට අපට සිතෙන්නේ එය කම්මැලි මිනිසුන් සිටින හරිම මූසල ස්ථානයක් ලෙසයි. ඒත් පෝලන්ත වැසියන්ට එය එසේ නොවේ. පෝලන්ත ජාතිකයන් මකුළුවා සලකන්නේ සෞභාග්‍ය උදාකර දෙන සතෙකු ලෙසයි. ඔවුන්ගේ නත්තල් ගස් සැරසීමට කෘත්‍රිම මකුළුවන් සහ මකුළුදැල් යොදාගැනීමද සිදුකරන අතර යේසු බිළිඳු උපත පිළිබඳව එම රටෙහි පවතින ජනප්‍රවාදයකට අනුව මකුළුවාට කෘතගුණ දැක්වීම සඳහා එසේ සිදුකරනු ලබයි. එම ජන කතාවට අනුව යේසු උපත සිදුවූ විට කුඩා බිළිඳා උණුසුම් කිරීම සඳහා පොරෝනා වියා දී ඇත්තේ මකුළුවන්ය.

වර්තමානයේදී නොයෙකුත් ආකාරයේ කෘත්‍රිම නත්තල් ගස් හඳුන්වා දී තිබුණත් ඒ සියල්ල පරයා ස්වභාවික ශාක යොදාගෙන නත්තල් ගස් සැකසීමට බොහෝ දෙනා තවමත් ප්‍රිය කරති. නත්තල් සමය තුළ ඇමරිකාවේ ස්වභාවික නත්තල් ගස් මිලියන 30-35 ක් පමණ අලෙවි වන බව සඳහන් වේ. කැනඩාවෙහි ස්වභාවික නත්තල් ගස් අලෙවිය මිලියන 6 ක් පමණ වේ. ඉන්දියාවෙහි ෆයින් වැනි ශාක බහුලව දක්නට නොලැබෙන නිසා ඇතැම් ප්‍රාන්තවල නත්තල් ගස් සැකසීම සඳහා කෙසෙල් ගස් යොදාගන්නා බව සඳහන් වේ.

ආගමික උත්සවයක සංකේතයක් ලෙස යොදාගන්නා නත්තල් ගස ගිනස් පොතට ගිය අවස්ථා රාශියක් පිළිබඳවද විටින් විට වාර්තා වී ඇත.

2016 දෙසැම්බරයේදී ශ්‍රී ලංකාවේ ගෝල්ෆේස් පිටියේ සෑදූ නත්තල් ගස 'ලොව විශාලතම කෘත්‍රිම නත්තල් ගස' යන ප්‍රවර්ගය යටතේ මේ වන විට ගිනස් පොතට ඇතුළත් වී ඇත. එම ගසේ උස මීටර 72.1 ක් ලෙස වාර්තා වේ. ඊට පෙර එම වාර්තාවට හිමිකම් කියා ඇත්තේ 2015 දෙසැම්බරයේ චීනයේ ගුවන්ග්සූ හි ඉදි කළ මීටර 55 ක් උස (තරුවත් සමග මීටර 56 ක්) කෘත්‍රිම නත්තල් ගසයි.

බ්‍රසීලයේ රියෝ ද ජෙනේරෝ හි කලපුවක ඉදිකරනු ලැබූ මීටර 85 ක උසින් යුතු නත්තල් ගස ලොව විශාලතම පාවෙන නත්තල් ගස ලෙස ගිනස් වාර්තා පොතට එක් වී ඇත්තේ 2007 වසරේදීය. මේ නත්තල් ගස සැරසීම සඳහා විදුලි බුබුළු මිලියන 3 කට අධික සංඛ්‍යාවක් යොදාගෙන ඇත.

නත්තල් ගසක් සැරසීමේදී එක් එක් ආකාරයේ වූ අලංකාර නිර්මාණ ඊට යොදා ගනී. එතෙක් මෙතෙක් ලොව ඉදිකළ නත්තල් ගස් අතරින් වැඩිම වටිනාකමකින් යුත් නත්තල් ගසේ වාර්තාවට හිමිකම් කියන්නේ 2010 වසරේදී අබුඩාබි හි එමිරේට්ස් පැලස් හෝටලයේ ලොබියෙහි ඉදිකර තිබූ නත්තල් ගසයි. මේ නත්තල් ගසෙහි සැරසිලි සඳහා රත්රන් බහුලව යොදාගෙන තිබූ අතර දියමන්ති, මුතු, මරකත (emeralds), නිල්මැණික් වැනි වටිනා මාණික්‍ය 181 ක් ගසෙහි එල්ලා තිබුණි. මේ සියලු දේ ඇතුළත්ව තිබූ එම නත්තල් ගසෙහි වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 11 ක් ලෙස සඳහන් වේ.

ස්වභාවික සහ කෘත්‍රිම ගස් හා ආකෘති යොදාගෙන කළ නත්තල් ගස් අතර මිනිසුන් යොදාගෙන කළ නත්තල් ගස් පිළිබඳවත් වාර්තා වේ. 2015 දෙසැම්බර් මාසයේදී ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයේ චෙන්ගනර් ප්‍රදේශයේදී ප්‍රදර්ශනය කෙරුණු මෙම නත්තල් ගස සඳහා මිනිසුන් 4030 දෙනෙකු සහභාගි වී ඇති එය ගිනස් පොතේද ලියවී ඇත. එම නත්තල් ගසට පෙනී සිටි වැඩි පිරිසක් එම ගමෙහි පාසල් සිසුන් විය.

### නත්තල් සුභ පැතුම් පත්

නත්තල් කාලය ළං වෙත්ම නැතුවම බැරි අංගයකි නත්තල් සුභ පැතුම් පත්. නූතන තාක්ෂණයෙන් ලොවම එකට කැටි වී ඇති වර්තමානයේදී සුභ පැතීම් විවිධ සමාජ ජාල සහ විද්‍යුත් පණිවිඩ ආදි පහසු ක්‍රම මගින් හුවමාරු වුවත් අදටත් තැපෑලෙන් සුභ පැතුම් යැවීම ජනප්‍රිය අංගයක් වී ඇත.

ලොව පළමුවන නත්තල් සුභ පැතුම් පත 1843 දී එංගලන්ත ජාතික සිවිල් නිලධාරියකු වන ශ්‍රීමත් හෙන්රි කෝල් ඔහුගේ මිතුරකු වන ජෝන් හෝර්ලිගේ සහයෝගයෙන් නිර්මාණය කර ඇත. පසුව ඔවුන් විසින් අලෙවිය සඳහාද සුභ පැතුම් පත් නිර්මාණය කර ඇති අතර සුභපැතුම් පතක් සිලිමක් (shilling) වැනි සුළු මුදලකට විකුණා ඇත. (එකල මෙය විශාල මුදලකි)

නත්තල් පතක් සඳහා වියදම් කළ ඉහළම මිල වාර්තා වන්නේ 2001 වසරේදී එක්සත් රාජධානියෙනි. එංගලන්තයේ Wiltshire හි පැවති Devizes නමැති

22 වන පිටුව බලන්න




# ප්‍රබන්ධකරණය

■ සිරිසේන විතානගේ

ප්‍රබන්ධකරණය නම් අදාළ භාෂාවෙන් යමක් රචනා කිරීමේ ශක්තියයි. එය ඔහු විසින්ම ඇතිකර ගත යුත්තකි. සතතාභ්‍යාසයෙන්ම නැතහොත් වැඩි වැඩියෙන් නිතර නිතර රචනා ලිවීමෙන්ම ගොඩනගා ගත යුතු ශක්තියකි. අපට කළ හැක්කේ මූලික මග පෙන්වීමක් පමණකි. එබැවින් හැකි පමණ රචනා ලියමින් තම ප්‍රබන්ධ ශක්තිය වැඩිකර ගැනීම කළ යුතුමය. මුලදී ඔබේ ප්‍රබන්ධකරණ ශක්තිය දුර්වල යැයි ඔබට හැඟෙන්නට පුළුවන. එහෙත් සැලකිය යුතු ප්‍රබන්ධ (රචනා) සංඛ්‍යාවක් ලියන විට ඔබට ඔබ ගැනම ආඩම්බර විය හැකි තත්ත්වයක් උද්ගත වනු නිසැකය. ඔබ විසින්ම තෝරා ගනු ලබන මාතෘකා ඔස්සේ ඒ රචනා ලියන්න.

## අදහස්

ඕනෑම මාතෘකාවක් යටතේ ප්‍රබන්ධයක් (රචනයක්) ලිවීමේදී අවශ්‍ය මූලික අමුද්‍රව්‍ය එම මාතෘකාවට අදාළව ඔබ තුළ පහළ වන අදහස් බව අමුතුවෙන් කිව යුතු නැත. කරුණු විස්තර කරන්නට හෝ නිර්මාණයක් කරන්නට පළමුව ඔබේ මනසේ අදහස් ඉපදිය යුතුය. මෙසේ අදහස් පහළ වන්නට නම් ඔබ යම් යම් දේ කියවා, අසා, දැක තම සිත තුළ ඒවා ගබඩා කොට ගෙන සිටිය යුතුය. "වැඩි වැඩියෙන් කියවන්නා වැඩි වැඩියෙන් ලියයි" යනුවෙන් සුප්‍රකට චීන කියමනක් ඇත. මෙහි අදහස කියවන පුද්ගලයා තුළ අදහස් ගබඩා වන බවයි. මේ නිසා පොත්පත්, පුවත්පත්, සඟරාදියෙහි පළවන විවිධ කරුණු ඇතුළත් ලේඛන වැඩි වැඩියෙන් කියවිය යුතුය. කියවන අතරම ඒවා ලියවී ඇති පිළිවෙළ ගැනද සිතන්න. එසේම ඒ රචනා ඔබේ රචනා හැටියට නැවත ලිවීමට උත්සාහ ගන්න. 'නූතන ලෝකයේ සාමයට ඇති බාධක' යන මැයෙන් වූ ලිපියක් කියවී යයි සිතමු. එයින් ගත් අදහසුත් ඒ ඇසුරෙන් ඔබම උපදවා ගත් අදහසුත් එකතු කොට යළි ඔබේ ලිපිය ලියන්න. මෙවැනි රචනා සැලකිය යුතු ප්‍රමාණයක් ඔබ අතින් ලියැවුණ හොත් ඔබ දක්ෂ රචකයකු වනවා නිසැකය. "ඕවා කියෙව්වාට, ලිව්වාට මතක හිටින එකක්යැ" යනුවෙන් ඔබ පසුබස්වන විතර්කයක් ඔබ තුළ පහළ විය හැකිය. එහෙත් කියවන හැම දෙයක්ම මතකයේ නොසිටියද කියවූ දෙය ඔබේ යටි මනසෙහි තැන්පත්ව තිබී අවශ්‍ය අවස්ථාවන්හිදී මතු වී එන බව නම් සහතිකය.

## සිතීම

රචකයකුට අවශ්‍ය අනිත් ගුණාංගය නම් විවිධ පැතිවලට නැඹුරුව සිතීමට ඇති හැකියාවයි. ඔබට ලැබෙන මාතෘකාව ඔස්සේ විවිධ පැතිවලට නැඹුරුව සිතීමට ඔබ පුරුදු විය යුතුය. මාතෘකාව දුටු පමණින්ම මේ ගැන මට කිසිවක් ලිවිය නොහැකි යයි නොසිතා ඒ ඔස්සේ විවිධ දිශාවනට මනස යොමු කරන්න. ඒ උත්සාහයේදී මනසේ සැඟවී ඇති අදහස් මතු වී එනු ඇත.

## විමර්ශනය

ඉහත කී අන්දමට කියැවීමෙන්, සිතීමෙන් ලබාගන්නා අදහස් රචනයෙහි ලිවීමට පෙර ඔබ පොදු විමර්ශනයක යෙදිය යුතුයි. මේ අදහස මේ මාතෘකාවට යෝග්‍යයද? මීට වඩා හොඳ අදහස් මේ යටතේ ලිවිය නොහැකිද? ආදි ප්‍රශ්න ඔබ තුළම නගා ගැනීමෙන් මේ විමර්ශනය සිදු කළ යුතුය. සමහර විට ඔබට ආ අදහසක් එසැටියෙන්ම රචනයට ඇතුළත් කළ හොත් ඔබේ දුර්වලකම් හෙළිදරව් විය හැකිය. අප තුළ ඇති අදහස් ඇති සැටියෙන්ම කොළයක ලියූ පමණින් හොඳ රචනයක් බිහි නොවන බව කල්පනාවට ගත යුතුය.

ඇතැම් රචනාවල දක්නට ලැබෙන පොදු දුර්වලකමක් නම් කරුණු රාශියක් ඇතත්, රචනය පිටු ගණනක් පුරා ලියැවී ඇතත් බොහෝ අදහස් මාතෘකාව සමග නොගැළපීමයි. බොහෝ විට මෙය සිදුවන්නේ දෙන ලද මාතෘකාව හරිහැටි කියවා තේරුම් නොගෙන මාතෘකාව දුටු වහාම ලිවීමට යාමෙනි. ලියූ දේ වෙනුවට මෙවැනි දේ ලියුවා නම් හොඳ යයි කල්පනා වන්නේ පසුවය.

'වර්තමාන ඉන්දන අර්බුදය' යන මාතෘකාව ගනිමු. මේ මාතෘකාවෙන් බලාපොරොත්තු වන්නේ පොදුවේ ලෝකය හමුවේ ඇති ඉන්ධන ගැටලුව පිළිබඳ විවරණයකි. එහෙත් මැද පෙරදිග ඇති තෙල් ළිංවල ස්වභාවය ගැන, තෙල් ලබාගන්නා හා ශුද්ධ කරන ක්‍රම ගැන, තෙල් වෙළෙඳපොළට යැවෙන හැටි ගැන ආදි ඉන්ධන හැඳින්වීමේ සිට ඊට අදාළ ලොකු කුඩා සියලුම දෑ ලිවීම මාතෘකාවෙන් පිට පැනීමක් මෙන්ම කාලය අපතේ හැරීමක්ද වෙයි. ඔබ හොඳ විමර්ශනයක යෙදී යෝග්‍ය, අයෝග්‍ය, අවශ්‍ය, අනවශ්‍ය දෑ තේරුම් බේරුම් කරගෙන යෝග්‍ය, අවශ්‍ය හා අත්‍යවශ්‍ය දෑ පමණක් රචනයට ඇතුළත් කළේ නම් එය ඉතා හොඳ රචනයක් වන්නට ඉඩ ඇත.

## සංවිධානය

රචනයෙහිදී විමර්ශනය මෙන්ම සංවිධානයද ඉතා අවශ්‍යය. මෙයට 'අදහස් පෙළ ගැස්වීම' යයිද කිව හැකිය.

- මුලට කිව යුතු කරුණු
- ඊළඟට කිව යුතු කරුණු
- අවසානයට කිව යුතු කරුණු

වශයෙන් අදහස්වල හොඳ අනුපිළිවෙළක් ඇති කර ගැනීමට අදහස් පෙළ ගැස්වීම අවශ්‍ය වෙයි. මෙවැනි ගොනුවක් නැතිව, හිතට එන එන කරුණු ලිවීමෙන් හොඳ රචනයක් බිහි නොවෙයි. එය දුර්වල සටහනක් පමණක් වනු ඇත.

ඉහත කී අදහස් උපදවා ගැනීම, ඒ ඔස්සේ සිතීම, විමර්ශනය, සංවිධානය යන දක්ෂතා සැලකිය යුතු රචනා ප්‍රමාණයක් ලිවීමෙන්ම තමන් තුළ ඇතිකර ගත යුතු ගුණාංගයි. ඒ සඳහා මාතෘකාවක් යටතේ කරුණු රැස් කරන්න. රැස් කරගත් කරුණු යෝග්‍යද අයෝග්‍යදැයි යළි යළිත් සිතන්න. ඉන්පසු රචනය ලියන්න. යළි කියවා අඩුපාඩු වේ නම් සකස් කරන්න.

## සැලැස්ම

ප්‍රබන්ධකරණයේදී සැලැස්ම මෙය විය යුතු යයි උපදෙස් දිය නොහැකිය. එහි මුල මෙසේ පටන් ගත යුතුය. මේ අන්දමට කරුණු විස්තර කළ යුතුය. මේ ආකාරයෙන් නිම කළ යුතු යයි කිව නොහැකිය. එක එක්කෙනා අනුගමනය කරන රචනා විලාශය අනුවත් මාතෘකාවෙහි ස්වභාවය ආදිය අනුවත් එහි වෙනස්කම් ඇති වේ. එහෙත් රසවත් වූත් හරවත් වූත් රචනයකට හොඳ ආරම්භයක් තිබීම අවශ්‍යය. මේ ආරම්භක වැකි දෙක දෙස බලන්න.

- වර්තමාන ලෝකයට බලපා ඇති ප්‍රශ්න අතරින් ඉන්ධන ප්‍රශ්නය වැදගත් තැනක් ගැනී.
- අප මේ පසු වන්නේ ඉන්ධන රකුසා මුව විවර කොට ගෙන ලෝකය ගිල ගැනීමට මාන බලමින් පසුවන අවදියකය.

මින් දෙවන වැකියේ ආරම්භය සිත් ගන්නා සුලු එකක් බවත් රචනාවකට එවැනි ආරම්භයක් තිබීම වැදගත් බවත් කල්පනාවට ගත යුතුය. ආරම්භය මෙන්ම රචනයේ ඉදිරි විකාශනයත් අවුලින් තොරව ගලා යන අදාළ අදහස් හා අනුපිළිවෙළින් යුත් අදහස්වලින් යුක්ත රසවත් හා හරවත් එකක්ම විය යුතුය. නිමාවත් එසේමය. හිටි හැටියේම නැවතීමේ ලකුණකින් පමණක් නිමාව දකිනු වෙනුවට එයද රසවත් වැකියකින් නිම වීම අවශ්‍යය. 'ඉන්ධන අර්බුදයෙන් ලොව පසු නොබසිනු ඇත. සෙසු සියලු අර්බුද හමුවේදී මෙන්ම එයද විසඳුම් ලබා ගනිමින් ලොව ඉදිරියට ගෙන යනු ඇත." වැනි නිමාවක් ගැන කල්පනා කරන්න.

මේ අනුව රචනයකට සුදුසු සැලැස්ම ඔබේම සිත තුළ ඔබ විසින්ම ඇඳගත යුත්තකි. එයද මනා හුරු පුරුද්දකින්ම කළ යුතුය. එවැනි හුරුවක් පෙර කී අන්දමට උසස් ලිපි ලේඛන රැසක් කියවීමෙනුත් සැලකිය යුතු රචනා ප්‍රමාණයක් ලිවීමෙනුත් ඇති කර ගන්නට ඔබට හැකි වෙනවා ඇත.

## සැකිල්ල

රචනා ලිවීමේදී සැකිල්ල බොහෙවින් ප්‍රයෝජනවත් වන්නකි. මෙහි 'සැකිල්ල' යනු අන් කිසිවක් නොව, ඔබ සිතට එන අදහස් දක්වන කටු සටහනයි. රචනය ලියන්නට පෙර මාතෘකාව ඔස්සේ සිතට එන අදහස් කඩදාසියක සටහන් කළ යුතුය. ඒ සඳහා ගත වන කාලය අනිවාර්යයෙන්ම අපතේ යාමක් නොවනු ඇත. සටහන් කළ එම කරුණු සිතට එහෙන් මෙහෙන් ගලා ආ ඒවා බැවින් එහි අනවශ්‍ය කරුණු රැසක් තිබිය හැකිය. එමෙන්ම එහි දස වැනියට ලිවිය යුතු කරුණක් මුලටත් මුලටම කිව යුත්තක් දස වැනියටත් සටහන්ය තිබිය හැකිය. මෙහි මුලදී දැක්වූ විමර්ශනයටත්, සංවිධානයටත් මේ සැකිල්ල විශාල ආධාරකයක් වනු ඇත. කටු සටහනෙහි ඇති කරුණු ගැන විමර්ශනාත්මකව සලකා බලා අනවශ්‍ය දෑ ඉවත් කිරීමටත් අවශ්‍ය දෑ එක් කිරීමටත් හැකි වනු ඇත. එමෙන්ම සැකිල්ලේ ඇති කරුණු නිසියාකාරව ගැළපෙන අනුක්‍රමයක් යටතේ පෙළ ගස්වා ගත හැකිය. මෙවැනි සැකිල්ලක තවත් ප්‍රයෝජනයක් නම් එකම කරුණ දෙතැනක ලිවීමෙන් වැළකීමයි. තවදුරටත් කියන්නට තිබෙන කරුණු මොනවාදැයි දැන ගැනීමටත් සැකිල්ල කැටපතක් වනු ඇත.

## භාෂාව

රචනයකදී අවශ්‍ය ශක්තීන් අතර භාෂා නිපුණත්වය විශේෂ තැනක් ගනී. හොඳ භාෂාවක් නැති තැන හොඳ රචනයක්ද බිහි නොවේ. ව්‍යාකරණානුකූල විය යුතු සේම නිරවුල් හා රසවත් වීමත් අදහස් ප්‍රකාශනයෙහි සමත් වීමත් අවශ්‍ය වේ. යමක් ප්‍රිය උපදවන අන්දමට ලිවීමත් අප්‍රිය උපදවන අන්දමට ලිවීමත් දෙකටම උපයෝගී වන්නේ භාෂාවයි. පහත දැක්වෙන ඡේද දෙක විමසිල්ලෙන් කියවන්න.

'අප අවට ලෝකය දෙස විමසිලිමත් ඇසින් බලන කවරකුට වුවද සැමදාම, සැම දෙයක්ම ඒකාකාරව නොපවත්නා බව දැක්ක හැකිය. පැළයක් ක්‍රමයෙන් වැඩී මහ ගසක් බවට පත්වීමද වරක කොළවලින් පිරී පැවති ගසක වර්ණවත් බවද තවත් වරක ඒ සියලු කොළ හැළී ඉපල් බේරීමද අප කවුරුත් දැක පුරුදු සාමාන්‍ය පෙරළිය. මිනිසුන්ගේ ඇඳුම් පැලඳුම්, යාන වාහන, ගේ දොර, සිරිත් විරිත්, ගති ගුණ ආදීන්හිද කලින් කලට ඇති වන පෙරළි සුළුපටු නැත'

'අපේ ගමේ අවුරුදු උත්සවයට මිනිසුන් ගොඩක් ඇවිත් සිටියේය. ඒ අය නොයෙක් පාට ඇඳුම් ඇඳගෙන සිටියා. ලිස්සන ගහේ නගින එක තමයි හුඟක්ම දෙනෙක් සතුටු වෙච්ච එක. කණාමුට්ටිය බිඳින එකත් එදා තිබුනා. මේවා බලලා අපි හරියට සන්තෝස වුණෙමි'

මෙහි පළමුවන ඡේදය ප්‍රවීණ ලේඛකයකුගේය. දෙවැන්න අපොස(සා.පෙළ) උත්තර පත්‍රයකින් උපුටා ගත්තකි. පළමු වන ඡේදයේ ඉදිරිපත් වූ අදහස ඉතාම නිරවුල්වත් රසවත්වත් ඉදිරිපත් වන සැටි බලන්න. ලෝකයේ වෙනස් වීමේ ස්වභාවය ගහ කොළවල මෙන්ම ලෝකයාගේ ඇඳුම් පැලඳුම්, යාන වාහන ආදියටත් එක සේ බලපාන බව දෙවරක් නොකියවා අවබෝධ වන අන්දමට එය ලියැවී තිබේ. මෙහි හැම වැකියක්ම ලියැවී ඇත්තේ එකම ලිඛිත භාෂාවෙනි. වියරණ දොසින්ද තොරය.

දෙවන ඡේදය ගැන ඉහත වර්ණනාව කළ හැකිද? එහි වැකි දෙකක් (අවුරුදු උත්සවයට මිනිසුන් ඇවිත් සිටියේය. සහ අපි හරියට සන්තෝස වුණෙමි) ලේඛන ව්‍යවහාරය අනුගමනය කොට ඇතත් එහිද උක්තාඛ්‍යාත සම්බන්ධය වැරදිය. සෙසු වැකි ලියා ඇත්තේ කථන ව්‍යවහාරයෙනි. මේ ඡේදයෙන් අවුරුදු උත්සවය ගැන කියවෙතත් එහි උත්සවශ්‍රීය මතු කොට දක්වන්නට රචකයා සමත්ව නැත. වියත් අයකුගේත් ශිෂ්‍යයකුගේත් ලේඛන දෙකක් මෙහි යෙදුවේ සංසන්දනය සඳහාම පමණක් නොවේ. දෙදෙනාගේ භාෂාවේ වෙනස්කම් පෙන්වා ඔබේ රචනයේදී ඔබ අනුගමනය කළ යුත්තේත් වියත් ලේඛකයාගේ භාෂාව වැන්නක් විය යුතුය යන්න කීමටය.

ඔබ මෙතෙක් ලියා ඇති ප්‍රබන්ධයන් නැවත කියවා බලන්න. ඔබේ බසත් වියත් ලේඛකයාගේ බස මෙන් වියරණට අනුකූල වී තිබේද? ලේඛන ව්‍යවහාරය හා කථන ව්‍යවහාරය මිශ්‍ර කොට ලියා තිබේද? රසවත් හා හරවත් බව තිබේදැයි ඔබම සිතා බලන්න. අඩුපාඩු වෙතොත් ඒවා මග හරවා නැවත ලියන්නේ කොහොමදැයි බලන්න.

**ලබන කලාපයෙන් ප්‍රබන්ධකරණය පිළිබඳ තවදුරටත් හදාරමු**

# ණයකරුවන්ට මගේ බැංකු ගිණුමට වලපදම් කළ හැකිද?



ඔබට මූල්‍යමය ගැටලුවක් ඇති වූ විට ඇති එකම සහනය ඔබගේ බැංකු ගිණුමේ පවතින ශේෂයයි. නමුත් එහි ශේෂය ශූන්‍ය වූ විට කොතරම් භයානක හැඟීමක් ඔබට ඇති වේද?

මූල්‍යමය ගැටලුව උග්‍ර වූ විට ඔබේ ජීවිතය ප්‍රශ්නවලින් පිරී යා හැක. ගිණුමේ ශේෂය ශූන්‍ය වූ විට ඔබේ රථයේ ණය වාරිකයවත් ගෙවා දමන්නේ කෙසේද?

මේ සියල්ල දෙස බලන විට මෙයට ප්‍රධානම ගැටලුව ලෙස පෙනී යන්නේ ඔබගේ බැංකු ණයයි (උගස/ ණය මුදල/ ණයවර පත). ඔබට යුතුකමක් තිබෙනවා ඔවුන්ගේ ණය මුදල සම්පූර්ණයෙන්ම හෝ භාගයක් හෝ ගෙවා අවසන් කිරීමට. කෙසේ වුවත් ඔබගේ බැංකු ගිණුමේ ශේෂය ශූන්‍ය නම් ඔවුන් ඔබට උදව්වක් කිරීමට ඉදිරිපත් වන්නේ නැත. ඒ ඔබගේ සෙසු සියලු ගෙවීම්වලට වැඩියෙන් ඔවුන්ගේ ගෙවීම ඔවුන් විසින් වැදගත් කොට සැලකීම හේතුවෙනි.

ඔබ මුදල් ලබාගැනීමේදී එය ආරක්ෂිත සහ අනාරක්ෂිත වශයෙන් දෙයාකාර වේ. සුරක්ෂිත ණය ලබාගැනීමේදී ඔබ සතු යම් වත්කමක් ඇපයට තැබීමට ඔබට සිදුවේ. එය දේපළ, ඉඩකඩම්, ගෘහභාණ්ඩ හෝ රථවාහන විය හැකිය. ඔබට ණය ගෙවා ගැනීමට නොහැකි වුවහොත් ඔබගේ ඇපයට තබන ලද වත්කම ඔවුන් සතු කරගැනීමේ අයිතිය ඔවුන්ට ඇත. මේ සඳහා කදිම නිදසුන වන්නේ උගස්කරයයි. එහිදී ඔබ ණය ගෙවා දැමීමට අපොහොසත් වුවහොත් ඔබගේ දේපළ ඔවුන් සතු කරගෙන විකුණා දැමීමෙන් ඔවුන්ගේ පාඩුව පියවා ගනී. මෙයට තවත් උදාහරණයක් වන්නේ ෆිනෑන්ස් කරන ලද වාහනයක් මිල දී ගැනීමයි. එහිදී ඔබ අවසන් වාරිකයත් පියවා නිම වනතුරු වාහනයේ පරම අයිතිය ඔබ සතු නොවේ.

ණයවර පත යනු අනාරක්ෂිත ණය ක්‍රමවේදයකි. ඔබ උගස් ණයක් තිබියදී තවත් ඉල්ලුම්පතක් යොමු කළද (එම බැංකුවටම හෝ) ඔවුන් පෙර ණය මුදලක් තිබියදී නැවත ලබාදීමට අකමැති වේ. ඔවුන්ට කළ හැකි එකම දෙය වන්නේ ඔබගේ ගිණුමෙන් මුදල් ලබාගෙන ණය පියවීම පමණි.

ඔබ මේ දෙස බුද්ධිමත්ව බලා ගිණුමේ ශේෂය ශූන්‍ය කර තැබුවහොත් ඔවුන් විසින් සිදුකරනු ලබන්නේ ගිණුමේ මුදල් ආපසු ගත නොහැකි ලෙස ගිණුම අවහිර කර දැමීමයි. එවිට ගිණුම් හිමියාට මුදල් තැන්පත් කළ හැකි වුවද තැන්පත් කළ මුදල් ආපසු ගැනීම සිදුකළ නොහැකි වේ.

නමුත් බැංකුව විසින් මෙය සිදුකරන බව ඔබට නොදන්වයි. එයට හේතුව වන්නේ එසේ ගිණුම් අවහිර කිරීමට නීතිමය බලයක් ඔවුන් සතු නොවීමයි.

රජයට ගෙවීමට ඇති හිඟ මුදල්වලටද (income tax, etc,.....) අවසරයක් අවශ්‍ය නොවේ.

නමුත් අනෙකුත් බැංකු නොවන ණයකරුවන් නීත්‍යානුකූල අවසරයක් ලබාගත යුතු වේ.

ඔවුන් විසින් ගනු ලබන ක්‍රියාමාර්ග ඔබට දන්වනු ලබන අතර ඔබ ඒවාට අනුකූල ලෙස ක්‍රියාකරනු නොලැබුවහොත් ඔබට සහ ඔබගේ ගිණුම්වලට විරුද්ධව ඔවුන් නීතිමය ක්‍රියාමාර්ග ගනු ලබයි. ඔබට නඩුවක් පැවරුනහොත් උසාවි යාමට සිදුවනු ඇත. නඩුකාරයාගේ තීන්දුව ඔබට විරුද්ධව ලැබුණහොත් ඔබට සියලු නඩු ගාස්තු, දඩ, ණය ඇතුළු සියල්ල ගෙවා දැමීමට සිදුවේ.

හඳුනාගෙන ඇති පරිදි ණය මුදල 'ඔන්ටාරියෝ' හිදී අවුරුදු දෙකකට පසු ගෙවා දැමිය යුතුය. එහෙත් වසර දෙකකට පෙර ණය මුදල ගෙවා දැමීමට නොහැකි වුවහොත් සියලු තර්ජන අහෝසි වී යයි. ඔවුන් ඔබට නැවත නඩු පැවරුවහොත් ඔබට නැවත උසාවි ඉදිරිපත් වී සාක්ෂි පෙන්වීමට සිදුවේ.

එහෙත් ඔබ එයින් කුඩා ගණනක් හෝ ගෙවා දැමුවහොත් කාලය නැවත සැකසී සියලුම ණයගැතියන්ට මුදල් ලබාදීමට කටයුතු කරයි.

**ඔබට තවත් මේ සම්බන්ධව ගැටලු ඇතොත් 416 650 5400 හෝ www.gtacredit.com වෙබ් අඩවිය මඟින් අප හා සම්බන්ධ වන්න.**

**වැඩි විස්තර පිටු අංක 23 හි අපගේ දැන්වීමෙහි සඳහන් වේ.**

# ලොව පාලනය කරන නියාම ධර්ම

■ රංජිත් නිමල්සිරි ජයසේන

## උතු නියාමය

ස්වභාව ධර්මයට එකඟව මතුවෙන කාලගුණික හා දේශගුණික සංසිද්ධීන්ගෙන් හටගන්නා වූ අවස්ථායි. දැඩි නියඟය, ගංවතුර, නාය යෑම්, සුනාමි වැනි උපද්‍රව, හදිසි භූ චලන නිසා ඇතිවෙන විනාශ, බෝවෙන රෝග, සාගත වැනි උපද්‍රව ඇතිවීම.

## බීජ නියාමය

මේ ධර්මතාවයට අනුව යම්කිසි බීජයකින් හට ගන්නේ එයටම අදාළ ශාකයන්ය. කොස් ඇටයක් රෝපණය කළ විට කොස් ගසක් ඇතිවන පරිදිය. දෙමවුපියන්ගේ හැඩරුව හා ගතිගුණ සිය දරුවනට පිහිටන පරිදිය. සිවුපා සතුන් කෙරෙහිද මෙපරිද්දෙන්ම පිහිටන අවස්ථාවන් ඇත.

## ධම්ම නියාමය

ළදරු අවස්ථාවේ සිට ඇඟපත වැඩී යොවුන් වියට පැමිණීම, ඉන්පසු ක්‍රමයෙන් කෙස් රැවුල සුදුවීම, ඇඟපත රැලි වැටීම, දත් වැටීම, ඇස් පෙනීම අඩුවීම, කන් ඇසීම දුර්වලවීම, වයස්ගතව මරණයට පත්වීම. මේවා ධර්ම නියාමයට අනුව සිදුවෙන කරුණුය. කුමන බලවේග යකින්වත් මේවා යටපත් කිරීමට හෝ වෙනස් කිරීමට නොහැකිය. අනිත්‍යතාවය නිසා මතුවෙන මේව බුදුරජාණන් වහන්සේටද පොදු වූ ධර්මතාවයන්ය.

## චිත්ත නියාමය

සිතෙහි ඇතිවන ස්වභාවයකි. සිතිවිලිවල ඇතිවීම හා නැතිවීම ක්ෂණිකව සිදුවෙයි. මොහොතකින් සැතපුම් දහස් ගණනක් දුරකට වුවද යැවිය හැකිය. එක් ක්ෂණයකදී සිතිවිලි දෙකක් ඇති නොවන අතර චිත්ත පරම්පරාවක් ලෙස හටගනියි. චෛතසිකව ලෝභ, දෝෂ, මෝහ සහ අලෝභ, අදෝෂ, අමෝහ යන චේතනා ඇතිවූ විට ඒවාට අනුව තමාගේ සිතිවිලි ක්‍රියාත්මක වෙයි. සිතේ ස්වභාවය එයයි.

## කම්ම නියාමය

යම්කිසි යහපත් දෙයක් හෝ අයහපත් දෙයක් සිදුකළ විට එයට විපාක දීම සිදුවන්නේ ඒ අනුවය. සමහර විට මෙම ආත්ම භවයේදී විපාක විඳීමට සිදුවෙන අතර සමහර විට ඊළඟ ආත්ම භාවයේදී හෝ සසර කවදා හෝ ලැබිය හැකිය. සමහර අවස්ථාවලදී කර්මයන්ගේ විපාකදීම අහෝසි වී යන අතර සුදුසු පරිසරයක් ගොඩ නැගුණ විට අනිවාර්යයෙන් විපාක දීම සිදුවෙයි.

# හත්පළේ...

6 වන පිටුවෙන්

මෙම වාර්තා මගින් පළවූ කරුණු අනුව බැඳුම්කර සිද්ධිය සම්බන්ධයෙන් ඉදිරිපත් වූ චෝදනාවන්හි තත්ත්වය බරපතල වූයෙන් එය සැලකිල්ලට ගත් ජනාධිපතිවරයා විසින් මේ පිළිබඳව පූර්ණ විමර්ෂණයක් සඳහා ජනාධිපති කොමිසමක් පත්කරන ලදී. ජනමාධ්‍ය මගින් කියවුණු අන්දමට මේ සිදුවීම සම්බන්ධව විශාල පිරිසක් මෙහි සාක්ෂි දීම සඳහා කොමිසම හමුවට කැඳවන ලදී. එමඟින් මෙතෙක් අනාවරණය නොවූ කරුණු රැසක් අනාවරණය කර ගැනීමට කොමිසමට හැකි විය. කොමිසමේ වාර්තාව 2017 දෙසැම්බර් 08 වෙනි දින නිකුත් වීමට නියමිත බැවින් එතැනින් ඔබ්බට කිසිවක් මෙහි සඳහන් නොකරමු.

මෙහි ලා කරුණු දෙකක් ගැන නම් සඳහන් කළ යුතුමය. එකක් නම්, මෙතෙක් කල් සිදුවූ පරිදි තම රජයෙන් සිදුවී ඇති වැරදි වසා ගැනීමට උත්සාහ නොකොට සිදුවී ඇති සේ පෙනෙන බරපතල වරදෙහි ස්වභාවය තේරුම් ගනිමින් මහජනයා වෙනුවෙන් ඒ පිළිබඳ විවෘත කොමිසමක් පත් කිරීමට ජනාධිපතිවරයා ගත් පියවර ප්‍රශංසනීය බව කිව යුතුය. වාර්තාව නිකුත් වූ පසු ඉන් ඔබ්බට සිදුවිය යුතු කටයුතු වෙතොත් පුද්ගලයින්ගේ තරාතිරම් නොබලා රට වෙනුවෙන් ඒ කාර්යයද ඉටුවෙනු ඇත යනු ජනතා අපේක්ෂාවයි. දෙවෙනි කරුණ නම්, කොමිසම හමුවේ හෙළිදරව් වී මාධ්‍ය මගින් ප්‍රසිද්ධියට පැමිණි කෝප් කමිටු සාමාජික වූත් නොවූත් මන්ත්‍රීවරුන්ගේ දුරකතන සංවාද පිළිබඳ පිළිකුල්ජනක හැසිරීමයි. චූදිතයන් සමග ඔවුන් කළැයි කියන මෙම දුරකථන සාකච්ඡා කිසිසේත්ම සදාචාරාත්මක නොවන්නේය. කෝප් කමිටු සාමාජිකයන්ගේත් සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේත් ප්‍රධානතම වගකීම නම් දූෂිතයන්ගෙන් සිදුවන දේපොළ මංකොල්ලකෑම් වැළැක්වීමට පියවර ගැනීමයි. එසේ තිබියදී මෙවැනි චෝදනා නැගුණු චූදිතයන් සමග සියවර, දෙසීයවර ආදි වශයෙන් දුරකතන සංවාද පැවැත්වීම කුමන නම් සදාචාරයකට අයත් වන්නේද? කෙතරම් නම් නීති විරෝධී වූත් සදාචාරයට පටහැණි වන්නක්ද යන්න විස්තර කළ යුතු නැත. එහෙත් මන්ත්‍රීවරුන් පිරිසක් මෙසේ හත්පළේ ගාගෙන තිබේ නම් නිසි පරීක්ෂණ පවත්වා ජනතාව වෙනුවෙන් ඔවුන්ටද නිසි දඬුවම් පැමිණවීම ඒ ඒ පක්ෂ සතු වගකීමයි. පාර්ලිමේන්තුවද සතු වගකීමයි.

කෙසේ වෙතත් දැනට කියවෙන අන්දමට බිලියන 145 ක පමණ පාඩුවක් මෙමගින් මහජනතාව වෙත පැවරී ඇති හෙයින් ජනතා සුභසිද්ධිය සඳහා යෙදවිය යුතුව තිබෙන මේ මුදල් මහජනතාවට බදු වශයෙන් නොපවරා අදාළ වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීමටද කටයුතු කරනු ඇත යනු ශ්‍රී ලංකාවේ ජනතාවගේ අපේක්ෂාවයි.

# ඒ තමා ප්‍රේම ලෝකේ...

15 වන පිටුවෙන්

ඉන්න ආත්තම්මා කෙනෙක්. මම මේ ඉන්නෙ මගේ දුවගෙ ගෙදර. පුතාත් මේ කිට්ටුවම ඉන්නෙ. ලංකාවෙන් කැනඩාවට එන කලා ශිල්ප ශිල්පිනියන් මට හමුවෙනවා. මෙහෙ තියන සංදර්ශන, කලා කටයුතුවලට මම සහභාගි වෙනවා. විහාරස්ථානවලට ගිහිං ආගමික කටයුතුවල යෙදෙනවා. පොත්පත් කියවනවා. පුතාල දුවල එක්ක ඇවිදින්න යනවා. ඉතිං මේ දේවල් මැද්දෙ ගෙවෙනකොට ජීවිතේ එක තැනක ගත වෙනවා කියා දෙයක් දැනෙන්නෙ නෑ. මේක තමයි ජීවිතේ... මේක තමයි සතුට... තෘප්තිය. අතීතය වගේම මගේ වර්තමානයත් හරිම සුන්දරයි.

**ඇත්තෙන්ම ඔව්... ඔබේ වර්තමානය වගේම අනාගතයත් ඉතාමත් සුන්දර වෙන බව අපට විශ්වාසයි.**

**ඔබ අප රැගෙන ගියේ කොතරම් සොඳුරු අතීතයකටද?**

**මෝරලා ප්‍රේම ගීතේ - ආදරේ මිහිර නෑවේ**
**ඒ තමා ප්‍රේම ලෝකේ - සෑමදා ජීවිතේ....**

**ඒ සුනීතා චිත්‍රපටයේ ලීනා ද සිල්වා සහ රවීන්ද්‍ර රූපසේන රඟපෑ ප්‍රේම ජවනිකාවක එන සුමියුරු ගීතයකි.**

**මේ සියලු මතකයන් අවදි කරගනිමින් සංග්‍රහ සත්කාර විඳිමින් ලීනා ද සිල්වා රූපසේන මහත්මිය සමග ගත කළ ඒ සොඳුරු හෝරා කීපය කෙතරම් ඉක්මනින් ගෙවී ගොස්ද? ඉතිං දැන් අප යා යුතුයි.**

**ලීනා ද සිල්වා මහත්මියනි, 50 දශකයේ සිට සිංහල සිනමා අම්බරයේ දිදුලමින් සුවහසක් ප්‍රේක්ෂක සිත් සතන් සුවපත් කළ පිනෙන් ඔබට නිදුක් නිරෝගී දීර්ඝායු සම්පත් සැලසේවා කියා අපි ප්‍රාර්ථනා කරමු.**

**සුබී දීඝායුකෝ භව !**

LESSON 6

Are you having a great time learning French lessons? Hope you enjoyed last week's conversation passage. Did you get an opportunity to use similar words and sentence patterns in a conversation? Last week's grammar lesson focused on regular conjugations of the second group of verbs in French. Hope you have a thorough understanding about the grammar done so far ! When learning French, it is important to study and memorize everything regularly. Practice makes you perfect. Therefore, you have to keep on practicing the genders of the nouns and their meanings, verb conjugations and irregular verbs in order to improve. If you are as dedicated and enthusiastic as we are, learning French will not be a nightmare anymore.

This month's Dasatha issue presents you a words list and a conversational passage that uses the given words. You can read and understand the conversational passage with the help of the vocabulary and the pronunciations given in Sinhala. This will enrich your French vocabulary and the conversation passage will help you understand correct pronunciations and correct contexts to use these learnt words. It will also help you improve your French reading skills, conversing skills and handling similar situations. The grammar lesson continues in order to make you use the language correctly. Learning grammar will help you in presenting your ideas in an accurate manner. Enjoy learning! Thank you!






## Le Vocabulaire (ලවොකැබියුලෑර්) Vocabulary

Did you study the last issue's vocabulary focusing chiefly on a conversation held at a grocery shop? Without a rich vocabulary you will never be able to converse well in French. Therefore, it is necessary to study the given words each month. The words presented in this issue are based on a conversation that takes place in a post office between the postal worker and an old deaf client.

Entrer ( ඔන්ත්‍රෙ) – to go in / to enter
Le bureau de poste (ලබියුරො ද පොස්ත්) – post office
Le guichet (ලගිෂෙ) – cashier
Derrière (දෙරියෑර) – behind
Vieux (විය) – old
Sourd (සුර) – deaf
Essayer (එසෙයියේ) – to try
Envoyer (ඔන්වොයියෙ) – to send
Le colis (ලකොලී) – parcel
L'employé (ලොම්ප්ලොයියෙ)- employee
Le paquet (ලපකෙ) – packet
Énorme (එනෝර්ම්) – enormous
Lourd (ලුර) – heavy
Le tour (ලතූර) – turn
Attendre (අතෝන්ද්‍ර) – to wait for
Fort (ෆෝර) – loud / strong
Accepter (අක්සෙප්තෙ) – to accept
Le timbre (ලතෑම්බ්‍ර) – stamp
Vouloir (වුලුවා) – to want to
L'impertinence (*f.*) (ලැම්පැරතිනොන්ස්) – impertinence
Le gouvernement (ලගුවැරනමොං) – government
Quitter (කිතෙ) – to leave
Fâché (ෆෂෙ) – angry
La valeur (ලාවල්ර) – value
Le centime (ලසොන්තම්) – centime / cent (money)
Vingt (වැං) - twenty
Le télégramme (ලතෙලෙග්‍රෑම්) – telegram
Le mot (ලමො) – word
L'argent (*m.*) (ල්රෂොං) – money
La poche (ලාපොෂ්) – pocket
Inquiet (ඇංකියෙ) – worried
La maison (ලාමෙයිසොං) – house
La pièce (ලාපියෙස්) – coin
Le porte-monnaie (ලපෝරත් මොනෙයි) – purse
Prêter (ප්‍රෙතෙ) – to lend
Rendre (රොන්ද්‍ර) – to give back
Bien sûr! (බියැං සියුර) – of course!
Chic (ෂික්) – nice / decent
Utile (යුතීල්) – useful
N'est-ce pas ? (නෙස්පා) – Isn't it?



## Grammaire (ග්‍රාමෑර්) Grammar

The lesson about the regular conjugations of the three verb groups in French is going to continue this week as well. Hope you do not have any problem conjugating the –er and –ir verbs! This month's Dasatha issue will explain the conjugations of the third group of verbs in French, regular -RE verb conjugations. Unless otherwise specified, all the verbs ending in –re, follow the model explained below in order to form the present tense:

- Take the verb in the infinitive form (in its original form)
- Ex: Attendre (අතොන්ද්‍ර) - to wait for
- Remove the ending –re in order to get the stem Attend-
- Add the following endings to the stem: -s, -s, -just the stem, -ons, -ez, -ent.

Formation:
J'attends (ජතොන්ද්) - I wait, I am waiting
Tu attends (තියු අතොන්ද්) - You wait, You are waiting
Il attend* (ඔන් අතොන්ද්) - He waits, He is waiting
Elle attend* (ඔන් අතොන්ද්)- She waits, She is waiting
On attend* (ඔන් අතොන්ද්)- One waits, One is waiting
Nous attendons (නුස් අතොන්දොං) - We wait, We are waiting
Vous attendez (වුස් අතොන්දෙ)- You wait, You are waiting
Ils attendent (ඉල් අතොන්ද්) - They wait, They are waiting
Elles attendent (එල් අතොන්ද්) - They wait, They are waiting

* In French, the present tense has only one form. Therefore, when you say I wait or I am waiting in French, always J'attend should be used.

*All the regular -re verbs form their conjugations following the above model. Some of these regular verbs are:

Entendre (ඔන්තෝන්ද්‍ර) – to hear
Perdre (පැරද්‍ර) – to lose
Répondre (රෙපොන්ද්‍ර) – to answer
Descendre (දෙසොන්ද්‍ර) – to go down
Vendre (වොන්ද්‍ර) – to sell
Étendre (එතෝන්ද්‍ර) – to stretch
Défendre (දෙෆොන්ද්‍ර) – to defend
Fondre (ෆොන්ද්‍ර) – to melt
Pendre (පෝන්ද්‍ර) – to hang / to suspend
Prétendre (ප්‍රෙතෝන්ද්‍ර) – to pretend
Rendre (රොන්ද්‍ර) – to give back

## Conversation (ලාකොන්වැර්සසියොන්) Conversation

### Au bureau de poste* ( ඕ බියුරො ද පොස්ත්)

As mentioned before, the conversation below takes place between a postal worker and a deaf client. The vocabulary given above will help you understand the passage after reading. After studying similar contexts, you will be able to handle similar situations confidently on your own. As the pronunciations are given, you would have a proper guidance while reading the passage.

(Roger et Françoise entrent au bureau de poste et vont au guichet. Ils se trouvent derrière un vieux monsieur sourd qui essaie d'envoyer un gros colis.) (රොෂ ඒ ෆ්රොන්ස්සුආස් ඔන්ත්‍ර ඕ බියුරො ද පොස්ත් ඒ වොං ඕගිෂෙග ඉල් ස තෘව් දෙරියෑර් අන් විය මසිය සුර් කී එසෙයි දොංවොයියෙ අන් ග්‍රෝ කොලීග)

Le vieux monsieur : Je veux envoyer ce colis à Marseille! (ජව ඔන්වොයියෙ ස කොලී ආ මර්සෙයි)

L'employé : (*regarde le paquet énorme*) Je regrette monsieur, votre paquet est trop lourd. (රග්රීද ල පකෙ එනෝර්මිල ජ රග්රෙත් මසියල වොත්‍ර පකෙ ඒ ත්‍රෝ ලුර්)

Le vieux monsieur : Comment ! Ce n'est pas mon tour ! Si, c'est mon tour. (*Il regarde les jeunes gens.*) Ces jeunes personnes sont après moi. Elles doivent attendre. (කොමොං සනෙපා මොං තූරෟ සී සෙමොං තූර්ග ඉල් රග්රද් ලෙ ජන් ෂොංග සෙ ජන් පැර්සොං සොං අප්‍රෙ මුවාග එල් දුවා අතොන්ද්‍ර)

L'employé: (*crie très fort*) Je dis non, monsieur ! Nous ne pouvons pas accepter votre. Vous ne pouvez pas envoyer ce colis. Il est trop lourd ! (ක්‍රී ත්‍රෙ ෆෝරල ජදී නො මසියෟ නූන පුවොං පාස් අක්සෙප්තෙ වොත්‍ර කොලීග වූ න පූවෙ පාස් ඔන්වොයියෙ ස කොලීග ඉල් ඒ ත්‍රෝ ලූරෟ)

Le vieux monsieur : Quelle impertinence ! Je vais ecrire au gouvernement. (*Il quitte le bureau de poste. Il est très fâché.*) (කෙල් ඇම්පැර්තිනොන්සෟ ජවෙයිස් එක්රිර ඕ ගුවැර්නමොංග ඉල් කීත් ල බියුරො ද පොස්ත්ග ඉල් ඒ ත්‍රෙ ෆෂෙ)

Roger : (*à l'employé*) Cinq timbres, s'il vous plaît monsieur. (ආලොම්ප්ලොයියෙල සැන්ක් තෑම්බ්‍ර සිල් වු ප්ලෙ මසිය)

L'employé : Quels timbres voulez-vous jeune homme ? De quelle valeur ? (කෙල් තෑම්බ්‍ර වුලෙ වූ ජන් ඔම්රෑ දකෙල් වල්රරෑ)

Roger : Des timbres à vingt centimes s'il vous plaît. Et voulez-vous envoyer ce télégramme ? (*L'employé compte les mots.*) C'est combien ? (දෙ තෑම්බ්‍ර ආ වැං සොංතීම් සිල් වු ප්ලෙග එ වුලෙ වුස් ඔන්වොයියෙ ස තෙලෙග්‍රෑම්? ලොම්ප්ලොයියෙ කොංත් ලෙ මොග සෙ කොම්බියෑං?)

L'employé : Quatre francs avec les timbres. (කැත්‍ර ෆ්රොන්ක් අවෙක් ලෙ තෑම්බ්‍ර)

Roger : (*cherche son argent dans sa poche. Il ne trouve rien. Il cherche dans l'autre poche. Il ne trouve rien. Il est très inquiet*) Françoise, je ne peux pas trouver mon argent. Il doit être à la maison. Quelles pièces as-tu dans ton porte-monnaie ? As-tu quatre francs ? (ෂැර්ෂ් සොං අර්ෂොං දොං සා පොෂ්ග ඉල් න තෘව් රියැංග ඉල් ෂැර්ෂ් දොං ලොත්‍ර පොෂ්ග ඉල් න තෘව් රියැංග ඉල් ඒ ත්‍රෙස් ඇන්කියෙත්ග ෆ්රොන්ස්සුආස්ල ජ න පපාස් තෘවේ මොන් අර්ෂොංග ඉල් දුවාත්එත්‍ර ආලාමෙයිසොංග කෙල් පියෙස් අ තියු දොං තොං පෝරත් මොනෙයිරෑ අතියු කැත්‍ර ෆ්රොන්ක්?)

Françoise: (*regarde dans son porte-monnaie*) J'ai quatre francs et dix centimes. (රග්රද් දොං සොං පෝරත් මොනෙයිල ජෙයි කැත්‍ර ෆ්රොන්ක් ඒ දීස් සොන්තීම්)

Roger : Prête-moi tes quatre francs et dix centimes. (ප්‍රෙත් මුවා තෙ කැත්‍ර ෆ්රොන්ක් ඒ දීස් සොන්තීම්)

Françoise : (*donne les quatre pièces à son frère*) Voilà Roger. Mais tu dois rendre l'argent plus tard. (දොන් ලෙ කැත්‍ර පියෙස් ආ සොං ෆ්රෑර්ග මෙයි තියු දුවා රොනද ල්රෂොං ප්ලියුතා්ර)

Roger : Oui, oui, bien sûr. Merci beaucoup ! Tu es chic ! (*Il donne l'argent à l'employé.*) Voilà monsieur. (වී වී බියැන් සියුරග මැරසි බොකෟ තියු එ ෂික්ෟ ඉල් දොං ල්රෂොං ආ ලොම්ප්ලොයියෙග වලා මසිය)

L'employé : Merci jeune homme. Et voilà vos timbres. Les sœurs sont quelquefois utiles, n'est-ce pas ? (මැර්සි ජන් ඔම්ග එ වලා වො තෑම්බ්‍රග ලෙ ස්ර සොං කෙල්කෆුවා යුතීල්ල නෙස්පා?)

* *cited from La langue des français by J. R. Watson*

**Kumudu Abeywardena**
Masters (French Literature),
BA (Modern Languages), Dip (AFC)
kumudu4444@gmail.com

# නත්තල හා...

18 වන පිටුවෙන්

වෙන්දේසියකදී පවුම් 20,000 කට (ඇ.ඩොලර් 26,000) විකිණී ඇති මෙම නත්තල් පත මිල දී ගත් ලංසුකරුවා කවුදැයි අනාවරණය වී නොමැත. 1843 වසරේදී හෙන්රි කෝල් සහ ජෝන් හොර්ලි විසින් එක්ව නිර්මාණය කළ පළමු නත්තල් පත මෙයයි. 13x8 සෙ.මී. පළලින් හා දිගින් යුත් මේ නත්තල් පත හෙන්රි කෝල් විසින් ඔහුගේ මිත්තණිය වෙත එවන ලද්දකි. සුබෝපභෝගී පැළැන්තියේ පරම්පරා තුනක පිරිසක් එක්ව නත්තල් රාත්‍රි භෝජනය ලබාගන්නා අයුරු ප්‍රධාන චිත්‍රයෙනුත් දිළිඳු මිනිසුන් නත්තල් භෝජනය භුක්ති විඳින අයුරු දෙපස ඇති අනු චිත්‍ර දෙකක් මගිනුත් එහි චිත්‍රණය කර ඇත. මෙය වර්ණවත් කොට ඇත්තේ ජෝන් හෝර්ලි විසිනි. මෙම නත්තල් පතෙහි පිටපත් 1000 ක් ලිතෝග්‍රැපි ආකාරයට මුද්‍රණය කොට එකක් ෂිලිං 1 ක ගණනේ විකුණා ඇති අතර එකල ෂිලිං එකක් යනු සාමාන්‍ය මිනිසකුගේ සතිපතා වැටුපකට සමාන වන්නක් හෙයින් නත්තල් පතක් මිල දී ගැනීම ධනවත් පංතියටම සීමා වූවක් විය. එදා එසේ විකුණූ නත්තල් පත් 1000 අතරින් වර්තමානයේදී ලොව ඉතිරිව ඇත්තේ නත්තල් පත් 12 ක් පමණකි.

ඇමරිකානු සාමාන්‍ය වැසියන් අතර නත්තල් සුභ පැතුම් පත් ජනප්‍රිය අංගයක් වී ඇත්තේ 1875 දී වන අතර එතෙක් එය ධනවත් පිරිස අතර හුවමාරු වූ සුබෝපභෝගී භාණ්ඩයක් ලෙස පැවතී ඇත. ජර්මන් ජාතික මුද්‍රණ ශිල්පියෙකු වූ ලුවී ප්‍රෑන්ග් විසින් මහා පරිමානයෙන් නත්තල් පත් නිෂ්පාදනය කොට ඇමරිකාව පුරා බෙදාහැරීමත් සමග නත්තල් සුභ පැතුම් උන්මාදය තරාතිරමකින් තොරව ඇමරිකානුවෝ වැළඳ ගති.

එසේ ඇරඹුනු නත්තල් පත් වෙළඳාම අද ලොව අතිශයින් ලාභ උපයන ව්‍යාපාරයක් වී ඇත. සුභපැතුම් පත් කර්මාන්තයේ ඉහළින්ම වැජඹෙන Hallmark වැනි සමාගම්වල නත්තල් සමයේ ආදායම පිළිබඳව සලකා බැලීමේදී මෙහි වර්තමාන තත්ත්වය සිතාගත හැක. නත්තල් සහ අලුත් අවුරුදු සමයේදී වෙළඳපොළෙහි ඇති සුභපැතුම් පත් ඉල්ලුම සපුරාලීම සඳහා ඇමරිකාව තුළ පමණක් සුභපැතුම් පත් සාදන සමාගම් 3000 කට අධික සංඛ්‍යාවක් පවතී. 2011 වසරේදී එක්සත් ජනපදය තුළ පමණක් නත්තල් පත් බිලියන 2 ක් අලෙවි වී ඇති බව සඳහන් වෙන අතර එරට වාර්ෂිකව සිල්ලරට අලෙවි වන සුභපැතුම් පත්වල ඇස්තමේන්තුගත ආදායම ඩොලර් බිලියන 7.5 ක් වෙතැයි පැවසේ. මෙම ආදායමින් සියයට 50 කට අධික ප්‍රමාණයක් නත්තල, වැලන්ටයින් දිනය, මවුවරුන්ගේ දිනය වෙනුවෙන් විකිණෙන කාඩ්පත්වලින් ලැබෙයි.

නත්තල් පත් සහ ඇමරිකාවේ ධවල මන්දිරය අතර ඇත්තේද නොබිඳෙන සබඳකමකි. ඇමරිකාවේ ජනාධිපතිවරයකු වූ Calvin Coolidge 1927 දී පළමුවරට නත්තල් පතක් මගින් ජනතාවට සුභ පතා තිබූ අතර ඔහුගේ අත්සන සහ ධවල මන්දිර ලිපිනය සඳහන් එම සුභ පැතුම රට පුරා පළවූ සියලුම පුවත්පත්වල පළ කිරීමෙන් එම ඇරඹුම සංකේතවත් කර තිබුණි. 1953 දී ජනාධිපති Dwight D. Eisenhower පළමුවරට කොන්ග්‍රස් සභිකයන්, තානාපතිවරුන් සහ අනෙකුත් සම්භාවනීය පුද්ගලයන් සඳහා ධවල මන්දිර ලිපිනයෙන් නත්තල් පත් තැපැල් කර යැවීම ආරම්භ කර ඇත. මෙසේ වසරකට සීමාසහිත ප්‍රමාණයකින් ධවල මන්දිරයෙන් යැවූ නත්තල් පත් ප්‍රමාණය සීමාව ඉක්මවා ගිය අවස්ථාවක් ලෙස ජනාධිපති Richard Nixon ගේ කාලය සඳහන් කළ හැක. එහිදී වාර්ෂිකව නත්තල් සුභපැතුම් පත් 40,000 ක් පමණ නික්සන් ජනපතිවරයා විසින් ලොව පුරා, රට පුරා තැපැල් කොට යවා ඇත. මෙම වාර්තාවද බිඳ හෙළමින් ජෝර්ජ් ඩබ්ලිව් බුෂ් ජනාධිපතිවරයාගේ සමයේදී ධවල මන්දිරයෙන් වාර්ෂිකව නත්තල් පත් මිලියන 1.5 ක් නිකුත් කළ බව සඳහන් වේ.



ඩිජිටල්කරණය ආරම්භ වූ 1996 වසරේ සිට තැපැල් මගින් නත්තල් පත් යැවීම යම් ආකාරයකට සීමා වුවත් එහි සැලකිය යුතු අඩුවක් සිදුවී නැති බවද කිව යුතුය. වෙබ්, ජංගම දුරකථන ආදී මාධ්‍යයන් භාවිත කරමින් තැපැල් පත්, ෆ්ලෑස්, සජීවීකරණ ක්‍රම, වීඩියෝ ආදී මාර්ගවලින් නිර්මාණය කර ඇති නත්තල් සුභ පැතුම් මිලියන ගණනක් අද අන්තර්ජාලයේ දක්නට ඇත.



## නත්තල් සීයා

නත්තල් දිනයේදී පුංචි දරුවන්ගේ ලොකුම බලාපොරොත්තුව නත්තල් සීයාගේ පැමිණීමයි. නත්තල් සීයාව කිසිදා ඇහෙන් දැක නැතත් පොඩි උන් ඒ විශ්වාසය තුළ ජීවත් වෙති. මේ ඒ නත්තල් සීයා පිළිබඳ තොරතුරුයි.

නත්තල් සීයා එසේත් නැතිනම් Santa Claus යන සංකල්පය මුළින්ම ග්‍රීසියෙන් (වර්තමානයේ මෙය තුර්කියට අයත් පළාතක් ලෙස පවතින බවද ඇතැමුන් පවසයි) ආරම්භ වූ බව ප්‍රකට කරුණක් වුවත් ඒ පිළිබඳව ස්ථිර කළ හැකි සාධක නොමැත. කෙසේ වුවත් එසේ ප්‍රකට වූ නත්තල් සීයා පුරාවත ගෙතී ඇත්තේ 4 වෙනි සියවසේ ග්‍රීසියේ මයිරා නම් පළාතේ ජීවත් වූ ශාන්ත නිකොලොස් බිෂොප්තුමා මුල් කරගෙනය. පිය උරුමයෙන් මහා ධනස්කන්ධයකට හිමිකාරයකු වූ නිකොලොස් තුමා ත්‍යාග වන්තයෙකු වූ බව කියවෙන කතා රාශියක් ඇත. ඉන් එක් කතාවක් මෙසේය. පැටිරා නම් පළාතේ ජීවත් වූ දිළිඳු මිනිසෙකුට විවාහ වන වයසේ දියණියන් තිදෙනෙකු සිට ඇත. එහෙත් අතමිට හිඟ වීම නිසා මේ දූවරුන්ට සුදුසු සහකරුවන් සොයාගැනීමට නොහැකිව මේ මිනිසා ඉතාමත් දුකින් කල්ගත කරන බව දැනගත් නිකොලොස් තුමා රන්කාසි මලු තුනක් රාත්‍රී තුනකදී දිළිඳු මිනිසාගේ නිවසේ දුම්කවුළුවෙන් ගෙතුළට දමා ඇත. මේ මුදලින් ඒ මිනිසා තම දූවරුන් විවාහ කර දී ඇත. මේ ආකාරයට දුගී දුප්පත් දරුවන් සඳහා ත්‍යාග බෙදා දීමටද නිකොලොස් තුමා තුළ තිබූ දැඩි කැමැත්ත ඉදිරියට ගෙන යෑම නත්තල් සීයාගේ බිහිවීම බව බොහෝ තැන්වල ලියවී ඇත.

ඕලන්ද ජාතිකයන් මේ ශාන්ත නිකොලොස් තුමාට දැඩි සේ ආදරය කර ඇති අතර ඔවුන් ඔහුව හඳුන්වා ඇත්තේ සින්ට් නිකොලොස් (Sint Nikolaas) යන නමිනි. පසුව එය සින්ටර්ක්ලාස් (Sinterklass) වී ඉංග්‍රීසියට පැමිණීමේදී සේන්ට්ක්ලෝස් (Saintclaus) ලෙස හැඳින්වීම කර ඇති බව පැවසේ.

ලංකාවේ දරුවන් 'නත්තල් සීයා' ලෙස සැන්ටාක්ලෝස් හඳුන්වන්නා සේ විවිධ රටවල ඔහුව හඳුන්වන නම් රාශියකි. ඉතාලියේදී 'බිෆානා', ප්‍රංශයේදී 'පේරේ නොයෙල්', එක්සත් රාජධානියේදී 'ෆාදර් ක්‍රිස්මස්', ස්වීඩනයේදී 'ජුල්ටොම්ටෙන්', කැනඩාව, ඕස්ට්‍රේලියාව, නවසීලන්තව වැනි රටවල් 'ක්‍රිස් ක්‍රිංගල්', ඩෙන්මාර්කයේ 'ජුල් මැන්ඩෙන්', රුසියාවේ 'දෙයුෂ්කා මොරෝස්' (මෙහි අරුත හිම සීයා යන්නයි), බ්‍රසීලය, ආර්ජන්ටිනාව වැනි රටවල් 'පපා නොයෙල්', නෝර්වේ 'ජුලේ බක්' ලෙසත් විවිධ නම්වලින් ඔහුව හඳුන්වයි.

නත්තල් සීයා තෑගි අරන් එන්නේ හිම කරත්තයක නැගී බව අපි කවුරුත් දන්නා දෙයකි. මේ කරත්තය ඇදගෙන යන්නේ පිනි මුවන් 9 දෙනෙකි. මේ පිනිමුවන්ගේ නම්ද අපූරුය. ඔවුන්ගේ නම් පිළිබඳව අරුත් දැක්වෙන කාව්‍යයක් ක්ලෙමන්ට් ක්ලාර්ක් විසින් නිර්මාණය කර ඇති අතර ඊට අනුව වේගයෙන් දුවන්නා-Dasher , නර්තන ශිල්පියා-Dancer, අශ්වයෙකු සේ උඩ පනිමින් දුවන්නා-Prancer, නරි දෙන-Vixen, වල්ගා තරුව-Comet, ප්‍රේමයට අධිපති දෙවියා-Cupid, අකුණ(ඩච් භාෂාවෙන්) Dunder, විදුලිය(ඩච් බසින්) Blixem, වැනි හුරුබුහුටි නම්වලින් ඔවුන් හඳුන්වා ඇත. මේ පිනිමුවන් අතර සිටි 9 වෙනියා Rudolph වන අතර ඔහුගේ නාසය රතු පැහැයෙන් දිස් වී ඇත. එසේම මෙම පිනිමුවන් අතර ගැහැනු සතුන් වැඩි බවද සඳහන් වේ.

නත්තල් සීයා හෝ සැන්ටා ක්ලෝස් යැයි කී පමණින් ඔහුගේ ස්වරූපය අප සිත්හි ඉබේම මැවේ. සුදුපැහැ දිගු රැවුලක්, ලොකු උදරයක්, රතු කබායක් සහ කේතුකාර තොප්පියක්, කළු බූට් සපත්තු යුවළක් පැළඳ නිතර සිනාමුසු මුහුණින් සිටින ප්‍රියමනාම මහලු මිනිසෙකු අප දන්නා නත්තල් සීයා වේ. එහෙත් නත්තල් සීයා ආරම්භයේ සිටම මේ ස්වරූපයෙන් සිටියෙකු නොවන අතර ඔහුට මෙම පෙනුම ලබා දී ඇත්තේ 19 වෙනි සියවසේ ඇමරිකාවේ සිටි දේශපාලන විකට කාටූන් චිත්‍ර ශිල්පියකු විසින් බව පැවසේ. 1863 වසරේදී තෝමස් නෙස්ට් නමැති මෙම කාටූන් චිත්‍ර ශිල්පියා Harper's Weekly සඟරාවට සැපයූ කාටූන් සඳහා ඇඳ තිබුණේ සුදු රැවුලක් සහිත බඩ මහත කුරුම්ට් නත්තල් සීයා කෙනෙකි. පසුව තෝමස් නෙස්ට් විසින්ම මෙම නත්තල් සීයා විවිධ ආකාරයට නිර්මාණය කර ඇත. එහිදී කාටූනයට ගැළපෙන ආකාරයට මුහුණේ ස්වරූපය බැරෑරුම් කිරීමත්, සිනාමුසු කිරීමත්, කළකිරීම, දුක, උද්වේගකර බව ආදිය ඇඟවීමත් සිදුකර තිබුණි. කුරුම්ට් නත්තල් සීයා උස යැවීමද නෙස්ට් විසින්ම සිදුකරන ලද්දකි. 1881 දී Harper's Weekly සඟරාවටම ඔහු විසින් මේ උස, බඩ මහත, තරබාරු, සිනාමුසු, මහලු නත්තල් සීයා නිර්මාණය කර තිබුණි.

නෙස්ට් විසින් අඳින ලද නත්තල් සීයා කලින් කලට නොයෙකුත් විපර්යාසයන්ට භාජන වූ අතර නත්තල් සීයාට විවිධ පැහැයේ ඇඳුම් කබා, තොප්පි, සපත්තු ඇන්ඳවීමද සිදුකර තිබුණි. එහෙත් මේ සියල්ලම පරදවමින් රතු කබාය, රතු තොප්පිය සහ කළු බූට් සහිත නත්තල් සීයා සැමවිටම ඉතුරු විය.

සෑම දෙයක්ම වාණිජකරණය වන ලෝකය තුළ නත්තල් සීයාටද ඉන් ගැළවුමක් නොවුණි. වෙළඳ භාණ්ඩ ප්‍රචාරණයේදී වරතමානයේදී මෙන්ම අතීතයේදීද නත්තල් සීයාව ජයටම යොදා ගෙන තිබුණි. 1868 දී නත්තල් සීයාගේ රතු පැහැ කේතුකාර තොප්පිය කොළ පැහැයෙන් වර්ණවත් කොට Sugar Plums රස කැවිලි දැන්වීමට යොදා තිබීම එක් උදාහරණයකි.

කොකාකෝලා සමාගම විසින් තම ප්‍රචාරණ කටයුතු සඳහා නත්තල් සීයාව කෙතරම් භාවිත කළේද යත්, නත්තල් සීයා යනු කොකාකෝලා හි නිත්‍ය සාමාජිකයෙක් වන තරමට එය ඉහවහා ගොස් තිබුණි.

1920 දී කොකාකෝලා සමාගම තම ප්‍රචාරණ කටයුතු සඳහා නත්තල් සීයා යොදාගැනීම අරඹා ඇති අතර ඔවුන් එහිදී යොදාගෙන ඇත්තේ නෙස්ට් ඇඳි බැරෑරුම් ස්වරූපයේ නත්තල් සීයාවයි. පසුව 1930 දී චිත්‍ර ශිල්පි ෆ්‍රෙඩ් මිසන් විසින් නිර්මාණය කළ විනෝදකාමී නත්තල් සීයා චිත්‍රයක් කොකාකෝලා වෙළඳ දැන්වීම් සඳහා භාවිත කර ඇත. 1931 දී D'arcy Adevertising Agency වෙත කොකාකෝලා දැන්වීම් සෑදීම භාර වීමත් සමග එහි චිත්‍ර ශිල්පියෙකු වූ Haddon Sundblom විසින් නත්තල් සීයා ඇඳ ඇත්තේ Clement Clark Moore's විසින් 1922 ලියන ලද A Visit From St. Nicholas නම් කවියට අනුකූලව බව සඳහන් වේ. 1931 සිට 1964 දක්වා සන්ඩ්බ්ලොම් විසින් නත්තල් සීයා විවිධ ආකාරවලින් කොකාකෝලා දැන්වීම් සඳහා යොදාගෙන ඇති අතර ශීතකරණයකින් කොකාකෝලා බෝතලයක් රැගෙන බොන නත්තල් සීයා, දුම්කවුළුවක් ළඟ සිට ඒ මත ඇති කොකාකෝලා බෝතලයක් දෙස බලා සිටින නත්තල් සීයා, කොකාකෝලා පිරවූ පෙට්ටියක් බැඳගෙන එන නත්තල් සීයා, සෙල්ලම් බඩු මැද ඉඳගෙන කොකාකෝලා පානය කරන නත්තල් සීයා වැනි විවිධ වූ ආකාරවලට එම රූව යොදාගෙන තිබුණි.

නත්තල් සීයාගේ රූපය කාටූන් ස්වභාවය ඉක්මවා ගිය ස්වභාවික මිනිස් ස්වරූපයකින් ඇඳීම සඳහා සන්ඩ්බ්ලොම් මහලු නිරූපකයෙක් යොදාගෙන තිබූ අතර ඔහු මිය යෑමෙන් පසු මෙම චිත්‍ර ශිල්පියාම නත්තල් සීයා ලෙස හැඳ පැළඳ කණ්ණාඩියක් ඉදිරිපස හිඳගෙන එම රූව චිත්‍රයට නගා ඇත. වරෙක ඔහු පැළඳ සිටි මුදුවද එක් දැන්වීමක නත්තල් සීයා චිත්‍රයේ චිත්‍රණය කර තිබී ඇති අතර එය නිරීක්ෂණය කළ ඇතැම් පුද්ගලයන් Mrs. Santa කොහේදැයි විමසිලිමත් වී ඇත.

# MONEY PROBLEMS?™

ඔබගේ සියලුම ණය එක් කුඩා මාසික වාරිකයකින් ගෙවන්න

**ඔබගෙන්ම විමසන්න....**

- ඔබගේ බැංකු අයිරාව **(overdraft)** සෑම විටම භාවිත කරන්නේද?
- ඔබ රැකියාවේ නිරතව සිටින විටත් නිවසේ පසුවන විටත් නිරතුරුව ණය හිමියන්ගේ තර්ජන හිරිහැරවලට ලක්වන්නේද?
- ඔබ නිවාස කුලිය, නිවාස උගස් වාරිකය හෝ වාහන සඳහා වන ගෙවීම් වෙනුවෙන් බලවත් පරිශ්‍රමයක් දරන්නේද?
- ඔබගේ විවාහය සම්බන්ධයෙන් හෝ සෞඛ්‍ය ගැටලු නිසා මූල්‍යමය ගැටලුවලට මුහුණ පා සිටීද?
- ඔබගේ ණය තක්සේරුව **(credit rating)** සෑම විටම අන්තරාකාරී මට්ටමක තිබේ යැයි ඔබ සිතනවාද?
- ඔබගේ වාහනය, නිවස, **RRSP**, ව්‍යාපාර කොටස් හා වෙනත් වත්කම් කොයි මොහොතක හෝ අහිමි වේ යැයි බියෙන් පසුවෙත්ද?
- ඔබට විරුද්ධව උසාවි නියෝග පනවා ඇත්ද?
- ඔබ කැනඩා රජය හා සම්බන්ධිත ආදායම් බදු ගැටලුවලින් පීඩාවට පත්වී සිටීද?



gta™ credit

**ඉහත ප්‍රශ්නවලින් එකකට හෝ පිළිතුර 'ඔව්' යන්න නම් ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට වහාම අප හමුවන්න**



**Scarborough / Downtown Toronto: 416-489-2000**
**Mississauga / Brampton: 416-650-5400**



| Scarborough | Toronto/Downtown | North York | Mississauga | Brampton |
|---|---|---|---|---|
| 201-4433 Sheppard Ave. E | 800-120 Eglinton Ave. E | 306-1280 Finch Ave. W | 110-93 Dundas Street E. | 201-7990 Kennedy Rd. South, |
| Scarborough, ON, M1S 1V3 | Toronto, ON, M4P 1E2 | North York, ON, M3J 3K6 | Mississauga, ON, L5A 1W7 | Brampton, Ontario, L6W 0B3 |

**Mark Shamly**
*Sinhalese Consultant*

*Proudly Served over 10,000 clients since 2004*
**Visit : GtaCredit.Com**

**Ajay Oberoi**
*Government Certified Counsellor*

*Whether you'll be travelling, planning your retirement, or creating that extra bit of security for you and your loved ones, the one thing you will need above all else is peace of mind.*



*Trust a dedicated person for all your Insurance and Investment needs. Here is what I cover*

**INSURANCE**
> TRAVEL INSURANCE
> SUPER VISA - HEALTH INSURANCE
> VISITOR VISA - HEALTH INSURANCE
> LIVING BENEFITS: CRITICAL ILLNESS, CANCER GUARD, LONG TERM CARE, DISABILITY INSURANCE
> PERMANENT LIFE INSURANCE: UNIVERSAL LIFE, WHOLE LIFE, TERM 100
> TERM LIFE INSURANCE

**INVESTMENTS**
> RRSP INVESTMENTS
> TFSA
> RESP



*Insurance Sales Representative for all your health and life insurance needs and investments.*

CALL VICTOR GAMAGE
304 MILNER AVENUE SUITE 904
SCARBOROUGH ON M1B 3V4
OFFICE :416 298 3448
MOBILE:64 780 2853
EMAIL: vgamage030azc@wfgmail.ca

WFG™

# IMPERIAL MORTGAGES INC.



**Residential Mortgages, Commercial Mortgage, Refinancing, Second Mortgage, First Time Home Buyers**

Refinancing: consolidate your debts to improve cash flow turn your home equity into cash when you need it most (home repairs and renovations, education financing); earn a return on your home equity through investments

Self-employed Non-income verifiers Credit issues New immigrants

**Abby Sri Haran**
Senior Mortgage Specialist

Tel: 416 818 1633 Fax: 905 888 6201
Email: abby.residentialmortgages@gmail.com
Licence # 10782



# ANOMA PERERA



Barrister, Solicitor & Notary Public
(Attorney-at-Law, Sri Lanka)

- REAL ESTATE - Residential & Commercial
- WILLS & POWERS OF ATTORNEY

EVENING & WEEK END CONSULTATIONS
AVAILABLE BY APPOINTMENT

## ANOMA PERERA LAW OFFICE

2985 Drew Road , Suite 216, Mississauga, Ontario. L4T 0A4
Telephone: (905) 673-5665 Fax: (905) 673-1682
e-mail : anomaperera01@gmail.com

# කැනඩාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් පදවිය හෙබවූ මහා ප්‍රාඥයා

■ **ආචාර්ය ඩබ්ලිව්. ඒ. අබේසිංහ**
**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපති**



මෑත කාලීන ශ්‍රී ලංකාවේ සදා අනුස්මරණීය නම් කීපය අතරට අනිවාර්යයෙන්ම එක්වන්නකි ගුණපාල මලලසේකර නාමය. ඔහු පිළිබඳ ලිපියක් ලිවීමත් ඔහුගේ චරිත කතාව ඉදිරිපත් කිරීමත් ඉතා පහසුය. එවැනි ලිපි හා චරිත කතා කොතෙකුත් ලියවීද ඇත. එතකුදු වුවත් ශ්‍රී ලංකාව වැනි පුංචි කොදෙව්වක උපදින්නට භාග්‍ය හෝ අභාග්‍ය හිමිව සිටි ශරීර ප්‍රමාණයෙන් පුංචි මේ මිනිසාගේ යෝධ යුග පුරුෂ කායය 21 වෙනි සියවසෙහි ඉතිහාසය නමැති කැන්වසය මත තබා එයට හිමි ප්‍රමාණයෙන් එය චිත්‍රණය කොට දැක්වීම නම් එතරම් පහසු කාර්යයක් නොවේ. වඩාත්ම වේදනාකර කාරණය නම් අද වුව ගුණපාල මලලසේකර විසින් අපගේ චින්තයත් ජාතියේ ඉතිහාසයත් මත තබන ලද මුද්‍රාව කුමක්දැයි හරිහැටි හඳුනා නොගැනීමය.

මින් එකසිය අටළොස් වසරකට පෙර පානදුර ප්‍රදේශයේ සුප්‍රකට ආයුර්වේද වෛද්‍යවරයකුගේ පුතකු හැටියට මෙලොව එළිය දුටු මලලගේ ජෝර්ජ් පීරිස් කුමරුවා (පසුව එම නම වෙනස් කොට ගුණපාල පියසේන මලලසේකර නම ගත්තේය.) පානදුරේ ශාන්ත ජෝන් විද්‍යාලයටත් එතැනින් කොළඹ වෛද්‍ය විද්‍යාලයටත් ගියේ ලෝක පූජිත බෞද්ධ පඬිවරයෙකු වන්නට නොව බටහිර පන්නයේ වෛද්‍යවරයෙකු (දොස්තර) වන්නටය. සිය පියාණන් ඇසුරෙනුත් ස්වෝත්සාහයෙනුත් සිංහල, පාළි, සංස්කෘතද පාසලින් හොඳට ඉංග්‍රිසි සහ ලතින්ද ඉගෙන සිටි තරුණ ජෝර්ජ් පීරිස් වෛද්‍යවිද්‍යාලයේ ගත කළේ එකම එක වසරක් පමණි. ඒ මුල් වසරේදීම ලන්ඩන් බී.ඒ. උපාධියට පෙනී සිට සමත් වන විට ඔහුගේ වයස අවුරුදු 19 ක් විය. අනතුරුව කොළඹ ආනන්ද විද්‍යාලයේ ගුරුවරයෙකු වශයෙන් සේවයට බැඳුණු ඔහු 1923 සිට 1926 තෙක් එංගලන්තයට ගොස් ලන්ඩන් විශ්වවිද්‍යාලයෙහි අධ්‍යයන කටයුතුවල නියැළුණේය. එහිදී ශාස්ත්‍රපති (MA) උපාධියත් දර්ශනපති :P.hd) උපාධියත් දිනාගත් ඔහු ඉන් පිටතට පැමිණියේ මහා පාණ්ඩිත්‍යයක් හිමි සැබෑ උගතකු හැටියටය. ඔහු දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කළ නිබන්ධය වූ The Pali Literature of Ceylon නම් වූ කෘතිය එකී විෂයය පිළිබඳව එවකට ලියවුණු උසස්ම කෘතිය ලෙස පිළිගත් හෙයින් ලන්ඩන් විශ්වවිද්‍යාලයේ සුවිශේෂ සම්මානයකින්ද පිදුම් ලැබුවේය.

1926 දී ලංකාවට පැමිණි ඔහු කොළඹ නාලන්දා විද්‍යාලයේ විදුහල්පති තනතුරට පත්වූ අතර ඊට වසරකට පසු කොළඹ විශ්වවිද්‍යාල ශාස්ත්‍ර ශාලාවේ හෙවත් යුනිවර්සිටි කොලිජියේ සිංහල-පාළි-සංස්කෘත කතිකාචාර්ය තනතුරට පත් විය. ඔහුගේ උගත් කම වඩ වඩාත් බැබළෙන්නට වූයේ මෙතැන් සිටය.



ඔහු විසින් ලියන ලද කාණ්ඩ දෙකකින් යුත් The Dictionary of Pali Proper Names නමැති කෘතිය ලෝක පූජිත වූයේය. මෙම කෘතියට ගෞරව කරමින් ලන්ඩන් විශ්වවිද්‍යාලය ඔහුට 1938 දී දර්ශන සූරි (D.Litt) උපාධිය පිරිනැමීය.

1948 දී ඔහු විසින් සම්පාදිත මලලසේකර ඉංග්‍රිසි-සිංහල ශබ්දකෝෂය ඉංග්‍රිසි උගන්නා සිංහල දරුවනට එදා සිට අද දක්වාම මහඟු පිටිවහලක්ව පවතී. 'ඉංග්‍රිසි ඉගෙනීමේ ආසාව ඇත්තවුන්ගේ ප්‍රයෝජනය සඳහා අංගසම්පූර්ණ ඉංග්‍රිසි-සිංහල ශබ්දකෝෂයක් නැති වීම මෙතෙක් පැවති බලවත් පාඩුවකි. මේ පොත සකස් කරන ලද්දේ ඒ පාඩුව පිරිමැසීමේ බලාපොරොත්තුවෙනි' යනුවෙන් ඔහු එහි ප්‍රස්තාවනාවෙහි සඳහන් කර ඇත. මෙසේ තවත් කෘතීන් කීපයක්ම රචනා කොට දේශයේ පමණක් නොව ජාත්‍යන්තරයේද ගෞරවයට පාත්‍ර වූ මෙතුමා 1924 දී යුනිවර්සිටි කොලිජියේ සිංහල-පාළි-සංස්කෘත මහාචාර්ය පදවියටත් පේරාදෙණිය ලංකා විශ්වවිද්‍යාලය බිහිවීමත් සමග එහි පාළි මහාචාර්ය ධුරයටත් පසුකලෙක ලංකා විශ්වවිද්‍යාලයේ පෙරදිග අධ්‍යයන අංශයේ අධ්‍යයන අංශ අධිපති ධුරයටත් පත්විය.

මෙසේ මලලසේකර මහතා අද්විතීය ශාස්ත්‍රවන්තයෙකු වූ අතරම විශිෂ්ට රාජ්‍ය තාන්ත්‍රිකයෙක්ද වූයේය. 1956 දී සිදුවූ ශ්‍රී ලංකාවේ බල පෙරළියත් සමග සෝවියට් දේශයත්, චීනයත් සමග ප්‍රථම වරට තානාපති සම්බන්ධකම් ඇති කරගත් අගමැති එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා සෝවියට් දේශයේ තානාපති හැටියට යවන්නට ඉන්දියාවේ විශිෂ්ට උගතකුව සිටි සර්වපල්ලි රාධක්‍රිෂ්ණන් තුමන්ගේ ප්‍රමාණයේ කෙනෙක් ශ්‍රී ලාංකිකයන් අතරින් සොයද්දී ඒ අවශ්‍යතාව සඳහා මහාචාර්ය මලලසේකර මහතා තෝරාගත්තේය. ඔහු එයට ඉතාමත්ම ගැළපුණේය. ඒ අනුව 1957 දී ඔහු ලංකාවෙන් විදේශගත වුණේ එවකට කොමියුනිස්ට් රටක මුල්ම ලංකා තානාපති වන්නටය.

මහාචාර්ය මලලසේකරගේ රුසියානු තානාපති සේවාවත් ඔහු එය හෙබවූ ගෞරවනීය සහ ආදර්ශවත් විලාසයත් අපගේ විදේශ තානාපති ඉතිහාසයේ ලියවී ඇත්තේ ස්වර්ණමය වූ අකුරිනි. එය තහවුරු කෙරෙන විශේෂ අවස්ථා දෙකක් පමණක් මෙහි ලා සටහන් කරමි. බණ්ඩාරනායක මහතා ඔහුට සෝවියට් තානාපති ධුරය යෝජනා කළ විට ඒ වන විටත් ලෝක බෞද්ධ සම්මේලනයේ සභාපතිවරයා වශයෙන් සිටි මලලසේකර මහතා "මා ලෝක බෞද්ධ සම්මේලනයේ නිර්මාතෘවරයා බව ඔබ දන්නවා. පන්සිල් පද පහ ආරක්ෂා කරන මට මා රකින පස්වෙනි සිල් පදය බිඳින්නට පුළුවන්කමක් නැහැ. තානාපති මට්ටමින් පැවැත්වෙන උත්සවවලදී ලංකා තානාපති වශයෙන් මධ්‍යසාරයෙන් අමුත්තන්ට සංග්‍රහ කිරීම නොකටයුත්තක්" යැයි කීය. එවිට බණ්ඩාරනායක මහතා නොපැකිලව දුන් පිළිතුර මෙසේය. "මගේ ආදරණීය මිත්‍රයාණනි, පාන වර්ගවලින් සංග්‍රහ කිරීම පිළිබඳ කාරණයේදී සම්පූර්ණයෙන්ම ඔබේ වැටහීමත් ප්‍රතිපත්තියත් අනුව ක්‍රියා කිරීමේ අයිතිය ඇත්තේ ඔබටයි. මම එවැනි දේට බාධා පමුණුවන නායකයෙක් නෙවෙයි"

අනෙක් අවස්ථාව නම් සෝවියට් රුසියාවේ ලංකා තානාපති කාර්යාලයේ පළමු නිල උත්සව අවස්ථාවයි. එදින උත්සවයේ ආරාධිතයන් පිළිගත්තේ සුදු පැහැති ජාතික ඇඳුමෙන් සහ කර වටා පැළඳි සාටකයකින් සැරසී ගත් මහාචාර්ය මලලසේකරයන්ය. සූප ශාස්ත්‍රයේ කෙළ පැමිණි ගෘහනියක වූ මලලසේකර මැතිනියගේ කැවුම්, කොකිස්, කිරිබත්, ආප්ප, ලුණුමිරිස්, අලුවා, කිරි අලුවා ආදි දේශීය කැවිලි පෙවිලිවලින් කෑම මේසය අලංකාරව තිබුණු අතර දොඩම්, වැල් දොඩම්, මිදි, ඇපල් ආදි පළතුරු මිශ්‍ර යුෂ පානය පිණිස සැකසී තිබුණි.

උත්සවයේ සම්භාවණීය ආරාධිතයා වූයේ එදවස ලෝක නායකයකුව සිටි සෝවියට් ජනාධිපති නිකිතා කෘෂෙප් ය. ජනාධිපති කෘෂෙප් සමග සතුටු සාමීචියේ යෙදෙන අතර වාරයේ පංච ශීලයේ එන සුරාවෙන් වැළකී සිටීමේ බුදු වදනත් වැළකී නොසිටීමේ ආදීනවත් මලලසේකර මහතා විස්තර කළේය. මලලසේකර පසුබිම හොඳින් දැන සිටි කෘෂෙප් වීදුරුවකට තමන් විසින්ම වැල්දොඩම් යුෂ පුරවාගෙන එහි රසය විඳින අතර මලලසේකර මහතාගේ පිටට තට්ටු කරමින් මෙසේ කියන්නට විය. "උතුමාණෙනි, ඔබේ ආගන්තුක සත්කාරය ඉතා ඉහළයි. නමුත් ඊටත් වඩා ඉහළින් මා සලකන්නේ ඔබ පිළිගන්නා දහමට කැප වීමට ඔබ තුළ පවත්නා ශක්තියයි". වොඩ්කා පානයට හුරු වී සිටි විශේෂ ආරාධිතයා සමග පැමිණි සෙසු දෙවැනි පෙළේ නිලධරුවෝද තම නායකයා අනුව යමින් පළතුරු පානවලින් තෘප්තිමත්ව විසිර ගියහ.

උත්සවයේදී මත්පැනින් තොර වීමට ගත් තීරණයට තානාපති කාර්ය මණ්ඩලයේ අයගෙන් පූර්ණ එකඟතාවක් පළ නොවීය. මලලසේකර මහතා බස හොඳින් හසුරුවමින් ඔවුන් ඉදිරියේ මෙසේ ප්‍රතිචාර දැක්වීය. "මා මෙන්ම ඔබ සැමත් සිංහල බෞද්ධයන් බව මා ඉතා හොඳින් දන්නවා. මධ්‍යසාර පානයෙන් වැළකී සිටීමට දෙන ප්‍රතිඥාව පස්වෙනි සිල්පදයයි. බෞද්ධයන් සිය කැමැත්තෙන් අන්‍යයන්ට මත්පැනින් සංග්‍රහ කරන්නේ නම් එයත් පාපයක්. මත්පැනින් අනුන්ට සංග්‍රහ නොකිරීමෙන් අප ඔවුන් ඉදිරියේ සිනහවකට බඳුන් වන්නේ යැයි සිතා කෙනෙක් භීතියට පත්වන්නේ නම් එය මොනතරම් දීන හැසිරීමක්ද?"

1957-1961 වසරවලදී සෝවියට් තානාපති තනතුරත් ඊට අමතරව ඒ කාලයේදීම පෝලන්තය, රුමේනියාව, චෙකොස්ලොවේකියාව යන දේශයන්හි තානාපති තනතුරුත් හෙබවූ මලලසේකර මහතා 1961-1963 යන වසරවලදී කැනඩාවේ මහ කොමසාරිස් තනතුරද හොබවමින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිතයා ලෙසත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ සභාපතිවරයා ලෙසත් සයිගෙ ාන්හි කරුණු සෙවීමේ දූත මණ්ඩලයේ සාමාජිකයකු ලෙසත් කටයුතු කළ අතර 1963-1967 වසරවලදී එක්සත් රාජධානියේ ලංකා මහ කොමසාරිස්වරයා ලෙසත් කටයුතු කොට යළි ශ්‍රී ලංකාවට පැමිණියේ අවුරුදු 10 කට පසුවය.

මේ සියල්ලට අමතරව බෞද්ධාගමේ උන්නතිය උදෙසා එතුමා විසින් කැපවීමෙන් කළ අගනා මෙහෙවරද අගය කළ යුතුය. 1927-1929 දෙවසරෙහි සමස්ත ලංකා බෞද්ධ සංගමයේ සම ලේකම් තනතුරද 1937-1939 දෙවසරෙහි එහි උප සභාපති තනතුරද 1939-1957 දක්වා වසර 21 ක් සභාපති තනතුරද යළිත් විදේශ සේවයෙන් පෙරළා පැමිණි පසු අභාවය තෙක්ම එහි සභාපති තනතුරද හොබවමින් කළ මෙහෙය අති විශාල වෙයි. ලෝකයේ බෞද්ධ රටවල් එක්කරලමින් ලෝක බෞද්ධ මහා සම්මේලනය බිහිකිරීමේ නිර්මාතෘවරයා වූයේද එතුමාය. 1950 දී ඇරඹුණු එහි සභාපතිත්වය එතැන් සිට 1958 දක්වා වසර 8 ක්ම ඉසිලීය. එක්සත් ජාතීන්ගේ යුනෙස්කෝහි සිදුහත් බෝසතුන් උපන් ලුම්බිණිය නගා සිටුවීමේ ව්‍යාපෘති කමිටුවේ සභාපතිවරයා වූයේද එතුමාය.

ලෝකය හමුවේ ශ්‍රී ලංකාව බැබළවූ මේ විශිෂ්ට විද්වතා, බෞද්ධ නායකයා, රාජ්‍ය තාන්ත්‍රිකයා, දේශප්‍රේමියා 1973 අප්‍රේල් මස 23 වෙනිදා සිය සේවාව අවසන් කොට මෙලොවින් නික්ම ගියේය.













# පරපුරක් තැනූ පරපුරක සතුට..........!

ටොරොන්ටෝ පුරවරයේ බොහෝ සති අන්ත ගෙවී යන්නේ දැඩි අවිවේකී බවකිනි. ප්‍රිය සම්භාෂණ, සංදර්ශන ඇතුළු නොයෙකුත් ආටෝප සාටෝපයන්ගෙන් පිරී ඉතිරුණු මෙපුරවරයේ ඉතාමත් සංවේදීව හා ආදරණීයව ගෙවී ගිය සති අන්තයක් ගත කිරීමේ අවස්ථාව පසුගියදා අපට හිමි විය. ඒ නොවැම්බර් මස 18 වෙනි දින මිසසාගා විහාරස්ථානයේදී පැවති 'වෙස්ට් එන්ඩ් වැඩිහිටි සුහද හමුව' අවස්ථාවයි. මෙම සුහද හමුව සංවිධානය කොට තිබුණේ වැඩිහිටි සංගමයට වසර 5 ක් පිරීමේ සංවත්සරය වෙනුවෙනි.

එදින පැවති උළෙලේ සිරි විසිතුරු මෙම සේයා රූ තුළින් ඔබට දකින්නට ලැබෙනවා මෙන්ම මෙම 'වැඩිහිටි සංගමය' පිළිබඳවත් මඳක් විමසා බැලීම යුතුකමක් කොට සලකමි. ජන කොට්ඨාසයක් එක්ව සාදාගත් සමිතියක්, සංගමයක් වසර 5 ක් පවත්වාගෙන යෑම ලෙහෙසි පහසු කටයුත්තක් නොවේ. එහෙත් සියලු අභියෝග ජයගනිමින් මිසසාගා වැඩිහිටි සංගමය ඉතාමත් නිහඬව එහෙත් අතිමහත් සේවාවක් සිදුකරමින් 5 වන වසරද පියමන් කරමින් සිටී.

මෙම සංගමයේ ආරම්භය පිළිබඳව එහි ක්‍රියාකාරී සාමාජිකාවක වූ නයනා දෙහිපොල මහත්මියගෙන් අප විමසීමක් කළා.

අපි මේ සංගමය පටන් ගත්තෙ 2013 ඔක්තෝබර් මාසෙ. අපේ වැඩිහිටි මවුපියවරුන් වෙනුවෙන් මේ වගේ වැඩපිළිවෙළක් ආරම්භ කරන්න මූලිකම අදහස ගෙන ආවේ සුගත් එදිරිසිංහ මහත්මයා. ඒ සමගම මේ සම්බන්ධයෙන් භද්‍රා ජයරත්න මහත්මියත් විශාල උනන්දුවකින් කටයුතු කළා. යසෝමාලා ගුණසේකර මහත්මිය ඒ උනන්දුව ක්‍රියාත්මක කර ගැනීමට අවශ්‍ය ශක්තිය සැපයූ අපේ වැඩිහිටි මාතාවක්. මෙය ඇත්තෙන්ම ඔවුන් තිදෙනාගේ අදහසක් අනුව ආරම්භ වුණු සංගමයක් යැයි කීවොත් මා වඩාත් නිවැරදියි. ඒ අයගේ උනන්දුව මත තමයි තවත් අපි කීපදෙනෙකුත් එකතු වෙලා මිසසාගා වැඩිහිටි සංගමය පිහිටුවා ගත්තෙ. මෙතනදි මිසසාගා විහාරස්ථානයේ නායක ස්වාමීන්වහන්සේ ලෙසින් කුළුගම්මන ධම්මාවාස හිමියන්ගෙන් නිරන්තරයෙන් ලැබෙන සහයෝගයත් අපේ සංගමය පිහිටුවීමේ සිට අද දක්වාම අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කරමින් අපට මග පෙන්වන අප සංගමයේ අනුශාසක වශයෙක් කටයුතු කරන කීඹිඇල කස්සප ස්වාමීන්වහන්සේත් අනිවාර්යයෙන්ම මතක් කළ යුතුමයි.

එතැන් සිට අද දක්වා සෑම මාසයකම අවසාන සතියේ යෙදෙන සිකුරාදා උදෑසන 9.00 සිට සවස 2.30 පමණ වනතුරු අප මේ මවුපිය වැඩිහිටියන් වෙනුවෙන් කාලය වෙන් කර කටයුතු කරනවා. ආරම්භයේදී ඉතා සුළු වැඩිහිටියන් පිරිසක් තමයි මේ සංගමයට සහභාගි වුණේ. ඒත් අද වන විට ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 50 ක් පමණ අප සංගමයේ සාමාජිකත්වය ලබාගෙන තියෙනවා. ඇත්තටම අප මේ පිරිස වෙනුවෙන් සිදුකරන සෑම කටයුත්තක්ම සැලසුම් කළේ මේ පිරිස සමග සිටිමින් ඒ ලබාගත් අත්දැකීම් ඔස්සේ ඔවුන්ගේ සතුට වෙනුවෙන්මයි. ඔවුන්ගේ රුචි අරුචි කම් හා දක්ෂතා තේරුම් ගැනීමෙන් පසු ඔවුන් සමග කටයුතු කරන එක අප කණ්ඩායමට පහසු වුණා. මෙතනදි අපි ඔවුන්ගේ සතුට, දැනුම, මතක ශක්තිය, සෞඛ්‍ය ආදි කටයුතුවලට මූලිකත්වය දී කටයුතු කරනවා. මාස දෙකකට සැරයක් වෛද්‍යවරයකු මගින් යහපත් සෞඛ්‍ය පවත්වාගෙන යාමේදී වැදගත්වන ආහාර පාන හා මානසික සෞඛ්‍යය ආදි තත්ත්වයන් පිළිබඳ උපදෙස් ලබා දීමත්, ශාරීරික අභ්‍යාස ආදිය සිදු කිරීමත්, ගීත ගායනා, කෙටි නාට්‍ය හා රංගනයන් ආදි කටයුතු සඳහා අවස්ථාව ලබාදීමත්, වැඩිහිටියන් වෙනුවෙන් කැනඩාවේ සිදුකෙරෙන කටයුතු පිළිබඳ දැනුවත් කිරීමත් සිදුවනවා. මවුපියන් රැස්වන දිනයේදී ඔවුන් වෙත ඔවුන් කැමති ආකාරයට ආහාරපානවලින් සංග්‍රහ කිරීමටද අප අමතක කරන්නේ නෑ.

අප සංගමය ආරම්භයේ පටන්ම සිංහල අලුත් අවුරුද්දට අවුරුදු ක්‍රීඩා සහ සිංහල කෑම බීම සහිතව අවුරුදු උත්සවයක් සංවිධානය කළා. ඒ වගේම ග්‍රීෂ්ම සෘතුවේදී එළිමහන් චාරිකා ආදිය සංවිධානය කිරීමත් සිදුකරනවා. ඊට අමතරව වැඩිහිටි දිනය සැමරීම, ශ්‍රී ලංකාවේ නිදහස් දිනය සැමරීම, වෙසක් උත්සවය සැමරීම වගේම නත්තල වෙනුවෙන් පුංචි සාදයක් සංවිධානය කිරීමත් අප සිදුකරනවා. අපේ අම්මල තාත්තලව මනසින් ශ්‍රී ලංකාවට රැගෙන යන එවැනි අවස්ථා සමරන අතර ඔවුන් දැන් ජීවත් වන කැනඩාවේ ප්‍රධානම දවස වන කැනඩා දිනය සැමරීමත් අපි සිදුකරනවා. ඇත්තටම මේ සියල්ලටම ඔවුන් ඉතාමත් සතුටින් හා උද්යෝගයෙන් සහභාගි වනවා.

තවත් දෙයක් කියන්න ඕන. මෙම සංගමය විහාරස්ථානය මූලික කරගෙන කළත් කිසිම ආගම් බේදයක් නෑ. අන්‍යාගමික් මවුපියවරුනුත් අපිත් එක්ක ඉන්නවා.

අපේ මේ අම්මල තාත්තලා හැමෝම වගේ අපේ මවුරටේදී හොඳ රැකියාවන්වල නිරත වුණු ඇසූ පිරූ තැන් ඇති අය. විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඒ අය තුළ තියන දැනුම විශ්මිතයි. අපේ පස්වන වර්ෂ පූර්ණ උත්සවයේදි ඔබ එය දකින්න ඇති. මේ වගේ වැඩපිළිවෙළක් තිබුණ නිසා තමයි ඒ දේවල් මෙහෙම වේදිකාවකට ගෙන ඒමට ඔවුන්ට අවස්ථාව ලැබුණේ. ඇත්තටම මම හරිම සතුටු වනවා මේ වගේ කටයුත්තකට එකතු වෙලා සේවයක් කරන්න ලැබුණ එකට. එක්තරා විදියකට මෙය සේවයකට එහා ගිය අපෙන් විය යුතු යුතුකමක් කියල මට හිතෙනවා.

මම මෙහිදී සඳහන් කළ යුතු තවත් දෙයක් තියෙනවා. මේ සංගමය මේ විදියට පවත්වාගෙන යාමට ඉතාමත් මහන්සි වන අපේ කණ්ඩායම ගැන. වැඩිහිටි සංගමයේ කටයුතු වෙනුවෙන් සිකුරාදා දිනයේ මේ බොහෝ දෙනෙක් තම රැකියාවලින් නිවාඩු ලබාගෙන එන්නෙ. පුදුම කැපවීමකින් තමන්ගෙම මවුපියවරුන්ට වගේ සලකමින් කිසිම ප්‍රති බලාපොරොත්තුවක් නොමැතිව ඒ කටයුතු සිදුකරන්නෙ. මේ කණ්ඩායම නම් වශයෙන් මම හඳුන්වන්නම්. භද්‍රා ජයරත්න, සුගත් එදිරිසිංහ, කුසුම් බොරළුගොඩ, යසා රාජපක්ෂ, කාන්ති මොල්ලිගොඩ, ටයනී ද සිල්වා, කුමුදු රත්නායක, ක්‍රිෂාන්ති දොඩම්පගමගේ, ආශා විජේවික්‍රම.

නයනා මේ තොරතුරු අපට පැවසූවාට ඔබට බොහොම ස්තූතියි. ඇත්තටම ඔබ ඇතුළු සියලුම දෙනාගේ අප්‍රතිහත කැපවීමේ ප්‍රතිඵල සංගමයේ 5 වන සංවත්සර උත්සව දිනයේ අප හොඳින් දුටුවා. වැඩිහිටි සංගමයට පණ පොවන ඔබ ඇතුළු දුවා දරුවන් කණ්ඩායම එදා ඒ මවුපියවරුන්ගේ ගෞරවාදරයට ලක් වුණේ හද පුරා බැඳුණු ළබැඳි සෙනෙහසින්. ප්‍රසිද්ධිය, ධනය, බල ලෝභය මූලික කරගෙන කටයුතු කරන කාලයක ඔබ කණ්ඩායම කිසිදු ලාභ ප්‍රයෝජනයකින් තොරව ඉතාමත් නිහඬව සිදුකරන මෙම කාර්යයට අපත් ගෞරව ප්‍රණාමක ස්තූතිය පළ කරනවා.

ඒ වගේම වැඩිහිටි සුහද හමුවට සහභාගි වෙමින් අපව රසවත් කළ මවුපියවරුන්ටත් සුවහසක් වූ අනෙකුත් සියලුම මවුපියවරුන්ටත් නිදුක් නිරෝගී චිර ජීවනය සැලසේවා ! යි ශීර්ෂ ප්‍රණාමකව සුභ ප්‍රාර්ථනා කරනවා.

**සටහන - චමරී අබේසිංහ**
**සේයා රූ - කෝසල මකුළොළුව**












LAL LAW OFFICE
Real Estate
Mortgages
Immigration Law
Family Law
Tax Law
Lal Handapangoda
Barrister & Solicitor
90 Kennedy Road South. Unit #7
Brampton, Ontario, L6W 3E7
Tel. 905.457.1025 | Fax 905.457.1045 | Cell 416.838.3966
Email: lallawfirm@gmail.com


AJITH BERAGAMA LL.B, LL.M
BARRISTER, SOLICITOR AND NOTARY PUBLIC
experienced, quality, knowledgeable and affordable service
AB Ajith Law Office
Real Estate Law
Landlord and Tenent Law
Personal Injury Law
Wills & Estates Law
Immigration Law
Family Law
24/7 Hotline - 647 328 6623
10 MILNER BUSINESS COURT,
3 RD FLOOR SCARBOROUGH M1B 3C6
OFFICE - 647 777 8347
FAX - 647 777 8348
EMAIL - AJITH@AJITHLAWOFFICE.COM


Century 21
Leading Edge Realty Inc. Brokerage
invis
Canada's Mortgage Experts™
THUSITH WEERASURIYA
REAL ESTATE SALES REPRESENTATIVE / MORTGAGE AGENT
416 616 2402
THUSITH.WEE@ GMAIL.COM
WWW.THUSITH.COM
"HELPING YOU GET MORE FOR YOUR REAL ESTATE"
T
Bus: 905-405-8484 Fax : 905-405-8881
www.Century21LeadingEdge.ca
7071 Airport Rd Suite 201, Mississauga, ON L4T 4J3
*Independently owned and operated.
Markham
165 Main St N.
Scarborough
1825 Markham Rd.
Ajax
527 Kingston Rd. W
Toronto North
1053 McNicoll Ave.
Yorkville
1300 Bay St.
Stouffville
6393 Main St.
Whitby
408 Dundas St. W
Don Mills
801 York Mills Rd.


Cakes To Dream On
මංගල කේක්
ලාංකේය මංගල කේක්
මංගල හා ප්‍රිය සම්භාෂණ සඳහා තනි තනි අතුරුපස (Individual Desserts)
ඉල්ලීම අනුව නිර්මිත කේක් වර්ග (Custom Cakes)
කප් කේක් / කේක් පොප් / මැකරොන්
ප්‍රනීත ආහාර මේස (Sweet Tables)
ඩබල් චොක්ලට් ෆොන්ටන්
චොක්ලට් වර්ග
සජීවී ද්‍රාවප නයිට්‍රජන් අයිස් ක්‍රීම් (Liquid nitrogen Icecream (Live)
සජීවී උදෑසන අහාර මේස
ලාංකේය ක්‍රමයට බත් සහ ව්‍යංජන
සැන්ඩ්විච් වර්ග
ලාංකේය බේකරි කෑම වර්ග (Pastries)
පලතුරු, චොක්ලට්, සීනිමය හා මාසිපෑන් වලින් නිර්මිත ප්‍රධාන කෑම සැරසිල්ල
(Edible Carvings for centre pieces)
සඳහා විශිෂ්ඨයන්.
25ස් වසරක අත්දැකීම් හා සහජ කුසලතාවෙන් සපිරි, ඔලිම්පික් රන් පදක්කම් ලාබී, සූපන ආචාර්ය ශිල්පී
දිමුතු පෙරේරා
අතින් හැඩගැන්වෙන සම්මානනීය ආහාර සැරසිලි, අප කේක්ස් ටු ඩ්‍රීම් ඔන් ආයතනයෙන් එළි දැක්වේ.
අප හා සම්බන්ධ වීමෙන් ඔබගේ ඊළඟ විශේෂ උත්සවය සඳහා අපගේ විශ්වාසනීය
උපදෙස් නොමිලේ ලබා ගත හැක.
Cakes To Dream On
www.cakestodreamon.ca
https://www.facebook.com/cakestodreamon
TP: 416-857-4566
order@cakestodreamon.ca
ටොරොන්ටෝ හා තදාසන්න ප්‍රදේශ (GTA), ඇජැක්ස්,
බර්ලිංටන්, ඕක්විල් හා මුස්කොකා දක්වා සේවා සැපයේ.
අවම ඇනවුම දස දෙනෙකු සඳහා.
තම නිවසටම ප්‍රවාහනය කෙරේ.


SYLVESTER STUDIO'S
CUSTOM PORTRAIT &
FINE ART PHOTOGRAPHY IN AJAX,
TORONTO & SURROUNDING AREAS
Professional Wedding and E-Shoots
416-300-1121
sylvesterstudios404@gmail.com
404
sylvester studios copyright



# තෙල්වලට වඩා දේශපාලනය ගබඩා කෙරෙන ත්‍රි'මලේ තෙල් ටැංකි

■ ජයරත්න ගුණමුණි ලේකම්
එතෙර අපි සංවිධානය - කැනඩා ශාඛාව

ශ්‍රී ලංකාවේ භූගෝලීය පිහිටීම නිසාත් ජාත්‍යන්තර නැව් මාර්ගයක් ආසන්නයේ පිහිටීම නිසාත් ගැඹුරුම ස්වභාවික වරායන්ගෙන් එකක් වන ත්‍රිකුණාමල වරායට හිමිවන්නේ ඉතා වැදගත් ස්ථානයකි. පළමු ලෝක යුද්ධයෙන් පසු බ්‍රිතාන්‍යයේ පෙරදිග කලාපයේ මූලික සැපයුම් මධ්‍යස්ථානය ලෙස ත්‍රිකුණාමලයේ චීන වරාය ප්‍රදේශයේ අක්කර 670 ක පමණ වපසරියක ඝන මීටර් 12,500 ක ධාරිතාවය ඇති තෙල් ටැංකි 101 ක් ඉදිකරන ලදී. මෙහි සමස්ත ධාරිතාව තෙල් මෙට්‍රික් ටොන් දසලක්ෂයකි. එවකට එය මුලු පෙරදිග කලාපයටම තෙල් ගබඩාව විය. ඉන් ටැංකි 2 ක් දෙවන ලෝක යුද්ධයේදී විනාශ විය.

බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවට 1948 දී නිදහස දුන්නද තෙල් ටැංකිවල අයිතිය බ්‍රිතාන්‍ය නාවික හමුදාව සතුව තබාගත්හ. එයින්ම මෙහි වැදගත් කම මනාව පැහැදිලි වේ. 1964 දී පවුම් දෙලක්ෂ පනස්දාහක් බ්‍රිතාන්‍ය නාවික හමුදාවට ගෙවා අයිතිය තෙල් සංස්ථාවට පවරාගත් අතර භූමියේ අයිතිය ශ්‍රී ලංකා රජය සතු විය. 60 දශකයේ කලාපයේ තෙල් ඉල්ලුම පිළිබඳ ගැටලු හා භූමියේ අයිතිය පිළිබඳ ගැටලු නිසා මෙම ටැංකි භාවිතය නිසි පරිදි සිදු නොවුණි. නමුත් 70 දශකයේ අග දක්වා දුම්රියෙන් රටේ අනෙකුත් ප්‍රදේශවලට තෙල් බෙදාහැරීම මෙම මධ්‍යස්ථානයෙන් සිදුකෙරිණි. පෞද්ගලීකරණය හා විකුණා කෑම ප්‍රතිපත්තිය වූ ජේ. ආර්. රජය 80 අග භාගයේදී මෙය ඇමරිකාවට බදු දීමට උත්සාහ කළද ඉන්දියාවේ දැඩි බලපෑම මත එය වැළැක්විනි. 1987 දී ඉන්දු-ලංකා ගිවිසුමේදී මෙම ටැංකි ඉන්දියාව සමග හවුලේ භාවිත කළ යුතු බවට යෝජනා විය.

පැවති යුදමය වාතාවරණය නිසා මෙම ටැංකිවලින් ප්‍රයෝජනයක් ගැනීමට මෑතක් වනතුරු නොහැකි වූ අතර 2002 දී සිංගප්පූරු සමාගමකට බදු දීමට සැලසුම් කොට තිබියදී බලයට පත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ලංකා-ඉන්දියන් ඔයිල් සමාගමට (LIOC) බදු දීමට තාවකාලික ලියවිල්ලක් අත්සන් කළේය. එදින සිට මාස 6 ක් ඇතුළත ලංකා රජය හා LIOC විධිමත් බදු ගිවිසුමකට එළඹිය යුතු විය. නමුත් මේ වනතෙක් එබඳු ගිවිසුමක් සිදුවී නැති අතර 2003 අගෝස්තු සිට LIOC තෙල් ටැංකි පරිහරණය කරන්නේ නීති විරෝධීවය. නීතිමය තත්ත්වය මෙසේ වුවද තාවකාලික ලියවිල්ලේ සඳහන් කුලී ගෙවීම් මේ වනතෙක් සිදුකරයි. එය එක් ටැංකියක් සඳහා වසරකට ඇමරිකානු ඩොලර් 1000 ක් වැනි සුළු මුදලකි. ටැංකි 99 ක් සඳහා ඩොලර් 99,000 ක් වන අතර පොම්ප හා අනෙකුත් උපකරණ සඳහා තවත් ඩොලර් 1000 ක් ලෙස ඩොලර් ලක්ෂයකි.

## ගිවිසුමෙන් ශ්‍රී ලංකාවට වන පාඩු

LIOC සමාගම මෙහි නළ පද්ධතිය කපා යකඩවලට විකිණූ අතර විශාල පිත්තල කරාම ඉන්දියාවට පැටවීය. 2007-2010 කාලය තුළ පමණක් මෙම පහසුකම් හරහා තෙල් යැවීම වෙනුවෙන් තෙල් සංස්ථාව ඉල්ලා ඇති මුදල රුපියල් මිලියන 945 කි. මේ කාලය තුළ ඔවුන් ගෙවා ඇති බදු මුදල රුපියල් මිලියන 40 කි. එනම් බදු මුදල් මෙන් 23 ගුණයකි.

2015 වෙළඳ සංඛ්‍යාලේඛනවලට අනුව උතුරු නැගෙනහිර හා උතුරුමැද ප්‍රදේශවලට පමණක් තෙල් බෙදාහැරීම මේ ටැංකි භාවිත කර සංස්ථාව මගින් සිදුකරයි නම් තෙල් සංස්ථාවට ප්‍රවාහන හා මෙහෙයුම් ගාස්තු ලෙස වැයවන රුපියල් මිලියන 1000 ක් වසරකට ඉතිරි කරගත හැකියි. නැව් ගාස්තු හා ප්‍රමාද ගාස්තු ආදිය සැලකූ කල සියල්ල රුපියල් මිලියන 1500 ක් පමණ වේ. පසුගියදා ඇතිවූ තෙල් අර්බුදයෙන් මේ පිළිබඳව හොඳ අවබෝධයක් අපට ලබාගත හැකිය. තෙල් නැවක් පැමිණෙන තුරු සියලු සේවාවන් අකර්මණ්‍ය වී බලා සිටීමට රටට සිදුවිය. එක් දිනක් වැඩ නැවැත්වීම කෙතරම් අලාභයක් රටට සිදුකරන්නේද යන්න දැනගැනීමට ආර්ථික විශේෂඥයන් අවශ්‍ය නොවේ. කොළොන්නාව හා මුතුරාජවෙල දෙකෙහිම ධාරිතාව (මෙට්‍රික් ටොන් ලක්ෂ 4) රටට සෑහෙන්නේ සති 2 කට පමණි. ඉල්ලුමට සරිලන සැපයුම් සංචිත සඳහා ටැංකියක් ඉදිකරන්නේ නම් පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 3 කි. රටේ ටැංකි නිකම්ම තිබියදී තව ටැංකි ඉදිකිරීමට ජනතාව මුදල් වියදම් කළ යුතුද? පිහිටීමේ වැදගත්කම නිසාම මෙම ටැංකි විදේශ සමාගම්වලට බදු දීමෙන් විශාල ආදායමක් රටට ලබාගත හැකිය. එසේම ඒ සඳහා පැමිණෙන නැව්වලට සේවා සැපයීමෙන් තවත් ආදායමක් උපයාගත හැකිය.

මෙම ටැංකි ප්‍රයෝජනයට ගත නොහැකි කැළෑ වැදුණු කෞතුක වස්තු ලෙස හුවා දක්වා විකුණා කොමිස් ගසා කෑමට බලා සිටින දේශපාලුවන් මේවා සම්බන්ධව ඉන්දියාව සමග හවුල් ව්‍යාපාරයකට යා යුතු බව ප්‍රකාශ කරයි. අලුත්වැඩියා සඳහා රජයට මුදල් නොමැති බව ප්‍රකාශ කරන්නේ ඒ පිළිබඳව වියදම් තක්සේරුවක් නොමැතිවය. 2016 වසරේ තෙල් සංස්ථාව විසින් ජාත්‍යන්තර සුදුසුකම් සහිත ආයතනයක් හරහා සිදුකළ පරීක්ෂණ වාර්තාවට අනුව ඉහළ ටැංකි අංගනයේ ටැංකි 16 ක් සඳහා නළ එළීම, දුම්රියෙන් තෙල් පුරවන අංගනය හා දුම්රිය මාර්ගයේ අලුත්වැඩියාව සඳහා වැයවන්නේ ඇමරිකානු ඩොලර් මිලියන 10 කි. මෙම මුදල වියදම් කිරීමට ලංකා ඛනිජ තෙල් සංස්ථාවට (CPC) හැකියාව ඇති අතර ඒ සඳහා කැබිනට් අනුමැතිය පවා ලබාගෙන ඇත. මෙම මුදල වසරකදී උපයාගත හැකි බව තෙල් සංස්ථාව පවසයි. මීට අමතරව නැව් තෙල් වෙළඳාම හා මේ වන විටත් විදේශ සමාගම් ඉල්ලා ඇති පරිදි ජාත්‍යන්තර තෙල් ගබඩා ලෙස භාවිත කිරීම හරහා විශාල මුදලක් උපයාගත හැකි වන අතර එයින් ඉතිරි ටැංකි අලුත්වැඩියාවට මුදල් පහසුවෙන් සොයාගත හැකිය.

මෙම ටැංකි සංකීර්ණයෙන් රටේ ආර්ථිකයටත් ජනතාවටත් සිදුවන බලපෑම ඉහත විස්තර කෙරුණි. ඊට අමතරව දේශපාලන උපාය මාර්ගිකව වැදගත් මෙම තෙල් ටැංකි නිසා කලාපීය බලවතුන් සමග දේශපාලන ගැටුම් ඇතිකර ගැනීමේ අවදානම අප හමුවේ ඇත. මෙම ටැංකි බදු දීමට තීන්දු කොට ඇත්තේ ඉන්දියාවට වන අතර චීනය එය නොරුස්සයි. එය සමනය කිරීමට හම්බන්තොට වරාය චීනයට බදු දීමට සිදුවී ඇත. කොළඹ වරායේ බටහිර ජැටිය චීනයට බදු දීම නිසා නැගෙනහිර ජැටිය අනිවාර්යයෙන් ඉන්දියාවට ලබාදෙන ලෙස ඉන්දියාව බල කරයි.

පෙරදිග-අපරදිග යා කරන නැව් මාර්ගයේ නැව් සඳහා ඉන්ධන ලබාදීමේ උපරිම විභවය ශ්‍රී ලංකාව සතුය. දැනට සිංගප්පූරුව විසින් සිදුකරන එම පහසුකම ලබාගැනීම සඳහා ඉන්දියන් සාගරයේ ගමන් කරන නැවක් අමතර තෙල් මෙට්‍රික් ටොන් 8000 ක් වියදම් කරයි. ශ්‍රී ලංකාව මෙය සපයන්නේ නම් ඔවුන්ට මෙයින් අඩක් අඩු කරගත හැකි වේ. මේ විශාල නැව් මාර්ගයේ ආසන්නම වරාය හම්බන්තොට වරායයි. මෙම මාර්ගයේ යන නැව්වලින් දහයෙන් එකකට තෙල් සැපයුවහොත් එක් දිනකදී තෙල් නැවක් අලෙවි කළ හැකිය. දැනට ඉදිකිරීමට සැලසුම් කොට ඇති තායිලන්තයේ ඇල මාර්ගය හරහා පැමිණෙන නැව් කිලෝ මීටර 1600 ක දුරක් අඩුකරගෙන හම්බන්තොටට පැමිණේ. හම්බන්තොට වරාය චීනයට දුනහොත් අද සිංගප්පූරුව ලබන සියලු ලාභ ශ්‍රී ලංකාව වෙනුවට චීනය ලබාගනු ඇත. හම්බන්තොට ඉදිකොට ඇති මෙම තෙල් පහසුකම ණය ගෙවීමේ පොරොන්දුව මත තෙල් සංස්ථාව ඉල්ලා ඇති අතර එය නොසලකා චීනයට ලබාදීමට සැලසුම් කරන බව ආරංචි මාර්ග පවසයි. හම්බන්තොට චීනයට දුනහොත් අනිවාර්යයෙන්ම ත්‍රිකුණාමලය ඉන්දියාවට දීමට සිදුවේ.

මෙම තෙල් ටැංකි හා වාරයයන් කළමනාකරණය කොට ඉතා අධික ලාභ ලැබීම සඳහා ක්‍රම විද්‍යාත්මකව සංඛ්‍යාලේඛණ සහිතව ඔප්පු කොට තිබියදීත් අපගේ බල ලෝභී, අදූරදර්ශී, විකුණාගෙන කෑම ප්‍රතිපත්තිය කොටගත් දේශපාලුවන් ඒවා එසේ නොකරන්නේ රටේ හා ජනතාවගේ අභාග්‍යය නිසා විය හැකිය.



SHANI HANWELLA
Registered Canadian Immigration Consultant, CEO,
Former Visa Officer, Canadian High Commission,
Colombo, Sri Lanka

NOVA Immigration Solutions Inc.
A CANADIAN IMMIGRATION CONSULTANCY FIRM
100% PARENTAL SUPER VISA AND 98% STUDENT VISA SUCCESS RATES
416 298 0990
shani.hanwella@novaim.ca
1585 Markham Road, Suite 405, Scarborough, ON M1B 2W1
www.novaim.ca



3 වන කොටස

# ප්‍රාර්ථනා මල් පිපුණා

පද්මිණී ජයතිලක

සඳරුවන් ලංකාවට පැමිණීමේ ආරංචියත් සමඟම ඔහුගේ මිත්‍රයින් හිතවතුන් නෑදෑයින් මෙන්ම ගමේ තරුණ පිරිසද ඔහු මුණගැසීමට නිතර නිතර වලව්වට පැමිණියහ. කවදත් මිතුරු සමාගම ප්‍රිය කළ ඔහු මේ අය සමඟ සතුටු සාමීචියේ නිරත වූයේ මහත් කැමැත්තෙනි. ඒ හැම දෙනෙකුටම තේ කෝප්පයකින් සංග්‍රහ කිරීමටද සඳරුවන් අමතක කළේ නැත. අනාගතයේදී දේශපාලන පොර පිටියට අවතීර්ණ වීමේ සිහිනය සිත තුළ මෝදු වෙමින් පවතින නිසා ඔහු සෑම කෙනෙකු සමගම සුහදත්වය ගොඩ නගා ගැනීමට පසුබට වූයේ නැත.

කුස්සියේ තේ පිළියෙල කිරීම පුෂ්පා අතින් සිදු වුවද තේ බන්දේසිය ඉදිරියට ගෙන ආවේ ලොකු මැණිකේ විසිනි. ලොකු මැණිකේ නැති වෙලාවට පුෂ්පා තේ බන්දේසිය සාලයේ මේසය මත තබා ගියාය.

තරුණ පිරිස වලව්වට පැමිණ සිටි වේලාවකදී සඳරුවන් තම ඉදිරි වැඩපිළිවෙළක් වූ කොහු ෆැක්ටරිය පිළිබඳ අදහස ඔවුන් හමුවේ තැබුවේය.

“නියමයිනෙ රුවන් මහත්තයා, හොඳ ගාණකට ගමේ කට්ටියට රස්සාවල් දෙන්න පුළුවන් වෙයි නේද? දෙන්නම්කො අපිත් නියම බකප් එකක්. ඒකනෙ ධනය, බලය තියෙන අය වැඩ කරන්න ඕනි අන්න එහෙමනෙ”

“ඕගොල්ලන්ගෙ සපෝට් එක තියෙනවනම් මොනවද කරන්න බැරි”

“මොකක්ද ඔය කොහු ෆැක්ටරිය. මොකක්ද ඒකෙන් කරන්නෙ?”

“මේකනෙ මල්ලි පොල් ලෙල්ල තලල කොහුවලින් බ්‍රෂ් එකක් හදනවා. ඒකට කියන්නෙ තවාෂි බ්‍රෂ් එක කියල. ඉතිරි වන කොහුබත්වලින් හදනවා කොහුබත් ගඩොලක්. එංගලන්තෙ මේ කොහු බත් ගඩොලට හොඳ ඩිමාන්ඩ් එකක් තියෙනවා. කොහුබත් ගඩොල තමයි ගස්වල තෙතමනය රඳවා ගන්න යොදා ගන්නෙ. මම ඊයෙ මේ වැඩේ පටන් ගන්න අපනයන සංවර්ධන මණ්ඩලයෙන් බලපත්‍රයත් ගත්තා. හුඟක් උපදෙස් මට එහෙදි ලැබුණා”

“රස්සාවල් කොච්චර විතර දෙන්න පුළුවන්ද රුවන් මහත්තයා”

“මෙහෙමයි නිර්මාල්, වැඩිපුර තියෙන්නෙ කම්කරු රැ කියාවල් තමයි. අනිත් රැකියාවල් තිහක් විතර තමයි ඇති වෙන්නෙ”

“මදෑ ගමේ දුප්පත් අයට ලොකු පිහිටක්නෙ. ගමේම ඉඳන් කීයක් හරි හොයාගන්න හොඳ චාන්ස් එකක්නෙ”

“ඔව් ගෑනු පිරිමි දෙගොල්ලන්ටම වැඩ තියෙනවා. හුඟක් දෙවල් කෙරෙන්නේ මැෂින්වලින්. මම මැෂින් ඇණවුමක් ඊයෙම කරලයි ආවෙ”

“එහෙනම් වැඩේ කෙරෙන එක ෂුවර්. ළඟදිම පටන් ගන්න පුළුවන් වෙයි”

“ඊළඟ ප්‍රශ්නය තමයි අජන්ත, මම හිතාගෙන ඉන්නෙ ඊළඟ පළාත් සභා මැතිවරණයට තරඟ කරන්න. මොකද අපේ බාප්පා ඊළඟ මහ මැතිවරණයට ඉල්ලන්නෙ නැතිලු. නංගිලා දෙන්නම දේශපාලනයට කැමති නැතිලු. මගෙන් බාප්පා ඉල්ලපු ඉල්ලීමක් තමයි දේශපාලනයට බහින්න කියල කියපු දේ. මොකද? බාප්ප මේ වෙනකොට ගොඩනග ාගෙන තියෙන දේශපාලන පසුබිම ප්‍රයෝජනයට අරගෙන පාර්ලිමේන්තුවට යන්න කියල තමයි එයා මට කියන්නෙ”

“ෂා .... හොඳ ආරංචියක්. ඇත්තම කියනවනම් රුවන් මහත්තයා අපි ඔයාගෙන් බලාපොරොත්තු වුණොත් ඕකම තමයි. අපේ ගමෙන් අපි දන්න කෙනෙක් පාර්ලිමේන්තු යනවා කියන්නේ ආයි මොනවද ඉතින් අපි ගියා වගෙම තමයි. මොනව කරන්න බැරිද රුවන් මහත්තයා. දැන් වැලි ටිකක් ගොඩ දාගන්නවත් බැහැනෙ දේශපාලන හයියක් නැත්නම්. අඩුම තරමෙ එයාර්පෝර්ට් එකට වාහනයක් දාගෙන දුවන්නත් දේශපාලන සපෝට් නැත්නම් බැහැ”

“ඔව් .. ඔව්.. රුවන් මහත්තයා අපේ ෆුල් බකප් එක අපි දෙනවා. ආයි නැහැ ඉතින් බොක්කෙන්ම තමයි. අපි ඉන්නව රුවන් මහත්තයත් එක්ක මැරෙන්න හරි”

“හරි. හරි. තාම බාප්ප පාර්ලිමේන්තුවෙ ඉන්නවනෙ. මහ ඡන්දෙට තව කල් තියෙනවා. මම මේ ළෑස්තිවෙන්නෙ ළඟ එන පළාත් සභාවට තරඟ කරන්න”

“ඔව් ඔව් දැන් දේශපාලනය යන්නෙ ඒ විදියටනෙ. මොන්ටිසෝරියෙන් පටන් අරන් විශ්ව විද්‍යාලයට යන්න එපායෑ”

“රුවන් මහත්තයා එහෙනම් දැන්මම ගමේ සමිති ටිකක් හෙම හදාගෙන සමාජ වැඩ ටිකක් කරන්න පටන් ගත්ත නම් තමයි වැඩේ නියමෙට පත්තු වෙන්නෙ”

“ඔව් ඔව් ජයන්ත හරි. මටත් ඒ ටික හිතුණා”

“අපි මේ ආවෙ රුවන් මහත්තයව බලලා යන්න. ආවා කියල අපිට ආරංචි වුණොත් ඊයෙ. අපිට ඕන දෙයක් කියන්න. අපි එනවා. ෆැක්ටරිය පටන් ගන්න. අපි එනවා සපෝට් එකට”

“මම නොදන්නවයැ ඕගොල්ලො ගැන”

“ආ... මෙන්න මම්ම තේ හදල ගෙනල්ල. තේ ටිකක් බීලම යන්න”

තරුණ පිරිස තේ පානයෙන් පසු නික්ම ගියහ.

“චූටි පුතේ, දැන් ජිනේලගෙ අජන්තලගෙ කටවල්වලින් හාමු කියල කියවෙන්නෙම නැහැ නේද?”

“ඕව ඔහොම තමයි මම්මෙ, කාලෙ හැටි. මහත්තයා කියල කථා කළානෙ. ඒ මදෑ. දේශපාලනයට යන්න ඉන්න මට හාමු පට්ටම රකින්න බැරිවෙයි ඉදිරියට”

“අනේ කාලේ වනේ වාසේ කිව්වලු”

“ඕවා ඔහොම තමයි මම්මෙ”

“මට බය හාමු පට්ටම නැති වුණා වගේ වලව්වෙ තත්ත්වෙත් ඔය දේශපාලනය හින්ද නැතිවෙයිද කියලයි”

“පිස්සුද මම්මෙ. අද දේශපාලනය තමයි නියම රස්සාව. නරකද ඇමති පට්ටමක් අරගත්තම. අන්න ඒක තමයි වලව්වේ තත්ත්වෙ රකින්න ගන්න ඕනි නියම තානාන්තරේ. ඇමති කෙනෙක් කියන්නේ මම්මෙ යුව රජ පට්ටමක්. ඇමති පට්ටමක් අරන් මිසක් මම නවතින්නෙ නැහැ. ඊට ඉස්සෙල්ල මේ ෆැක්ටරිය පටන් ගන්න ඕනි. මොනවා කරන්නත් යහමින් සල්ලි තියෙන්න එපායැ”

“එතකොට ඔය පක්ෂවලින් සල්ලි දෙන්නේ නැද්ද දේශපාලන වැඩවලට”

“ඒ ලැබෙන ටික මදි. දැන් මුළු දිස්ත්‍රික්කෙම මනාප ගන්න එපායැ. මුලදි මුලදී ටිකක් යහමින් අතේ සල්ලි වියදම් වෙයි. ඌරගෙ මාළු ඌරගෙ පිට උඩම තියල කපනවා වාගෙ පස්සෙ පස්සෙ දේශපානයෙන්ම ආදායම් මාර්ග පාද ගන්න පුළුවන් වෙයි. ඒ විදිහට තමයි ඔය වැඩ සිද්ධ වෙන්නෙ”

“අනේ මට නම් ඔය මොකුත් තේරෙන්නෙ නැහැ පුතේ”

* * * * * *

සඳරුවන් වීරමුනි විසින් වලව්වත්තේම කෙළවරක ඉදිකරනු ලැබූ කොහු ගඩොල් ෆැක්ටරිය ඉතාමත් උත්කර්ෂවත් අන්දමින් විවෘත විය. ආරම්භක උත්සවයට පැමිණ සිටි ආරාධිතයා වූයේ සඳරුවන්ගේ පුංචි බාප්පා, මහ ආණ්ඩුවේ කර්මාන්ත ඇමති විමලවර්ණ වීරමුනි මහතාය.

සඳරුවන්ගේ ආරාධනය පිළිගෙන පළාතේ ප්‍රභූවරු මෙන්ම ගම් වැසියන්ද විශාල පිරිසක් මෙයට සහභාගි වූහ. ඒ පැමිණි සිය ගණනටම සෑහෙන පරිදි තේ මේසයක් සඳරුවන් විසින් පිළියෙල කර තිබුණි. දේශීය කෑම මෙන්ම බටහිර පන්නයේ කෙටි කෑම වර්ගවලින් එය පිරී ඉතිරී තිබුණි. සෑම කෙනෙකුටම හොඳ නැවුම් කිරි වීදුරුවක්ද පිරිනමන ලදී.

සඳරුවන්ගේ කොහු කර්මාන්ත ශාලාවේ සේවක සමූහයෙන් බහුතරය එම ගමේම වැසියෝ වූහ. පරිපාලනමය තනතුරු පමණක් පුවත්පත් දැන්වීම් මගින් සුදුසුකම් ලත් පුද්ගලයින්ට ලබා දුන්නේය. ගමේම අය පරිපාලනය සඳහා බඳවා ගතහොත් කර්මාන්ත ශාලාවේ පැවැත්මට එය බාධාවක් විය හැකි බව සඳරුවන්ගේ විශ්වාසය විය.

කෙසේ හෝ ගමේ සිටි රැකියා විරහිත කොටසකට මේ මඟින් රැකියා හිමි විය. ගමින් පිටට නොගොස් අතමිට සරුකර ගත හැකි රැකියාවක් ලැබීම ඔවුන්ගේ සතුටට හේතු විය.

විමලවර්ණ වීරමුණි ඇමතිතුමා උත්සව සභාව අමතමින් තම සහෝදරයාගේ පුත්‍රයා අනාගතයේ රටේ ඉහලම නායකයෙකු වනවාට කිසිදු සැකයක් නැති බව පුන පුනා ප්‍රකාශ කරන ලදී. ලංකාවේ පමණක් නොව විදේශ රටවලද ගොස් මනා අත්දැකීම් සම්භාරයක් රැස්කර ගෙන සිටින මොහු උගත්කමින්ද දක්ෂකමින්ද නිපුණතාවයන්ගෙන්ද වැදගත් පරම්පරා අභිමානයකින්ද සැදුම්ලත් ආකර්ශනීය තරුණයෙකු හෙයින් ඔහුට අනාගතයේදී මේ රටේ නායකයා වීමට හැකි සියලු දෙය හිමි වී ඇති බව ප්‍රකාශ කරන ලදී.

ලොකු මැණිකේද මහත් ආඩම්බරයෙන් යුතුව උත්සව සභාවේ අසුන්ගෙන සිටි අතර මෙතෙක් කල් යටපත්ව තිබූ වලව්වේ අභිමානය නැවතත් හිස ඔසවමින් ඉදිරියට එන බව දැනුන හෙයින් තව තවත් උද්දාමයට පත්විය.

සඳරුවන් කොහු ගඩොල් අපනයනය කළේ එංගලන්තයටය. තවාෂි බ්‍රෂ් ආපනයනය කළේ ජපන් රටටය.

අතමිට තරමක් සරු වූ විගසම සඳරුවන් පළමු කටයුත්ත ලෙස තෝරා ගත්තේ වලව්ව අලුත්වැඩියා කිරීමය. එහි පෞරාණික ගාම්භීර පෙනුම එලෙසම රැකෙන පරිද්දෙන් අලුත්වැඩියාව සිදු කරන ලදී. එමෙන්ම වත්තේ තිබූ පරණ පොල්ගස් ඉවත් කර යටි වගාවද දමන ලදී. සෑම පොල්ගසකටම හොඳ පෝෂණයක් ලැබෙන පරිද්දෙන් පොල් ලෙලි සහ පෝර සපයන ලදී.

වලව්වේ කටයුතු මැණිකේ විසින් මෙහෙයවනු ලැබීය. කුස්සියේ පාලනය කරලැයින්ගේ අණසකට යටත් විය. කරලැයින් වයෝවෘද්ධ සේවිකාවක් වුවද ලොකු මැණිකේ වලව්වේ නැති වෙලාවට කරලැයින්ගේ අණට පිටුපාන්නට කිසිවකුට නොහැකි විය. පුෂ්පා කරලැයින්ට ලෙන්ගතුකමක් මෙන්ම බියක්ද දැක්වීය.

කරලැයින්ට දුව පැන ඇවිද වේගයෙන් වැඩක් කිරීමට බැරි බව දන්නා සඳරුවන් බොහෝ විට වැඩ පැවරුවේ පුෂ්පාටය. ඔහුගේ රෙදි සේදීම, රෙදි මැදීම, අමුත්තන්ට තේ පිළියෙල කිරීම, කෑම මේසය සැකසීම මේ සියලු කටයුතු ඇයට පැවරුණි. සඳරුවන් මෙරටට පැමිණීමට පෙර පුෂ්පා උදාසීනව සිටි කම්මැලි තැනැත්තියකි. දැන්නම් ඇය කඩිසර කමින් යුත් ජේත්තුවට සිටින මෙහෙකාරියක් වූවාය. සඳරුවන්ටද පුෂ්පාගේ රුව නෙතට රසඳුනක් විය.

මේ කටයුතු සියල්ල මෙලෙස සිදුවෙද්දී සඳරුවන්ට මංගල්‍යයක් කර දීමට ලොකු මැණිකේ මඟුල් කපුවන්ට දොලපිදේනි පුදමින් සිටී. සඳරුවන් කෑගල්ලේ කරඬුපන වලව්වේ නර්මදාටත් රත්නපුරයේ ශ්‍රීධර වලව්වේ මිථිලාටත් අකමැති වූයේ ඔහු ඉංග්‍රීසි පන්නයට හැදුණු යුවතියක් ප්‍රිය කළ නිසාය. අවසානයේ ගෙනෙන ගෙනෙන හැම යෝජනාවක්ම ඔහුට නොගැලපුන නිසා පුවත්පත්වල පිහිට පැතීමට ලොකු මැණිකේ තීරණය කළාය. ඉංග්‍රීසි පුවත්පත් වලද සති අන්ත සිංහල පුවත්පත්වලද දැන්වීම් පළකළේ ඒ තීරණයට අනුවය.

සඳරුවන්ගේ සියලු කටයුතු සඳහා අක්කලා

**32 වන පිටුව බලන්න**



# ප්‍රාර්ථනා මල්...

31 වන පිටුවෙන්

තිදෙනාගෙන් මෙන්ම මස්සිනාලාගෙන්ද නොමඳ සහයෝගයක් හිමි විය. මනාලියක් සෙවීමේ කටයුත්තටද ඒ පරිද්දෙන්ම ඔවුහු ලොකු මැණිකේට සහාය වූහ.

මෙතුවක් කලක් තුළ වලව්වට දිනපතා පැමිණි එකම පිරිමි පුළුට වූයේ ඤදන් ඤදුන් ජයසේනය. හිමිදිරි උදෑසන කිරි බෝතල් දෙකක් සමග පලා මිටි ටිකක් රැගෙන වලව්වට පැමිණෙන ඔහු පාපැදියේ බෙල් එක නාද කරන්නේ පුෂ්පාගේ රුව බලාපොරොත්තුවෙන්ය. පුෂ්පාද සිනහ කට පුරවාගෙන ජයසේන වෙතට දුව යන අතර ඔහු ඇය අතට සුදෝ සුදු කිරි බෝතල් දෙක දී ආදරණීය බැල්මක් හෙළා ඇගේ මුහුණ දෙස බලා සිටී. එහෙත් ඇයගෙන් ඔහුට ලැබෙන්නේ ඔලොක්කු හිනාවකි. පස්ස පොඩ්ඩක් ගස්සා කිරි බෝතල් දෙක රැගෙන මුළුතැන් ගෙය දෙසට යන ඇය දෙස මඳ සිනාවක් පාමින් ටික වේලාවක් බලා සිටින ජයසේන නැවතත් තම පාපැදිය වේගයෙන් පදවාගෙන පිට වී යන්නේය.



ජයසේන ටික වේලාවක් ඇය දෙස බලා සිටින බව දන්නා නිසාම පුෂ්පා මුළුතැන් ගෙයි දොර ළඟට ගොස් නැවත පිටුපස හැරී ජයසේන දෙස බලා කට ඇදකර සිනහවක් පෑමට පුරුදු වී සිටියාය.

මේ දෛනික සිදුවීම දෙස උඩුමහලේ ඉදිරිපස කාමරයේ ජනේලය තුළින් බලා සිට මහත් වින්දනයක් ලැබීමට සඳරුවන්ට හැකි විය. ටික දිනක් මේ දෙස බලා සිටි ඔහුට ජයසේනගේ අහිංසක කමත් පුෂ්පාගේ ඉඟිබිඟිත් දවසේ කාර්ටූනය බවට පත්විය. ඔහු තුළද පුෂ්පාගේ දැක්ම යම් උද්දාමයකට හේතුවන බවක් ඉබේම දැනෙන්නට විය.

ලොකුමැණිකේගේ මේ දිනවල ප්‍රධාන කාර්යය වී ඇත්තේ සඳරුවන්ට මනාලියක සෙවීමය. ඇය විසින් ලැබී ඇති ලිපි අතරින් තම පුතුගේ හඳහනට ගැලපෙන වත්කම, උගත්කම සැසඳෙන ලිපි වෙන්කර ගන්නා ලදී. සඳරුවන්ට පවා නොදන්වා ඇය තම රියදුරු සමඟින් එම නිවෙස් වෙත ගොස් තොරතුරුද මනාලියගේ හැඩරුවද දැකගෙන සඳරුවන් දැනුවත් කිරීම කරනු ලැබේ. මේ අනුව ඇයගේ අවසන් වටයේ තේරීමේදී ඉතිරිව සිටියේ මනාලියන් සිව්දෙනෙකු පමණකි. සඳරුවන්ට මේ සිව්දෙනා බැලීමට යාමට දිනයක් සූදානම් කර ගන්නා ලෙසට කොතරම් පැවසුවද ඔහු වැඩ, වැඩ කියමින් එය අතපසු කරන ලදී.

ඇත්ත වශයෙන්ම මේ දිනවල සඳරුවන් සිටින්නේ තමන් පටන් ගත් අලුත් කම්හලේ වැඩ කටයුතුත් සමඟ ඉතාමත් අවිවේකීවය. උදෙන්ම මම්මා රැගෙන එන තේ කෝප්පය බී වලව්වෙන් පිටවෙන ඔහු සමහර දිනවල නැවත පැමිණෙන්නේ රාත්‍රී දහයද පසු වූ විටය. දිවා ආහාරය ඔහුගේ රියැදුරු පැමිණ රැගෙන ගියත් උදේ ආහාරය ඔහු ලබාගන්නේ පිටින්මය. ඉරිදා දිනයේ පමණක් පැය කිහිපයක් වලව්වේ රැඳෙන සඳරුවන් වැඩිපුරම කාලය ගත කරන්නේ කම්හල තුළය. කම්හලේ කටයුතු ඉතාමත් සාර්ථකව දියුණුව කරා ඇදී යාම එහිම රැඳී සිටීමට හේතුවය. ලොකු මැණිකේ කොතරම් ඇවිටිලි කළද ඔහුගේ මනාලියන් බැලීමේ ගමන නම් දිනෙන් දිනම කල් ගියේය.

මේ අතර ගමේ පොදු කටයුතු කිහිපයකටම සඳරුවන්ට මුල්වීමටද මේ අතර සිදුවිය. ගමේ තරුණ පිරිස එක් වී සඳගිරි තරුණ සමිතිය සහ සඳගිරි අවමංගල්‍ය ආධාර සමිතිය නමින් සමිති දෙකක්ම සඳගිරි වලව්ව මුල්කරගෙන පටන් ගන්නා ලදී. මෙතෙක් කලක් මේ ගම් පළාතට විශාල අඩුපාඩුවක්ව තිබූ අවමංගල්‍ය ආධාර සමිතිය සෑම දෙනාගේම පැසසුමට ලක් වූ සේවයක් කිරීමට පෙරමුණ ගෙන ඇත. ගමේ පංසල වූ ගිරිතලාව බෝධිරුක්ඛාරාමයේ ආරම්භ කරන ලද මෙම සමිතිය සඳහා සඳරුවන් විසින් පන්සල් වත්තේ ගොඩනැගිල්ලක්ද ඉදිකරන ලදී. එම ගොඩනැගිල්ල තුළ සමිති සමාගම් කටයුතුවලට අමතරව ඉරිදා දිනවල දහම් පාසලේ පංතිද පැවැත්වීමට හැකි විය. මෙතෙක් කල් බණ මඩුවේ ඉඩ පහසුකම් මදිකම නිසා ගුළි වී සිටි පංති කිහිපයක් දැන් එහි පැවැත්වේ. ඒ සඳහා අවශ්‍ය මේස පුටුද සඳරුවන් විසින් සපයන ලදී. මේ සද්ක්‍රියාවන් තුළින් සහ බොහෝ පිරිසකට රැකියා සපයා දීම මගින් ගමේ ජනප්‍රිය ප්‍රභූ චරිතයක් බවට පත්වීමට ඉතාමත් කෙටි කාලයක් තුළදී සඳරුවන්ට හැකි විය.

මේ අතරතුර වලව්වේ සේවයට තවත් මුරකරුවෙක් සහ රියැදුරෙක්ද එක්වූහ. රියැදුරු සඳරුවන් සඳහාය. මුරකරුට පැවරුණ රාජකාරී අතර, වලව්වත්ත අලංකරණය කිරීමද ඇතුළත් විය. තවද තම ෆැක්ටරිය සඳහා තවත් වාහන තුනක්ම මිල දී ගැනීමට සඳරුවන්ට හැකිවිය.

කුස්සියේ කටයුතු ක්‍රමයෙන් පුෂ්පා වෙත පැවරුණේ කරලැයින්ගේ දෑස් පෙනීම දුර්වල වීම හේතුවෙනි. හදිසියකදී හෝ පුෂ්පා ලොකු මැණිකේ සමඟ යම් කාර්යයක නිරත වන විටදී කරලැයින් ඉවුම් පිහුම් කළොත් කුමන හෝ නුසුදුසු දෙයක් ලොකු මැණිකේට කෑම පිඟාන තුළ දකින්නට ලැබේ.

"කරලැයින්ගෙ ඇස් නම් දැන් පේන්නෙම නැහැ. අද බෝංචි කරල් ඇතුළෙ පනුවො"

"අනේ මැණිකේ මම හොඳට බලල බෝංචි කැඩුවෙ. හොඳට හේදුව"

"කරලැයින්ට පේන්නෙ නැති හින්දනේ. මෙහෙම බැහැ කරලැයින් මම දැන් කෑම උයන වැඩේ මුළුමනින්ම පුෂ්පට පවරනවා. පුංචි හාමුට එහෙම ඔය ඉසකෙස් ගහක් හෙම හම්බ වුනොත් ආයෙ වලව්වෙන් කෑම එපා කියල කියයි. පිටින්ම කන්න ගනී. පුෂ්පා මීට පස්සෙ කෑම උයන එක කරයි. කරලැයින් අත් උදව්වක් දීල හරි වැරදි කියල දෙන්නකො"

"හොඳයි හාමු. හොඳයි. මම දැන් ඉතින් වයසයිනෙ"

**ලබන කලාපයෙන් හමුවෙමු**





# ජීවිතයට හොඳ නරක ගෙනෙන සහ පෙන්වා දෙන හඳහන

## 2017 දෙසැම්බර් 01 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා ලග්න අනුව ශුභාශුභ තත්ත්වය කෙසේද?

(මෙම ජ්‍යොතිෂ පලාපල සටහන් ලියැවෙන්නේ කැනඩාවට සුදුසුවන පරිදි ගණනය කිරීමෙනි)



### මේෂ ලග්නය

ලග්නාධිපති කුජ 7 වැන්නේ ගුරු සමග යෝග වී ගමන් කරයි. තම වැඩකටයුතු සාර්ථකව කරගැනීමට හැකි වන කාලයකි. අන් අයගේ බලපෑම්වලට යොමු නොවේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. විභාග ජය ලැබේ. රැකියා දියුණුව සැලසේ. ආදායම් මාර්ග ශුභ වේ.

### වෘෂභ ලග්නය

ලග්නාධිපති සිකුරු 7 වැන්නේ ගමන් කරයි. සතුරු කරදර අඩුය. රැකියා දියුණුව ඇති කෙරේ. රැකියා වෙනස් වීමට ඉඩ ඇත. ආදායම් මාර්ග සරු වේ. අධ්‍යා-පන කටයුතුවලට ශුභයි. අෂ්ටම ඒරාෂ්ටකය ලබා ඇති හෙයින් සඳු 8 වැන්නේ නම් බාධක අනතුරු පීඩා ඇතිවීමට ඉඩ ඇති හෙයින් ප්‍රවේසම් විය යුතුය.

### මිථුන ලග්නය

ලග්නාධිපති බුධ 7 වැන්නේ ගමන් කරයි. කාර්යබහුල වන කාලයකි. ක්‍රියාශීලී වේ. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. විභාග ජය ලැබේ. කරගෙන යන සහ අලුතෙන් ආරම්භ කරන වැඩ කටයුතුවලට ශුභයි. අය-වැය සම තත්ත්වයේ පවතී.

### කටක ලග්නය

ලග්නාධිපති සඳු 10 වැන්නේ ගමන් කරමින් මාසය ඇරඹේ. ගමන් බිමන් අධික වේ. රැකියා කටයුතුවලට ශුභයි. ගේ දොර, රථ වාහන ගැනීමේ අවස්ථාව ඇත. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. ප්‍රේම සබඳතා ඇතිවිය හැක. ආදායම් මාර්ග ශුභ වේ.

### සිංහ ලග්නය

ලග්නාධිපති රවි 4 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපනයට ශුභ වේ. සංගීත කලාවට ප්‍රිය වේ. ගේ දොර ගැනීමේ භාග්‍යය ඇත. සමාජ සේවා වැඩ කටයුතුවල යෙදේ. පිරිස් බලය ලැබේ. රැකියා දියුණුව ඇති කෙරේ. ආදායම් මාර්ග ශුභ වේ.

### කන්‍යා ලග්නය

ලග්නාධිපති බුධ 4 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතු යහපත්ව කෙරෙන ශුභ කාලයකි. අලුත් දේ ඉගෙනුමට, චිත්‍ර කලාවට, නිර්මාන කටයුතු කිරීමට සිත් දේ. රැකියා ව්‍යාපාර කටයුතු දියුණුව සැලසේ. තනතුරු ලැබීමේ වාසනාව ඇත. අලුතෙන් ආරම්භ කරන කටයුතුවලට ශුභයි. පදිංචිය වෙනසක් ඇතිවිය හැක. ආදායම් මාර්ග ශුභ වේ.

### තුලා ලග්නය

ලග්නාධිපති සිකුරු 2 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතුවලට ශුභ වේ. රැකී රක්ෂා කටයුතු දියුණු වේ. බාධක බිඳ ඉදිරියට යාමේ හැකියාව ලැබේ. තර්ක විතර්කවලට හොඳයි. වැඩ කටයුතු සාර්ථක වේ. ආදායම් මාර්ග ශුභ වේ.

### වෘශ්චික ලග්නය

ලග්නාධිපති කුජ 12 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. විභාග ජය ලැබේ. මේ කාලයේදී තර්කානුකූලව කතා කිරීමට ශක්තිය ඇත. සමාජසේවා වැඩ කටයුතුවල නිරත වේ. රැකියාව ශුභ වේ. වැඩ රාජකාරි අධික වේ. අය-වැය සම තත්ත්වයේ පවතී.

### ධනු ලග්නය

ලග්නාධිපති ගුරු 11 වැන්නේ ගමන් කරයි. රැකී රක්ෂා ව්‍යාපාර කටයුතුවලට ශුභයි. ලාභ ලැබේ. සමාජ සේවා කටයුතුවල යෙදේ. පිරිස් බලය ලැබේ. තනතුරු ලැබීමට පුළුවන. සඳු ලග්නයේ නම් ජන්ම, ලග්න ඒරාෂ්ටක ඇති හෙයින් වඩා ප්‍රවේසම් විය යුතුය. අධ්‍යාපන කටයුතු ශුභ වේ.

### මකර ලග්නය

ලග්නාධිපති ශනි 12 වැන්නේ ගමන් කරයි. රැකියා කටයුතු, ව්‍යාපාර කටයුතු දියුණුව සැලසේ. ඉඩකඩම් ගැනීමේ භාග්‍යය ඇත. තනතුරු ප්‍රශංසා ලැබීමට හැකිය. ආදායම් මාර්ග සරු වේ. ශනි 12 වැන්නේ ගමන් කිරීම ශුභ නොවේ.

### කුම්භ ලග්නය

ලග්නාධිපති 11 වැන්නේ ගමන් කරයි. රැකියා ව්‍යාපාර කටයුතු දියුණු වේ. තනතුරු උසස්වීම් ලැබිය හැක. රැකියා අපේක්ෂිත අයට ලැබීමට පුළුවන. අධ්‍යාපන කටයුතුවලට ශුභයි. අලුත් විෂයයන්, භාෂාවන් ඉගෙනුමට ලැබේ. ධන ලාභ ඇත. පිනට දහමට යොමු වේ.

### මීන ලග්නය

ලග්නාධිපති ගුරු 8 වැන්නේ ගමන් කරයි. රැකී රක්ෂා දියුණු වේ. අලුතෙන් ආරම්භ කරන කටයුතු ශුභ වේ. සිතිවිලි අධික වේ. හිතමිතුරු පිරිස් බලය ලැබේ. පිනට දහමට වඩාත් යොමු වේ. ආදායම ශුභ වේ.



එම්. වයි. ධර්මවිජය
ජ්‍යොතිෂ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා,
ජ්‍යොතිෂ ශිරෝමණී(රන්පදක්කම් ලාභී)
ඔබගේ සියලුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න
දුරකථන අංක කැනඩාව: 01-905 990 2311
Email: ashawije18@yahoo.ca

# රිය අනතුරු වසංගතය

- වියානා ඇළට මෝටර් රථය පෙරළී මව - පියා මරුට; පුතා අතුරුදන් (2017 නොවැම්බර් 24 - දිවයින)
- Father of 9 believed to be among 3 killed in fiery crash on Hwy. 400 (Nov 1, 2017 - CityNews)
- Two brothers among three children killed as stolen car hits tree (Nov 26, 2917 - The Telegraph)

**අප ඉහත පළ කළේ ඉතාමත් මෑතකදී ශ්‍රී ලංකාවේ, කැනඩාවේ සහ එංගලන්තයේ පුවත්පත් තුනක පළවූ ප්‍රවෘත්ති සිරස්තල තුනකි. මේ සියලුම පුවත්වලින් කියවෙන්නේ රිය අනතුරු පිළිබඳවයි. එසේම ඒ රිය අනතුරුවලදී එක් අයෙකුට වැඩි පිරිසක් මියගොස් ඇති අන්දමද එම සිරස්තල නිරීක්ෂණය කිරීමේදී අපට පෙනී යයි. දිනපතා මාධ්‍ය කෙරෙහි අවධානය යොමු කරන ඕනෑම අයෙකුට මේ පිළිබඳ පැහැදිලි කිරීමට අටුවාටීකා ලිවීම අවශ්‍ය නොවේ.**

**රිය අනතුරු පිළිබඳ 2013 වසරේ සටහන්ව ඇති ලෝක දත්ත වාර්තාවල වසරකට මිලියන 1.3 කට ආසන්න පිරිසකට ජීවිත අහිමි වී යන බව දැක්වෙයි. එම සංඛ්‍යාලේඛණවල, වසරකදී ශ්‍රී ලංකාවේ රිය අනතුරුවලින් මිය යන සංඛ්‍යාව 3691 ක්ද කැනඩාවේ එම සංඛ්‍යාව 2114 ක්ද වශයෙන්ද සටහන් වී ඇත.**

**කැනඩාවේ සිදුවන රිය අනතුරු පිළිබඳව රක්ෂණ ආයතනයක් මගින් පසුගියදා නිකුත් කළ නවතම වාර්තාවකට අනුව 2016 වසරට වඩා සියයට 2.5 කින් 2017 වසරේදී රිය අනතුරු වැඩිවී ඇත. මෙම රිය ගැටුම්වලින් තුවාල ලබා සහ මරණයට පත්වී ඇති බහුතරය පාපැදි කරුවන් සහ පදිකයන් බවද එම වාර්තාව පවසා සිටී. එහිදී කැනඩාවේ රිය අනතුරු බහුල පළාත් ලෙස ඔන්ටාරියෝ, ඇල්බර්ටා, නිව්බ්‍රවුන්ස්වික් හා නෝවා ස්කෝෂියා හඳුනාගෙන ඇත.**

**කැනඩාවට මේ ගත වන්නේ ශීත කාලයයි. මෙම කාලයේදී පවතින අඳුරු තත්ත්වයත්, හිම වැටීමෙන් සිදුවන අවහිරතාත් නිසා රථවාහන පැදවීමේදී ඔබ වඩාත් සැලකිලිමත් විය යුතුයි. එසේම සෑම වසරකම දෙසැම්බර් හා ජනවාරි උත්සව සමයද වැඩිම අනතුරු සංඛ්‍යාවක් සිදුවන කාල වකවානු බවද ඔබ මතකයේ තබාගන්න.**

හදිසි අනතුරු සිදුවීමේදී තැනක් නොතැනක් නැත. රැයක් දවාලක් නැත. හදිසි අනතුරු ඒ තරම්ම අවිනිශ්චිතය. එහෙත් මෑතක සිට මෙතෙක් තැනක් නොතැනක් නොවූ හදිසි අනතුරුවලට නිශ්චිත බවක් සහ තැනක් ලැබී ඇත. තැන මහ පාරයි. අද රැයකදී හෝ දවාලකදී ලොව කොතැනකදී හෝ රිය අනතුරක් සිදුවන බව නිශ්චිතය. එබැවින් මේ රිය අනතුරු රැල්ල ලෝක සෞඛ්‍ය විශේෂඥයන් සලකනුයේ ලෝක වසංගතයක් ලෙසිනි.

හැමදාම තුවාලකරුවන් කිහිපදෙනකුගෙන්ම රෝහල් ඇඳන් පුරවන්නට මහ පාර සමත් වෙයි. රටක ආර්ථික සංවර්ධනයේදී ඉතා වැදගත් අංගයක් ලෙසින් සැලකෙන මහපාර තවත් අතෙකින් රටක් ගිලන් කරවන්නටද හේතු වන බවට මෙයම කදිම නිදසුනකි. අද ලෝකයේ ජනතාව මරු තුරුලට යැවුමට හේතු වන සාධක අතුරින් දහ වැනියට සිටින්නේ මහ පාර සහ ඊට අරක් ගත් යාන වාහනයි. සෞඛ්‍ය විශේෂඥයන් මෙය වසංගතයක් ලෙසින් හඳුන්වනුයේ දින දින මේ අනතුරු වැඩි වන නිසාය.

ලෝ පුරා මාර්ග සංවර්ධනය වීමත් ජනගහණය සහ ඔවුන්ගේ අවශ්‍යතා වැඩි වීමත් නිසා යාන වාහන ප්‍රමාණය විශාල ලෙස වැඩි වී ඇත. මේ තත්ත්වය නිසා 1990 දශ ලක්ෂ 5.1 ක් වූ ලොව මාර්ග අනතුරු ප්‍රමාණය 2020 වන විට දශලක්ෂ 8.4 ක් දක්වා වැඩි වනු ඇතැයි ලෝක සෞඛ්‍ය සංවිධානය අනතුරු අඟවයි. ඔවුන් මේ බව පවසන්නේ මේ වන විට සිදුවෙමින් පවතින අනතුරු ප්‍රවණතාව සලකමිනි. අනාවැකිය සඵල වුවහොත් වසර 2020 දී රිය අනතුරු ලොව සිදුවන අකල් මරණ අතර තුන් වැනි හේතුව බවට පත් වනු ඇත. මේ නිසා ගමනක් බිමනක් යාම සඳහා මහ පාරට බැසීම මුහුදු යෑමටත් වඩා අවදානම් සහ අනතුරුදායක කාර්යයක් බවට පත්වනු ඇත. මේ අනතුර මේ වන විට බොහෝ දෙනකු විසින් වටහා ගනු ලැබ ඇත. ඒ සඳහා කිසිඳු පිළියමක් ගෙන නොමැති යයි චෝදනා එල්ල කිරීමද කළ නොහැකිය. ඒ මාර්ග ආරක්ෂාව වෙනුවෙන් කවර හෝ වැඩපිළිවෙළක් දියත් වන නිසාය. ප්‍රශ්නය වන්නේ මේ සියලු වැඩපිළිවෙළ පෙරළා දමමින් මහපාරේ මාරයා ජය ගැනීමය.

නිදසුනක් ලෙස ශ්‍රී ලංකාවේ මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් විවිධ පියවර ගැනෙයි. විශේෂයෙන් මහජනතාව දැනුවත් කිරීමට ඇතැම් පාසල් වැනි සංවේදී ස්ථානවල විශේෂ වැඩපිළිවෙළ දියත් වෙයි. මාර්ග නීති කඩ කිරීම් වැළැක්වීමට තැන තැන මුවා වී සිටින රථවාහන පොලිසියේ නිලධාරීන් සෑම මාර්ගයකම දැකිය හැකිය. එහෙත් මාර්ග අනතුරු සැලකිය යුතු මට්ටමකට අවම කර ගැනීමට මෙම පියවර කිසිදු ලෙසකින් වත් හේතු වී නැතිද යන පැනය අප ඉදිරියේ වෙයි.

අප විමසිය යුතු කරුණු සැඟවී ඇත්තේ මේ තත්ත්වය මතය. එනම් මාර්ග අනතුරු අවම කිරීම සඳහා මෙතෙක් ගෙන ඇති ක්‍රියාමාර්ගයන්හි ඵලයක් නැති වීමේ හේතු සාධක විමසීමය. මේ සම්බන්ධව ලෝක සෞඛ්‍ය සංවිධානය මීට වසර කිහිපයකට පෙර ලෝකයේ බොහෝ රටවල නියෝජිතයන් සහභාගී කරගෙන පුළුල් අධ්‍යයනයක් සිදු කළේය. එයින් අනාවරණය වී ඇත්තේ රථවාහන අධික වශයෙන් පවතින දියුණු රටවලට වඩා සංවර්ධනය වෙමින් පවතින රටවල රිය අනතුරු වැඩි බවය. 1998 සංඛ්‍යා ලේඛන සලකන කල රිය අනතුරු නිසා වූ මරණවලින් සියයට 88 ක්ම සිදුව ඇත්තේ දියුණු වෙමින් පවතින රටවලය. එය සංඛ්‍යාත්මකව 10,29,037 කි. දියුණු රටවල සිදුව ඇති මරණ ගණන 1,41,656 කි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 12 ක් පමණ වේ. බොහෝ සෙයින්ම රිය අනතුරුවලට ගොදුරුව ඇත්තේ වයස අවුරුදු 15 ත් 44 ත් අතර වූ පුද්ගලයන් බැවින් ඔවුන් රටක සංවර්ධන ක්‍රියාවලිය වෙතින් ඈත් කරවීමට මෙම මග මරුවන් හේතු වී තිබේ. විශේෂයෙන් දරු පවුලක් රකින මවක හෝ පියකු මෙවැනි අනතුරකින් ජීවිතක්ෂයට හෝ සදාකාලික අබ්බගාත තත්ත්වයට පත් වුවහොත් එම පවුලට අත්වන ඉරණම වටහා ගැනීම අපහසු නැත.

කෙසේ වුවද බර කරත්ත. බක්කි කරත්ත වෙනුවට අරක් ගත් නව වාහන හඳුන්වා දීමෙන් පසුව ගත වූ සියවස තුළ මාර්ග අනතුරු හේතුවෙන් අවම වශයෙන් ජනතාව ලක්ෂ 300 ක් වත් මිය ගොස් ඇති බව සංඛ්‍යාලේඛන පෙන්වා දෙයි. අද ලෝකය ඒඩ්ස් වැනි 'ජාත්‍යන්තර මට්ටමේ වසංගත' කෙරෙහි අවධානය යොමු කොට තිබුණද ඒඩ්ස්වලට කුප්‍රකට අප්‍රිකාවේ ඒඩ්ස් මරණ අභිබවමින් දරුවන්ට මරු කැඳවා ඇත්තේ රිය අනතුරු බව 1998 සංඛ්‍යාලේඛන පෙන්වා දෙයි. මරු තුරුලට ගිය සංඛ්‍යාවට වඩා ඉතා විශාල ප්‍රමාණයක් රිය අනතුරු නිසා තුවාල සහ සදාකාලික අබ්බගාතයන් බවට පත්ව තිබේ. එය ඉලක්කම්වලින් කිවහොත් 38848625 කි.

ආර්ථිකය අතින් සලකන කල දියුණු වෙමින් පවතින රටවල දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1 ක් පමණ නැති කර දමන්නට රිය අනතුරු සමත්ය. මෙය ලෝකයම සලකන කල ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 517.8 කි. මෙවැනි ව්‍යසනයක් සිදු කරන මාර්ග අනතුරුවලට බලපාන හේතු සාධක මේ මේ යයි කෙටියෙන් කිව හොත් බීමත්ව රිය පැදවීම, රථවාහනවල ආරක්ෂක පිළිවෙත් නිසි පරිද්දෙන් අනුග මනය නොකිරීම, මාර්ග නිර්මාණය සහ මාර්ග ආරක්ෂක පියවර නිසි පරිදි අනුගමනය නොකිරීම සහ වාහන ආරක්ෂිත ලෙස සැලසුම් නොකිරීම, මාර්ග නීති රීති නොපිළිපැදීම සහ නීති ක්‍රියාත්මක නොවීමත් වාහන නිසි ලෙස නඩත්තු නොකිරීම වැනි කරුණු සැකෙවින් හුවා දැක්විය හැකිය. එහෙත් ඒ ගැන සැලකිලිමත් වීම පමණක් කිසිසේත් ප්‍රමාණවත් නොමැති බව ලෝ පුරා සෞඛ්‍ය විශේෂඥයන්ගේ අදහස වී තිබේ. එනම් ඔවුන් අවධාරණය කරනුයේ මේ හේතු සමග නිරතුරු බැඳී ඇති සාධක පිළිබඳව සියුම් ලෙසින් අධ්‍යයනය කළ යුතු බවය. විද්‍යාත්මක පර්යේෂණ කළ යුතු බවය.

මේ තත්ත්වය බරපතලම වන්නේ ලොව රිය අනතුරු නිසා සිදුවන මරණවලින් සියයට 88 ක්ම වන්නේ තුන්වැනි ලෝකයේ රටවල නිසාය. එනම් ඇති හැකි රටවල් තම රටේ මූල්‍ය ප්‍රතිපාදනවලින් සහ එරට දානපතියන්ගේ මූල්‍යාධාර මැද අනතුරුවලට හේතු සහ ඒවා අවම කිරීමේ මං පිළිබඳව විවිධ වූ විද්‍යාත්මක පර්යේෂණ පවත්වයි. එහෙත් එවැනි දියුණු රටවල විවිධ වූ කොන්දේසි සමග පිරිනමන ණය මත ආර්ථිකය හසුරවා ගැනීමට හුරුව සිටින තුන්වැනි ලෝකයට ඒ පිළිබඳව සිතන්නට වත් ඉඩක් නැත. ඔවුන්ට පර්යේෂණ කිරීම සඳහා ප්‍රතිපාදන නැති වීමත් ලෝක ප්‍රශ්නයක් බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ පර්යේෂක කණ්ඩායමක් විසින් හඳුනා ගනු ලැබ තිබේ.

රට රටවලටද ආවේනික වූ විවිධ ගැටලු පවතී. එම ගැටලු එක් එක් රටකට සේම එක් එක් පළාතකටද ආවේනික වන තරමට පුළුල් විවිධත්වයක පවතී. ඒ නිසා සෑම රටකම මාර්ග අනතුරු පිළිබඳව නිසි ඇගයීමක් සහ අධ්‍යයනයන් සිදු කළ යුතු කාලය එළඹ ඇති බව ඔවුහු අවධාරණය කරති. එමෙන්ම මාර්ග අනතුරු අවම කිරීම සඳහා මුළු ලෝකයම විශේෂ ක්‍රමෝපායයක් දියත් කළ යුතු බව පෙන්වා දෙන ලෝක සෞඛ්‍ය සංවිධානය ඒ සඳහා මේ වනවිටත් මාර්ග අනතුරුවලින් වැළකීම සඳහා පස් අවුරුදු ක්‍රමෝපායයන් හඳුන්වා දී ඇත. මෙවැනි ක්‍රමෝපායයන් අපේ රටට ගැලපෙන පරිද්දෙන් දියත් කිරීමට සහ ඒ සඳහා ජාත්‍යන්තර මට්ටමේ ආධාරත් දේශීය පර්යේෂකයන්ගේ සේවයත් ලබා ගැනීම කෙරෙහි මෙරට සෞඛ්‍ය අංශ උත්සුක විය යුතුය.

## අනතුරු වැඩි වීමට වැඩියෙන් බලපාන්නේ කවර හේතූන්ද ?

'අධික වේගය මරු කැඳවයි' මෙවැනි නාම පුවරු මහමග ගමනක් යන ඕනෑම කෙනකුට බොහෝ විට දැකිය හැකි දසුනකි. එහෙත් මහපාරේදී මරු කැඳවන්නේ අධික වේගයම පමණක් නොවන බව මේ පිළිබඳව අධ්‍යයනය කළවුන් විසින් අනාවරණය කරගනු ලැබ තිබේ. ඔවුන්ට අනුව අධික වේගය බොහෝ විට අනතුරුවලට මග පාදා ඇත්තේ රියදුරන් බීමත්ව රිය පැදවූ අවස්ථාවලදීය. එබැවින් බීමත්ව රිය පැදවීම රිය අනතුරුවලට හේතු වන අංක එකේ සාධකය බව පිළිගැනෙයි. බ්‍රිතාන්‍යයේ මේ පිළිබඳව කෙරුණු අධ්‍යයනයකින් හෙළි වී ඇත්තේ එරට රථවාහන අනතුරුවලින් සිදුවන මරණවලින් සියයට 20 කටම බීමත් බව හේතු වී ඇතිය යන්නය. බීමත්ව රිය පැදවීම හා බැඳි කරුණු පිළිබඳව අධ්‍යයනය කළ යුත්තේ එක් එක් රටවලට අනුකූල සහ ආවේනික රටාවකටය. එමෙන්ම ඊට අදාළ නීති රීතිද ක්‍රියාත්මක කළ යුත්තේ රියදුරන්ගේ බීමත් බව කෙරෙහි මනා සැලකිල්ලකින් පසුවය. මෙම පිළිවෙත් රථවාහන පොලිසියකට මැනැවින් ක්‍රියාත්මක කළ හැකිය.

එමෙන්ම ශ්‍රී ලංකාවේ සිදු කෙරුණු එක් අධ්‍යයනයකින් පසු වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීනයකු පැවසූයේ රියදුරන්ගේ වයස සහ ඔවුන් පෙළන මානසික ගැටලු පවා රිය අනතුරු කෙරේ සැලකිය යුතු බලපෑමක් කරන බවය. වයෝවෘද්ධ රියදුරන්ගේ ඇස් පෙනීම, කන් ඇසීමේ දුර්වලතා මෙන්ම අවධානය බිඳී යාම වැනි කාරණා හරහා මෙකී තත්ත්වය උද්ගතව ඇත. පසුගිය කාලයේ සිදුවූ පෞද්ගලික බස්රථ අනතුරු පිළිබඳව සලකා මෙම කරුණු හෙළි කළ මේ ප්‍රවීන වෛද්‍යවරයා පැවසූයේ පෞද්ගලිකව විවිධ මානසික ආතතීන්ගෙන් පෙළෙන රියදුරන් මහපාරේ ඇති දැඩි තරගකාරී සහ තදබදකාරී පරිසරය හරහා නොසැලකිලිමත් තත්ත්වයට පත් කරවන බවය.

ලෝක තත්ත්වය සලකන කල රිය අනතුරු සම්බන්ධයෙන් බලපාන තවත් ප්‍රබල සාධකයක් වන්නේ අනාරක්ෂිත ලෙස වාහනවල ගමන් කිරීමය. විශේෂයෙන් ආසන පටි නොපැළඳීම මෙම තත්ත්වයට හේතු වී තිබේ. ආසන පටි සහ කුඩා දරුවන් ගෙන යන විශේෂ ආසන භාවිතය වර්ධනය කිරීම සඳහාද විවිධ රටවල විවිධ සමාජයන්ට අනුකූලව විවිධ ක්‍රමෝපායයන් දියත් කළ යුතුය. මේ පිළිබඳව දියුණු වන රටවල විවිධ ප්‍රශ්න පවතී. එනම් අද ශ්‍රී ලංකාව සැලකුව හොත් ගමන් කරන රථවාහනවල ආසන පටි පළඳින්නේ ඉතා සුළු පිරිසකි. ඒද ඉදිරිපස අසුන්වල ගමන් කරන අය වන අතර පසුපස ගමන් කරන අය ආසන පටි පැළඳ සිටිනු දැකීම අතිශයින්ම විරලය. අදාළ නීතිය නිසි පරිදි ක්‍රියාත්මක වන රටවල පවා බොහෝ විට ඉදිරිපස මගීන් ආසන පටි පළඳින අතර පසුපස මගීන් ඒ කෙරෙහි එතරම් උනන්දුවක් දක්වන බව නොපෙනේ. ඇතැම් වාහනවල ඒ සඳහා පහසුකම් නොමැති අතර අදාළ නීති රීතිද නිසි පරිදි ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවන් පවතී.

අධික වේගය පාලනය කිරීම සඳහාද විශේෂ වැඩපිළිවෙළක් සෑම රටකටම තිබිය යුතුය. වර්තමානයේ ශ්‍රී ලංකාවේ පවා වේග සීමා පනවා තිබේ. එහෙත් මෙම වේග සීමා ඇතැම් විට එම මාර්ගයට සහ එය පරිහරණය කරන්නන්ගේ ආරක්ෂාව, පහසුකම් සහ අවශ්‍යතා නිසි පරිදි අධ්‍යයනයට ලක් නොකර හුදෙක් පොතේ හැටියට පනවා ඇති වේග සීමාවන් වේ. ඒ නිසා එම නීති රීතිද පැනවිය යුත්තේ මාර්ගයේ තත්ත්වය, ආරක්ෂාව සහ අවශ්‍යතාව යන සියලු කරුණු පදනම් කරගෙනය. සැකෙවින් කියතොත් රථවාහනවල වේගය අවශ්‍ය තැනදී අවශ්‍ය ආකාරයට පාලනය කිරීම සඳහා නීති රීති පැනවිය යුතු අතර එම නීති රීති ක්‍රියාත්මක කරවීමටද අදාළ අංශ කල්පනාකාරී විය යුතුය.

ඇති නැති පරතරය මහමග අනතුරුවලට ප්‍රබල හේතුවක් බව පෙන්වන තවත් ලකුණක් වනුයේ මාර්ගවල නිසි ප්‍රමිතියයි.

38 වන පිටුව බලන්න


ALPC
AHANGAMA LAW
PROFESSIONAL CORPORATION
Real Estate Law
Immigration Law
Corporate Law
Wills and Estates
Family Law
Simple Divorce/ Separation and Marriage Agreements
4465 Sheppard Avenue East
Unit 21, Toronto, ON
M1S 5H9
Canada
Tel: 647-977-2263
Cell: 647-215-7642
Fax: 647-977-2264
E-mail: info@ahangamalaw.com
Anoshan Ahangama
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC


SFL
SILVY FERNANDO LAW
✓ Personal Injury
✓ Real Estate Purchase/Sale/Refinance
✓ Family Law
✓ Wills
✓ Powers of Attorney
✓ Affidavits
✓ Immigration
✓ Commercial Property Sale/Purchase
✓ Landlord-Tenant
✓ Notarizing & Commissioning
✓ Incorporations
Silvy Fernando LL.B.
Barrister, Solicitor & Notary Public
350 Highway 7 East, Suite 213
Richmond Hill, ON L4B 3N2
Tel: 416-272-6587/ 905-597-1716
Email: Silvy@sfdolaw.com


EVERYTHING MORTGAGES
LIC#12755
www.everythingmortgages.ca
We'll Target The Best Rates!
Why won't your bank give you the best interest rate? Call our team today or apply online and learn how we can negotiate a better rate than your banks can offer you! We work hard to give you the best options so you can make an informed decision.
Mortgage Renewals and Refinancing
First Time Homebuyer? Mortgage coming up for renewal? We can help you save money!
Investment Properties
Looking to invest in a second piece of property? Thinking about a vacation or recreational property? We can help!
Safe and Secure Application
Use our easy to comlpete online mortgage application form if you're looking to buy, renew, refinance or need a pre-approval for your next property purchase.
Manzeel Patel
Mortgage Broker - M11002628
Direct: 647-272-8355
Suite 704 – 1500 Don Mills Road,
Toronto, ON M3B 3L7
T 416 - 840 - 6368
F 416 - 850 - 5153
info@everythingmortgages.ca
www.everythingmortgages.ca
RMG
Meridian
MERIX
Lendwise
Scotiabank
Paradigm
Alterna
EQUITABLE BANK
blueprint
BRIDGEWATER BANK
MCAP
INDUSTRIAL ALLIANCE
radius financial
ICICI Bank
NATIONAL BANK FINANCIAL GROUP
CANADIANA FINANCIAL CORP
CMLS Financial
FIRST NATIONAL FINANCIAL LP
B2B BANK
OPTIMUM MORTGAGE
TD
XCEED
STREET CAPITAL
FISGARD
HOME TRUST
HOMEquity
SAVINGS

## මතක වැහි

තකහනියෙම දුර නෑයෙක්
ඇවිදින් ගෙන ආ සතුටක්
වගේ මුවග මුවග දොඩන
ගී සිරිපොද වැස්ස වැටෙන
ඉහට අල්ල තබා දුවන
උදෑසනම මුවා සොයන
හැම කඳුළම සතුටක් වුව
මගේ සිතට ඇයි කරුවල

අදත් කොපි පොතක් නොමැතිව
ගුරු මග තුන් හිත බෙරිවුණ
නංගියෙ ඔබේ මුහුණ වගේ
එදත් අහස අද වාගෙම
කන සිර වී රළු දෑසින්
ගිනි පුපුරන අකුරු ගෙදර
මල් වඩමක් වගේ එවෙලෙ
මගෙ දෑසට නුඹේ මුහුණම

පිඟන් කටුව තබා උලන
කිරි පිහි මුවහත අද්දර
අහස බලා කඳු නැග්ගා
අම්මා කිරි කඳුළු ගන්න
වැහි වැස්සා ඉකි බිඳුණා
මුට්ටිය ගොස් ගඟේ යන්න
අඩ සඳ රොටියෙන් ඇහැකිද
කුසේ අඳුරු මුළු නිවන්න

ණය පොත පිරිලා වැස්සට
කඩේ මුහුණ බෑ බලන්න
කොස්සැට මුල්ලක් ගොඩ විත්
හිතේ සතුට බෑ කියන්න
මේ වැහි කූළ එදා රසෙන්
මේඝ දූත රස විඳින්න
අම්මා මගෙ ළඟට අවුත්
බැහැ මේ තුට දමා යන්න

**රණතුංග මල්ලවආරච්චි**

## වෙන්දේසිය

අතැඹුලක් වන්
පිරිසිදු
නිකලැල් ප්‍රේමය
නුඹේ නමින්
මගේ හද ගැබ තුළ පිපුණු
නුඹ සින්න කළා
අපූරුවට
වැඩිම ලන්සුවකට
ඈවරයි.... දෑවරයි.... තුන්ඈවරයි....

**ලක්දිනි මංචනායක**

## බිරිඳ මගේ නුඹ

සොඳුර නුඹ මගෙ තනිය මකනා
සෙවනැල්ල සේ හිඳිමිනා
බිරිඳ නුඹ මට දිරිය දෙවනා
ඉන්ද්‍රඛීලය නොසැලෙනා
දිනිඳු නුඹ මට එළිය මවනා
සඳකි නුඹ මට සිසිල සදනා

මවකි නුඹ මට ළමැද සතපා
සෙනෙහෙ වඩලා වියෝ නසනා
විලකි නුඹ මට නිමල දියපිරි
මගේ දිවියේ පවස නිවනා
මගේ දෙවොලේ පිදෙන දෙවඟන
නුඹයි සිරිකත නිවසෙ දිලෙනා

කඳුළ සුසුමද ගතේ පීඩා
නිවයි විකසිත සිනාමල් මුව
තුමුල මහමෙර විලස නොසැළී
මගේ දරුවන් සුරකිනා මව
රන් හුයෙන් දෑගිලි බැඳෙන්නට
බවෙන් බවයේ වාසනා
බවෙන් බවයේ වාසනා

**ආචාර්ය ජගත් රූපසිංහ**

## මගේ නත්තල

සත්වගට සෙත් සැදූ
මුනි සරණ ගිය මා හිස
මනුවගට සැනසුම
ගෙනෙනු වස් පෙරුමන් පිරූ
උතුම් මහ පුරිසකු වෙත
නැවෙතොත් කවර අරුමය?

දිළිඳුන් මැද ඉපිද
සෙට ගුණින් නොම දිළිඳුව
දෙව් දම් රැකි පවර
අසිරිය සිරිත ඔබගේ

දෙදහස් දොළොස් වස්
පෙර ඔබ උපත වූ දා
බුදුනුවකුව මමද
සමරම් සිතින් සුපසන්

**ජයත් පියදසුන්**

## තාත්තාගේ මළගම

තිස්තුන් කෝටියක්
දේවාල තැනූ තාත්තේ
ඇයි එක දෙවියෙක්වත්
මළගමය නොආවේ

මැති-ඇමති-අගමැති
ජනාධිපතිලා
කළු ගලෙන් පහසුවෙන්ම
තැනූ තාත්තේ
ඇවි ග්‍රාම සේවකවත්
මළගමට නොආවේ

වෙසමුණි-මහසෝන්-රීරි
සද්දන්ත යක්ෂයින්
එක රැයින් මට්ටු කළ තාත්තේ
ඇයි මේ එක යකෙක්වත්
මළගමට නොආවේ

පණ ඇද ඇද
සූවිසි බුදුවරුන්
එක අච්චුවේ තනපු තාත්තේ
ඇයි ගසේ හාමුදුරුවොවත්
මළගමට නොආවේ

**අමිල තේනුවර**

## පුතාට ලියූ කවිය...!

මෝටර් සයිකලය මත
පියාඹන විටදි නුඹ
මගේ හද හඬපු හැටි
නුඹ දැක්කෙ නැහැ පුතේ

කුසට ආ දින පටන්
දෝර ගැලු සෙනේ කඳ
වින්ද දුක් කන්දරා
කිව්වෙ නැහැ මම නුඹට

මරු ළඟට ගොස් හැරී
ආපු ඒ ගමන ගැන
සිතෙන විටදී අදත්
පිපෙයි හිරිගඩු ගතේ

නුඹත් නුඹෙ නැගනියත්
මගේ ඇස් දෙක වගෙයි
නුඹෙන් තොර ලෝකයක්
සිතිය නොහැකිය කොහෙත්

**අසෝක ජයලත්**

## දුම්බර පතලේ දුක් ගින්දර

දුම්බර පතලෙ රෑ දහවල් ගෙවන්නේ
මන්තර කිය කියා දෙවියෝ යදින්නේ
යන්තර වගෙයි හරි හරියට දුවන්නේ
පින්කර නැති නිසයි අපි දුක් ගෙවන්නේ

කන්නේ එකම වේලයි ඒ රෑට තමයි
බොන්නේ බොර දියයි කිරි හොද්දේ පිහිටයි
පින්නේ ලී මැස්සේ මදුරුවන් තලයි
යන්නේ කවදාද ගමරට හීන පෙනෙයි

රෑට බතට කිරි හොද්දක් හදාගෙන
කුසේ ගින්න ඒකෙන් අපි නිවාගෙන
ලන්තෑරුමට තෙල් ඩිංගක් දමාගෙන
ඉන්නේ දුක් කඳුළු හිත යට ඔබාගෙන

හිතේ දුකට කවි පදවැල් බැඳෙන්නේ
ගතේ දිරිය දෝනාවයි බිඳින්නේ
රන් කුරහන් නෙවෙයි මිනිරන් හොයන්නේ
තුන්සිය හැට දොහේ මෙහෙමයි නැහෙන්නේ

නෙතේ පිහිට මට අඹුදරු දකින්නට
ගතේ පිහිට උන් ඇති දැඩි කරන්නට
අතේ වත නැතිව උන් කොයි බලන්නට
පුතේ උඹලාව හැම දෙවි රකින්නට

අඹුදරු දකින්නට ඇතැඟිලි ගණිනවා
හිත යට නැගෙන දුක් ගින්දර කියනවා
උඩට උඩුවියන් පාවඩ මැවෙනවා
පෙර පව් ගෙවෙනතුරු කරුමය ගෙවෙනවා

**අතුල උදය**

## වෛර

දිනක් හෝ නොදැක හිඳින්නට
නොහැකි විය
එකල
දිනක් හෝ
නොබින ඉන්නට
නොහැකි විය
එකල
එහෙත්
විරසක වූ කල
කෙලෙස ඇති විණිද
ඒ
වෛර

**සමන් හේරත්**

## යහ දෙසුමින් සුභ පැතුම්

මිනිසුන් තුළින් යහ ගුණ බැබළෙන කරුණු
බලකාමීන්ට හඬ ගා දෙසුමන් කෙරුණු
ලෝ අප සැමට සාමය සමගිය බෙදුනු
නත්තල අසිරියකි සමිඳුන් දිනු කිතුනු

අත්විඳි කුරිරු නොමිනිස්කම් තුරන් කළ
සාමය සමගියේ සිතිවිලි පුබුදු කළ
සිත් සනසනා දහමක් දේශනා කළ
දිනයයි ජේසු සමිඳුන් උපන් නත්තල

ප්‍රේමයේ සිසිලසින් සැනසුම් සුව විඳිමු
සාමය පතුරුවා යුද බිය පිටු දකිමු
නාමය ජේසු සමිඳුන්ගේ සිහි කරමු
ලෝකෙම නත්තලේ පණිවුඩ පතුරවමු

**විමල් රූබසිංහ**





# රිදී වින්දන

ටොරොන්ටෝවෙන් නිතර ඇසෙන සිංහල සංගීත නාදය වෙනස්ම මගකට යොමු කළ සුවිශේෂී සංගීත සැ ඳෑවක මිහිර විඳගැනීමේ අපූරු අවස්ථාවක් පසුගියදා අපට හිමි විය.'රිදී වින්දන' ලෙස නම්කර තිබූ මෙම ප්‍රසංගයේදී එදා මෙදා තුර සිංහල සිනමාවේ ගැයුණු සුමියුරු ගීත රැසක් ඉතාමත් මිහිරි ලෙස ගායනා විය. තේමාවට ඉතාමත්ම උචිත ආකාරයෙන් මෙම ප්‍රසංගය සඳහා යොදාගෙන තිබූ වීඩියෝ පට, දෘෂ්‍ය ප්‍රයෝග ආදියත් කෝසල මකුළොළුවගේ විශිෂ්ට දක්ෂතා තුළින් වේදිකා පසුතල හා ශාලා අලංකරණය සඳහා යොදාගෙන තිබූ නිර්මාණ පිළිබඳවත් විශේෂයෙන්ම සඳහන් කළ යුතුය.

චමින්ද මාරසිංහ සහ ජයනාග ප්‍රනාන්දු විසින් රිදී වින්දන ප්‍රසංගය සංවිධානය කර තිබූ අතර නව සංගීතයද මුසු කරමින් සංගීතය මෙහෙයවීම සිදුකළේ ප්‍රවීණ සංගීතඥ සුනිල් ජයසිරි විසිනි.

**සේයා රූ සටහන්**
**- පියුමලී ජයසිංහ**











# ශ්‍රවණී ගී දැහැන

ලින්ටන් ප්‍රනාන්දු සංගීත සංයෝජනය කළ 'ශ්‍රවණී ගී දැහැන' සංගීත ප්‍රසංගය පසුගියදා බ්‍රැම්ටන්හි ග්‍රේශ් ප්ලේස් ශාලාවේදී පැවත්වුණි. වෘත්තීය සංගීතවේදියකු නොවන ලින්ටන් පේරාදෙණිය සරසවියේ කෘෂිකර්මය පිළිබඳ උපාධිධරයෙකිග එහෙත් ඔහුගේ සංගීතය පිළිබඳ හැකියාව සහ දැනුම විශිෂ්ටයග ඔහු විසින් සංගීත සංයෝජනය කර ඉදිරිපත් කළ මෙම ප්‍රසංගයේදී ප්‍රවීණ සංගීතවේදී ලයනල් සෙනෙවි සමග ටොරොන්ටෝවල වෙසෙන අපට නිතර හමුවන ප්‍රවීණ ගායක ගායිකාවන් මෙන්ම යොවුන් ශිල්පීන් රැසක් ගී ගයන ලදී. ශ්‍යාමලී ජයමහගේ නිවේදනයෙන් රසගැන්වූ මෙම ප්‍රසංග යේදි වෙහාරාල ආලෝකාල මන්දාරා සහ කලිඳු යන යෞවන යෞවනියන්ද සිංහලෙන් සහ ඉංග්‍රීසි භාෂාවෙන් නිවේදනයට එක්වියග යෞවනයට ඉඩදීම පැසසිය යුතු ගුණාංගයකිග ලින්ටන්ගේ ආදරණීය බිරිඳ රාජිකා කලිඳු පුතු සහ දියණිය නෙත්මිද ගායනයෙන් සහ නිවේදනයෙන් එක්වූ මෙම රසාලිප්ත හෝරා කිහිපය ප්‍රවීණ ඉන්දීය ගායන ශිල්පිණී නන්දිතා රමේෂ්ගේ ගායනා තුළින් තවත් රසවත් වියග ලින්ටන්ගේ මෙම කුළුඳුල් ප්‍රයත්නය ඉතාම මිහිරි රසවත් සංගීත සැඳෑවක් වියග ලින්ටන්ට අපේ සුබපැතුම් සමග ප්‍රසංගය සැම වසරකම ඉදිරිපත් කිරීමට වාසනාව සහ අවස්ථාව ලැබේවායි පතමුග

**සටහන- ආචාර්ය ජගත් රූපසිංහ**













## රිය අනතුරු...

34 වන පිටුවෙන්

එනම් දියුණු රටවල මාර්ග ඉතා විශාල මුදලක් වැය කර නවීන සියලු ආරක්ෂක ක්‍රමෝපායයන් යොදමින් නිර්මාණය කරද්දී සහ නිසි පරිදි නඩත්තු කරද්දී තුන් වැනි ලෝකයේ රටවල් තමන්ට ඇති මාර්ග ටික නිසි පරිදි කලට වේලාවට නඩත්තු කර ගැනිමේ මූල්‍යමය නොහැකියාවෙන් පෙළෙයි. 'මාර්ගය ලෙස්සන සුලුයි. ප්‍රවේශමින් පදවන්න' යයි කෙතෙක් බෝඩ් ලෑලි තිබුණද ඇතැම් මාර්ගවල කිසිදු සලකුණක් දක්වා නොමැතිවත් කඩතොලු ස්ථාන රාශියක් පවතින බව පෙනී ගොස් ඇත. අනපේක්ෂිතව හමුවන මෙවැනි බාධක මහමග අනතුරු සඳහා විශේෂයෙන් හේතුවන බව මේ වන විට අනාවරණය වී ඇත. රිය අනතුරු පිළිබඳව හඬ නගන බොහෝ දෙනකුද මේ තත්ත්වයන් පිළිබඳ අවධානයට යොමු කර ඇති බවක් පෙනෙන්නට නැත.

කඳු සහිත සහ බෑවුම්, විශාල වංගු වැනි ස්ථානවලදී ඊට යොදන ආරක්ෂිත වැට කඩුලුද රිය අනතුරු වළක්වා ගැනීම සම්බන්ධයෙන් විශේෂයෙන් වැදගත් වෙයි. එහෙත් ප්‍රතිපාදන හිඟ වීමේ රෝගයෙන් පෙළෙන බොහෝ දියුණු වෙමින් පවතින රටවල මේ තත්ත්වයෙන් විශාල ප්‍රශ්න පැන නගී.

රථවාහන සඳහා විශේෂිත ආරක්ෂක සැලසුම්ද තිබීම අනිවාර්යය. ඇතැම් රථවාහනවල හැඩය සහ මෝස්තර නිර්මාණය සහ ඇතුළත අංගෝපාංග සවි කිරීමේදී එහි හැඩය කෙරෙහි සැලකිලිමත් නොවීම නිසා අනතුරුවලින් වැළකීම දුෂ්කර වී ඇත. මෑතකදී මගී ආරක්ෂාව පිළිබඳව අධ්‍යයනය කළ පර්යේෂක කණ්ඩායමක ප්‍රධානියා වන වෛද්‍ය රොනන් ලියොන්ස් පවසන්නේ නව රථවාහනවල බාහිරයේ පදික ආරක්ෂාව සඳහා ඉවහල් වන උපාංග හඳුන්වා දීම සඳහා පර්යේෂකයන් මෙන්ම රථවාහන නිෂ්පාදකයන්ද උනන්දු විය යුතු බවය.

මීට අමතරව විශේෂ අවධානයක් යතුරුපැදි සම්බන්ධයෙන් දැක්විය යුතු බව බොහෝ විචාරකයන්ගේ මතයයි. ලෝකයේ සිදුවන රිය අනතුරුවලදී වෙනත් වාහනවල ගමන් කරන අය මෙන් සය ගුණයක් යතුරුපැදි ධාවකයන් සහ එහි ගමන් කරන්නන් අනතුරට ලක්වන බව සොයා ගෙන තිබේ. එනම් යතුරුපැදි අනාරක්ෂිත ලෙස පැදවීම, විශේෂයෙන්ම නිසි ප්‍රමිතියකින් තොර හිස් වැසුම් පැළඳීම සහ හිස් වැසුම් නොපැළඳීම නිසා විශාල අනතුරු ප්‍රමාණයක් ලොව පුරා සිදු වෙමින් පවතී. එම නීතිරීති ක්‍රියාත්මක කිරීමෙන් යතුරු පැදි ආශ්‍රිත අනතුරු සැලකිය යුතු ලෙස අවම කරගත හැකිය.

මේ සියලු කරුණු අතර තවත් අවධානයට යොමු කළ යුතු වැදගත්ම කරුණක් වන්නේ මාර්ග ආරක්ෂාව පිළිබඳව නිසි අධ්‍යාපනයක් ලබා දීමය. එහෙත් බොහෝ දියුණු වෙමින් පවතින රටවල මාර්ග ආරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම සම්බන්ධයෙන් ඇත්තේ බටහිර දියුණු රටවල ආකෘතීන්ය. ඒවා ඇතැම් විට එම රටවලට නොගැලපෙන සෙයක් පෙන්නුම් කරයි. ඒ සඳහා විශේෂ ක්‍රමෝපායයක් ඇති කර ලීම අධ්‍යාපන බලධාරීන්ගේ මෙන්ම සෞඛ්‍ය, පොලීසිය සහ රථවාහන සම්බන්ධ බලධාරීන්ගේද වගකීමක් බවට පත්ව ඇත.

### රිය අනතුරු වැළැක්වීමට ලෝක සැලසුමක්

මාර්ග අනතුරු වළක්වා ගැනීම සම්බන්ධයෙන් මේ වනවිට ලෝක තත්ත්වයෙන් ක්‍රියාත්මක වන සැලසුම් පිළිබඳව අවධානය යොමු කළ යුතුය. මෑතකදී ලෝක සෞඛ්‍ය සංවිධානයේ මූලිකත්වයෙන් සිදු කෙරුණු එක්තරා අධ්‍යයනයක් අවසානයේදී ඊට සහභාගී වූ විද්වත් මණ්ඩලය ලෝකයේ රිය අනතුරු අවම කිරීම සඳහා භාවිත කළ හැකි පස් අවුරුදු ක්‍රමෝපායයක් මේ වනවිට ඉදිරිපත් කොට තිබේ. එහි පළමු පියවර වන්නේ දීර්ඝ කාලීනව මාර්ග අනතුරුවල පවතින ව්‍යාප්තිය සහ එහි ඇති සෞඛ්‍ය අනතුර පිළිබඳව පුළුල් අධ්‍යයනයක් සෑම රටකම සිදු කිරීමය. අදාළ දත්ත එක්රැස් කිරීම මේ වනවිට බොහෝ දියුණු වෙමින් පවතින රටවල ඒකාකාරීව සිදු වන්නේ නැත. එය විධිමත්ව සිදුවන්නේද නැත. රිය අනතුරු නිසා මිය ගිය අය පිළිබඳව වාර්තා වූවද ඇතැම් විට රෝගී බවට පත්වන්නන් සහ එහි සමාජ බලපෑම පිළිබඳ වාර්තා වන්නේ අල්ප වශයෙනි.

මේ දත්ත මගින් ක්ෂේත්‍රයේ අඩුපාඩු හඳුනාගත හැකි වන අතර ඒ ඔස්සේ පුළුල් පර්යේෂණ දිගුකාලීන සහ කෙටිකාලීන ඉලක්ක මත සිදු කිරීම ඊළඟ පියවරයයි. ඒ සඳහා රටක සිටින විවිධ මට්ටමේ පර්යේෂකයන් සහ නිලධාරීන් සහභාගී කරගත හැකිය.

මේ පර්යේෂණ මත ලැබෙන විවිධ තොරතුරු රටවල් අතර හුවමාරු කිරීමටද අදාළ බලධාරීන් කටයුතු කිරීමේ වැදගත්කමද මෙහිලා පෙන්වා දී තිබේ. මේ දත්ත ජාලය රටකට ගැලපෙන්නා වූ පුළුල් අනතුරු වළක්වා ගැනීමේ සැලසුමක් සඳහා අතිශයින්ම වැදගත්ය.

මෙම තොරතුරු ඇසුරෙන් අනතුරු වළක්වා ගැනීම සඳහා සෑදෙන සැලසුම්වලට දායක කර ගත යුත්තේ මෝටර් රථ පිළිබඳ රාජ්‍ය ආයතන හෝ සෞඛ්‍ය අංශ පමණක් නොවන බව ලෝක සෞඛ්‍ය සංවිධානයේ අදහසයි. ඔවුන් තම ක්‍රමෝපාය මගින් පෙන්වා දෙන පරිදි මහාමාර්ග පිළිබඳ වගකිව යුතු ආයතන, පළාත් පාලන ආයතන මෙන්ම අධ්‍යාපන අංශවලටද මාර්ග අනතුරු වළක්වා ගැනීම සඳහා යම් යම් වගකීම් පැවරෙයි. මේ වගකීම් නිසි පරිදි ඉටු කිරීමට කටයුතු කළ යුතුය. කෙසේ වුවද රට රටවල් වෙන් වෙන් වශයෙන් සැලකුවද සෑම රටකම මාර්ග ආරක්ෂාව සහ අනතුරු හා සබැඳි ප්‍රශ්න අප වටහා ගත යුතුය. එහිලා වෙසෙසින්ම සඳහන් කළ යුතු කරුණක් වනුයේ එක් එක් ප්‍රදේශයේ භෞමික තත්ත්වයන් සමාජයීය පසුබිම වැනි කාරණා පවා මෙම අනතුරු වළක්වා ගැනීමේ පුළුල් සැලසුමට අයත් විය යුතු බවය.


Why Pay More?
1%
Are You Planning to Sell a Property?
Listing Commission*
BUY or SELL through us and get an amazing chance to
WIN
1 of 10 GREAT PRIZES INCLUDING 2016 HONDA CIVIC
1st Prize
8 TVs
I will guide you through the process in a professional, friendly and accountable manner
Call for more information
Nishantha 416 417 0763
Century 21
Nishantha Donsiyambalapitiyage Sales Representative Email:nishan.don@gmail.com
Innovative Realty Inc. 2250 Markham Road Unit 3 Toronto ON M1B2W4. Office: 416 417 0763


AKG WEB DESIGN
TAKE YOUR BUSINESS ONLINE!
✔ Professional Quality
✔ E-Commerce Features
✔ Fully Responsive
✔ Reliable Service
✔ 24/7 Support
FLEXIBLE PRICING
MONTHLY OR ONE TIME FEES
LET US CREATE FOR YOU
647-995-3391
LEARN MORE AT: http://webstore.danakg.ca



# වැඩිහිටි වියේ පෝෂණය රකින ලෝකයේ හොඳම ආහාර වේල

■ වෛද්‍ය පාලිත සමන් ජයකොඩි

නිවැරදි පෝෂණය නිරෝගීභාවයේ පදනම වන අතර වැරදි පෝෂණය ලෙඩ රෝගවල පදනමයි. ජීවිතයේ සියලුම අවධි සඳහා මෙය සත්‍යයක් වන අතර වැඩිහිටි අවධිය සඳහා මෙය වඩාත්ම සත්‍යය වෙයි. එහෙත් වැඩිහිටියන්ගේ පෝෂණය පිළිබඳ බරපතල නොසළකා හැරීමක් වැඩිහිටියන් විසින්මද සමාජය විසින්ද සිදුකර තිබේ. එසේම වාණිජ සමාගම් වැඩිහිටියන් පෝෂණය සම්බන්ධයෙන් බරපතල ලෙස නොමග යවා ඇත. එම තත්ත්වයන්ගේ අනිවාර්ය ප්‍රතිඵලය වී තිබෙන්නේ වැඩිහිටියන් පෝෂණ ගැටලු රාශියකට මුහුණ දීමය. වැඩිහියන්ගේ දත් නොමැතිවීම නිසා ඇතිවන සැපීමේ දුර්වලතා, ජීර්ණයේ සහ පෝෂ්‍ය පදාර්ථ අවශෝෂණයේ දුර්වලතා ආදියද එක් වූ විට තත්ත්වය වඩාත් කනගාටුදායක වේ. ඒ නිසා වැඩිහිටියන්ගේ සෞඛ්‍යය බරපතල අනතුරුදායක තත්ත්වයකට ඇද වැටී ඇත. වැඩිහිටියන් අතර බහුල ලෙස දැක ගත හැකි පෝෂණය සහ ඒ සම්බන්ධ ගැටලු වන්නේ විජලනය, හාමතය සහ මන්දපෝෂණය, රක්තහීනතාවය, විටමින් ඌණතා, මළබද්ධය, අර්ශස් රෝගය, බඩවැල පාත්වීම, ගැස්ට්‍රයිටිස්, ස්වභාවික ආහාර සඳහා කෑම අරුචිය, දියවැඩියාව, කොලෙස්ටරෝල් වැඩිවීම, අධිරුධිර පීඩනය හා තරබාරු බව, අස්ථි පද්ධතිය දුර්වල වීම, ආහාර අනුභවයේ සතුට නැති වීම ආදි තත්ත්වයන් හා රෝග හේතුවෙනි.

විජලනය සහ ඒ නිසා ඇතිවන ක්ලාන්තය කැරකිල්ල ආදිය කිසිදු වියදමකින් තොරව මෙන්ම පහසුවෙන්ම මගහරවා ගත හැකිය. ඒ සඳහා කළ යුත්තේ අවම වශයෙන් පිරිසිදු පානීය ජලය ලීටර 2 ක් වත් වැඩිහිටියන් විසින් පානය කිරීමය.

අනෙකුත් පෝෂණ සහ ඒවා තුළින් පැන නගින සෞඛ්‍ය ගැටලු අවම කරගැනීම සඳහා මෙන්ම විසඳා ගැනීම සඳහා වැඩිහිටියන් විශ්වාසය තැබිය යුත්තේ විවිධ කිරිපිටි වර්ග ඇතුළු ඊනියා පෝෂණ පැකට්, ටින් හෝ බෝතල් කෙරෙහි නම් නොවේ. එසේම වෛද්‍යවරුන් වෙතින් නිර්දේශ කරවා ගන්නා විවිධ විටමින් වර්ග කෙරෙහිද නොවේ. අප සතු ලෝකයේ උසස්ම ආහාර වේල කෙරෙහිය.

## ලෝකයේ උසස්ම ආහාර වේල

අපේ රටේ වසර දහස් ගණනක් තිස්සේ තහවුරු වූ බත් මූලික කොටගත් විශිෂ්ට ආහාර රටාවක් තිබේ. අපේ වැඩිහිටියන් නිවැරදි පෝෂණය ලබාගැනීම සඳහා විශ්වාසය තැබිය යුත්තේ එම බත් මූලික කොටගත් ආහාර රටාව අනුව යමින් සකසා ගන්නා අංග සම්පූර්ණ බත් වේල කෙරෙහිය. ඇත්ත වශයෙන්ම එය ලෝකයේ ඇති උසස්ම ආහාර වේලද වන්නේය.

අංග සම්පූර්ණ බත් වේල සකසා ගැනීමේදී ඒ සඳහා තෝරා ගන්නා සහල් වර්ගයද වැදගත්වේ. වැඩි පෝෂණයක්ද දියවැඩියාව වැනි රෝගවලින් වැඩි ආරක්ෂාවක්ද ලබාදෙමින් මළබද්ධය ආදි ගැටලුවලට හොඳ විසඳුමක්ද ලබාදෙන්නේ තම්බපු රතු හෙවත් රතු නාඩු සහල්ය. බත් පිස ගැනීමේදී වැඩිහිටියන්ගේ දිරවන පහසුව සඳහා හොඳින් ඇට පුළුන් වන සේ පිස ගත යුතුය.

අංග සම්පූර්ණ බත් වේලේ දෙවැනි ප්‍රභවය ලෙස තෝරා ගත යුත්තේ ඇට වර්ග, පියලි වර්ග හෙවත් මාංශ බෝගයි. මුං ඇට, කඩල, කව්පි, පරිප්පු වර්ග, කොල්ලු, උඳු, මෑ සහ බෝංචි වර්ගවල මෝරපු ඇට, සෝයා ආදිය මෙම කාණ්ඩයට අයත් වේ. මෙම කාණ්ඩය නිවැරදි පෝෂණය තහවුරු කිරීම සම්බන්ධයෙන් බොහෝ දෙනා සිතනවාට වඩා සුවිසල් මෙහෙයක් ඉටුකරයි. මේවායේ ඉතාම ඉහළ ප්‍රෝටීන් ප්‍රතිශතයක් අඩංගුය. ජනප්‍රිය මතය වන්නේ ප්‍රෝටීන් බහුලව ඇත්තේ මස්, මාළු කිරි, බිත්තර ආදි සත්ව ආහාරවල කියාය. නමුත් සත්‍යය වන්නේ ඒ සියල්ලටම වඩා වැඩි ප්‍රෝටීන් ප්‍රතිශතයක් මෙම පියලි වර්ග වල තිබීමය. බත් සමග මෙම පියලි වර්ග එකට යහමින් ආහාරයට ගැනීමේදී සියලුම ඇමයිනෝ අම්ලවලින් අනූන ඉතාම උසස් තත්ත්වයේ ප්‍රෝටීන් ලැබීම තහවුරු වෙයි. ඊට අමතරව විශාල ශක්ති ප්‍රමාණයක්ද හිතකර මේද අම්ල විශාල ප්‍රමාණයක්ද විටමින් වර්ග රාශියක්ද කැල්සියම් යකඩ ආදි ඛනිජ රාශියක්ද තන්තු සහ ශාක රසායනික බහුලවද පියලි වර්ගවලින් ලබාදෙයි.

අංග සම්පූර්ණ බත් වේලේ තුන්වැනි ප්‍රභවය ලෙස තෝරාගත යුත්තේ පලා වර්ග හෙවත් කොළ එළවළු සහ අනෙකුත් එළවළු වර්ගයි. එළවළු තෝරා ගැනීමේදී පලා වර්ගවලට සෑමවිටම මුල් තැන දිය යුතුය. එයින්ද කතුරුමුරුංගා, මුකුණුවැන්න, ගොටුකොල, කන්කුන්, නිවිති, සාරණ, තම්පලා ආදි වශයෙන් වූ අපේ රටේ සිය ගණනක් තිබෙන තද කොළපාට පලාවලට මුල්තැන දීමෙන් වැඩි පෝෂණීය ගුණයක්ද වැඩි ඖෂධීය ගුණයක්ද ලබාගත හැකිය. සෑම වේලකටම අවම වශයෙන් එක් පලාවර්ගයක්වත් යහමින් එක් කර ගැනීම වැඩිහිටියන්ගේ පෝෂණයේත් නිරෝගිභාවයේත් ආර්ථික සමෘද්ධියේත් විපල්වීය වෙනසකට මං පාදයි.

අංග සම්පූර්ණ බත් වේලේ හතරවෙනි ප්‍රභවය ලෙස තෝරාගත යුත්තේ කොස්, දෙල්, අල, බතල ආදියයි. ඒවායේ බත්වල මෙන්ම පිෂ්ඨ ධාතුව බහුලව පවතින නිසා බත්වලට ආදේශකයක් ලෙසත් බත්වල අඩුව සැපරීමට ඌණපූරකයක් ලෙසත් යොදා ගත හැකිය. කොස්, දෙල්, අල, බතල අපේ රටේ ඉතාම බහුලව පවතින අතර බොහෝවිට ඒවා ලබාගැනීමට කිසිම මුදලක් වැය නොවන්නේ බොහෝ ගෙවතුවල මේවා යහමින් ඇති බැවිනි. මේවායේ කිසිම වස විසක් අඩංගු වන්නේද නැත. එසේම නැවුම්ව ආහාරයට එකතු කර ගත හැකිය.

## සත්ව ආහාර අවශ්‍යම නැත

වැඩිහිටියන්ගේ කායික මානසික නිරෝගීභාවය වෙනුවෙන් ශාක ආහාරවලින් ආහාර වේලේ පදනම දමාගත් අපි ඊළඟට සත්ව ආහාර ගැන නිවැරදි අවබෝධයක් ලබාගනිමු. සත්ව ආහාර අනිවාර්ය යැයි මින් කිසිසේත්ම අදහස් නොකරන අතර සියලුම ශාක ආහාර බාණ්ඩ බහුලව සම්මිශ්‍රණයක් සේ ගැනීමෙන් නිවැරදි පෝෂණ තහවුරු කර ගත හැකිය.

මස්, මාළු, කිරි, බිත්තර ලෙස ප්‍රධාන සත්ව ආහාර වර්ග හතරකි. මේවායින් මිනිසුන්ට නිරෝගි වන්නට උදව් කරන්නේ මාළු පමණි. එයිනුත් වඩා සුදුසු වන්නේ සාලයා, හුරුල්ලා, හාල්මැස්සා වැනි ගුණයත් වැඩි මිලෙනුත් අඩු කුඩා මාළුය. ඒවායින් වේලන ලද කරවලද ඉතාම ගුණදායක වන අතර ඒවා කටුවත් සමගම ආහාරයට ගැනීමෙන් වැඩිහිටි වියේදී තහවුරු විය යුතු කැල්සියම් අවශ්‍යතාවය පහසුවෙන් ලබාගත හැකිය. එවිට කැල්සියම් පතා කිරිපිටි පස්සේ යාමට අවශ්‍ය වන්නේද නැත.

මස්, බිත්තර, සහ කිරි අධික වශයෙන් භාවිතය සෞඛ්‍යයට ඉතාම හානිකර බව වැඩිහිටියන් විසින්ද අවබෝධ කර ගත යුතුය. කිරිපිටි වැඩිහිටියන්ට කිසිසේත්ම අත්‍යවශ්‍ය ආහාරයක් නොවන බවත් සමාගම්වල නොමග යෑවීම්වලට වැඩිහිටියන් රැවටිය යුතු නැති බවත් මෙහිදී දැඩිව අවධාරණය කළ යුතුය.

අංග සම්පූර්ණ බත් වේලේ ඊළඟ ප්‍රභවය ලෙස අප තෝරාගත යුත්තේ කුලුබඩුය. ආහාරයට රසය සහ සුවඳ ලබාදීමට වඩා වැඩි යමක් කුළුබඩුවලින් සිදු නොකරන බව බොහෝදෙනාගේ විශ්වාසය වුවත් කුළුබඩු නිවැරදි පෝෂණයට අතිශයින්ම වැදගත්ය. කුළුබඩුවලින් විශාල පෝෂණ සංඝටක ප්‍රමාණයක්ද අපේ ආහාරවේලට එක්කරන බව අප තේරුම්ගත යුතුය. විශේෂයෙන් කොත්තමල්ලි, දුරුවර්ග, උළුහාල්, අබ, කුරුඳුපොතු ආදි කුළුබඩු වර්ග යකඩ කැල්සියම් ආදි ඛනිජවලින්ද ප්‍රෝටීන්වලින්ද තන්තු සහ ශාක රසායනිකවලින්ද පොහොසත්ය. නමුත් මිරිස් සහ ගම්මිරිස් ආහාරයට එකතු කර ගත යුත්තේ තමාට දරාගත හැකි සීමාවට යටත්වය. ඇත්ත වශයෙන්ම ආහාර අරුචියට ප්‍රත්‍යක්ෂ ඖෂධයක් වන තැම්බුම් හොද්ද අපේ කුළුබඩු වල නිර්මාණශීලී එකතුවකි.

අංග සම්පූර්ණ බත්වේල සඳහා අවසන් ප්‍රධාන ප්‍රභවය ලෙස තෝරාගත යුත්තේ පොල්ය. පොල්, ගාන ලද පොල් ලෙස සම්බෝල මැල්ලුම්වලටත් ක්ෂණකම් නොවන කිරි ලෙස ව්‍යංජනවලටත් එකතු කර ගත හැකිය. සීමාසහිතව තෙම්පරාදු කිරීමේ සහ තෙලෙන් බැද කෑමේ වරදක් නැත. උවමනාවට වඩා ක්ෂණකමට මිටිකිරි භාවිතයත් සෑම වේලකටම සෑම දෙයක්ම තෙම්පරාදු කර කෑමත් සුදුසු නොවේ. අපේ පැරැන්නන් අපට කියාදී ඇති පරිදිම රාත්‍රියට තෙල් බැඳුම්වලින් වැළකී සිටීම ඉතාම යහපත්ය.

මේ ආකාරයෙන් රසයෙන්, සුවඳෙන්, පෙනුමෙන්, විවිධත්වයෙන්, පෝෂණ සංඝටක අනුපාතයෙන් සහ ප්‍රමාණයෙන්, මෙන්ම ඖෂධීය ගුණයෙන්ද අනූන ආහාර වේලක් අපට බත් මූලික කොටගෙන සකසා ගත හැකිය. එය ඉතා පැහැදිලි ලෙසම ලෝකයේම ඇති උසස්ම ආහාර වේලද වෙයි. බත් තුන් වේලටම ආහාරයට ගැනීමෙන් අපේ වැඩිහිටියන්ට කායික මානසික සුවතාවය නංවාගෙන ඇතිවිය හැකි පෝෂණ සහ සෞඛ්‍ය ගැටලුවලින් පහසුවෙන්ම මිදිය හැකිය.

ප්‍රධාන කෑම වේලට පසු අතුරුපස ලෙසත් ප්‍රධාන කෑම් වේල් අතරටත් සෑම විටම කෙසෙල්, පැපොල්, අඹ, අන්නාසි ආදි සිය ගණනක් වන දේශීය පලතුරු වර්ග හැකි තරම් එකතු කර ගත යුතුය. මෙහිදී බොහෝ දෙනා හොඳම පලතුරු සේ විදේශීය මිදි, ඇපල් කෙරෙහි විස්වාසය තැබුවත් විදේශීය මිදි, ඇපල් යනු පලතුරු නොව වස විස ගැල්වූ රොඩු බව අවධාරණය කළ යුතුය.

ප්‍රධාන ආහාර වේල් අතරට කෙටි කෑම වේල් 2 ක් එකතු කර ගත හැකිය. ඒ සඳහා ඉහතින්ද පෙන්වා දී ඇති පලතුරක් භාවිත කළ හැකිය. හාල් පිටි සහ පියලි වර්ගවල පිටි සම සමව ගෙන අග්ගලා සකසා ගැනීමෙන් සමතුලිත වැඩි පෝෂණ ගුණයක් ලබාගත හැකිය. කුරහන් හැලපයක් හාල්පිටිවලින් සැකසූ ආප්පයක් වැනි දෙයක්ද ආහාර වේල් අතරට සුදුසු කෙටි කෑම වේ. බොහෝදෙනා පොඩි බඩගින්නට යැයි කියා ක්‍රීම් ක්‍රැකර් විස්කෝත්තු අධික වශයෙන් භාවිතයට පෙළඹී තිබුණත් එයින් අවැඩක් මිස වැඩක් නම් වන්නේ නැත.

උදේට සහ රාත්‍රියට වෙනත් දේශීය විකල්ප ආහාර ගැනීමට අවශ්‍ය අයට ඒ සඳහාද බාධාවක් නැති අතර සතියකට කිහිප වරක් එසේ කිරීමෙන් ආහාර වේල්වල විවිධත්වයද තවදුරටත් ඔප් නංවා ගත හැකිය. පිටි සහිත ආහාර සඳහා හාල්පිටි, කුරක්කන් පිටි, උළුඳු පිටි, හල් පිටි, මුං පිටි ආදි දේශීය පිටි ප්‍රභවයන් යොදා ගත යුතුය. මේ ආහාර පාන් පිටිවලින් තොර වීම සෑම අතින්ම යහපත්ය.

ලබා ගත යුතු ආහාර ප්‍රමාණ තීරණය කිරීමට ඇති හොඳම ක්‍රමය වන්නේ තමාගේ ශරීරයේ උසට සරිලන බර පවත්වා ගන්නා ප්‍රමාණයට ආහාර ගැනීමය. සෑම දෙනාම ආහාර වේලේ විවිධ උපරිමයෙන් වැඩිවන පරිදි සහ ආරක්ෂා වන පරිදි ආහාර වේල සැලසුම් කර ගත යුතුය. එවිට සියලුම පෝෂ්‍ය පදාර්ථ නොඅඩුව ලැබෙන අතර සෞඛ්‍යාරක්ෂාවද උපරිමයෙන් තහවුරු වෙයි.

# ආතති සමනය සඳහා ශාන්තිකර්මයන්ගේ බලපෑම



■ අයෝමි ඉරුගල්බණ්ඩාර

ලොව විසූ ප්‍රාථමික මිනිසාගේ මූලික අවශ්‍යතාවන් වූයේ ආහාර හා නිවාස පමණි. ආහාර නොමැති වූ විට ඇති වන ආවේග සම්පන්න, ගැටලුකාරී තත්ත්වයෙන් මිදීමට ප්‍රාථමික මිනිසුන් භවභෝග අතින් සශ්‍රීකත්වය ලබා ගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ අතර පුද පූජා හා ඇදහිලි විශ්වාස තුළින් සශ්‍රීකත්වය සාක්ෂාත් කර ගැනීමට ප්‍රමුඛ තැනක් දුන්හ.

ලොව පුරා ව්‍යාප්ත වූ ප්‍රාථමික ශිෂ්ටාචාරයන්ගේ ඉතිහාසය විමර්ශනය කරන විට මෙම කරුණ වඩාත් හොඳින් දැකගත හැකි වේ. එදා ග්‍රීකයන් තම මිදි අස්වනු වගාව අරභයා පැවැත්වූ පුද පූජා සෘජුව සශ්‍රීකත්වය හා සම්බන්ධ වේ. අපගේ අලුත් සහල් මංගල්‍යයද, හින්දුන් අලුතින් නෙළාගත් සහලින් ගවයන්ට කිරිබතක් සාදා, ගවයන් කවා පොවා සරසවා සිදු කරනු ලබන චාරිත්‍රවාරිත්‍ර තුළ ඇත්තේද සශ්‍රීකත්වය හා බැඳුණු චාරිත්‍ර කිහිපයකි. මේ ආකාරයට බැලුවහොත් ලොව බොහෝ ප්‍රාථමික ශිෂ්ටාචාරයන්ගේ ආරම්භය සශ්‍රීකත්වය හා බැඳුණු පුද පූජා සමඟ සහසම්බන්ධ වන අතර ඒවා පසුපස මනෝ විද්‍යාත්මක දර්ශනයක්ද ඇති බව පෙනී යනු ඇත.

ප්‍රාථමික මිනිසුන් සමාජානුයෝගී කිරීමෙහි ලා අනුකරණය ප්‍රබල වූ බව බොහෝදෙනා දන්නා කරුණකි. 'අනුකරණයෙන් විනෝදාස්වාදයත්, අධ්‍යාපනයත් ලැබෙතියි' ඇරිස්ටෝටල් කියයි. ඇනිමිස්ටික්වාදී දර්ශනයට අනුගත වෙමින් ගහකොළ, පර්වත, ආදියට වන්දනාමාන කළ ප්‍රාථමික ජන සමාජයන්හි උපත ලැබූ, විවිධාකාර ශාන්තිකර්ම වතාවත්හි ඔවුන් පිහිටෝපකාර ලැබූයේ අනුකරණාත්මක, අභිචාරාත්මක ක්‍රමයන්ගෙනි. ඒ තුළින් ඔවුන් ලැබූ භාව විරේචනය පසුකාලීනව අප දන්නා ආතතීන් පහ කිරීම සඳහා යොදා ගන්නා උපදේශනයේ ක්‍රමවේද හා යම් තරමකට සමාන වේ. යාතුකර්මවලදී පුදනු ලබන දෙවිදේවතාවුන්, යක්ෂයන් සතුටු කිරීම මගින් වින කරනු ලැබූ සියලුදෙනා සතුටු කිරීමට යොදා ගන්නා උපක්‍රම මගින් ආතුරයා විෂයෙහි භාව තුලනයක් ඇති කිරීමට ඉන් සමත් වන නිසාවෙනි. මෙම පුද පූජාවලදී විනෝදාස්වාදාත්මක උපහාස කතා, නර්තන විධි, පරලවීම්, ආවේශ වීම්, සියල්ලෙන් ඉටු වන්නේ පුද්ගලයා විෂයෙහි පවත්නා ආතතීන් පහ කිරීමයි. අනුකරණාත්මක රංගනයෙන් මෙසේ මුදාහරිනු ලබන භාවයන් විටෙක නාට්‍යමය ස්වරූපයක් ගනියි. ඉංග්‍රීසි Drama යන වචනය සෑදී ඇත්තේ Dran නමැති ලතින් වචනයෙනි. එහි අර්ථය 'කර පෙන්වන දෙයක්' යන්නයි.

මානසික රෝග කෙරෙහි බලි තොවිල්, ශාන්තිකර්මයන්ගේ විශේෂ බලපෑමක් දක්නට ලැබේ. ඒ කරුණු දෙකක් නිසාය. ඉන් පළමුවැන්න වන්නේ බොහෝ අවස්ථාවලදී මානසික රෝග යක්ෂ, ප්‍රේත දෝෂයන්ට සම්බන්ධ ලෙස සැලකීමය. එදා ගැමියා දැනුවත්ව හෝ නොදැනුවත්ව සියලු රෝග යන්ගේ මූලාරම්භය 'මනස' හරහා සිදුවන බව පිළිගත්තේය. මෙහි ගැඹුරු මනෝවිද්‍යාත්මක හරය වන්නේ රෝගය පිළිබඳ වගකීම රෝගියාගෙන් (ආතුරයාගෙන්) ඉවතට ගත් පසු එයින් රෝගියාට ඇතිවන මහත් සහනය මගින් රෝගය යන්න බාහිර කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් ලෙස ගර්හා කොට පළවා දමා ජීවිතය අලුතින්ම ආරම්භ කිරීමට ශක්තිය ලබාදීමයි. ශාන්තිකර්මවලදී ගසනු ලබන බෙරපද මගින් ආතුරයා ස්වයං මෝහනයකට පත් කර, යටි සිත අවධි කර, තමන්ට දෙන විධානයන් යටි සිතෙහි ගැඹුරින් තැන්පත් කර ගන්නා අතර තමන්ගේ චර්යාව විධානයන්ට අනුව ධනාත්මකව වෙනස් කර ගැනීමට සවිඥානිකව ආතුරයාට ලැබීමයි.

දෙවැනි කාරණාව වන්නේ ආතුරයා කේන්ද්‍රකොට ගනිමින් පවුලක් වශයෙන් හා ගමක් වශයෙන් සියලුදෙනා ශාන්තිකර්මය වටා එකතුවීමයි. මෙවැනි අවස්ථාවක පවුල අතර, පවුලේ ඥාතීන් අතර හා ගම අතර අන්‍යෝන්‍ය වශයෙන් එකමුතුවක් ඇතිවෙයි. අන් අයගේ සාමූහික සහාය ලැබෙන නිසා පුද්ගල සන්නිවේදනය යහපත් වෙයි. ආතුරයාට අන් අයගේ අවධානය ලැබෙයි. එවිට ඔහු-ඇය පෙළූ මානසික තනිකමෙන් බිඳෙයි. තමන් වටා සියල්ලන් සිටින බව සිතයි. සමහර අවස්ථාවලදී උද්වේගකර බෙර පද සමඟින් නැටුමට පෙළැඹී අවසානයේදී ප්‍රකෘති සුවයට පත්වීම තුළද ඇත්තේ කායිකව හා මානසිකව ලිහිල් වීමකි. ආතතිය මුදා හැරීමකි. මෙයට අමතරව මේ ශාන්තිකර්ම අවස්ථාවන්හිදී සිදු කරනු ලබන පුද පූජා වතාවත් හැරුණු කොට විවිධ අනුරූපණ හා නාට්‍යමය අවස්ථා ඇතුළත් හාස්‍යෝත්පාදක හා ශෘංගාරාත්මක වටපිටාව තුළින් ඇති කරනු ලබන ජීවය නරඹන්නන් තුළ පවතින ආතතිය මුදා හැරීමට සමත් වේ. මේ සඳහා හොඳම උදාහරණය වන්නේ සොකරි නාට්‍යයයි. සශ්‍රීකත්වය අපේක්ෂාවෙන් සිදුකරන ගැමි නාට්‍යයක්, ශාන්තිකර්මයක් ලෙස ප්‍රකට සොකරි හා බැඳුණු ව්‍යංගාර්ථ මෙන්ම කුණුහරුප කලාව තුළ ඇත්තේ මනෝ නාට්‍යය ලක්ෂණයයි. නාට්‍ය මගින් චිත්ත විරේක කළ හැකි බව ඇරිස්ටෝටල් පෙන්වා දී තිබේ. කුණුහරුප කලාව මගින්ද සිදුවන්නේ පුද්ගලයා විෂයෙහි පවතින මානසික ආතතිය පහ කිරීමයි.

ශ්‍රී ලංකාවේ සංස්කෘතික අනන්‍යතාව රැකී ඇති බලිතොවිල්, කොහොඹා කන්කාරිය, දහඅට සන්නිය, මඩු යාග, රිද්දි යාග ආදිය ගත්විට අනාදියේ සිට යම් පුද්ගලයකු දක්වන අසාමාන්‍ය චර්යා රෝගී තත්ත්වයක් ලෙස සලකා මනෝ ප්‍රතිකාර වශයෙන් ශාන්තිකර්ම යොදා ගත් ආකාරය කැපී පෙනේ. මේවායෙහි සංවිධානාත්මක අන්තර්ගතය පරීක්ෂා කරන විට සියලු රෝග සඳහා මනස බලපාන බව එදා සිටම සිංහලයන් දැන සිටි බව හැඟ වේ. 'පීඩාකාරී පරිසර තත්ත්ව යටතේ මිනිසාගේ චර්යාව වෙනස් වේ. විමුක්තිය ලබාගැනීමට නම් ජීවිතයට සතුටින් මුහුණ දිය යුතු බව' ගෝසාලයන් කියා ඇත්තේ එබැවිනි.

# හිසරදය ගැන ඔබ සැලකිලිමත්ද?

■ මනෝවෛද්‍ය විශේෂඥ ආර්. ඒ. ආර්. පෙරේරා

හිසරදය වේදනාකාරී හා පීඩාකාරී වුවද, හිසරදයන් වැඩිහරික් බරපතල රෝගාබාධ හඟවන ලක්ෂණයන් නොවේ. හිසරදයන්ගෙන් 90% ක් පමණ හටගන්නේ ආතතිය හෝ ඉරුවාරදය හේතුකොට ගෙනය. හිසරදයන් වර්ග කළ හැකි එක් මඟක් නම් ජීවිතයට තර්ජනයක් විය හැකි හදිසියේ හටගන්නා හිසරදයන්ගෙන්, හදිසියේ හට නොගන්නා සාමාන්‍ය හිසරදයන් වෙන්කොට හඳුනාගැනීමය. හදිසියේ හටගන්නා තදබල හිසරදයන් ජීවිතයට වහා තර්ජනයක් විය හැකි බැවින් ඒවාට අප්‍රමාදව ප්‍රතිකාර කළ යුතුව ඇත.

මොළයේ රක්තපාතයට (Brain hemorrhage) සම්බන්ධ හිසරදයන් රෝගීන් සාමාන්‍යයෙන් විස්තර කරන්නේ විදුලි කෙටීමක් වැනි හදිසියේ හටගන්නා හිසරදයන් ලෙසටය. හදිසියේ හටගන්නා මේ හිසරදයන් අඩු හෝ වැඩි තීව්‍රතාවකින් යුතුව දින ගණනක් පැවැතිය හැකිය. මෙවන් අවස්ථාවල අසාමාන්‍ය රෝග ලක්ෂණ පහළ විය හැකි අතර, හිසදරය හටගන්නා විට කෙටිකාලීන සිහිය නැති වීමක්, බෙල්ලේ තද බවක් හෝ ඇසිපිය ගැසීමේ අසාමාන්‍යතාවක් ඇතිවීමට ඉඩ තිබේ.

මොළයේ රක්තපාතය හේතුකොට ගෙන ආඝාතය (Stroke) වැළඳිය හැකි හෝ මරණය සිදුවිය හැකි හෝ හෙයින් මෙවන් හිසරදයන් වහා වෛද්‍යවරයකුගේ අධීක්ෂණයට භාජන විය යුතුය. ස්කෑන් පරීකෂණයකින් අසාමාන්‍යතා හඳුනාගත හැකි අතර, සමහර අවස්ථාවල මොළය සැත්කමකට භාජන කිරීම, ප්‍රතිකාරයේ අත්‍යාවශ්‍ය අංගයක් විය හැකිය.

වයස අවුරුදු 50 ට හෝ ඊට වැඩි තැනැත්තන්ගේ මධ්‍ය ප්‍රමාණයේ ධමනි ප්‍රදාහය නිසාද හිසරදය ඇතිවිය හැකිය. මෙවන් අවස්ථාවල ආහාර විකන විට හිසේ කැක්කුම උත්සන්නවී මුළු සිරුර පුරා කැක්කුම් වේදනා හටගැනීමට ඉඩ තිබේ. මේ හේතුකොට ගෙන පෙනීමේ දුර්වලතාවන් ඇතිවීමටද ඉඩ ඇත. ඖෂධ ප්‍රතිකාර මගින් මෙවන් හිසරදයන්හි වේදනාව බොහෝ දුරට අඩු කළ හැකිය.

මෙනින්ජයිටිස් රෝගය නිසා උණ සමග හිසරදය හා බෙල්ලේ තද ගතිය ඇතිවිය හැකිය. මේ රෝගී තත්ත්වය සමනය කළ හැක්කේ රෝහල් ගතවී ප්‍රතිජීවක මගින් ප්‍රතිකාර කිරීමෙනි.

හිසරදයෙන් පෙළෙන බොහෝ දෙනෙක් සැක පහළ කළද මොළයේ අර්බුදකාරී ගෙඩි (Tumor) හටගන්නේ ඉතා කලාතුරකිනි. අර්බුදකාරී ගෙඩි ඇති අවස්ථාවල ගැස්ම හා මුර්ජාව ඇති වී ස්නායුවේද අසාමාන්‍යතා ඇතිවේ. දරුණු හිසරද අවස්ථාවලදී මෙය නිතර හටගත්තද, හිසදරය නිසා නින්දෙන් අවදි වීම මෙවන් ගෙඩිවල වැදගත් ලකෂණයකි.

පොකුරු හිසරදය (Cluster headache) නමින්ද හිසරද විශේෂයක් තිබේ. මෙහි රෝග ලක්ෂණ නම් එක් ඇසක් පිටුපස හටගන්නා වේදනාව හා එම ඇස රතුවීම, කඳුළු ගැලීම හා නාසය අවහිරවීමය. මෙවන් හිසරදයන් පූර්ව ලකෂණ නොමැතිව හදිසියේ හටගෙන පැයක පමණ කාලයකින් පසුව සමනය වේ. මත්පැන් ගැනීමෙන් පසු මේ වේදනාව දරුණු විය හැකිවාක් මෙන්ම මේ හේතුකොට ගෙන නින්දෙන් අවදිවියද හැකිය.

කෝටර හිසරදය (Sinus headache) සාමාන්‍යයෙන් හටගන්නේ ශීතල දේශගුණය හෝ ප්‍රතිශ්‍යාව සමගය. උදය කාලයේ දරුණු ස්වභාවයක් උසුලන මෙය හිසේ හෝ මුහුණේ එක් ප්‍රදේශයකට පමණක් සීමාවේ. කැස්ස, කිවිසුම් යෑම, හදිසි හිස චලනය මෙහි රෝග ලක්ෂණ අතර වේ. ශීතල දේශගුණය සහ මත්පැන් පානය ආදිය නිසා මෙම හිසරදය දරුණු වේ. කෝටර හිසරදයෙන් යුත් තැනැත්තන්ට තෘෂ උණ (hay fever) හෝ අසාත්මිකතාවන් ඇතිවිය හැකිය.

ඇස් විඩාව නිසා හටගන්නා හිසරදය, දිගු වේලාවක් කියවීම හෝ පරිගණක තිරය දෙස බලා සිටීම නිසා ඇතිවිය හැකිය. හෝමෝන හිසරදය (Hormonal headache) හටගන්නේ ඔසප් චක්‍රය, ඔසප් නැවතීම හෝ උපත් පාලන පෙති භාවිතය නිසාය. චක්‍රීයව (cyclically) හෝ ආර්ථවභාවයෙන් (menopause) පසු හෝමෝන ඖෂධ නතර කිරීමෙන් පසු මෙම හිසරදය පහව යයි.

කොයිටල් හිසරදය (Coital headache) සංසර්ග අවස්ථාවන්හිදී හටගෙන විනාඩි හෝ පැය ගණනක් පැවතිය හැකිය. විකම්පනයකට පසු ඇතිවන හිසරදයට ව්‍යාකූලතාව, ඉස කරකැවිල්ල, කිපෙන සුලු ගතිය, මතක ශක්තිය හීනවීම හා සිත එකඟකරගැනීමේ දුෂ්කරතාව ආදිය අයත් වේ.

ඉරුවාරදය නිසා හටගන්නා හිසරදය වඩාත් සුලභ රෝගී තත්ත්වයකි. මෙම හිසරදය හටගැනීමට ප්‍රථම භාව්‍යම ප්‍රභාවක් ඇතිවී ඉන් අනතුරුව පැය භාගයකට හෝ පැයකට පමණ පසු තද හිසරදය හටගෙන එය පැය 6- 8 දක්වා කාලයක් පැවතිය හැකිය. මෙයට වමනය, ඔක්කාරය හා ආලෝකය දෙස බැලීමට ඇති අපහසුතාවද අයත් වේ. සමහර ආහාර වර්ග ගැනීමෙන් පසු, තද ගඳ සුවඳ ආඝ්‍රාණය කිරීමෙන් පසු හා ඔසප් චක්‍රයෙන් අනතුරුව මේ හිසරදය හටගත හැකිය. ආතතිය, මත්පැන් පානය, චීස් හා චොක්ලට් වැනි දෑ ආහාරයට ගැනීම ආදිය නිසා මේ රෝගී තත්ත්වය උත්සන්න වීමට ඉඩ තිබේ. ඉරුවාරදය හටගන්නේ හිසේ ධමනි විස්තාරණය වීම හේතුකොට ගෙනය.

ආතතිය නිසා හටගන්නා හිසදරයද (Tension headache) තවත් සුලභ රෝගී තත්ත්වයකි. මේ හිසදරය හිස දෙපසත් බෙල්ලේත් හටගන්නා අතර වෙහෙසකර කාර්යයයන්ගෙන් පසු සාමාන්‍යයෙන් දවසේ අග භාගයේදී හටගනී. ආතති හිසරදය, වේදනාව අඩු වැඩි වෙමින් සති හෝ මාස ගණන් පැවතිය හැකිය. සාමාන්‍ය වේදනා නාශක සමග කරන cognitive ප්‍රතිකාරයෙන් මේ වේදනාව සුවපත් කළ හැකිය. එහෙත් සමහර ආතති හිසරදයන්ට ඉරුවාරදයට කරන ප්‍රතිකාර කිරීම අවශ්‍ය වේ.

# පිරිත හා බැඳුණු රිද්ම රටාව



■ සිරිපාල රදම්පොල

පිරිත විධිමත් ශාන්තිකර්මයක් ලෙස සමාජගත වන්නේ සිංහල ජන සමාජයෙහිය. එහෙත් වංශ කතාගත තොරතුරු හා සෙල් ලිපි මූලාශ්‍ර ඇසුරින් කරන අධ්‍යයනයකදී වටහා ගතහැක්කේ පොළොන්නරු යුගය වනතෙක්ම සංවිධානගත ශාන්තිකර්මය ලෙස පිරිත නොපැවතුණු බවය.

මෙරට පිරිත් කී ආකාරය පිළිබඳව ග්‍රන්ථ ගත කරුණු විමසීමේදී මහාවංශ ටීකාවේ සඳහන් බුදුන් යක්ෂ දමනය සඳහා මහා පිරිත් කී ආකාරයත් විජයාවතරණ සිද්ධි විස්තරයේදී මහාවංශය සඳහන් කරනු ලබන විජය කුමරුට උපුල්වන් දෙවියන් පිරිත් නූල් බැඳ පිරිත් පැන් දී ආරක්ෂාව සලසනු ලැබූ ආකාරයත් වැදගත් වේ. මහා සෑයේ ධාතු නිධානෝත්සවයේදී භික්ෂූන් ගණ සජ්ඣායනයක් පැවැත්වී යැයි මහාවංශය සඳහන් කරනු ලබයි. එමෙන්ම දුර්භිකෂ අවස්ථාවකදී පළවන උපතිස්ස රජු, හතරවන අග්ගබෝධි රජු, දෙවන සේන රජු, පස්වන කාශ්‍යප රජු පිරිත් කියවූ බව මහාවංශය කියයි. උත්සවාකාරයෙන් කළ මෙම පිරිත් දේශනාවන් රතන සූත්‍ර දේශනාවන්ට සීමා වූයේය. ඊට පාදක වූයේ රතන සූත්‍ර අටුවාවේ සඳහන් විශාලා මහනුවර තුන්බිය දුරු කරනු වස් කළ රතන සූත්‍ර දේශනාවය.

මේ පිළිබඳව දැනට හමුවන පුරාණම සෙල්ලිපි සටහන ක්‍රි. ව. 3 - 4 සියවස්වලට අයත් හේරත් හල්මිල්ලෑව සෙල්ලිපිය ලෙස හඳුනා ගතහොත් එහි වන 'අටනටි මගල තිනි අනුමවනි සතර බණවරක එකන කොටු වසෙ වඩිය හෙත නිස මුව ලබන දමකව තබන ලතෙවි සලහි..... ලියවය පතිටි පිත' නම් පාඨය පිළිබඳ සලකා බලනු වටී. මෙම ලිපිය නවක භික්ෂූන් අනිවාර්යයෙන්ම හදාළ යුතු යැයි රජු විසින් සම්මුතියක් ලෙස දක්වන ලද පාඨ විස්තර කරන ලිපියකි. එහි අටානාටිය, මංගල සූත්‍රය, සතර බණවරක් ගැන සඳහන් වේ. එසේනම් වෙනම සංගෘහිත වූ සතර බණවරක් හා පරිබාහිර පිරිත් සමූහයක් වූ බව මේ සෙල් ලිපිය විසින් උපකල්පනය කරන්නට පොළඹවනු ලබයි.

එමෙන්ම ඉන් අනතුරුව පිරිත පිළිබඳව වන වැදගත් සටහනක් පස්වන කාශ්‍යප රජුගේ පුවරු ලිපියෙන් දැක්වේ. එහිද පිරිත් 'සතර බණ්වර් පිණිස් වුවන් මහණ් කරනු ඉසා' ආදී වූ පාඨය පැණේය. මහණ කරන වුන් අඩුම තරමින් පිරිත් හා සතර බණවරවත් ප්‍රගුණ කර තිබිය යුතුය යන්න එහි අදහස වේ. මෙහිදීත් පිරිත් හා සතර බණවර පිළිබඳව වෙන වෙනම සඳහනක් වේ. සතර බණවර අද අප අතට පත්වී පවත්නා සංවිධානාත්මක පිරිත් පොතේ හරයයි. මෙම සතර බණවර පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයකදී වටහාගත හැකි වන්නේ එම ධර්මය සංගෘහිත වන්නේ භික්ෂු ජීවිතය අර්ථපූර්ණය කරනු සඳහා වන පරමාර්ථ සහිතව බවය. එය ගැඹුරින් අධ්‍යයනය කළ යුතු පැතිකඩකි.

උක්ත සාධක ඇසුරින් අප හඳුනා ගන්නට උත්සාහ කරනුයේ පිරිත හා සතර බණවර වෙන වෙනම වටිනාකම් දෙකක් සහිතව සමාජගතව තිබූ බවයි. සතර බණවරෙහි පිරිත් සූත්‍ර සංගෘහිත වී තිබිණි. භික්ෂූන්ට ගිහියන්ගේ ආගමික අවශ්‍යතා ඉටුකිරීමේදී මෙම පිරිත් සූත්‍ර පිළිබඳ වූ දැනුම අතිශයින්ම වැදගත් වූ ආකාරය පෙනේ. අඩුම තරමේ බුද්ධඝෝෂ යුගය වනවිට රතන, මෙත්ත, ධජග්ග, ඛණ්ධ, මොර, ආටානාටිය, අංගුලිමාල යන පිරිත් හත සමාජයේ ප්‍රචලිතව තිබූ ආකාරය විසුද්ධි මාර්ග යේ අභිඤ්ඤානිද්දෙසයේ බුද්ධ ක්ෂේත්‍ර විස්තරයෙන් තේරුම්ගත හැකිය. එහි බුදුන් දෙසූ පිරිත්වල බලය පැතිරී පවත්නා ප්‍රදේශ දක්වනු ලබයි. බුද්ධඝෝෂ කතෘ සුමංගල විලාසිනියෙහිද ආටානාටිය පිළිබඳ පරිකර්ම විස්තරයේ පිරිත ගැන සඳහන් කර ඇත. එම සඳහන ප්‍රකාරව ආටානාටිය සූත්‍රය දේශනා කළ යුතු වන්නේ සත් දිනක් යනතුරු රතන, කරණීය හා ධජග්ග පිරිත් දේශනාවලින් අනතුරුවය.

## ගැටලු අරභයා පිරිත් කීම

වංශගතානුගත තොරතුරුවලිනුත් සෙල් ලිපි සාධක ඇසුරිනුත් අට්ඨකතා ආශ්‍රයෙනුත් පිරිත පිළිබඳව ලැබෙන මූලික තොරතුරු විමසීමේදී පිරිත් දේශනාවන් මුල් යුගයේ සිට තිබුණ නමුදු එය අද පවත්නා ආකාරයේ ශාන්ති කර්මයක් නොවූ බව පෙනේ. රටේ ප්‍රධානම පිරිත් උත්සව සිද්ධ වනුයේ දුර්භික්ෂ බය තුරන් කරවීම අරමුණු කරගෙන බව මහාවංශානුගත තොරතුරු පෙන්වා දෙයි. එහිදී දේශනා කරනුයේ රතන සූත්‍රයයි. සුමංගල විලාසිනියේ ආටානාටිය පිළිබඳ පරිකර්ම විධියේ විස්තර වනුයේ යක්ෂ දෝෂයක් ඇතිවූ ආතුරයෙකුට පිරිත් කළ යුතු ආකාරයයි. බුද්ධඝෝෂ යුගයේදී ප්‍රකට වූ අනෙක් පිරිත් පාඨ වන ඛන්ධ පරිත්තය සර්ප බිය තුරන් කරනු සඳහාය. අංගුලිමාල පිරිත ගැබිණි මවුවරුන් සුවපත් කරනු සඳහාය. මෙත්ත, ධජග්ග, මෝර, ආරක්ෂක මන්ත්‍ර ලෙස භාවිතය සඳහාය.

මේ සෑම සූත්‍රයකටම සමාජ ජීවිතය හා සම්බන්ධ ගැටලු අරභයා අනන්‍ය වටිනාකමක් හිමි වී ඇති ආකාරය තේරුම් ගත හැකිය. මේ අනුව අනුරාධපුර යුගය මුල් අවධියේ සිට අවසාන භාගය වනතෙක්ම පිරිත් කීමේ ක්‍රමයක් පැවතුන බවත් ඒ ඒ අවස්ථානුකූලව අවශ්‍යතාව අනුව තෝරාගත් පිරිත් සජ්ජායනා කරවා ගත් බවත් නිගමනය කළ හැකිය.

අට්ඨකතාවන්ට අනුව පුරාණ සිංහල සමාජය අප්‍රමාණව දන් දෙනු ලැබූ, බණ ඇසූ, සිල් රකිනු ලැබූ සමාජයකි. මේ සමාජයේත් දිවා රාත්‍රි නොකඩවා සති ගණන් මාස ගණන් කළ ධර්ම දේශනාවන් ගැන තොරතුරු ලැබේ. දිවා රෑ දෙකෙහිම පැවති ධර්ම දේශනාවලට හිමිවරු තුන් නමක් සහභාගි වූ ආකාරය අංගුත්තර නිකාය අට්ඨ කතාවෙන් පෙනේ. වඩාත්ම ජනප්‍රිය වූයේ අරියවංශ දේශනාවය. බෙහෙවින්ම වැදගත් පුද සිරිතක් කොට සැලකූ එම දේශනාවට රාජ රාජ මහාමාත්‍යයන් ගම්බිම් පූජා කොට දන්වැට පැවැත්වූ ආකාරය සෙල්ලිපි හා වංශගතානුගත තොරතුරුවලින් පෙනේ. මාගම වර්ෂයක් පාසා පැවැත්වුන අරියවංශ දේශනාව අසන්නට කුඩ්ඩරජ්ජ පලාතේ සිට මාගම මහාවාපියට පා ගමනින් ගිය භික්ෂූන් ගැන රසවාහිනිය සඳහන් කරයි. අරියවංශයේ පෙළ අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ උරුවෙල වග්ග සූත්‍රය විය හැකි බවට වල්පොල රාහුල හිමියෝ 'ලංකාවේ බුදු සමයේ ඉතිහාසය' කෘතියේ දක්වති.

මේ වකවානුවේ රටේ සාමාන්‍ය ජනතාවගේ රුචිකත්වය වින්දන ප්‍රභාව පිළිබඳ යහපත් තක්සේරුවක් මේ අට්ඨකතාගත තොරතුරුවලින් මෙන්ම තත්කාලීන ශිල්ප කලා සම්ප්‍රදායේ වූ බුද්ධිගෝචර ලක්ෂණවලින්ද ප්‍රකට වන්නේය. මේ මිනිසුන් ශබ්ද රසයට වඩා බුද්ධි ගෝචර වූ අර්ථ රසයටම ප්‍රිය කළ බැවින් පිරිත වෙනුවට එම සූත්‍රයන්හි පාඨ විවරණය කරමින් කෙරුනා වූ ධර්ම දේශනා ක්‍රමයට ආශක්ත වූ බව සිතිය හැකිය.

## සතර බණවර සජ්ඣායනය

බණ පිරිත් කතිකාවකට අනුව අද පවත්නා ආකාරයේ සතර බණවර සජ්ඣායනය හරය කොට ගන්නා පිරිත් පින්කම් ආරම්භ වනුයේ පොළොන්නරු යුගයෙහිදීය. අනුරාධපුර යුගයේදී අරුත් රස මුල් කරගෙන ප්‍රචලිත වූ ධර්ම දේශනා වෙනුවට ශබ්දරසය ප්‍රමුඛ වන පිරිත් දේශනාවක් පොළොන්නරු යුගයේ ප්‍රචලිත වනුයේ තත්කාලීන සමාජ පෙරළියේ අංශයක් වශයෙනි.

ඓතිහාසිකව සලකා බැලීමේදී මේ යුගය ආරම්භ වනුයේ එතෙක් පැවති සිංහල සමාජයේ ඇගයීම් හා වටිනාකම් සහිත හර පද්ධතිය තීරණාත්මක පරිවර්තනයක් ඇති කරවමිනි. අනුරාධපුර යුගය අවසන් වනුයේ එතෙක් ලක්දිව පැවති අභිමානය පලුදු කර පස්වන මිහිඳු රජු ස්වකීය මෙහෙසිය හා පංචකකුධ භාණ්ඩද සමග සොළීන්ට හසුවීමෙනි. හේ ජීවග්‍රහයෙන් රැගත් සොළීහු සිරකරුවෙකු ලෙස ඔහුව ඔවුන්ගේ රටට රැගෙන ගියහ. පස්වන මිහිඳු මිය යනුයේත් සිරකරුවෙකු ලෙසිනි.

එතැන් සිට සොළී අධිරාජ්‍යයේ ප්‍රාන්තයක් වන ලංකාවට හින්දු සංස්කෘතියේ දැවැන්ත සෙවනැල්ලද පතිත වන්නේය. පළවන විජයබාවන් සොළී අධිරාජ්‍යයෙන් නිදහස් කරගෙන පොළොන්නරුවට රැගෙන යනුයේ මේ හින්දු සංස්කෘතිය හා වෙන් නොකළ හැකි සේ මුහු වූ සමාජයකි.

එමෙන්ම වලගම්බා යුගයේ සිට ඉතිහාසයේ සෑම කලෙකම මෙරටට පැමිණි ඉන්දියානු මහායානික හා තන්ත්‍රයානික බෞද්ධ සංකල්ප මෙරට බුද්ධාගම භක්ති ගෝචර ජන ආගමක් සේ සකස් කරමින් සිටියේය. මෙම තාන්ත්‍රික බෞද්ධ සම්ප්‍රදායට මූල බීජ සපයනුයේත් හින්දු තන්ත්‍රවේදය විසිනි.

මෝගල් ආක්‍රමණත් සමඟ 12 වන සියවසේදී ඉන්දියාවෙන් බුදු දහම තුරන්වීම නිසා මෙතෙක් සිංහල බෞද්ධයින් ලද ජාත්‍යන්තර අත්දැකීම් නැතිවී ගියේය. එතැන් සිට සිංහල බෞද්ධ ජන ආගමික සම්ප්‍රදාය හැඩගැන්වූ ප්‍රධානම සංස්කෘතික ප්‍රවාහය නිර්මාණය කරනුයේ ද්‍රවිඩ හින්දුන්ය. පිරිත් සජ්ඣායනය ජනප්‍රිය සංස්කෘතිකාංගයන් වනුයේ මේ යුගයෙහිදීය.

මන්ත්‍ර පාඨ සජ්ඣායනය වෛදික සංස්කෘතියේ මූලිකාංගයකි. වේදය පිළිබඳ විවිධ ගායන ශෛලීන් හා ඒ ඇසුරින් වර්ධනය කරගත් සංගීත සම්ප්‍රදායක්ද වූ බව වෛදික සාහිත්‍ය කෘතිය පෙන්වා දෙයි. චතුර්වේදයෙන් සාම වේදය සඳහා ගයත්‍රී, ඓන්ද්‍රීය ආග්නේය, මහානාම්නි, වැනි ගායන ශෛලීන් වූ බව ඉන් පෙනේ. මන්ත්‍ර පඨනයෙන් කළ හින්දු ශාන්ති කර්මවලදී ශබ්ද රසය මිස අර්ථ රසය ප්‍රමුඛ නොවීය. එහෙත් එහි වන විචිත්‍ර ශාන්තිකර්මික ලක්ෂණ සාමාන්‍ය මිනිසා ආකර්ශනය කළ බව පෙනේ. ආකර්ෂණීය ශාන්තිකර්මික ලක්ෂණ හා අභිචාර විධි සහිතව සතර බණවර සහිත පිරිත් සජ්ඣායනය ඇරඹෙනුයේ මේ සමාජ අවශ්‍යතාවන් තෘප්ත කරනු රිසිව බව පෙනේ.

## පිරිතෙහි රිද්ම රටාව

බැතිමතුන් බැඳ තබා ගන්නා පිවිතුරු මනෝභාවයන් උපදවන පිරිතෙහි රිද්ම රටාව පිළිබඳ යම් විමසුමක් කිරීමට අනතුරුව අපව පොළඹවනු ලබයි. දැනට ශේෂ වී ඇති පුරාණ ශාන්තිකර්ම සියල්ලක්ම යම් තුළනාත්මක ඇගැයීමකට ලක් කරන විට ඒවා තුළ ගැබ් වී ඇති ස්වභාවධර්මයේ නියාමයන් පිළිබඳව වන ගැඹුරු විවරණයන් හඳුනාගත හැකිය. සෑම ශාන්ති කර්මයක්ම පුරාණ මිනිසා නව දැනුම සොයා යෑමට හා විවරණය කර ගැනීමට කළ උත්සාහයකි. පිරිත එම ශාන්ති කර්ම සම්ප්‍රදායේ දියුණු අවස්ථාවක් සනිටුහන් කරන්නකි.

අර්ථ රසය වෙනුවට ශබ්ද රසයම උද්දීප්ත කරනු ලබන පිරිත් ශාන්ති කර්මයේදී එම මුඛ්‍ය පරමාර්ථ සාධන වනුයේ නූතන ශබ්ද විද්‍යාවේ මූලධර්මවලට සපුරා එකඟවය. පිරිත් මණ්ඩපය ඉතාම නිශ්ශබ්ද තැනකි. චාරිත්‍ර විධි විසින්ම ඒ නිහඬ බව සලසා දී ඇත. එය නූතන ශබ්දාගාරයක අනිවාර්ය අංගයකි.

ගුවන් විදුලි තාක්ෂණයේදී

48 වන පිටුව බලන්න




# පහයි කාලෙ....

■ අනුරුද්ධ වැලිගමගේ - මිසසාගා

අසංක හතරවෙනි වේදිකාවේ හිඳ මග බලන්නේ පහයි කාලේ කෝච්චිය වේදිකාවට එන තුරුය. මේ වෙලාවට එන බොහොමයක් දෙනාගේ මුහුණු අසංකට හුරුය. ඒ වසර ගණනාවක් තිස්සේ ගමින් නගරයට රැකියාවට එන ඔහු බොහෝ දිනවලට ගෙදර යන්නේ මේ කෝච්චියේ නිසාය. අන්තිම මොහොතේ එන සමහරු හති හලමින් කඩිමුඩියේ පඩි නගින්නේ මේ දුම්රිය මග හැරුණොත් තව පැය කාලක් ඉන්නට වෙන නිසාය.

කාලයත්, පරිසරයත් සමග ජීවන රටාව වෙනස් වුවද දුම්රිය ගමන අසංකට නුහුරු නුපුරුදු නොවේ. ලංකාවේ සිටි කාලයේද පාසල් සමයේ පටන් විධායක තනතුරකට පත්වන තුරු රැකියාව කරන කාලයේද කාලය ඉතිරි කරන, වාහන තදබදයෙන් මිදුණු පහසු ප්‍රවාහන මාධ්‍යයක් ලෙස අසංක දුම්රිය අත් විඳ තිබිණි. දුම්රියෙන් යනවිට ප්‍රධාන නගරවලට තම රථය පදවනවාට වඩා අඩු කාලයකින් සහ තදබදයකින්, වෙහෙස අඩුවෙන් මෙන්ම අඩු ආතතියකින්ද යන්නට පුළුවන.

මෙහිද බොහෝදෙනා දුම්රිය යොදා ගන්නේ මේ හේතුව නිසා බව තේරුම් ගන්නට අසංකට වැඩි කලක් ගියේ නැත. එබැවින් අසංකද ටොරොන්ටෝවේ දුම්රිය මගියෙකු විය.

ලංකාවේ මෙන්ම මෙහිද දේශපාලකයන් හඬ නගා කියන තරමටම සේවාවක් නොතිබුණත්, මිල අධික වුවත්, ආරක්ෂාව සහ සුව පහසුවද, ඕනෑම දේශගුණයකදී පහසුවෙන් නගරයට ඇතුළු වීම සහ පිටවීම කෙරෙන නිසා අසංක දුම්රිය ගමන ප්‍රිය කළේය.

වේදිකාවේ සිට වටපිට බලන අසංකට පෙනෙන්නේ විවිධාකාර දෑය. සමහරු කන් දෙකේ ඔබාගත් සංගීත නාදවලට සවන් දෙමින් ඇවිදිති. තවත් සමහරු ජංගම දුරකථනයෙන් නිමක් නැති කතාබහක යෙදෙති. ජංගම දුරකථනයෙන් ක්‍රීඩාවක යෙදෙන්නෝද කෙටි වීඩියෝ ක්ලිපයක් දෙස නෙතු යොමා සිටින පිරිස්ද ඒ අතර වෙති. අසංක දැක පුරුදු සමහරු වචනයක් දෙකක් කථා කර සුවදුක් විමසන්නේ නැතුවාද නොවේ. විවිධ ඇඳුම් විලාසිතා, ගමන් රටා මෙන්ම ගෙනයන බෑග් විලාසිතාද විවිධත්වයන්ද සමගින් ගමෙන් නගරයට පැමිණෙන ජන සංස්කෘතිය අමුතුම රටාවක් නොවේදැයි අසංකට සිතුනි. තනිවම සිනාසෙන, සින්දුවක් මුමුණන මුහුණුත්, ලෝකයම ඔළුවේ තබාගෙන අවට වටපිටාව ගැන කිසිදු හැලහොල්මනක් නොමැතිව ඇවිදින මුහුණුත් අතරේ මාරුවෙන් මාරුවට අසංක බලන්නේ අද දුම්රිය තවමත් නැත්තේ ඇයිද කියාය. එසේ ඈත දුරින් පෙනෙන දුම්රිය මාර්ගය දෙසත්, අත් ඔරලෝසුව දෙසත් මාරුවෙන් මාරුවට බලමින් සිටින්නේ තමන් පමණක් නොවන බවත් තවත් බොහෝ දෙනෙකු එසේ කරන බවත් ප්‍රත්‍යක්ෂ කරගත් අසංක තම නොඉවසිල්ල මොහොතකට සමනය කර ගත්තේය.

"ඔයාගේ හිනාවත් හරියට කුවේට්වල ඉන්න මගේ පොඩි පුතාගෙ වගේ...."

නිතර දකින වියපත් කාන්තාවක් සිය ජංගම දුරකථනයේ වූ සේයාරුවක් පෙන්වමින් කිවේ අදය. කට්ටිය කිවුවාට මුහුණු ගලපන්නට එච්චර හුරු නැති අසංක හීන් හිනාවකින් ඇයට ස්තුතිවන්ත විය.

"අද නම් කෝච්චිය පරක්කුයි වගේ "

දුම්රිය වේදිකාවේ තමා අසලින් හුන් බීර කම්හලේ අන්කල් කිවේ දැන්ය. වේදිකාවන්හි කරන අලුත්වැඩියා කටයුතු හේතුවෙන් මේ මාසයේ දුම්රිය පමා වියහැකි බව සදහන් පත්‍රිකා බෙදූ හැටි අසංකට සිහිවිය. දුම්රිය පැමිණෙන විට ආරක්ෂාව පිණිස හැඬවෙන සීනු නද ළඟින් ඇසෙන්නට වූයෙන් කවුරු කවුරුත් දැන් පෝලිම් ගැසුණේ දොර හැරුණු විගසම ඇතුළට පනින්නටය.

'ආසනයක් අල්ලා ගත්තොත් කරදරයක් නැතුව යතෑකි' අසංක තමාටම මුමුණා ගත්තේය.

අහස සිඹින තට්ටු ගොඩනැගිලි විවිධ හැඩයන් ගනිමින් අහස් කුස දෙසට විහිදී සිටින්නේ තමා කුඩා කල පේළියට හිට ගනිමින් උස බැලූ ආකාරය සිහි ගන්වමිනි. ඇඟිලිවලින් එසවෙමින්, උරහිස් ඔසවමින් අනෙකාට වඩා තමා උස බව පෙන්වන්නට එදවස කුඩාවුන් උත්සාහ කළ බව අසංකට තවම මතකය. ඒවායේ හැඩයන් සහ ස්වරූපය හරියටම විලාසිතා තරගයක් අවසානයේ පේළියට ඉන්නා නිරූපිකාවන් පෙළක් මෙන් යැයි දැයි අසංකෙට සිතිණි.

දුම්රියත්, ජීවිතයත් නිරන්තරයෙන් එකට බැඳී ඇති යුගලයක් බව අසංකට සිතෙන්නේ ඇයිදැයි තේරුම් බේරුම් කරගන්නටත් පෙර දොරටුව විවර වූයේය. අසංක ඇස ගසාගෙන සිටින්නේ ජනේලයක් ළඟ ආසනයක් අල්ලා ගන්නටය.

විවිධ වයස් සීමාවල, විවිධාකාර ඇඳුම් ඇදගත් පිරිස් දුම්රියට ගොඩවිය. සමහරු කඩිමුඩියේ පරිගණක ක්‍රියාත්මක කරන්නට වූ අතර සමහරු යළිත් ජංගම දුරකථන ක්‍රියාත්මක කරමින් පෙම්බස්හි දෙවන පරිච්ඡේදය ආරම්භ කළහ. සමහරු කතාබහ පටන් ගත්තේ කාලගුණය හෝ දේශපාලනය ගැනය. පොතක් පත්තරයක් ගෙන නිශ්ශබ්ද කලාපය වූ උඩුමහලට නැගී කියවන අයද ඒ අතර වූහ. පුංචියට නින්දක් දාගත්තානම් හොඳයි කියා සිතුණු බැවින් වේදිකාවෙන් මෑත්වන දුම්රියේ දසුන සමගින්ම අසංක අසුනේ කොනකට බර විය.

ශානකගේ රුව එක්වරම මතුවුයේ දුම්රිය මැදිරි යාකරන දොරටුව අද්දරිනි.

"මචං පරක්කු වුණා... යන්තම් අන්තිම පෙට්ටියෙ එල්ලුනේ"

කඩිගුලක් ඇවිස්සුනාක් මෙන් නිවෙස් බලා යන පිරිස් රැස්කන මේ වෙලාවට විනාඩියක් පරක්කු වුණොත් අසුනක් අල්ලා ගැනීම අසීරු කටයුත්තකි.

"මේ හරියේ නම් සීට් එකක් දැක්කෙ නැහැ කට්ටිය මැද්දට යනවා දැක්ක" අසංක වචන ගොනු කළේ තමා දුටු නිරීක්ෂණ ඇසුරිනි.

"හරි මචං මම ගිහින් බලන්නම්.... ආයේ හම්බවෙමු..."

ශානක අසංකට කෝච්චියේදී හමුවන ශ්‍රීර ලාංකික මිතුරෙකි. පමාවී පැමිණි එවන් දිනක තමන්ටත් ගමනාන්තය දක්වාම හිටගෙන යන්නට වූ හැටි අසංකට මතක් වූයේ එවිටය. ශානක ඊළග දුම්රියට නවතින්නේ නැත්තේ සිය දියණිය සංගීත පන්තියට ගෙන යා යුතු බැවිනි. කැනඩාවට අලුතින් පැමිණි ඔවුනට තවමත් ඇත්තේ එක වාහනයක් නිසා සියලු ප්‍රවාහන කටයුතු පැවරී ඇත්තේ ඔහුගේ පිට මතය. තමන්ටද එවන් කාලයක් තිබුණු බව අසංකට සිහිපත් විය. වාසනාවට දෝ දැන් තවත් වාහනයක් ඇති බැවින් බිරිඳ ශාමිලාට දූ දරුවන්ගේ කටයුතු කළමනාකරණය කර ගන්නට පුළුවන. වෙලාවකට අසංකට ශාමිලා ගැන ඇතිවන්නේ දුකකි. විටෙක එය ආඩම්බරයකි. ලංකාවේදී මෙන් උදව්වට කවුරුවත් නැති මේ ශීත රටේ බටහිර කාන්තාවන් මෙන් දිරියෙන් යුතුව රැකියාවත්, දරුවන්ගේ කටයුතුත්, ගෙදර වැඩත් කරගන්නට ඇයට ඇති යකඩ ශක්තිය නිසාය.

"ජීවිතයත් හරියට කෝච්චිය වගේ"

නෙරංජන් අන්කල් කියූ කතාව අසංකට සිහිවිය.

"බලන්නකො අසංක මිනිස්සු එක එක රස්සාවල් කරනවා, එක එක නගරවල පදිංචි වෙනවා. දවසින් දවසට වයසට යනවා. හරියට මේ කෝච්චිය වගේ"

කාරණාව හරිහැටි පැහැදිලි නොවුයෙන් අසංක ඒ කොහොමදැයි ඇසුවේය

"කෝච්චියත් එක තැනක ඉඳන් තවත් තැනකට යනවා.දවසින් දවස එක එක පාරවල්වල එක එක නගරවලට. හැබැයි ඒකේ යන මිනිස්සු වගේම වයසට යනවා. පෙනුමින් වෙනස් වුණත් චර්යාවෙන් වෙනස් වෙන්නේ නැහැ. මේ කෝච්චි පෙට්ටි එන්ජින් පරණ වුණාම ඒ වෙනුවට අලුත් කෝච්චියක් මේ වෙලාවට මෙතනට එනවා"



තම අදහස් අසා සිටින්නට කෙනෙක් සිටිනා වග දැනීමෙන් නෙරංජන් අංකල් ගේ මුවගට සිනාවක් නැගිණි. කෙමෙන් කෙමෙන් දුම්රිය නගරයෙන් බැහැර වූ බව දැනෙන්නේ තට්ටු ගොඩනැගිලි අතර වැසී තිබුණු හිරු බැසයන දසුන ගහකොළ අතරින් දිස් වන්නට වූ බැවිනි.

මේ සිතුවිලි අතරේ අසංකට ඇහැ පියාගන්නට ඉඩක් ලැබුණේම නැත. මේ වෙලාවේ අම්මාත්, තාත්තාත් කුමක් කරනු ඇත්දැයි ඔහුට සිතිණි. එක් අතකින් ඔවුන් දමා තමා කළ අභිනික්මන කෙතරම් අසාධාරණ එකක්දැයි ඔහුට සිතිණි. ඒත් ගිය වසරේ ඔවුන් මෙහි සංචාරයකට ආ වේලේ තමා ඔවුන්ට නවතින්නට එන්නට කියා කී බව ඔහුට සිහිපත් විය.

"අපි දෙන්න තව ටික කලක් ඔය පුරුදු විදිහටම ඉන්නම්"

අම්මා කීවේ අමනාපයෙන්දැයි අසංකට තවමත් ගැටලුවකි.

"අපි දෙන්නට දැන් හරි පාළුයි. මුළු ගෙදරම හිස්වෙලා වගේ. මල්ලියි ඔයයි ඉන්නකොට ගෙදරම පිරිලා තිබුණා. තාත්ත නම් කියනවා දැන් මේක විකුණලා දාල පොඩි ගෙදරකට යමු කියල....."

ගිය සතියේ අම්මා කියූ වචන අසංකට මේ දැන් කිවුවා සේ මතකය.

නැවතුම් පල කිහිපයක නතර කළ බැවින් දුම්රියේ සැහෙන සෙනගක් දැන් බැස ගොසිනි. කතාබහ කරමින් සිටි පිරිස් වෙනුවට දැන් දකින්නට ඇත්තේ තැන් තැන්වල නිදන සහ සංගීතයට සවන් දෙන කිහිප දෙනෙකු පමණි. වටින් ගොඩින් ඝන කළුවර වැටීගෙන එන බවද පෙනේ.

දුම්රිය නැවතුම් පොළේ නතර කළ සැනින් දුවන්නට පටන් ගන්නා පිරිසත්, කලබලයක් නැතුව හතර වටේ බල බලා යන කිහිප දෙනෙකුත්, තමන්ගේ නැවතුමට යන්නට තව කොපමණ වේලා ඇත්දැයි වෙලාව බලන පිරිසත් අතරේ අසංක කෝච්චියෙන් බැස්සේ කඩිනමින් වාහනයට යන අදහසිනි.

# ඉබ්බන්වල හන්දියේ ඉබ්බන්ගේ කතාව



කොළඹ ඉබ්බන්වල හන්දියට එම නම ලැබුණේ ඈත අතීතයේ ඒ අසල ඉබ්බන්ගෙන් පිරි වළක් තිබුණු බැවින් යැයි කට කතාවක් පවතී.

වරක් එම ප්‍රදේශයට මහා නියඟයක් පැමිණියේලු. වළේ වතුර අඩියටම හිඳී ගියේලු. වළ ඉබ්බන්ගෙන් ගහනව පැවැතියේලු. එසේම මසුන්ගෙන්ද පිරී පැවැතියේලු. වළ අඩියටම සිඳී එහි මසුන් ගහනව සිටීම කොක්කුන්ට රජ මඟුලක් විය. මුළු පළාතේම සිටි කොක් රාළලා උන්ගේ මායියන්ද දූ දරුවන්ද කැටුව පැමිණ සිත්සේ මසුන් අල්ලාගෙන තම බඩ කට පුරවා ගත්හ.

"අපේ යාළුවෝ කොක්කුන්ට බිලි වෙනවා. අපට එහෙම කරදරයක් නැති වුණාට හෙට අනිද්දා වෙන කොට වතුර නැතුව අපිත් මැරිලා යාවි" ඉබි නායකයා තම වර්ගයාට කීවේ අය වැය ඡන්දය ගැන බලවත් සිත් තැවුලෙන් සිටින අමාත්‍යවරයෙක් මෙනි.

"මම කියන්නම් බොස් වැඩක්. කිරිඉබ්බන්ආරේ තියෙනවලු වතුර පිරිච්ච වැව් ඕන තරම්. මේ කොක් රාළලාට කියමු අපි එහාට අරගෙන ගිහිං දාන්න කියල. අනික අපේ නෑයොත් ඉන්නවානෙ ඒ පළාතෙ" හෙට අනිද්දා දිවංගත වීමට පෙරුම්පුරන මහලු ඉබ්බෙක් යෝජනා කළේය.

"උඹ කොහොමද දන්නෙ කිරිඉබ්බන්ආරෙ වතුර පිරිච්ච වැව් තියෙනවා කියල?" ඉබි නායකයා ඇසීය.

"අනේ අම්මපා ඔහෙත් හරියට අහවල් පක්ෂ නායකයා වගේම තමයි. කිසිම දෙයක් දන්නෙ නෑ. ඔහේ ටී. වී. බලනවයැ? එෆ්.එම් අහනවයැ? අඩුම ගානෙ පත්තරයක් බලන කෙනෙක්ද? රටේ ලෝකෙ සිද්ධ වෙන කිසිම දෙයක් දන්නෙ නෑ. දන්නෙ එකම දෙයයි. මෝඩ කතා කිය කියා පුටුවෙ ලැගලා ඉන්න විතරයි. මේ දවස්වල කොළඹට නියඟ වුණාට හම්බන්තොට පළාතට ධාරාණිපාත වැස්සලු" මහලු ඉබ්බා තරමක කේන්තියෙන් කියද්දී නායක ඉබ්බා නිහඬ විය.

"අංකල්ගෙ යෝජනාව අගෙයි" තරුණ ඉබ්බෝ සහ ඉබ්බියො එම යෝජනාව ඒකමතිකව සම්මත කළහ.

ඒ අනුව වතුර හිඳී තම පරපුර මිය යෑමට පෙර තමන් සියළුම දෙනා කිරි ඉබ්බන් ආරට ගුවනින් ගෙන ගොස් දමන ලෙස ඉබ්බෝ කොකුන් ගෙන් ඉල්ලා සිටියහ.

ඔවුන්ගේ ඉල්ලීම කොකුන්ගේ සාකච්ඡාවට ගැනිණි. "ඉබ්බො හිටියට අපට ඇති පලේ මොකක්ද? ඕන්න ඔහේ ගිහිං දාමු. අපට කන්න ඉන්න මාළුනෙ උනුත් දෙසා බාන්නෙ. ගිහිං දාමු ගිහිං දාමු" කොක්කු අවසන් නිගමනයට එළඹියහ.

රංචුවේ සිටි හැඩි දැඩි කොකුන් දෙදෙනෙකුට ඉබි රංචුව ගුවනින් ප්‍රවාහනය කිරීමේ කාර්ය පැවරිණි. ඔවුන් දෙදෙනා ශක්තිමත් කෝටුවක් ගෙනවිත් එහි දෙකෙළවර සිය හොටවලින් වැරයේ අල්ලා ගත්හ.

"කවුද ඉස්සෙල්ලාම ගෙනියන්නෙ? එක සැරේකට එක්කෙනයි" නායක කොකා කීවේය.

"මම මම" නායක ඉබ්බා පෙරට ආවේය.

"නායකතුමා මමයි යෝජනාව කළේ" වයෝවෘද්ධ ඉබ්බාද පෙරට ආවේය.

"මමයි නායකයා" නායක ඉබ්බා ඔහුට රවමින් කීවේය.

"අහවලා වගේමයි. තමන්ට වාසි යමක් ලැබෙනවා නම් පැනලා ගන්නවා. අවාසි එකක් නම් නෑහුනා නොදැක්කා වගේ ඉන්නවා. උන්නැහෙට යන කලම තමයි කවදා හරි ඔහේටත් යන්නෙ. අදම වෙන්නත් බැරි නෑ" වයොවෘද්ධ ඉබ්බා නෝක්කාඩු කියමින් පසෙකට විය.

"හ්ම්...... නායකයා එන්න. මේ කෝටුව කටින් තද කරලා අල්ල ගන්න. කට බුරුල් කරන්න නම් එපා. දන්නවානේ එහෙම වුණොත් තමුන්ට වෙන දේ?" නායක කොකා නායක ඉබ්බාට තරයේ උපදෙස් දුන්නේය.

නායක ඉබ්බා කෝටුවේ එල්ලුනේය. කොකුන් දෙදෙනා ඔහු රැගෙන ගුවන් ගත වූහ.

දැන් කොකුන් දෙදෙනා ඉබ්බා රැගෙන කිරිඉබ්බන්ආර බලා වේගයෙන් පියාඹති. ඔවුහු හොරණ ප්‍රදේශයට උඩින් පියාසර කරද්දී මහ කෑ ගැසිල්ලක් ඇසිණි.

'අද අහවලාගෙ ජන හමුවක් වත්ද?' ඉබ්බා සිතුවා මිස නොඇසුවේය. කට ඇරියොත් සිදුවෙන දේ දන්නා ඉබ්බා කෝටුව තදින්ම හපාගෙනම පහත බැලීය. කොල්ලෝ කුරුට්ටෝ රැළක් ක්‍රීඩා පිටියක ක්‍රිකට් ගසමින් සිටියහ. අහසින් යන ඉබ්බා දුටු ඔවුහු කෑ ගසන්නට පටන් ගත්හ.

"ඒයි මචංල අන්න බලාපල්ල ඉබ්බෙක් පියාඹනෝ.... බලාපල්ලකො අරූගෙ හැටි. ඩයට් එකකට මරු මරු... ඇදගෙන වැටුණොත් නියම කෑම..... අපෝ මම නම් කන්නෙ නෑ. ජරාව ඕකුන් කන ඒවා දන්නවානේ..." කොල්ලෝ විවිධ අදහස් දැක්වූහ. ඔවුන්ගේ වදන්වලින් ඉබ්බාට හොඳටම කේන්ති ගියේය.

"මම කන්නෙ තොපේ අම්....." ඉබ්බාට කියන්නට ලැබුණේ එපමණකි. එහි තිබූ දැවැන්ත ගලක් මතට ඉබ්බා දඩාස් ගා පතිත විය. කටුව කුඩු වී ගිය ඉබ්බාගේ මස් ටික ඉබි මසට ලොල් කොල්ලන් විසින් රැගෙන යන ලදී.

"මොකෝ සිද්ධ වුණේ මම හිතුවෙ හෙට එයි කියල" කොකුන් දෙදෙනා ආපසු එනු දුටු නායක කොකා විශ්මයෙන් ඇසීය. සිදුවූ දේ කොකුන් දෙදෙනා සිය නායකයාට විස්තර කළහ.

"අහවලා වගේමයි. මෝඩ නායකයා නැහුනෙ කට නිසා" වයෝවෘද්ධ ඉබ්බා කීවේය.

"කවුද ඊළඟට" කොක්කු ඇසූහ.

"මම මම" වයෝවෘද්ධ ඉබ්බා ඉදිරිපත් විය.

"දන්නවානේ තමුසෙලාගෙ ලොක්කට වෙච්ච දේ? හයියෙන් අල්ලා ගන්නවා. කිරිඉබ්බන්ආරට ගිහිං වැවට ලෑන්ඩ් කරන තුරු කට අරින්නෙ නෑ හරිද?" නායක කොකා තරයේ අවවාද කළේය.

ඉබ්බා කෝටුවේ එල්ලුනේය. කොකුන් දෙදෙනා එහි දෙකෙළවර හොටින් ඩැහැ ගෙන ගුවන් ගත වූහ.

පැයකදී පමණ ඔවුහු හොරණට ළඟා වූහ. දැන් ඔවුහු පියාසර කරන්නේ නායක ඉබ්බා දිවංගත වූ ප්‍රදේශයට ඉහළිනි. එම කොලු රැළ තවමත් ක්‍රීඩා පිටියේ ක්‍රීඩා කරමින් සිටියහ. උඩ බලාගෙන කෝටුවේ එල්ලී සිටි ඉබ්බා ඔවුන් නොදුටු නමුත් ඔවුන්ගේ ඝෝෂාවට අනුව තේරුම් ගත්තේය.

"මුන්ද අර අපේ බොස් දිවංගත...." ඉබ්බාට කියන්න ලැබුණේ එපමණකි. ඔහුද ඔවුන්ගේ නායකයා ගුවනේ සිට පහතට දිවංගත වූ ගල මතටම වැටී සුන්නද්දූලි විය.

කොකුන් දෙදෙනා ආපසු ගොස් සිය නායකයාට පුවත සැල කළහ.

"තව ට්‍රිප් එකක් ගිහිං එන්න පුළුවන් නේද? රෑ බෝ වුණොත් එහේ නතර වෙලා හෙට පාන්දරින් එනවා" කැප්ටන් කොක් නියෝග කළේය.

"මමයි ඊළඟට යන්නෙ. මම නම් මග නහින්නෙ නෑ. ඕං බලාපල්ලා මම කිරිඉබ්බන්ආරටම යන්නෙ නැද්ද කියල" තරුණ ඉබ්බෙක් කයිවාරු ගසමින් ඊළඟට ඉදිරිපත් විය.

ඉබ්බා කෝටුවේ එල්ලා ගත් කොකුන් දෙදෙනා ගුවන් ගත වූහ. පැයක පමණ ඇවෑමෙන් ඔවුහු හොරණට ළඟා වූහ. යට කී ක්‍රීඩා පිටියට ඉහළින් පියාසර කරද්දී කොලු රැළ සිරිත් පරිදි ඝෝෂා කළහ. එහෙත් ඉබ්බා දැඩි අධිෂ්ඨානයෙන් යුතුව කට තද කැරගෙනම සිටියේය. තවත් සැතපුම් දෙක හමාරක් ගිය තැන තමා කොල්ලන්ගෙ න් බේරී අදාළ ස්ථානය පසු කැර ඒම ගැන ඉබ්බාට ආඩම්බරයක් දැනිණි.

"කොහොමද? මම පාඩුවෙ....." ඉබ්බාට කියන්නට ලැබුණේ එපමණකි.

ඔහු ගුවනින් බිමට පතිතව කට උත්තරද ගැනීමට පෙර දිවංගත විය.

කොකුන් දෙදෙනා මහත් කනස්සල්ලෙන් යුතුව ආපසු පැමිණෙනු දුටු කැප්ටන් ඒ කොක් වැඩේත් වැරැදී ඇතැයි උපකල්පනය කළේය.

"අපි නිකං පෙට්‍රල් පුච්චනවා. විතරයි මුන් මහ මෝඩ ජාතියක්" කොක්කු සිය ප්‍රධානියාට කීහ.

"හොඳයි මාව ගෙනියනවලා බලන්න. මම නොවෙයි කටක් අරින්නෙ ඔය අසමජ්ජාති කොල්ලො මොනවා කීවත්" ගුවන් ගත වීමට පුල පුලා මඟ බලා සිටි ඊළඟ ඉබ්බා කීවේය.

"බලමු තමුසෙත් කොච්චර දුරක් යයිද කියල" කියමින් කොක්කු ඔහුද රැගෙන කිරිඉබ්බන්ආර බලා පිටත් වූහ.

හොරණ ප්‍රදේශය පසු කරද්දී ක්‍රීඩා පිටියේ කොලු රැළ උන් නොදුටු බැවින් ඔවුන්ගෙන් කිසිදු ප්‍රතිචාරයක් නොවීය. කෝටුවේ එල්ලී සිටි ඉබ්බා විශ්මයට පත්විය.

"මචංල මොකද දන්නෙ නෑ අද උන් සද්ද නැත්තෙ?" වදන් පෙළේ අග වදන් දෙක තුන කොකුන්ට නෑසුනි. ඒ ඉබ්බාට එම වදන් පිට කැර ගත හැකි වූයේ බිමට පතිත වීමට ඔන්න මෙන්න කියා තිබියදී බැවිනි.

කොකුන් දෙදෙනා ආපසු පැමිණ කැප්ටන් කොක් වෙත සිදුවීම වාර්තා කළහ.

"දැන් හවස් වෙලානෙ හෙට උදේ පාන්දරින් ඔය ඉන්න දෙතුන්

48 වන පිටුව බලන්න



# දුර බැහැර සිට අනුන්ගේ සිත කියවයි

■ සජීව විජේවීර

**ධම්මපදයේ චිත්ත වග්ගයේ 153 වැනි ගාථාවේ මෙසේ සඳහන් වේ.**

**අනේක ජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං**
**ගහකාරකං ගවේසන්තෝ - දුක්ඛා ජාති පුනප්පුනං**

**ධම්මපදයේ චිත්ත වග්ගයේ 154 වැනි ගාථාවේ මෙසේ සඳහන් වේ.**

**ගහකාරක දිට්ඨෝසි - පුන ගේහං න කාහසි**
**සබ්බා තේ ඵාසුකා භග්ගා - ගහකූටං විසංඛිතං**
**විසංඛාරගතං චිත්තං - තණ්හානං ඛයමජ්ඣගා**

'වඩුව මම ඔබ දිටිමි. හොඳින් හඳුනා ගතිමි. නැවත තට මා නමින් ගෙයක් සෑදිය නොහේ. ගේ හදන උපකරණ සියල්ල නැසූයෙමි. තණ්හාව නැති කළෙමි. විසංඛාරික වීමි'

යනුවෙන් දැක්වෙන්නේ මිනිසා ඇතුළු සත්වයා මැරී මැරී ඉපිද ඉපිදී සසර සැරිසරණ බව බුදු දහමේ විස්තර කැර ඇති ස්ථානයකි.

බුදුන්වහන්සේගේ දේශනාවේ මැරුණු සත්ව වර්ගයා සසර සැරිසරණ බව දැක්වුවද ලොව ඇති වෙනත් ආගම්හි මෙවැනි දෙයක් පිළිගන්නේ නැත. විශේෂයෙන්ම යුරෝපීයයෝ යළි ඉපදීමක් ගැන විශ්වාසයක් තබන්නේ නැත.

එවන් ලෝකයක යළි යළිත් ඉපදීම පිළිබඳ මහත් වූ ආන්දෝලනාත්මක සිදුවීම් මාලාවක් විස්තර කරන්නෙකි එඩ්ගාර් කේසි.

එඩ්ගාර් කේසි පවසන්නේ තමන්ට ස්වයං නිද්‍රාවකට පත්වීමෙන් අන් අයගේ රෝගාබාධයන්ට ප්‍රතිකාර ලබාදීමේ හැකියාව පවතින බවයි. මෙහිදී ඔහු රෝගයට වස්තුබීජ සොයා යන්නේ යම් පුද්ගලයකුගේ පෙර භවයන්ට එබිකම් කිරීමෙනි. මේ ක්‍රමයට විවිධ වූ රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී ඔහු තැබූ සටහන් රාශියක් තවමත් ඉතිරිව තිබේ. මේවායින් බොහොමයක් මහත් ආන්දෝලනාත්මකය.

එඩ්ගාර් කේසිගේ ජීවිතයේ අවසාන කාලයේදී ඔහු ගැන සඳහන් කරනු ලැබුවේ වර්ජිනියා වෙරළේ ප්‍රාතිහාර්යකාරයා යනුවෙනි. ඔහු අන් අයගේ අතීත ආත්ම ගැන කියන ලද කරුණු හේතුවෙන්ම ඔහුට මෙවැනි අන්වර්ථ නාමයක් ලැබුණද සැබැවින්ම ඔහු ප්‍රාතිහාර්යකරුවෙක් නොවේ. රෝගීන් මත අත තබා ආශිර්වාද කිරීමෙන් හෝ මන්තර ගුරුකම් ශක්තියකින් හෝ එඩ්ගාර් කේසි රෝගීන් සුවපත් කළේ නැත. ඔහු ඇතැම් විට තමන් සිටින ස්ථානයට සැතපුම් දහස් ගණනක් ඈත සිට දිවැසින් කියනු ලබන විශ්මයජනක තොරතුරු අනුව රෝගීන්ට සුවය ලැබිණි.

ඔහු මෙය කරන ලද්දේ සම්මෝහ නිද්‍රාවක් හෙවත් තමන් විසින්ම හෝ වෙනත් අයකු විසින් යෝජනා කරන ලදුව කෘත්‍රිම නින්දකට සමවැදීමෙනි. එඩ්ගාර් කේසි මෙලොව එළිය දුටුවේ 1877 දී කෙන්ටකි හි හොප්කින්ස්විල් නම් ගම්මානයේය. දුප්පත් ගොවි පවුලක උපන් ඔහුට වැඩිදුර අධ්‍යාපනයක් ලබන්නට හැකියාවක් ලැබුණේ නැත. යන්තම් නම වැනි ශ්‍රේණිය දක්වා උගත් එඩ්ගාර් කේසි ගොවිතැනට හුරු කරන්නට ඔහුගේ මාපියන් කොතෙක් උත්සාහ ගත්තද එය ව්‍යර්ථ වූයේ කේසි නගරයට යාමෙනි. අනතුරුව පොත් සාප්පුවක ලියන්නකු ලෙස සේවය කළ කේසි රක්ෂණ සමාගමක වෙළෙඳ නියෝජිතයකු ලෙස කටයුතු කරන්නට වූවේය.

තරුණ වියේදීම කේසි බලාපොරොත්තු නොවූ අකරතැබ්බකට මුහුණ දුන්නේ හඬ පිට නොවීමේ රෝගයකින් පෙළීමෙනි. විටෙක ගොරෝසු හඬක් පිටකරන කේසිට තවත් විටෙක කිසිදු හඬක් පිටකිරීමට නොහැකි වෙයි. මේ රෝගයට කොතෙක් ප්‍රතිකාර ගත්තද එයින් ප්‍රතිඵලයක් අත්වූයේ නැත. රෝගයට ප්‍රතිකාර අපේක්ෂාවෙන් වෛද්‍යවරු ගණනාවක් සොයා ගියද අවසානයේ සිදුවූයේ බලාපොරොත්තු කඩවීම පමණි. මේ නිසාම ඔහුට තම කාර්යයන් කරගෙන යාම පවා අපහසු විය. ඒ නිසාම තම සේවයෙන් සමුගත් කේසි අවසානයේ ඡායාරූප ශිල්පියකුගේ සහායකයකු ලෙස එක්වූයේ ඒ සඳහා කට හඬ අවශ්‍ය නොවන බැවිනි.

මේ අලුත් වෘත්තිය කරගෙන යන අතරතුරදී ඔහු සිටි නගරයට අමුත්තකු පැමිණියේය. ඒ විනෝද ක්‍රීඩකයකු මෙන්ම මෝහන නිද්‍රාව ප්‍රගුණ කළ 'හාට්' නම් පුද්ගලයෙකි. මේ අමුත්තා නගරයේදී කේසි හමුවූ අවස්ථාවකදී මෝහන නිද්‍රාව උපයෝගී කරගනිමින් ඔහුගේ රෝගය සුව කළ හැකිදැයි උත්සාහ කිරීමට තමන් කැමති බව කීවේය.

තමන්ට කරන්නට කිසිදු දෙයක් නොවුනෙන් තම රෝගය සුව කරගැනීම සඳහා ගත හැකි අවසන් තුරුම්පුව වූ මේ අවස්ථාවට මුහුණ දීමට කේසි ඉටාගත්තේය. අවසානයේ කේසි නිද්‍රාවට භාජන කැරිණි. කේසි නිද්‍රාවට යොමු කරන අවස්ථාවේ ලේන් නම් පුද්ගලයෙක්ද බලා සිටියේය. ඔහුද ඒ වනවිටත් මෝහන නිද්‍රාව ප්‍රගුණ කරමින් සිටි තැනැත්තෙකි. හාට් මෝහන නිද්‍රාව උපයෝගී කරගනිමින් එඩ්ගාර් කේසිගේ රෝගයේ අක්මුල් සොයා යාමට උත්සාහ ගත්තද එයින් ප්‍රතිඵලයක් අත්වූයේ නැත. නමුත් ලේන්, කේසිගෙන් ඉල්ලා සිටියේ තමන් සමග එක්ව නිද්‍රාවට පත්ව මේ සඳහා තවත් උත්සාහයක් යොදන ලෙසයි.

ලේන්ගේ සිතේ වෙනත් අදහසක් තිබෙන්නට ඇත. ලේන්ගේ පෙරැත්තය නිසාම කේසි මේ දෙවැනි උත්සාහය සඳහාද එකඟ වූවේය.

ලෙන් ක්‍රමයෙන් කේසි මෝහන නිද්‍රාවට පත් කළේය. අනතුරුව ඔහු කළේ නිද්‍රාවේ සිටි කේසිට ඔහුගේ රෝග ස්වභාවය විස්තර කරන්නට යැයි යෝජනා කිරීමයි. මෙතෙක් කතා කිරීමට නොහැකිව සිටි කේසි කතා කරන්නට වූවේය. ටිකෙන් ටික තම හඬ අවදි කළ කේසි තමන්ගේ රෝග ස්වභාවය විස්තර කරන්නට වූයේ එතැන සිටි ඔහුගේ හිතවතුන් පවා මවිත කරමිනි. සාමාන්‍ය තත්ත්වයේදී කථා කළ නොහැකිව සිටි කේසි කියා සිටියේ පුදුම කථාවකි.

"සාමාන්‍ය තත්ත්වයේදී කතා කළ නොහැකිව ඇත්තේ ස්නායු දුර්වලතාවක් හේතුවෙන් ස්වර රජ්ජුන්ගේ පිටුපස ඇති පේශි අඩක් අක්‍රිය වීම හේතුවෙනි. මේ නිසා කායිකව රෝගී තත්ත්වයක් ඇතිවී තිබේ. නිද්‍රාවේ පසුවෙද්දී රෝගය වැළැඳී ඇති ස්ථානයන්ට ලේ ගමන් කරනු ඇතැයි යෝජනා කිරීමෙන් මේ රෝග තත්ත්වය ඉවත් කළ හැකිවනු ඇත."

මේ කථාව කීවේ කේසි විසිනි. එයට වහාම ක්‍රියාත්මක වූ ලේන්, කේසිගේ ස්වර රජ්ජුවලට ලේ ගමන් කිරීමේ දුර්වලතාව මග හැරී යනු ඇතැයිද, එයින් මේ අපහසුතාව ඉවත්වනු ඇතැයිද කේසිට යෝජනා කළේය.

විනාඩි කිහිපයක් ගතවිය. නිද්‍රාවේ පසුවූ මිනිසා යළි මෙසේ කීවේය.

"දැන් සියල්ල හරි. රුධිර ගමනය නිසි පරිදි සිදුවනවා. ලේ ගමන ප්‍රකෘති තත්ත්වයට පත්වන්නටත් ඉන්පසු නැගිටින්නටත් යෝජනා කරන්න."

කේසිගේ මේ විධානය අනුවද ලේන් ක්‍රියාත්මක වූවේය. නින්දෙන් පිබිදුණු කේසි සාමාන්‍ය තත්ත්වයෙන් කතා කරන්නට වූවේය. නමුත් වරින් වර ඔහුට මේ රෝගය යළි යළිත් වැළඳුනේය. ඒ සෑම අවස්ථාවකදීම ලේන් ලේ ගමනාගමනය නිසි පරිදි සිදුවන්නට යැයි කියා උපදෙස් දෙයි. එවිට කේසි යළි සාමාන්‍ය පරිදි කථා කරන්නට පටන් ගනී.

ලේන් සිටියේද කලක පටන් පවතින උදර රෝගයකින් පීඩා විඳිමිනි. මේ රෝගයට පිළියම් සෙවීම සඳහා ලේන් කේසිගේ සහය පැතුවේය. නමුත් මෙහිදී ලේන් කළේ සාමාන්‍යයෙන් කරන දෙයක් නොවේ. රෝගය ඇති තමන් වෙනුවෙන් කේසි නිද්‍රාවට භාජන කිරීමයි. ඒ අනුව නිද්‍රාවේදී කේසි, ලේන්ගේ ශරීර තත්ත්වය විස්තර කරමින් ඒ සඳහා අවශ්‍ය ප්‍රතිකාර ක්‍රමයක්ද යෝජනා කළේය. මේ ප්‍රතිකාර ක්‍රමය ලේන් අත්හදා බැලුවේ කිසිදු පැකිලීමකින් තොරවය. අවසානයේදී කේසි ජයගෙන තිබිණි. ප්‍රතිකාර ආරම්භ කොට සති කිහිපයකින් ලේන්ගේ උදරාබාධය සුව අතට හැරුණි.

කේසි මේ වනවිට ක්‍රිස්තුස් වහන්සේගේ අනුගාමිකයකු බවට පත්ව සිටියේය. ඔහුගේ අපේක්ෂාව වූයේ ආගමික දේශකයකු වීමයි. එහෙත් ඔහුට අන්‍යයන් සුවපත් කිරීමේ හැකියාව ලැබී ඇතැයි ලේන් පෙන්වා දෙන්නට වූවේය. ලේන්ගේ පෙරැත්තය ප්‍රබල වෙමින් තිබිණි. අවසානයේ මේ ගැන සොයා බලන්නට ඔහු නොයෙක් ග්‍රන්ථ කියවූවද අගක් මුලක් සොයාගත නොහැකි විය. අවසානයේ කේසි ලේන්ගේ ඉල්ලීමට එකගවූයේ මෙය පරීක්ෂණයක් වශයෙන් පමණක් සිදුකිරීමට කැමති බවත් කිසිසේත්ම තම සේවය වෙනුවෙන් මුදලක් නොගන්නා බවත් පවසමිනි.

මෙය පර්යේෂණයක් වූ බැවින් නිද්‍රාවේදී කේසි කියන දේ සටහන් කරගන්නට විය. ඔවුන් මෙලෙස සටහන් තබා ඇති පිටපත්වලට කේසිගේ පුනරුත්පත්ති සටහනින් නම තබා තිබේ. කේසිගේ මේ කියැවීම් දිනෙන් දින ජනප්‍රිය වන්නට විය. මේ අතර ඔහු විස්මිත ඇදහිය නොහැකි කියවීම් පිළිබඳ සටහන් තබා තිබේ. දිනක් කේසිට ලැබුණු පණිවිඩයකින් කියවුණේ දැරියක පිළිබඳ තොරතුරකි. පස් හැවිරිදි වියේ පසුවන මෙම දැරිය වසර තුනක කාලයක සිට මොළයේ අසාමාන්‍ය රෝගයකින් පෙළෙන බවත් එම කාලයේ සිට මනස නිසි පරිදි නොවැඩෙන බවත් මෙය ආරම්භ වූයේ සෙම්ප්‍රතිශ්‍යාවකින් පසුව බවත් කේසිට ලැබුණු තොරතුරු විය.

මේ දැරිය පිළිබඳ සොයා බැලීමට කේසි තීරණය කළේය. ඒ අනුව

**48 වන පිටුව බලන්න**

Saliroo Creations
All Your Publishing Needs
under one roof

Graphics
Illustrations, Logos, Banners, Mags, Books, Brochures, Ads, Flyers.....

Web Sites
Web Design, Website Development, Webhosting (Linux & Windows), Shopping Cart Systems.....

Computer Repairs
Laptops, Netbooks & Desktop Computors, Replace LCD Screens, Software Installations

ඔබගේ සියලු ප්‍රකාශන අවශ්‍යතා සහ
පරිගණක අලුත්වැඩියාවන් සඳහා
Tel : 416 201 0628

French Tutoring

Individual and small group classes for French learners
French reading, writing, and conversing
Any grade from grade 1-12, university minors and French Immersion

Kumudu Abeywardena, B.A
(Modern Languages), Dip (AFC)
T.P - 647 824 1897

පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි

## නොගැයූ ගීතය

එය ප්‍රධාන නගරයෙන් එපිට පිහිටි මහා විද්‍යාලයකි. ගුරු මණ්ඩලයේ වූයේ විසි දෙනෙකි. එහි නියෝජ්‍ය විදුහල්පතිවරු දෙදෙනෙක් වූහ. ඉන් ලියනආරච්චි මහතා කඩිසර, කටසැර තැනැත්තෙක් විය. හැමවිටම කැපී පෙනෙන්නට උත්සාහ දැරූ හෙතෙම, ඇතැම් විට ගුරුමණ්ඩලයට හාස්‍යය හා විනෝදය සැපයීය. විදුහල්පතිතුමා ඊළඟ අවුරුද්දේ විශ්‍රාම යන බැවින් ඔහු නිතරම 'මුල්පුටුවට' ඇහැ ගහගෙන සිටියේය. පාසලේ දෙවැනි වාරය අවසානයේ විවිධ ප්‍රසංගයක් පැවැත්වීමට ගුරු මණ්ඩලය තීරණය කර, අදාළ දිනය හා වෙලාවද ස්ථිර කර ගන්නා ලදී. විදුහලේ සංගීත හා නැටුම් ගුරු මහත්මීන් මෙහිදී බොහෝ කැපවීමෙන් කටයුතු කළ අතර පාසල් වේලාවෙන් පසුවද සිසුන්ට නැටුම්, ගැයුම් පුහුණු කළෝය.

ලියනආරච්චි මහතාටද ගීත ගායනා කිරීමේ යම් හැකියාවක් තිබුණද එතුමාගේ කටහඬ මිහිරි නොවීය. එතුමාටද විවිධ ප්‍රසංගයේ ගීතයක් ගැයීමට අවශ්‍ය විය. ඒ සඳහා එතුමා තෝරා ගත්තේ 'කවාලා විළඳ ජාති' නම් වූ පැරැණි ගීතයයි. සංගීත ගුරුතුමියගේ කාමරයට ගිය එතුමා ගීතය පුහුණු වන්නට පටන් ගත්තේය. ලියනආරච්චි මහතා ගීතයේ මුල් කොටස තාලයට ගැයුවත් අතුරු වාදනයෙන් පසුව ගායනා කළේ රිද්මයකට හෝ ශ්‍රැතියකට අනුව නොවේ. සංගීත ගුරුතුමිය බොහෝ වෙහෙස වී, එම ගීතය ගායනා කරන නිවැරදි ක්‍රමය පෙන්වා දුන්නත් ලියනආරච්චි මහතා ගායනා කළේම ශ්‍රැතියෙන් පිට පනිමිනි. නියෝජ්‍ය විදුහල්පතිතුමා අමනාප කර ගැනීමට නොහැකි නිසා සංගීත ගුරුතුමිය මෙම අපහසුතාව විඳ දරා ගත්තාය.

විවිධ ප්‍රසංගය පැවැත්වෙන දිනය උදා විය. ළමයින්ගේ ගැයුම්, වැයුම් කීපයකට පසු ලියනආරච්චි මහතාගේ වාරය පැමිණියේය.

වේදිකාවට නැගුණු එතුමා කෙටි දේශනයක්ද පවත්වා ගීතය ගැයීමට සූදානම් විය. ආරම්භක වාදනය අවසන් වූ සැණින් එතුමා "කවාලා විළඳ ජාති" යැයි ගයද්දී එක්වරම විදුලිය විසන්ධි විය. විනාඩි 25 ක් පමණ ගෙවුණත්, විදුලිය නොලැබුණි. අපහසුවෙන් හා කෝපයෙන් වේදිකාවේ රැඳී සිටි ලියනආරච්චි මහතා මුහුණ කළු කරගෙන වේදිකාවෙන් බැස කැන්ටිම දෙසට ගියේය. සිදුවී තිබුණේ මෙයයි.

ලියනආරච්චි මහතා ගීතය ආරම්භ කරන විටම, සංගීත ගුරුතුමියගේ උපදෙස් මත ප්‍රධාන ස්විචය අක්‍රිය කර ඇත්තේ තරුණ ගුරු මහතෙක් විසිනි. යළි විදුලිය ලැබුණත් ගීතය ගයන්නට වේදිකාවට නැංගේ ලියනආරච්චි මහතා නම් නොවේ.

**ආනන්ද සරත් ගුණසේන**

## විදුහල්පති ආරච්චි

දැනට දශක කිහිපයකට ඉහත වෙන්නප්පුව ජෝශප්වාස් විදුහලේ 20 වැනි සියවසේ මුල්භාගය තේමා කරගත් ශෛලිගත සම්ප්‍රදාය අනුව නිර්මාණය කළ නාට්‍යයක් වේදිකාගත කෙරිණි. එම නාට්‍යය රචනා කරනු ලැබුවේ තිමෝති පෙරේරා සහ විලියම් පෙරේරා යන විදුහල්පති සොහොයුරන් දෙදෙනෙකි. නාට්‍යයේ රඟපෑම සඳහා නළු නිළියන් තෝරාගනු ලැබුවේ අධ්‍යාපන කොට්ඨාසයේ විදුහල්පතිවරුන්, ගුරුවරුන් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතරින් වීම විශේෂත්වයකි. අධ්‍යක්ෂණය, සංගීතය, වේශ නිරූපණය සහ වේදිකා සැරසිලි එකිනෙකාගේ නිපුණත්වය අනුව ගුරු සිසු සහභාගිත්වයෙන් සිදු කෙරිණි. පාඨශාලා පරීක්ෂක මුහන්දිරම් මහතා නිෂ්පාදන කළමනාකරු වශයෙන් ඉතා දක්ෂ ලෙස සැලසුම් ක්‍රියාත්මක කෙළේය.

මේ වන විට මා හලා / බණ්ඩිරිප්පුව රජයේ විදුහලේ සේවය කරමින් සිටි අතර, පනස්විය ඉක්ම වූ අපේ විදුහල්පති ජෝශප් පීටර් මහතා 'ආරච්චි' ලෙස ප්‍රධාන චරිතයක් සඳහා තෝරා ගනු ලැබිණි. පසුබිම් කථකයා ලෙස මා තෝරා ගැනිණ. නළු නිළි සියයකට අධික සංඛ්‍යාවකින් සැදුම්ලත් මෙම දැවැන්ත නාට්‍යය නිර්මාණය නැරැඹීම සඳහා සම්භාවනීය විශාල පිරිසක් පැමිණ තිබුණු අතර ප්‍රධාන චරිත රඟපාන නළු නිළි පිරිස, වේශ නිරූපණය සඳහා වෙන් කළ පන්ති කාමරයක වෙස් ගැන්වීම්වලට සහභාගිවෙමින් සිටියහ. අපේ විදුහල්පතිතුමා ආරච්චි ලෙස බාපන සහිත නිල ඇඳුමින් සැරසී, නැමි පනාව හිස ගසා, කැටයම් කළ යෂ්ටිය අතැතිව තේජස් විලාශයෙන් අසුන්ගෙන සිටියේය. සුදුජාතික ඒජන්ත නොහොත් දිසාපති හාමුදුරුවන් ලෙස රඟපෑවේ ගුරුවරයකු වූ එතුමාගේ ගෝලයෙකි. ඔහු ටොප් හැට් එක දමා ටේල් කෝට් එක සහිත යුරෝපීය ඇඳුමින් සැරසී, කළු උපැස් යුවළක් පැලඳ විරාජමානව සිටියේය. ඔහු තම ගුරුවරයා වූ විදුහල්පති ආරච්චිට විහිළුවක් කරනු රිසියෙන්, නාට්‍යයට අදාළ නොවූ දෙබස් ඛාණ්ඩයකින් ඇමතීය.

"ඒයි ආරච්චියා උඹට විරුද්ධව පෙටිෂන් ගොඩක් මට ඇවිත් තියනවා. උඹ කෂිප්පු ගහලා මිනිෂ්ෂු නැති වාරෙ වැයික්කියෙ ගෙවල් අෂ්ෂට රිංගන්ඩ හදනව කියල... බෝම කෙතයි ආරච්චියා මං උඹව ඉන්ටඩික්ට් කරල උඹේම දඬුකඳේ ගෂ්ෂනවා" එහි සිටි පිරිස එවිට හඬ නඟා සිනාසෙන්න වූහ.

තම ගෝලයා තමාට කළ මදිපුංචිකමත්, පිරිසේ සිනා හඬත් නොඉවසූ විදුහල්පති ආරච්චි යක්ෂාවේෂ විය.

"බොල ගෙරියා තෝ මොන දිසාපතියෙක්ද බොල? මං කව්ද කියල තොට අමතක වුණාද මූසලයෝ?" කියමින් ඔහු වෙත කඩා පනිද්දී පිරිස මැදිහත්ව අමාරුවෙන් සමතයකට පත්කර ගත්හ.

නාට්‍යය ආරම්භ විය. ප්‍රේක්ෂකයන්ගෙන් ශාලාව පිරී ඉතිරී තිබුණි. ගායන වාදන මධ්‍යයේ පුරා පැය දෙකක් විවිධ චරිත ඉතා සාර්ථක ලෙස ළගන්නා ස්වරූපයෙන් නිරූපණය කළ ගුරු සිසු පිරිස 'සියවසරයි නවෝදයයි' නාට්‍යය නිර්මාණය අත්පොළසන් හඬ මැද සමාප්ත කළහ.

විශිෂ්ට රඟපෑම් සඳහා අපේ විදුහල්පති ආරච්චිට ගෞරව සම්මානයක් හිමිවිය. සම්මානය ලබාගත් එතුමා කලබලයෙන් පන්ති කාමර පිරික්සනවා දුටු 'පොතේ ගුරා' ලෙස රඟපෑ ස්ටීවන් ඉස්කෝලෙ මහතා

"මොනවද ලොකු මහත්තය හොයන්නෙ?"

"කෝ ඕකා.... දිසාපති ගුරා?" එතුමා කෝපයෙන් ගෝරනාඩු කරමින් ඔහු දෙසට හැරුණේය.

"ඒ ඉලංදාරිය නාට්‍යය ඉවුර වුණු ගමන් දිසාපති ඇඳුම් පිටින්ම බයිසිකලේක නැගල ඉගිල්ලුණා... තොප්පියත් ඔළුවේ"

"එහෙමද?" දිග සුසුමක් පිටකළ අපේ විදුහල්පති තුමා මහපාර දෙස බලා යෂ්ටිය ඔසවා වේගයෙන් බිමට ඇන්නේය.

**සරත් විජයරත්න**

## ගංවතුර පෙන්වූ හැටි

ඌව පළාතේ ප්‍රධාන නගරයට ඈතින් පිහිටි ජනප්‍රිය මහා විද්‍යාලයකි. මේ ගුරු මණ්ඩලයේ එක් සුවිශේෂී ගුරු මහත්මයෙක් සේවය කළේය. නිතර පතපොත කියවන විවිධ විෂයයන් සම්බන්ධයෙන් මනා දැනුමක් ඇති මේ ගුරු මහතා පාසලේ ජනප්‍රිය ගුරුවරයෙක් විය. පන්තියේ පාඩම් පොතට සීමා නොකර ප්‍රායෝගිකව රඟදක්වා පෙන්වීමට එතුමා නිතරම උත්සාහ දැරීය. මේ නිසා මෙතුමාගේ පාඩම් ඉතා රසවත් විය. පන්ති කාමර වෙන් නොකළ විවෘත ශාලා තිබූ එකල යාබද පන්ති කාමරවල සිසු දරුවෝ පමණක් නොව ගුරු මහත්ම මහත්මීහුද එතුමාගේ අපූරු පාඩම් රස වින්දාහ.

එක් දිනෙක සිංහල පාඩමට මාතෘකාව වූයේ 'ගංවතුරයි'. මේ ගුරුතුමා පාඩමට ප්‍රවේශයක් ලබා ගනිමින් "මේ ළමයි ගංවතුර දැකල තියෙනවද?" ප්‍රශ්න කළේය. උඩරට කඳුකර පෙදෙස්වල ළමයින්ට එකල ගංවතුර අරුමයක්ම විය. ලංකා සිතියමේ ගංවතුර ඇතිවන පළාත් විස්තර කළ ගුරුතුමා පාඩමේ ප්‍රායෝගික කොටස ආරම්භ කළේය.

"ඔන්න හිතාගන්න දැන් වැස්සක් වහිනවා. ඔන්න සැර වෙනවා. දැන් සතර වටින් අකුණු ගහනවා විදුලි කොටනවා...." ගුරුතුමා රංගනය කරගෙන ගියේය. "ඔන්න දැන් හිතා ගන්න ගංවතුර ටික ටික ගලාගෙන එනවා......" ගුරුතුමා කලිසම දණහිස තෙක් නමා ගත්තේය. "ඔන්න යටිපතුල ළඟට ගැලුවා.... දැන් දණහිස ගාවට ගලනවා..... අපි මේකෙන් බේරෙන්න උස තැනකට නඟින්න ඕන.... එහෙම නේද....? ඔන්න මම උස තැනකට නඟිනවා....." පැවසූ ගුරුතුමා ගුරු පුටුවට නැංගේය. ළමුන් හූ කියමින් අත්පොළසන් දෙන්නට වූහ. යාබද පන්ති කාමරවල ගුරුවරුද ළමයිද මේ අපූරු රංගනය දෙස බලා සිටියහ.

"ළමයිනේ දැන් බේරුමක් නෑ තව ගලනවා ගලනවා..... ඔන්න දැන් මම ඉන්න උස ස්ථානයටත් ගංවතුර ගලනවා ගලනවා....." යැයි පැවසූ ගුරුතුමා ගුරු මේසයටම නැග්ගේය. ඒ මත එහෙ මෙහෙ දුවමින් ගංවතුරේ අරුමය පෙන්වීය. යාබද පන්තිවල දරුවෝද දුවගෙන විත් එම පන්තියට පැමිණ මේ ගංවතුර පාඩම දෙස බලමින් අත්පුඩි ගසමින් ඝෝෂා කරන්නට වූහ. මේ විශාල ඝෝෂාව කුමක්දැයි බැලීමට වේවැල අතින් ගත් විදුහල්පතිතුමා පැමිණියේය. ගුරු මේසය මත දඟලන 'ප්‍රායෝගික ගුරු මහතා' දුටු එතුමා සිනහව ආයාසයෙන් නතර කරගෙන ආපසු කාර්යාලයට ගියේය.

ගුරුතුමාගේ ගංවතුර පාඩම එසේ නිමාවට පත්විය.

# වැඩකාරයාට බොරු බෑ - බොරුකාරයාට වැඩ බෑ



■ කේ. බී. මානෑව

"කටට ආ පළියට ඔහොම දොඩංට නාකයි සිරියෝ.. උඹ දන්නවද ඔය මහ පයිණ්ඩයක් කොරන එක සොච්චං (සුළු) නැති විත්තිය..?"
"ඉන්දා මං ඔය කීවේ කෙබරයක්යැ කිරි අත්තේ.... කීවාම මොකෑ රටෙන් තොටෙන් අඩලක්ම (බාග යක්ම) ඉන්නේ මහ පයිණ්ඩකාරයෝ නෙවැ.."
"හරි.. හරි. උන්නැහැලා පුරුවේ ජාතියේ ඉඳලාම ඔය මහකාරියට පුරුදුපට්ටං තියෙන ඈයෝනෙ."
"එතකොට ඒ ජාතිවල උන්දැලා හතරාපායවල ඉඳලා තල්ලු වෙච්චි ඈයෝද කිරි අත්තේ..?"
"හුඃ.... එහෙම නෙවෙයි කියලා කියන්ට මං දිවැස් ඇත්තෙක්යැ. ඒත් ඉතිං රටේ තොටේ අනිත් ඈයොන්ට වඩා උන්නැහැලා කොරන කියන දේවල් දිහා ඇහැවැටුණාම ඒ ඇත්තොන්ට ලබන ආත්මේනං කොහේ වැටෙන්ට වෙයිදැ කව්දෑ දන්නේ"
"හැබෑ.. ට.. කිරි අත්තේ, මට පපුවේ වදින පුරස්නෙට උත්තර දුන්නං බලන්ට.."
"හ්.. හෑ.. ඒ මොකෑ බොල, උඹට වැදුණු පුරස්නෙ?"
"මං කියන්නෙ කිරිඅත්තේ. මනාප හිඟන සන්දියේ වැලේවැල් නැතුව සීරංගෝවෙලා හිටපු (කේඩෑරිවී සිටි) මුන්නැහැලා දැන් වට අඩි දහයේ දොළහේ කොට්ට ගස් වාගේ ආරලා, මෝරලා ආවේ කෝමදැ අෑ..?"
"ඕකද පුරස්නෙ..? ඕකට තමයි කියන්නේ පිනේ මහිමේ කියලා. උඹට කියන්ට රටේ තොටේ අපේ ලේ දාඩිය සූරලා හිටං එක පොළකට කොරාගන එව්වා දියකොර කොර හදන රාජ කාජබෝජ නින්දේ කොටා බාන පින පහළවෙලා තියෙන්නෙ උන්නැහැලාට නෙවැ."
"හරි.. හරි, එහෙනං එකදොහක් මහ සම්මුතියේ උදවියට දෙන කාජබෝජ ඩිංගිත්තක් අඩුපාඩු උනා කියලා එක මහ ඇත්තෙක් මහසම්මුතියේ මහ විජ්ජුම්බරයක් (ගාලගෝට්ටියක්) කෙරුවේ ඒක වෙන්ටැ නේද කිරි අත්තේ..?"
"නැතුව.. නැතුව. එහෙම පුළුවන්ද අඩුපාඩු කොරන්ට? රටරාජ්ජේ ධනස්කන්දෙන් වැඩිම හරියක් කාබාසිනියා කොරන්නේ උන්නැහැලාගේ කාජබෝජවලට නෙවැ"
"එතකොට කිරි අත්තේ උන්නැහැලා කන්ටම පහළවෙච්චි රැව්වක් වෙන්ටද..?"
"එහෙනං උඹ හිතුවද උන්නැහැලා කන එකට සරිවරි වෙන්ට රටට කඹුරයි කියලා..?"
"හැබෑට එතකොට උන්නැහැලා රට හදනවා කියලා බෙරිහං දෙන්නේ වැඩක් පොළක් කොරන්ට දන්නැතුවද කිරිඅත්තේ..?"
"ඉන්දා වැඩක් පොලක් කොරන්ට කඳක් බඩක් නමා ගන්ට පුළුවනැයි. ඇයි උඹ දැක්කෙ නැතැයි එක මහ ඇත්තෙක් වප්මඟුලක හීහාන්ට ගොහිං අම්බරුබාන කුලප්පුවෙච්චි හැටි."
"මොකෑ දැක්කෙ නැත්තේ.., එව්ඩේ (ඒ වේලාවේ) මට නං හිතුණෝ අම්බරු බානට හිතෙන්නැති, ඒ වාගේ අමනයෝ නඟුලේ වියගහේ බැඳලා හරක් දක්කන හැටි පෙන්නංට ඕනෑ කියලා.
"චෑ.. චෑ.., ඒක අම්බරුවන්ට කොරන මදි පුංචි කොමක් නෙවැ. කෝම උනත් සිරියෝ තෙල් මන්ද මෝරලා වැඩි හින්දා උන්නැහැලාගෙන් මස්කඩකාරයොන්ට වත් වැඩක් වෙයිද කියන්ට බෑ ඕං."
"එහෙනං උන්නැහැලාට වැඩපොළ බැරි හින්දා වෙන්ටෑ, වැඩකාරයාට බොරු බෑ.. බොරුකාරයාට වැඩ බෑ.. කිය කියා පංගුවක් උදවිය කෑකොස්සං ගහන්නෙ නේද කිරි අත්තේ..?"
"ඒ උනාට සිරියෝ අගුපොතේ (පිළිකන්නේ) වකුටු වෙලා හිටං වීරයෝ කියලා හිතං ඉන්න නහුකුටු බල්ලෝ බිරුවාට පාරේ යන කරත්ත නවතීවියැ."
"එහෙනං කිරිඅත්තා කියන්නේ 'කරත්ත වහා නවත්තාපියව්' කියලා කුරුටු ගාපු කඩදැහි ලෑලි උහාගන බල්ලොත් පාරමැදට පනින්ට ඕනෑ කියන එකද?"
"බොලං සිරියෝ බල්ලෝ උනාට උන් කෙලේගුණ දන්නවා. හාම්පුතා අඳුනනවා.. හාම්පුතාගේ සකලමනාව පරයින්ගෙන් ආරස්සා කොරළා දෙනවා. එහෙම ගුණේ පණේ ඇති අපූරු සත්තු කොටහක් පාරවල් මැදට පැනලා පිස්සු බලුකං කොරයි කියලා උඹ හිතනවානං ඒක බලු සංහතියටම කොරන මහා අවලාදයක් ඕං.."
"හැබෑට බල්ලෝ ඔච්චර පංකාදු සත්තු කොටහක් බව මගේ ළොඳ මන්දට (මොළයට) වැටුණෝ දැන් නෙවැ."
"ඒ හින්දා වැට නැති කටෙන් සද්ද නොකර බත් කන කටෙන් යමක් කමක් දැන කොරාගන කට පාපං."
"ඒක හැබෑවයි කිරිඅත්තේ, මං මීට ඉස්සරලා එහෙම කීවේ අද රටේ තොටේ කඩදැහි ලෑලි උහාගන, පාරමැද බෙරිහං දෙන කලාසිකාරයෝ (කලහකාරයෝ) හැම තැනම, හැම වෙලේම කෑමොර දිදී කුළුවෙලා ඉන්න හින්දයි."
"ඔය ආතපාත නැති දඩාවතේ යන, නැත්තං පිස්සු වැටිච්චි නහුටු බල්ලෝ මිසක් හැම බල්ලෙක්ම කරත්ත පස්සේ බුරබුරා යනවා උඹ දැකලා තියෙනවැයි සිරියෝ..?"
"අනේ නෑ කිරි අත්තේ."
"ඔය මහ සම්මුතියේ වැට නැති කටෙන් සද්ද බද්ද කොරන ඈයෝ හිටියට, හැම ඇත්තෙක්ම එහෙම නෑ නෙවැ.."
"හැබෑවයි. කිරිඅත්තේ හැබෑවයි."
"එහෙනං මීට පස්සෙන් පහු කටේ හතරාඟුල අරිනකොට තැනේ හැටියට මොළේ කල්පනා කොරලා හිටං ඕනැ දේ විතරක් බත්කන කටෙන් පිටකරපං සිරියෝ."
"කිරි අත්තගේ ඔය පංකාදු කියමන මට විතරක් නෙවෙයි කටට ආ පළියට දොඩෝන කාටත් හොඳා ඕං."



## පිරිත හා බැඳුණු...

42 වන පිටුවෙන්

මෙතෙක් බිහිවූ විශිෂ්ටතම මයික්‍රෝෆෝනය රවුම් හැඩයක් ගන්නා ඔම්ලි මයික් ලෙස හඳුනාගනු ලබන මයික්‍රෝෆෝන විශේෂයයි. එහි මුළු ධාරිතාවම ශබ්දය ලබාගනී. පිරිත් මණ්ඩපයේ හිඳ පිරිත් දේශනා කරනු ලබන්නේ කවාකාර වටයක් සේ හිඳගෙනය. පිරිත් මණ්ඩපයේදී මෙම ශබ්ද විකාශනය කිරීමේ න්‍යාය ප්‍රකට වනු පෙනේ.

පිරිත් දේශනා සඳහා සම්මුති හා විධි නියාම ඇත්තේ බණ පිරිත් කතිකාවතෙහිය. ව්‍යජනබුද්ධිය නොපිරිහෙළා, ගීත ස්වර හෝ අර්ථස්වර හෝ මන්ද්‍රස්වර හෝ නොපවත්වා ශ්‍රවණීය මාත්‍රාඥතාවෙන් පැවැත්විය යුතු යනු ලෙස බණ පිරිත් කතිකාවත පිරිත් සජ්ඣායනා කළ යුතු අයුරු දක්වයි. මේ නිර්දේශ ප්‍රකාරව කියන පිරිතෙහි වනුයේ ස්වර පහකි. ස, රි, ග, ම, ප යන මෙම ස්වරවලිනුත් වැඩි වශයෙන් භාවිත වනුයේ ස, රි, ග, ස්වර තුනය. 'ප' ස්වරය භාවිත වනුයේද අඩු වශයෙනි. එමෙන්ම ආරෝහණ හා අවරෝහණ විධිද මෙහිදී භාවිත නොවේ. මේ ගායන විලාශය අනුදැනීමේ පදනම කුමක්දැයි හඳුනාගැනීමට උත්සාහ කරනු වටී.

අපට සමීප මෙම ස්වර සංකලන හමුවනුයේ ඉන්දියානු රාගධාරී සංගීතයෙහිය. ඉන්දීය රාගධාරී සංගීතයේ ස්වර පහක් තිබූ වකවානුවක් තිබිණිඩ ඒ වකවානුවේ එය පටු සීමාවකට කොටු වී තිබුණේය. එහෙත් 'ධ' සහ 'නි' ස්වර එක්වී ස්වර සප්තකය සැදුනු පසු රාග නිර්මාණය කිරීමටත්, මිනිස් හැඟීම් ප්‍රලය කිරීමටත් සමත් සරාගී සංගීතයක් නිර්මාණය වූයේය. මේ නාද රටා හැඟීම් උද්දීපනය කළා මිස විරාගික මානසිකත්වයක් නිර්මාණය කළේ නැත.

මේ දැනුම ඉතාම වැදගත් සංකල්පයක් හෙළි කරයි. අපව ගායන මාධූර්යකින් ඇඳ බැඳ තබාගනු ලැබූවද එම නාද රටා කිසිසේත් අපව රාගී පෙළඹවීමකට ලක් කරන්නේ නැත. බුද්ධියෙන් කරන කාර්යයක් සඳහා පිරිතේ වන මෙම ගැඹුරු සංගීත විද්‍යාත්මක ලක්ෂණය භාවිත කළ හැකිය.

මෙම ලක්ෂණය ශාන්ති කර්ම ගීයෙහිද දක්නට ලැබේ. එම ලක්ෂණය නැවත ජන ගීයෙහිදී හමුවේ. ඉන්දියානු රාගධාරී සංගීතයෙන් නොඇසෙන ශාන්තිමය හැඟීමක් දනවන නාද රටා උක්ත ගායනාවලදී අපට ඇසෙන්නේ එබැවිනි. ඇල් කෙතක ගී ගැයූ යුවතියකගේ කවි අසා සඟ සැටනමක් රහත් වූ බව පරමත්ථජෝතිකාවේ පෙනේ. ජනගීයෙහි වන ස්වර පංචකය උපදවන උපශාන්ත රසය හා මේ පරමත්ථජෝතිකා පුවත සසඳනු වටී.

සෑම ශාන්ති කර්මයකම අභිචාර විධියකම ගැබ් වී ඇත්තේ මිනිසා ස්වභාවධර්මය විවරණය කර ගැනීමට ගනු ලැබූ උත්සාහයකි. එහිදී දැනුම පිළිබඳව වන මූල ධර්ම සමුදාය ඔහු විසින් ග්‍රහණය කරගත් ආකාරය පෙනේ. නව දැනුම ගොඩ නැගෙනුයේ එම මූල ධර්ම මත පිහිටමිනි. එබැවින් අතීතයෙන් උරුම වූ මෙම දැනුම් සම්භාරය විචාරශීලීව අධ්‍යයනය කරනු විනා අවිචාරවත්ව බැහැර කළ යුතු නොවේ.

## ඉබ්බන්වල හන්දියේ...

44 වන පිටුවෙන්

දෙනාවත් අරගෙන යනවා. තරයේම අවවාද කරනවලා කට රැක ගෙන ඉන්න කියල" නායක කොකා ඔවුනට දැඩිව අවධාරණය කළහ.

කොකුන් දෙදෙනා පසුදා පාන්දරින් සිය රාජකාරියට වාර්තා කළහ.

"එකෙක්වත් හොරණින් එහාට ගියේ නෑ. හොඳට මතක තියා ගන්නවලා. කට පරිස්සම් කර ගන්නවලා"

සිදුවීම් එකින් එක විස්තර කළ කොක්කු ඉතිරි ඉබ්බන්ට තරයේම අවවාද කළහ. දැන් වළේ සිටින්නේ ඉබ්බන් සතර දෙනෙකි. එනම් දෙමාපිය දෙදෙනෙක් හා ඔවුන්ගේ දියණියන් දෙදෙනාය.

"කවුද ඔය හතර දෙනාගෙන් ඉස්සෙල්ලා යන්නෙ?" කොක්කු ඇසූහ.

"අපි හතර දෙනාම එක සැරේට බැරිද?" ඉබි දෙමහල්ලෝ එසේ ඇසුවේ කොකුන් කෙරෙහි උපන් සැකයකින් යුතුවය.

"තමුසෙල හිතුවද අපි යකඩ කියල? යකඩ කොක්කු ඉන්නෙ තුවක්කුවල" කොක්කු කෝප වූ සෙයක් පළ කළහ.

ඉබි යුවළ පසෙකට ගොස් සාකච්ඡාවක යෙදුණහ.

"ඉස්සෙල්ලා ඔහේ ගිහිල්ලත් බෑ. මටත් තනියම යන්න නිකං මොකක්ද මොකක්ද වගෙයි. මේ කෙල්ලො දෙන්නා තනියම යවන්නත් බෑ. ඕකුන් දෙන්නා මට නම් විශ්වාස නෑ" ඉබ්බිය කීවාය.

"නොගිහිල්ලත් බෑනෙ ඕයි. මේකෙ ඉඳලා කන්න බොන්න නැතුව මැරෙන්නයි වෙන්නෙ" ඉබ්බාටද මඳක් කේන්ති ගියේය.

"මළත් මට මගේ පතිවත වටිනවා ඕයි. හොඳයි මට මොනවා හරි වුණත් කාරි නෑ කියමුකො. මම කසාද බැඳපු ගෑනියෙක්. මම වගේයැ අර කෙල්ලො දෙන්නා. වීදුරු භාජනයක් ඉරි ගියොත් බිඳුනොත් ඒකෙන් වැඩක් තියෙනවද ඕයි?" ඉබ්බිය තදබල දෙගිඩියාවකිනි.

"ඉක්මන් කරනවලා අපට තව වැඩ තියෙනවා" කොක්කු කෑ ගැසූහ.

ඉබි යුවළ අවසන් තීරණයකට එළඹියහ. ප්‍රථමයෙන්ම ඉබ්බා ගුවන් ගතවීමටත් ඊළඟට ඉබ්බිය හා අවසාන වශයෙන් ඔවුන්ගේ දියණියන් දෙදෙනාම එකවර ප්‍රවාහනය කිරීමටත් තීරණය කැරිණි. එම තීරණය ඉබි යුවළගේ සිත් මඳක් සන්සුන් කිරීමට සමත් වූ සෙයකි.

"හොඳට මතක තියා ගන්නවා. තමුසෙලාගෙ පරපුරම නැහුනෙ කට නිසා" කෝටුවේ එල්ලීමට සූදානම් වූ ඉබ්බාට කොක්කු තරයේම අවවාද කළහ.

"තාත්තේ අනේ තාත්තේ බොහොම පරෙස්සමෙන් තාත්තාට මොනවා හරි වුණොත් අපට ඉඳලා වැඩක් නෑ" ඉබි දියණියෝ හඬමින් කීහ.

ඉබ්බා කෝටුවේ එල්ලුනේය. කොක්කු ඔහුද රැගෙන ගුවන් ගත වූහ.

'මම නම් කට ප්‍රවේශම් කැරගෙන කිරි ඉබ්බන් ආරටම යනවාමයි' තරයේම අධිෂ්ඨාන කරගත් ඉබ්බා තදින්ම කෝටුව සපාගෙන සිටියේය.

තිදෙනාගේ උත්සාහය සපල වෙමින් ඔවුහු කිරිඉබ්බන්ආර වැව ප්‍රදේශයට ළඟා වෙමින් සිටියහ. "මූ නම් මොලේ ඇති එකා නේද මංචං" එක කොකෙක් එසේ කියන්නට කට ඇරියේය. ඔහුගේ කටින් කෝටුව ගිලිහී ගියේය. කෝටුවේද ඉබ්බාගේද බර සමබරව තබා ගැනීමට අපොහොසත් වූ අනෙක් කොකාගේ කටින් කෝටුව ඉබ්බාද සමගින් ගිලිහී ගියේය. ගලක් මතට පතිත වූ අසරණ ඉබ්බා චප්ප වී ගියේය.

"මොකක්ද මෝඩයෝ ඒ කරපු ගොන් වැඩේ? ඉබ්බා කට ප්‍රවේශම් කැර ගත්තා. මේ සැරේ උඹයි වැඩේ කෑවෙ" අනෙක් කොකා තම සගයාට දැඩිසේ දොෂාරෝපණය කළේය.

"දැන් මොනවද ගිහිල්ලා ලොක්කටයි අර ගෑනු තුන් දෙනාටයි කියන්නෙ?" හෙතෙම යළිත් තම සගයා ඇමතීය.

"මොකක් හරි බොරුවක් කියමු" වරද කළ කොකා පහත් හඬින් කීවේය.

"මට නම් බෑ බොරු කියන්න" පළමුවැන්නා යළි කීවේය.

"අපේ ඉබ්බන්වල හන්දිය හයිඩ් පාක් එකේ මාසයකට නිල් රතු කොල රැස්වීම් කීයක් තියෙනවද? ඒ හාදයො අර දෙසා බාන්නෙ ඇත්තද? මිනිස්සුඩ හතරැස් බොරු කනටේනර් ගණන් කියද්දී අපි අපේ ආත්මාරක්ෂාවට මේ වගේ පුංචි බොරුවක් කීවම මොකද මචං?" වරද කළ කොකා සිය සගයාට බැගෑපත් විය.

ඒ අනුව ආපසු පැමිණි කොක්කු තම රාජකාරිය එවර නම් අකුරටම ඉටු කළ බව සිය නායකයාට වාර්තා කළහ.

"නංගි..... ඔයාලගෙ තාත්තා නම් හරිම ඉන්ටෙලිජන්ට් පොර. කිරිඉබ්බන්ආර වැව ළඟටම ගිහින් අපි බිමට ලෑන්ඩ් කරලා හා බහින්න කියන තුරුම පොර කට ඇරියෙ නෑ" කොක්කු කීහ.

"අයියලා දෙන්නට තෑංක්ම තෑංක්" ඉබි යුවතියෝ මදහස පාමින් කියා ලජ්ජාවෙන් බිම බලා ගත්හ.

"එයා හරිම ඉන්ටෙලිජන්ට් තමයි. ඒකනේ මේ වළේ සිය ගණනක් ඉබ්බියො හිටියත් එයා මැරි කරන්න මේ මාවම තෝරා ගත්තෙ" ඉබ්බිය ආඩම්බරයෙන් කීවාය.

"දුවේ එහෙනම් මම යන්නම්. ඔය දෙන්නා තනි තනියම එන්න එපා. කොච්චර වුණත් මට නම් මුන් දෙන්නා එච්චර විශ්වාස නෑ. ඔය දෙන්නාම එකවර එන්න. තනි තනියම යන්න කතා කළත් බෑ කියන්න" ඉබ්බිය සිය දියණියන් දෙදෙනාට තරයේම අවවාද කරමින් ගුවන් ගත වූවාය.

කොකුන් දෙදෙනා ඇය රැගෙන පැය හත අටකදී කිරි ඉබ්බන්ආරවැව ප්‍රදේශයට ළඟා වූහ.

"හච්චීන්" එවර අනෙක් කොකාට හදිසියේම කිවිසුමක් ගියේය. ඔහුගේ කටින් කෝටුව ගිලිහී ගියේය. සමබරතාව පවත්වා ගැනීමට අනෙක් කොකා අපොහොසත් විය. කෝටුව ඩැහැගෙන සිටි ඉබ්බියද වැව දැක දැක ගුවනේ සිට බිමට පතිතව පරලොව ගියාය.

"කරන්න දෙයක් නෑ මංචං. ඒක හදිසි ශාරීරික අවශ්‍යතාවක්. ඒක මට පාලනය කර ගන්න පුළුවන් දෙයක් නෙවෙයිනෙ" කොකා නිදහසට කරුණු දැක්වීය.

"හරි හරි මම නෑ කීවෙ නෑනෙ. දැන් අර කෙල්ලො දෙන්නට මොනවද කියන්නෙ?" අනෙකා ඇසීය.

"උන් දෙන්නත් ට්‍රාන්ස්පෝට් කරන්න ගියොත් උන් දෙන්නත් වැටිල මැරෙනවාමයි. ඒ නිසා අපි හොඳින් බැරි නම් නරකින් හරි උන් දෙන්නා කසාද බැඳගෙන එහේම නතර කර ගනිමු" අනෙක් කොකා යෝජනා කළේය.

"උඹට පිස්සුද? කොක්කුයි ඉබ්බියොයි ගැලපෙනවද අපේ උන් අපිව කොන් කරාවි" මිත්‍රයා තම සගයාගේ යෝජනාව තරයේම ප්‍රතික්ෂේප කළේය.

"උඹ අහල නැද්ද මනුස්ස කෙල්ලෝ නරින්ව කසාද බැඳල තියෙනවා. ඉස්සරත් එහෙම වුණා කියලා පොත්වල තියෙනවා. මෑතකදීත් එහෙම එකක් වෙලා මම දැක්කා ඉරිදා පත්තරේක තිබුණා. කොල්ලෙක් බැල්ලියක් කසාද බැඳපු කතාවකුත් මේ ළඟදී පත්තරේක ෆොටෝ එකකුත් එක්ක දාලා තිබුණා" මිතුරා දිගින් දිගටම කරුණු කියද්දී සගයා මඳක් පසුබා සිටියේය.

"උන් දෙන්නා වතුර නැතිවම මැරිල යාවි" ඔහු අවසානයට කීවේය.

"අපි උන් දෙන්නා බේරෙට ගිහින් දාමු"

"බේරෙට? අච්චර ලස්සන කෙල්ලො දෙන්නා. ඊට වඩා හොඳයි උන් දෙන්නගෙ බෙල්ල මිරිකලා දාපං. උඹ දන්නෙ නැද්ද බේරෙ කියන්නෙ අසූචි වළක් කියල"

"එහෙනම් මාළිගාකන්දෙ ටෑංක් එකට ගිහින් දාමූ"

"ඒක නම් හොඳ අදහස. හැබැයි ඒකට දැම්මොත් එදායින් පස්සෙ අපට උන් දෙන්නව දකින්නවත් ලැබෙන එකක් නෑ"

"ඒකට මගේ ළඟ හොඳ අයිඩියා එකක් තියෙනවා මචාං"

"මොකක්ද"

"ඊට කලින් අපි දෙන්නා උන් දෙන්නව කසාද බඳිමූ. එතකොට හරිනෙ"

"උඹේ මොළේ තමයි මොළේ. තෙමෙන්න එපා. වහින වෙලාවට රේන් කෝට් එකක් පාවිච්චි කරපං"

කොක්කු අවසන් නිගමනයකට පැමිණියහ. බොහෝ සේ සතුට පිරි සිත්වලින් යුතුව ඔවුහු ඉබ්බන්වල බලා ආපසු පියාසර කළහ.

අවාසනාවකි. ඔවුන් ආපසු එන විට ඉබි යුවතියන් දෙදෙනා විජලනයෙන් මිය ගොස් සිටියහ.

## දුර බැහැර සිට...

45 වන පිටුවෙන්

ඔහු එහි ගියේ ලේන් සහ සිය යතුරු ලියන්නාද සමගිනි. වසර තුනකට පෙර සෑදුණු සෙම්ප්‍රතිශ්‍යාවකින් පසු දැරිය මේ තත්ත්වයට පත්ව තිබේ. මාපියන් පවසන්නේ මේ දැරිය රැගෙන හැකිතාක් විශේෂඥ වෛද්‍යවරුන් හමුවට ගිය බවත් ඒ කිසිදු වෛද්‍යවරයකු මේ රෝගය නිසි පරිදි හඳුනා ගැනීමට අපොහොසත් වූ බවත් කේසි දැනගත්තේය.

දුප්පත් ගොවියකුගේ පුතකු වන කේසි වෛද්‍යවරුන්ට පවා සුව කළ නොහැකි යැයි කියා තිබූ මේ දැරිය සුවපත් කරන්නේ කෙසේදැයි කාගේත් අවධානයට ලක්ව තිබිණි. වෛද්‍යවරු කියා සිටියේ මේ රෝගය මාරාන්තික බවයි. නිතර නිතර වෙව්ලීමෙන් පීඩා විඳි දැරිය මරණාසන්නව සිටින බව පැවසූ වෛද්‍ය විශේෂඥයන් කියා සිටියේ දැරිය නිවසට ගෙන ගොස් කැමැත්තක් කරගන්නා ලෙසයි. දැරිය නිවසට රැගෙන ගිය පසු එඩ්ගාර් කේසිගේ හැකියාව පිළිබඳ දැනගත් මාපියෝ ඔහුට ආරාධනා කළහ. දැරියගේ නිවසටම කේසි ගියේය. ඒ ලේන්ද සමගිනි. ලේන් යෝජනාව කළේය. අනතුරුව කේසි කියන දේ වචනයෙන් වචනය සටහන් කළේය. කේසි කියා සිටියේ සෙම්ප්‍රතිශ්‍යාව වැළඳීමට ටික දිනකට පෙර දැරිය වාහනයකින් වැටී ඇති බවයි. මේ වැටීමෙන් තැලුණු ස්ථානයේ සෙම්ප්‍රතිශ්‍යාවට හේතු වන විෂබීජයක් තැන්පත්ව ඇති බැවින් වෙව්ලීම සිදුවන බවත් කේසි කියා සිටියේය. මේ සඳහා සුදුසු ප්‍රතිකාරද කේසි පැවසීය.

දැරිය වාහනයකින් වැටුණු බව ඇගේ මව කීවාය. බාහිරින් කිසිදු තුවාලයක් පෙනෙන්නට නොමැති බැවින් ඒ ගැන වැඩි අවධානයක් යොමු නොවූ බවද මේ රෝගයත් වැටීමත් අතර කිසියම් සම්බන්ධයක් ඇතැයි කිසිවකුත් විශ්වාස නොකළේය. රෝගයත් එයට ප්‍රතිකාරත් විස්තර කිරීමෙන් පසු කේසි නිද්‍රාවෙන් අවදි වූවේය. ලේන් උපදෙස් දුන් ආකාරයට දැරියගේ මාපියෝ අදාල ප්‍රතිකාර ආරම්භ කළහ. සති කිහිපයක් ඇතුළත දැරියගේ වෙව්ලීම නැතිවී ගියේය. ටික කලකින් දැරියට පැරණි දේ පිළිබඳ මතකය යළි ලැබෙන බව පෙනෙන්නට තිබිණි. ඉන්පසු ඇය තම මාපියන්ට කලකට පසු කථා කළාය. අවසානයේ දී ප්‍රධාන පෙළේ විශේෂඥ වෛද්‍යවරුන්ට පවා නොහැකි වූ දේ ගොවියකුගේ පුතකු වූ එඩ්ගාර් කේසි සිදුකිරීම පුදුම සහගත දෙයක් වී තිබිණි.



# ජනාධිපති පදවිය ගැන

## ජනාධිපතිවරු මෙසේ කියති






■ **කේ. එන්. ඕ. අමරදාස**

ඕනෑම රටක ප්‍රධානියා ලෙස සැලකෙන ජනාධිපති පදවිය තරම් කතාබහට ලක්වන වෙනත් මාතෘකාවක් නැති තරම්ය. රටක ජනාධිපති තනතුර කොයි අන්දමේ එකක්දැයි හරිහැටි දන්නේ එම පදවිය හෙබවූ තැනැත්තන් මිස අන් අය නොවේ.

ඇමෙරිකාවේ ජනාධිපති පදවිය ඉසිලූ තැනැත්තෝ ඒ තනතුර පිළිබඳව විවිධ මත පළ කර ඇත්තාහ.

ජනාධිපති එෆ්. ඩී. රූස්වේල්ට් ට කොටින් ගැන බියක් තිබූ බව ඔහු ඒ පිළිබඳව දක්වා ඇති මතයෙන් හෙළිවේ.

"මේ පදවියට පත්වී පළමු මාස කීපය තුළ මට හැඟී ගිය කරුණක් නම් ජනාධිපතිවරයෙක් වීම කොටියෙක් පිට නැගී ගමන් කිරීමට සමාන බවය. එක්කෝ ඔහු නොනැවතී එසේ ඉදිරියට යා යුතුය. නැත්නම් කොටියාගේ ගොදුරක් බවට පත් විය යුතුය."

ජනාධිපති ජෝන් ඇඩම්ස් එය දුටුවේ මේ ආකාරයටය.

"මා ජනාධිපති පදවිය සඳහා නැවත වතාවක් තෝරා පත්කර ගත්තේ නම් තව එක් වසරක් වත් ජීවත් නොවනවාට කිසිදු සැකයක් නැත."

තමා ජනාධිපති පදවිය ඉසිලූ සිව් වසර තමාගේ ජීවිතයේ ඉතාමත් අවාසනාවන්ත සිව් වසර බවද ඔහු තවදුරටත් පවසා තිබේ.

ජනාධිපති පදවියෙන් සමුගෙන ජනාධිපති මන්දිරයෙන් ඉවත්ව යන ජේම්ස් බුචානන්, අලුතෙන් එම පදවියට තේරී පත්වූ ඒබ්‍රහම් ලින්කන්ට එය විස්තර කර ඇත්තේ මේ ආකාරයටය.

"මා මේ මන්දිරයෙන් ඉවත්ව ආපසු මගේ නිවසට යන විට මා තුළ ඇති ප්‍රීතිය, එයට ප්‍රවිෂ්ට වන ඔබ තුළ ඇත්නම් මේ රටේ සිටින ඉතාමත් වාසනාවන්ත පුද්ගලයා ඔබය."

ජනාධිපති ඒබ්‍රහම් ලින්කන් එම පදවිය විග්‍රහ කළේ මේ ආකාරයටය.

"මට හැඟෙන්නේ දඬුවමක් හැටියට ඇඟේ තාර ගා, පිහාටු අලවා, දුම්රියක නංවා, නගරයෙන් පිටතට ගෙනයනු ලැබූ පුද්ගලයාට හැඟුණු දේමය. ඒ පිළිබඳව ඔහුගේ අදහස් විමසූ තැනැත්තාට ඔහු පැවසුවේ ඒකෙ තිබුණ නම්බුකාරකම නොතිබෙන්ඩ, මම යන්නෙ පයින්මයි" කියාය.

ජනාධිපති ජේම්ස් ඒ. ගාෆීල්ඩ් තම පදවිය ගැන ප්‍රශ්න කරන්නේ මෙසේය.

"අනේ දෙයියනේ. මිනිස්සු මෙතෙන්ට එන්ඩ මේ තරම් වලිකන්නෙ මොන උලව්වකටද?"

ජනාධිපතිවරයෙක් ඕනෑම තත්ත්වයකට මුහුණ දීමට සූදානම්ව සිටිය යුතුය යනු වුඩ්රෝ විල්සන්ගේ මතයයි.

"ජනාධිපති පදවිය සඳහා මලල ක්‍රීඩකයෙකුගේ ශාරීරික ශක්තියත්, මවක සතු ඉවසීමේ ගුණයත්, ආදි ක්‍රිස්තු භක්තිකයෙක් සතු දුක් විඳදරා ගැනීමේ ශක්තියත් අවශ්‍යයයි." ඔහු පවසා ඇත්තේ ඒ නිසාය.

විලියම් හොවාර්ඩ් ටාෆ්ට් ජනාධිපති පදවිය දුටුවේ කිසිම බලතලයක් නැති නිකමෙක් සතු තනතුරක් ලෙසටය.

"මට මේක එපා වෙන්නෙ නැත්නම් මට හෙන ගහන්ඩ ඕනෑ. ජනාධිපතිගෙ රාජකාරිය වෙලා තියෙන්නෙ අනිත් අයගෙ කතාවලට ඇහුම්කන් දීගෙන නිකම් බලාගෙන ඉන්න එක විතරයි." යනුවෙන් ඔහු පවසා තිබේ.

ජනාධිපති වොරෙන් ජී. හාඩින් ද ඉදිරිපත්කර ඇත්තේ මීටම සමාන අදහසකි.

"මා ජනාධිපති බව බොහෝ අවස්ථාවල මටම ඒත්තු නොයන හැඩයි."

ජනාධිපති තෝමස් ජෙෆර්සන් ජනපති පදවිය ගැන දැරූ අදහස සදාතනික සත්‍යයක් නොවේද?

"ජනාධිපති පදවියට පත්වීම සඳහා කෙනකුට උපකාර වන කීර්තිය, එම පදවියෙන් ඉවත් වී යන විට ඔහුට ඉතිරි වන්නේ නැත"

මේ සෑම ජනාධිපතිවරයෙක්ම එම තනතුර නීරස, කරදරකාරී, වැඩකට නැති අප්‍රසන්න පදවියක් ලෙස සැලකුවද, තියඩෝර් රූස්වෙල්ට් එය දුටුවේ ඔවුන් සියලුදෙනාටම වඩා වෙනස් ආකාරයකටය.

"අන් කිසි ජනාධිපතිවරයෙක් මා මෙන් ජනාධිපති පදවියේ ප්‍රීතිය භුක්ති නොවිඳින්නට ඇත."

ඉහත සියලු දේ පැවසුවේ ඇමෙරිකාවේ හිටපු ජනාධිපතිවරුන්ය.

එහෙත් ජේ. ආර්. ජයවර්ධන මහතා විසින් හඳුන්වා දී ඇති දැනට අප රටේ පවත්නා විධායක ජනාධිපති පදවිය හෙබවූ තැනැත්තෙක් කිසිදා එසේ පවසාවි දැයි කෙනෙක් තුළ සැකයක් ඇතිවේ.

ජනාධිපති පදවිය හොබවන කාලය තුළ පමණක් නොව ඉන් විශ්‍රාම ගත් විටද අප රටේ ජනාධිපතිවරයකුට අසීමිත වරප්‍රසාද සමුදායකට හිමිකම් තිබේ.

ඔහු හෝ ඇගේ ජීවිත කාලය පුරාවටම කලින් දැරූ රාජ්‍ය නායකත්වයේ අභිමානය රැකෙන පරිදි විශ්‍රාම කාලය ගත කිරීමට එම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඉඩ සලසා ඇත.

එම තැනැත්තාට රුපියල් ලක්ෂයකට ආසන්න විශ්‍රාම වැටුපක් හිමිවෙන අතර කැබිනට් අමාත්‍යවරයකුට හිමි සියලු වරප්‍රසාදයද හිමිවන්නේය. ඔහු හෝ ඇගේ අභිමතය පරිදි නිල නිවසක් ලබාගැනීමට හෝ පෞද්ගලික නිවසක් රජයේ වියදමෙන් ප්‍රයෝජනයට ගැනීමේ වරප්‍රසාදය ඒ තැනැත්තා සතුය.

ආරක්ෂාවද කැබිනට් අමාත්‍යවරයකුට ලබාදෙන ආරක්ෂාවට සමානය. නිල රථ මෙන්ම ආරක්ෂක රථද හිමි වන අතර ඉන්ධන දීමනාවන්ටද හිමිකම් ලැබේ. නිල රථය සඳහා අවශ්‍ය නම් වෙඩි නොවදින මෝටර් රථයක් ලබාගත හැකිය.

හිටපු රාජ්‍ය තාන්ත්‍රිකයකු ලෙස විදේශ රටකින් ආරාධනයක් ලැබුණහොත් ඒ සඳහා අවශ්‍ය කෙරෙන දීමනාවන්ටද හිමිකම් ලැබේ. ඔහුට හෝ ඇයට කාර්යාලයක් පවත්වාගෙන යෑමටත් ඒ සඳහා කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යෑමටත් හිමිකම් තිබේ.

ජනාධිපති පදවිය හෙබවූ අවධියේ කරන ලද කිසියම් වරදකට එම තැනැත්තාට එරෙහිව නඩු පැවරීමටද නොහැකිය. එමෙන්ම ජනාධිපතිවරයා විශ්‍රාම ගියද 'හිටපු' යන වහර නොයොදා 'ජනාධිපති' යන නාමය දිගටම භාවිත කළ හැකිය.

ජනාධිපති ධූරය දරද්දී හෝ ඉන් විශ්‍රාම ගත්විට හෝ ඒ තැනැත්තා මියගිය හොත්, වැන්දඹුවට විශ්‍රාම වැටුපෙන් තුනෙන් දෙකක්ද, විශ්‍රාමික ජනාධිපතිවරයකුට හිමි අනෙකුත් සියලු වරප්‍රසාදයන්ද හිමිය.

මෙවන් අසීමිත වරප්‍රසාද සමුදායක් හමුවේ අපේ රටේ ජනාධිපතිවරයෙක් එය වැඩකට නැති පදවියක් ලෙස කිසිදා හඳුන්වාවිදැයි කෙනෙක් තුළ සැකයක් ඇතිවේ.




Toronto
ගිම්හානයේ අග
යුග යුග රිද්ම
YUGA YUGA RIDMA
LIVE IN CONCERT
Indrani Perera
Visharadha Deepika Priyadarshani
Nirosha Virajini
Uresha Ravihari
Saturday
December 16, 2017
Sir John A. Macdonald Collegiate Institute
2300 Pharmacy Ave, Toronto
Producer / Coordinator
Asian Film & Drama Foundation, USA
Music Director
SAMANTHA PERERA
Presented by
BOSTON LANKA
For more info:
Palitha Hegoda (647) 831-1915 Scarborough / Chamila Jayatillake (416) 880 4874 Toronto
Badra De Zoysa (416) 496-1092 Toronto / Gayan Senadeera (416) 824-6153 Scarborough
Bandula Saputhanthiri (416) 666- 9980 Ajax / Rashanthi Hettiarachchi (416) 432-1532 Brampton
Asoka Perera (647) 286-6925 Brampton / Jagath Rupasinghe (647) 300-8054 Markham
Indrani Rathnayake (416) 439-8295 Scarborough / Ravi De Silva (647) 890-1581 Mississauga
Rathna Malgaha (905) 275-0302 Mississauga / Sandini/(Najith) Nanayakkara (905) 216-3586 Brampton
Asoka Pinnaduwage (416) 270-5874 North York
Tickets
$50 $30
Save the date...

# BEYOND YOUR EXPECTATIONS !

## Residential & Commercial Real Estate

**BUY or SELL your HOME with me**

**For Buyers**

**I will pay your first months mortgage***

*Limited to $300.00 for Each $100,000 Mortgage

**For Sellers**

**My commission for your listing will be 0% when you Sell & buy a home with me.****

**Sellers when buying will not receive the 'first month mortgage on me' rebate in combination with the '0% commission for me' rebate for listing, however the Seller will have the choice of either or.



**5% DOWN ? No problem!**

**I will guide you through obtaining your DREAM HOME through my proven system!**

ABR ACCREDITED BUYER REPRESENTATIVE

CNE CERTIFIED NEGOTIATION EXPERT

RE/MAX 100% Club Award

2016, 2014, 2013, 2011, 2010

RE/MAX Platinum Club Award

2015, 2012

The Diamond Realty Inc Brokerage

A member of CanLanka BUSINESS ASSOCIATION

RE/MAX HALL OF FAME

*With me as your agent, your dreams of finding the perfect home can be made a reality!*

**New to Canada, First time Buyers, lack of down payment, Credit problems ?**

**Call me Today !**

I will be happy to guide you through the process in a professional, friendly and accountable manner.

Join the many happy home owners I've helped and find the perfect home for you!

# Gamini Abeysinghe. ABR, CNE

**Real Estate Sales Representative**

E-mail : shinko@rogers.com Office - 416 235 2500 Fax - 416 235 2828

1570 Kipling Ave(N of Eglinton) Toronto. ON M9R 2Y1

**Toll Free: 1-800 611 2882 Ext 102**

# Mobile : 416 822 2789

**www.gaminiabeysinghe.com**

● Some conditions apply. Please feel free to contact me for further details ** ● Not intended as solicitation of sellers under listing contracts or buyers under buyer representation agreements


KATPAKAM GROCERY
SALES START FROM DEC 15 - JAN 15 2018
CHRISTMAS NEW YEAR AND 7TH ANNIVERSARY SALE
MD CORDIAL 2 FOR - $ 10.00
CONDENSED MILK - $ 1.99
JAM - $ 1.99
NESTOMALT - $ 4.99
MASOOR DHAL 8Lb - $ 4.99
URID DHAL - 8Lb - $ 9.99
URID DHAL - 4Lb - $ 4.99
EASTERN - DOSA PODI, PUTTU PODI, IDLY PODI, IDIYAPPAM PODI, APPAM PODI
BUY TWO GET ONE FREE
FROZEN COCONUT - $ 2.99
FROZ ROTI 30PC - $ 7.99
PAPADAM 2 FOR $ 1.00
MALDIV CHIP - $ 5.99
SESAME OIL 1L - $ 4.99
GREEN JACK TIN 2 FOR - $ 3.00
TUSK BASMATI RICE - $ 5.99
URITHIRA RED RAW RICE 8Lb - $ 6.99
MORE SPECIALS IN THE STORE
THANK YOU FOR A SUCCESSFUL SIX YEARS OF BUSINESS!
We wish you Merry Christmas & Happy New Year!
6970 Lisgar Drive, Unit B1, Mississauga, L5N 8C8
Derry/ 9th Line(Behind 7 Eleven Gas Station)
TEL: 905 785 0444
Katpakam Grocery


ඔබ සැමට සාමය සතුට පිරි
සුබ නත්තලක් වේවා....!
Merry Christmas
& HAPPY NEW YEAR
The Diamond Realty Inc Brokerage
දසත Dasatha
ගාමිණී අබේසිංහ
Gamini Abeysinghe